# බුද්ධ පූජාව හා වන්දනාව

**නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස**
**නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස**
**නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස**

ඒ භාග්‍යවත් අරහත් සම්මා සම්බුදු රජාණන් වහන්සේට මාගේ නමස්කාරය වේවා!!!

## ආරාධනාව

**යාවතා භගවා ලෝකේ - තිට්ඨෙය්‍ය තව සාසනං**
**තාවතා පතිගණ්හාතු - පූජා ලෝකානු කම්පයා.**

ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, යම්තාක් ඔබ වහන්සේගේ ශාසනය ලොව පවතීද, ඒ තාක් ලෝකානුකම්පාවෙන් සියලු පූජාවන් පිළිගන්නා සේක්වා!

## පහන් පූජාව

**ඝණ තෙලප්ප දිත්තේන - දීපේන තම ධංසිනා**
**තිලෝක දීපං සම්බුද්ධං - පූජයාමි තමෝ නුදං**



සුවඳ තෙලෙන් දැල්වූ අඳුර දුරලන්නා වූ මේ පහනින් තුන් ලොවට පහනක් වූ මෝහාන්ධකාරය දුරලූ සම්මා බුදුරජාණන් වහන්සේට මම මේ පහනින් පුදමි. පූජාවේවා !

**තිලෝක මහිතං සම්බුද්ධං - දීපෙන පූජයාමහං**
**තේන ධම්මේන සංසාරෙ - චක්ඛු සුජ්ජතු සබ්බදා**

තුන්ලෝක වාසීන් විසින් පුදන ලද සම්මා සම්බුදු රජාණන් වහන්සේට මම පහන් ආලෝකයෙන් පූජා කරමි. ඒ පහන් පූජාවේ කුසලානිසංසයෙන් සසරේදී ප්‍රඥා චක්ෂු සම්පත්තිය මනාකොට පහළ වේවා!

**වෙනෙය්‍ය හදයේ මෝහ - තමෝක්ඛන්ධ විනෝදකං**
**දීපේනේතේන පූජෙමි - පඤ්ඤා දීප ධරං ජිනං**

වෙනෙය්‍ය ජනයාගේ හදවතෙහි ඇත්තාවූ මොහ නැමැති අන්ධකාරය දුරුකලාවූ ප්‍රඥා නැමැති ආලෝකය දරන්නා වූ පස්මරුන් දිනූ ජිනෙන්ද්‍රියන් වහන්සේට මම මේ පහන් ආලෝකයෙන් පූජා කරමි. පූජා වේවා!

**ඉමිනා පුඤ්ඤ කම්මේන - පඤ්ඤවා සීලවා සදා**
**භවිත්වාහං ලභෙ සීසං - ධම්ම චක්ඛුං අනුත්තරං**

මේ සිදු කර ගන්නා ලද පුණ්‍ය කර්මයෙන් මම සැම කල්හිම සීලවන්තයෙක් වී ප්‍රඥාවන්තයෙක් වී අනුත්තරවූ ධර්ම චක්ෂුව ලබන්නෙමි. ලබන්නෙම්වා !

## විදුලි ආලෝක පූජාව

**විජ්ජුල්ලතා පදිත්තේන - දීපෙන තම ධංසිනා**
**තිලෝක දීපං සම්බුද්ධං - පූජයාමී තමෝනුදං**

විදුලි ආලෝකයෙන් දැල්වූ, අඳුර දුරු කරන්නාවූ මේ විදුලි පහනින් තුන් ලොවට පහනක් වූ මොහන්ධකාරය දුර ලූ සම්මා සම්බුදු, බුදුරජාණන් වහන්සේට මම මේ පහන් පූජා කරමි. පූජා වේවා!

## සුවඳ දුම් පූජාව

**සුගන්ධිකාය වදනං - අනන්ත ගුණ ගන්ධිනං**
**සුගන්ධිනාහං ගන්ධෙන - පූජයාමී තථාගතං**

සුවඳවත් මුව පියුමක් ඇත්තාවූ අනන්ත ගුණ සුවඳින් සුවඳවත්වූ තථාගත බුදුරජාණන් වහන්සේට මම මේ සුවඳින් පූජා කරමි. පූජා වේවා!

## කපුරු පූජාව

**ඝණ සාරප්ප දිත්තෙන - දීපේන තම ධංසිනා**
**තිලෝක දීපං සම්බුද්ධං - පූජයාමී තමෝනුදං**



මේ ප්‍රදීපා ආලෝකයෙන් කෙලෙස් අඳුර දුරුකළාවූ මේ පහනින් තුන්ලොවට පහනක් වූ මොහාන්ධකාරය දුරලූ සම්මා සම්බුදු රජාණන් වහන්සේට මම කපුරු ඉටිපන්දම් ආලෝක පූජාවෙන් පූජා කරමි. පූජා වේවා!

## සිසිල් පැන් පූජාව

**සුගන්ධං සීතලං කප්පං - පසන්න මධුරං සුභං**
**පානීය මේතං භගවා - පතිගණ්හාතු මුත්තම**

''ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස,'' සුවඳවත් වූ සිසිල් වූ කැප වූ පහන් වූ මිහිරි වූ පිවිතුරු වූ උතුම් වූ මේ පැන් උත්තමයන් වහන්ස පිළිගන්නා සේක්වා !

**අනන්ත ඤානොවිමලො-දක්ඛිණෙයෙයා ගුණාකරො**
**පතිගණ්හාතු භගවා - දක්ඛිණොදක මුත්තමං**

''ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස,'' නිර්මල පිරිසිදු අනන්ත ඥාණයෙන් යුක්ත වූ දක්ෂිණාවට ගුණ ආකරයක් වූ භාග්‍යවතුන් වහන්ස උතුම් වූ මේ දක්ෂිණෝදකය පිළිගන්නා සේක්වා!

## උණු පැන් පූජාව

**අධිවාසේතු නො භන්තේ - උණ්හොදකං පරිකප්පිතං**
**අනුකම්පං උපාදාය - පතිගණ්හාතු මුත්තම**

''ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස,'' අපගේ ආරාධනය ඉවසන සේක්වා. උත්තමයන් වහන්ස අප විසින් සකස් කළ සියල්ලෙන් කැපවූ උතුම් වූ මේ උණු පැන් අනුකම්පාවෙන් පිළිගන්නා සේක්වා!

## කිරි ආහාර පූජාව

**අධිවාසේතු නො භන්තේ - පායාසං පරිකප්පිතං**
**අනුකම්පං උපාදාය - පතිගණ්හාතු මුත්තම**

''ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස,'' අපගේ ආරාධනය ඉවසන සේක්වා. උත්තමයන් වහන්ස අප විසින් සකස් කළ සියල්ලෙන් කැපවූ උතුම් වූ මේ ක්ෂීරපායාසය අනුකම්පාවෙන් පිළිගන්නා සේක්වා!

## කැඳ පූජාව

**අධිවාසේතු නො භන්තේ - තරලං පරිකප්පිතං**
**අනුකම්පං උපාදාය - පතිගණ්හාතු මුත්තම**

''ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස,'' අපගේ ආරාධනය ඉවසන සේක්වා. උත්තමයන් වහන්ස අප විසින් සකස් කළ සියල්ලෙන් කැපවූ උතුම් වූ මේ කැඳ ආහාරය අනුකම්පාවෙන් පිළිගන්නා සේක්වා!



## ආහාර පූජාව

**අධිවාසේතු නො භන්තේ - භොජනං පරිකප්පිතං**
**අනුකම්පං උපාදාය - පතිගණ්හාතු මුත්තම**

''ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස,'' අපගේ ආරාධනය ඉවසන සේක්වා. උත්තමයන් වහන්ස අප විසින් සකස් කළ සියල්ලෙන් කැපවූ උතුම් වූ මේ ආහාර දානය අනුකම්පාවෙන් පිළිගන්නා සේක්වා!

## ව්‍යඤ්ජන පූජාව

**අධිවාසේතු නො භන්තේ -ව්‍යඤ්ජනං පරිකප්පිතං**
**අනුකම්පං උපාදාය - පතිගණ්හාතු මුත්තම**

''ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස,'' අපගේ ආරාධනය ඉවසන සේක්වා. උත්තමයන් වහන්ස අප විසින් සකස් කළ සියල්ලෙන් කැපවූ උතුම් වූ මේ ව්‍යඤ්ජන ආහාරය අනුකම්පාවෙන් පිළිගන්නා සේක්වා!

## කැවිලි පූජාව

**අධිවාසේතු නො භන්තේ - ඛජ්ජකං පරිකප්පිතං**
**අනුකම්පං උපාදාය - පතිගණ්හාතු මුත්තම**

''ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස,'' අපගේ ආරාධනය ඉවසන සේක්වා. උත්තමයන් වහන්ස

අප විසින් සකස් කළ සියල්ලෙන් කැපවූ උතුම් වූ මේ රස කැවිලි ආහාරය අනුකම්පාවෙන් පිළිගන්නා සේක්වා!

## පලතුරු පූජාව

**අධිවාසේතු නො භන්තේ - පලා ඵලං පරිකප්පිතං**
**අනුකම්පං උපාදාය - පතිගණ්හාතු මුත්තම**

''ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස,'' අපගේ ආරාධනය ඉවසන සේක්වා. උත්තමයන් වහන්ස අප විසින් සකස් කළ සියල්ලෙන් කැපවූ උතුම් වූ මේ පලතුරු අනුකම්පාවෙන් පිළිගන්නා සේක්වා!

## තැඹිලි පැන් පූජාව

**අධිවාසේතු නො භන්තේ - සංනීරං පරිකප්පිතං**
**අනුකම්පං උපාදාය - පතිගණ්හාතු මුත්තම**

''ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස,'' අපගේ ආරාධනය ඉවසන සේක්වා. උත්තමයන් වහන්ස අප විසින් සකස් කළ සියල්ලෙන් කැපවූ උතුම් වූ මේ තැඹිලි පැන් අනුකම්පාවෙන් පිළිගන්නා සේක්වා!

## කිරි ගිලන්පස පූජාව

**අධිවාසේතු නොභන්තේ-ඛීර පානං පරිකප්පිතං**
**අනුකම්පං උපාදාය - පතිගණ්හාතු මුත්තම**

''ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස,'' අපගේ



ආරාධනය ඉවසන සේක්වා. උත්තමයන් වහන්ස අප විසින් සකස් කළ සියල්ලෙන් කැපවූ උතුම් වූ මේ කිරි ගිලන්පස අනුකම්පාවෙන් පිළිගන්නා සේක්වා!

## කිරිපැණි පූජාව

**අධිවාසේතු නො භන්තේ-දධි ඵාණිතං පරිකප්පිතං**
**අනුකම්පං උපාදාය - පතිගණ්හාතු මුත්තම**

''ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස,'' අපගේ ආරාධනය ඉවසන සේක්වා. උත්තමයන් වහන්ස අප විසින් සකස් කළ සියල්ලෙන් කැපවූ උතුම් වූ මේ කිරි පැණි අනුකම්පාවෙන් පිළිගන්නා සේක්වා!

## දැහැත් පූජාව

**නාගවල්ලී දලූපේතං - චුණ්ණ පූග සමායුතං**
**තාම්බූලං පතිගණ්හාතු - සකප්පූර මිදං ජිනො**

බුලත්, සුණු, පුවක් වලින් යුක්ත වූ කපුරු සහිත මේ බුලත් ජිනේන්‍ද්‍රයන් වහන්සේ පිළිගන්නා සේක්වා!

## වැළඳීමට ආරාධනාව

**නිවේදයාමි සම්බුද්ධං - වීතරාගං මහාමුනිං**
**නිමන්තයාමී සුගතං - ලෝක ජෙට්ඨං නරාසභං**

වීතරාගී වූ ලෝකයට ජ්‍යෙෂ්ඨ වූ සත්වයන්ට

ශ්‍රේෂ්ඨ වූ සොභන ගමන් ඇත්තා වූ මහා මුනීන්ද්‍ර වූ සම්මා සම්බුදු රජාණන් වහන්සේට දන්වමි ආරාධනා කරමි.

## මල් පූජාව

**වණ්ණ ගන්ධ ගුණෝපේතං - ඒතං කුසුම සන්තතිං**
**පූජයාමි මුනින්දස්ස - සිරිපාද සරෝරුහෙ**

මනා වර්ණයෙන් හා සුගන්ධයෙන් යුත් මේ මල් සමූහයෙන් මුනීන්ද්‍රයන් වහන්සේගේ ශ්‍රී පාද පද්මයෙහි පූජා කරමි. පූජා වේවා!

**පූජෙමි බුද්ධං කුසුමේන නේන**
**පුඤ්ඤේන මෙතේන ලභාමි මොක්ඛං**
**පුප්ඵං මිලායාති යථා ඉදම්මෙ**
**කායෝ තථා යාති විනාසභාවං**

මම මේ මලින් බුදුරජාණන් වහන්සේ පුදන්නෙමි. මේ පිනෙන් නිවන් ලබම්වා. මේ මල මැලවෙන්නාසේ මාගේ සිරුරද විනාශයට පත්වන්නේය.

## ගිලන්පස පූජාව

**අධිවාසේතු නො භන්තේ - පානකං පරිකප්පිතං**
**අනුකම්පං උපාදාය - පතිගණ්හාතු මුත්තම**

''ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස,'' අපගේ



ආරාධනය ඉවසන සේක්වා උත්තමයන් වහන්ස අප විසින් සකස් කළ සියල්ලෙන් කැපවූ සිසිල් ගිලන්පස පානය අනුකම්පාවෙන් පිළිගන්නා සේක්වා!

## අෂ්ඨපාන ගිලන්පස පූජාව

**අධිවාසේතු නො භන්තේ -අට්ඨපානං පරිකප්පිතං**
**අනුකම්පං උපාදාය - පතිගණ්හාතු මුත්තම**

''ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස,'' අපගේ ආරාධනය ඉවසන සේක්වා. උත්තමයන් වහන්ස අප විසින් සකස් කළ සියල්ලෙන් කැපවූ අෂ්ඨපාන ගිලන්පස අනුකම්පාවෙන් පිළිගන්නා සේක්වා!

## චතුමධුර පූජාව

**අධිවාසේතු නො භන්තේ - චතුමධුරං පරිකප්පිතං**
**අනුකම්පං උපාදාය - පතිගණ්හාතු මුත්තම**

''ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස,'' අපගේ ආරාධනය ඉවසන සේක්වා උත්තමයන් වහන්ස අප විසින් සකස් කළ සියල්ලෙන් කැපවූ ප්‍රණීත චතුමධුර ආහාරය අනුකම්පාවෙන් පිළිගන්නා සේක්වා!

## බෙහෙත් පූජාව

**අධිවාසේතු නො භන්තේ - භේසජ්ජං පරිකප්පිතං**
**අනුකම්පං උපාදාය - පතිගණ්හාතු මුත්තම**

''ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස,'' අපගේ ආරාධනය ඉවසන සේක්වා උත්තමයන් වහන්ස අප විසින් සකස් කළ බෙහෙත් ඖෂධ අනුකම්පාවෙන් පිළිගන්නා සේක්වා!

## අටපිරිකර පූජාව

**අධිවාසේතු නො භන්තේ -අට්ඨපරික්ඛාරං පරිකප්පිතං**
**අනුකම්පං උපාදාය - පතිගණ්හාතු මුත්තම**

''ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස,'' අපගේ ආරාධනය ඉවසන සේක්වා උත්තමයන් වහන්ස අප විසින් සකස් කළ අටපිරිකර අනුකම්පාවෙන් පිළිගන්නා සේක්වා!

## සෙසු පිරිකර පූජාව

**අධිවාසේතු නො භන්තේ-සේසපරික්ඛාරං පරිකප්පිතං**
**අනුකම්පං උපාදාය - පතිගණ්හාතු මුත්තම**

''ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස,'' අපගේ ආරාධනය ඉවසන සේක්වා උත්තමයන් වහන්ස අප විසින් සකස් කළ සෙසුපිරිකර අනුකම්පාවෙන් පිළිගන්නා සේක්වා!



## විලඳ පූජාව

**අධිවාසේතු නොභන්තේ-ලාජා පුප්ඵං පරිකප්පිතං**
**අනුකම්පං උපාදාය - පතිගණ්හාතු මුත්තම**

''ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස,'' අපගේ ආරාධනය ඉවසන සේක්වා, උත්තමයන් වහන්ස අප විසින් සකස් කළ විලඳ අනුකම්පාවෙන් පිළිගන්නා සේක්වා!

## කොඩි පූජාව

**ධම්මද්ධජ ධරං ධීරං - ධජුග්ගත මහායසං**
**ධජේනේතෙන පූජේමි - ධම්ම රාජං ධජූපමං**

ධර්මය නැමති ධජය දරන්නා වූ මහ යසස් නැමති ධජයෙන් නැගී ගියාවූ ධීර වූ ධජයක් (කොඩියක්) බඳු වූ ධර්ම රාජයන් වහන්සේට උස් වූ කොඩියෙන් පූජා කරමි. පූජා වේවා!

**සාධු !සාධු!! සාධු!!!**

# බෝධි පූජාව හා වන්දනාව

## බෝධි පූජාව

**සේවිතං ධම්ම රාජේන-පත්තුං සම්බෝධි මුත්තමං**
**වන්දාමි බෝධි රාජානං - නිබ්බාන සුඛ සිද්ධියා**

ධර්ම රාජයාණන් වහන්සේ විසින් උතුම් වූ සම්මා සම්බෝධියට පැමිණීම පිණිස සේවනය කරණ ලද ජයශ්‍රී මහා බෝධිරාජයාණන් වහන්සේට මම නිවන් සුවය අවබෝධ වීම පිණිස වන්දනා කරමි. නමස්කාර කරමි. නමස්කාර වේවා!

## පහන් පූජාව

**සේවිතං ධම්ම රාජේන-පත්තුං සම්බෝධි මුත්තමං**
**පූජේමි බෝධි රාජානං - දීපා ලෝකේන සාදරං**

ධර්ම රාජයාණන් වහන්සේ විසින් උතුම් වූ සම්මා සම්බෝධියට පැමිණීම පිණිස සේවනය කරණ ලද ජය ශ්‍රී මහා බෝධිරාජයාණන් වහන්සේට මේ පහන් ආලෝකයෙන් සාදර ගෞරවයෙන් පූජා කරමි. පූජා වේවා!

## විදුලි බුබුලු පූජාව

**සේවිතං ධම්ම රාජේන-පත්තුං සම්බෝධි මුත්තමං**
**පූජේමි බෝධි රාජානං - විජ්ජුදීපේන සාදරං**



ධර්ම රාජයාණන් වහන්සේ විසින් උතුම් වූ සම්මා සම්බෝධියට පැමිණීම පිණිස සේවනය කරණ ලද ජය ශ්‍රී මහා බෝධිරාජයාණන් වහන්සේට සාදර ගෞරවයෙන් මේ විදුලි බුබුළු පහන් ආලෝකයෙන් පූජා කරමි. පූජා වේවා!

## සුවඳ දුම් පූජාව

**සේවිතං ධම්ම රාජේන-පත්තුං සම්බෝධි මුත්තමං**
**පූජේමි බෝධි රාජානං - ගන්ධ ධූපේන සාදරං**

ධර්ම රාජයාණන් වහන්සේ විසින් උතුම් වූ සම්මා සම්බෝධියට පැමිණීම පිණිස සේවනය කරණ ලද ජය ශ්‍රී මහා බෝධිරාජයාණන් වහන්සේට සාදර ගෞරවයෙන් මේ සුගන්ධ ධූපයෙන් පූජා කරමි. පූජා වේවා!

## සුවඳ මල් පූජාව

**සේවිතං ධම්ම රාජේන-පත්තුං සම්බෝධි මුත්තමං**
**පූජේමි බෝධි රාජානං - ගන්ධ පුප්ඵේන සාදරං**

ධර්ම රාජයාණන් වහන්සේ විසින් උතුම් වූ සම්මා සම්බෝධියට පැමිණීම පිණිස සේවනය කරණ ලද ජය ශ්‍රී මහා බෝධිරාජයාණන් වහන්සේට සාදර ගෞරවයෙන් මේ වර්ණගන්ධ සම්පන්න මල් සමූහයෙන් පූජා කරමි. පූජා වේවා!

# සිසිල් පැන් පූජාව

**සේවිතං ධම්ම රාජේන-පත්තුං සම්බෝධි මුත්තමං**
**පූජෙමි බෝධි රාජානං - සීතොදකේන සාදරං**

ධර්ම රාජයානන් වහන්සේ විසින් උතුම් වූ සම්මා සම්බෝධියට පැමිණීම පිණිස සේවනය කරණ ලද ජය ශ්‍රී මහා බෝධිරාජයාණන් වහන්සේට සාදර ගෞරවයෙන් මේ ප්‍රණීත සිසිල් පැන් සමූහයෙන් පූජා කරමි. පූජා වේවා!

# ගිලන්පස පූජාව

**සේවිතං ධම්ම රාජේන-පත්තුං සම්බෝධි මුත්තමං**
**පූජෙමි බෝධි රාජානං - පානකේනේන සාදරං**

ධර්ම රාජයාණන් වහන්සේ විසින් උතුම් වූ සම්මා සම්බෝධියට පැමිණීම පිණිස සේවනය කරණ ලද ජය ශ්‍රී මහා බෝධිරාජයාණන් වහන්සේට සාදර ගෞරවයෙන් මේ ප්‍රණීත ගිලන්පස සමූහයෙන් පූජා කරමි. පූජා වේවා!

# අෂ්ඨපාන පූජාව

**සේවිතං ධම්ම රාජේන-පත්තුං සම්බෝධි මුත්තමං**
**පූජෙමි බෝධි රාජානං - අට්ඨපානේන සාදරං**

ධර්ම රාජයාණන් වහන්සේ විසින් උතුම් වූ සම්මා සම්බෝධියට පැමිණීම පිණිස සේවනය



කරණ ලද ජය ශ්‍රී මහා බෝධිරාජයාණන් වහන්සේට සාදර ගෞරවයෙන් මේ ප්‍රණීත අෂ්ඨපාන ගිලන්පස සමූහයෙන් පූජා කරමි. පූජා වේවා!

# චතුමධුර පූජාව

**සේවිතං ධම්ම රාජේන-පත්තුං සම්බෝධි මුත්තමං**
**පූජේමි බෝධි රාජානං - චතුමධුරේන සාදරං**

ධර්ම රාජයාණන් වහන්සේ විසින් උතුම් සම්මා සම්බෝධියට පැමිණීම පිණිස සේවනය කරන ලද ජය ශ්‍රී මහා බෝධිරාජයාණන් වහන්සේට සාදර ගෞරවයෙන් මේ චතු මධුර (ප්‍රණීත ගිලන්පස) සමූහයෙන් පූජා කරමි. පූජා වේවා!

# දැහැත් පූජාව

**සේවිතං ධම්ම රාජේන-පත්තුං සම්බෝධි මුත්තමං**
**පූජේමි බෝධි රාජානං - තාම්බූලේන සාදරං**

ධර්ම රාජයාණන් වහන්සේ විසින් උතුම් සම්මා සම්බෝධියට පැමිණීම පිණිස සේවනය කරන ලද ජය ශ්‍රී මහා බෝධිරාජයාණන් වහන්සේට සාදර ගෞරවයෙන් මේ දැහැත් සමූහයෙන් පූජා කරමි. පූජා වේවා!

## බෙහෙත් පූජාව

**සේවිතං ධම්ම රාජේන-පත්තුං සම්බෝධි මුත්තමං**
**පූජේමි බෝධි රාජානං - ඔසධේනෙන සාදරං**

ධර්ම රාජයාණන් වහන්සේ විසින් උතුම් සම්මා සම්බෝධියට පැමිණීම පිණිස සේවනය කරන ලද ජය ශ්‍රී මහා බෝධිරාජයාණන් වහන්සේට සාදර ගෞරවයෙන් මේ බෙහෙත් සමූහයෙන් පූජා කරමි. පූජා වේවා!

## සුවඳ පැන් පූජාව

**සේවිතං ධම්ම රාජේන-පත්තුං සම්බෝධි මුත්තමං**
**පූජෙමි බෝධි රාජානං - ගන්ධොදකේන සාදරං**

ධර්ම රාජයාණන් වහන්සේ විසින් උතුම් සම්මා සම්බෝධියට පැමිණීම පිණිස සේවනය කරන ලද ජය ශ්‍රී මහා බෝධිරාජයාණන් වහන්සේට සාදර ගෞරවයෙන් මේ සුවඳ පැන් අභිසේඛයෙන් පූජා කරමි. පූජා වේවා!

## මල්දම් පූජාව

**සේවිතං ධම්ම රාජෙන-පත්තුං සම්බෝධි මුත්තමං**
**පූජෙමි බෝධි රාජානං - මාලාදාමේන සාදරං**

ධර්ම රාජයාණන් වහන්සේ විසින් උතුම් සම්මා සම්බෝධියට පැමිණීම පිණිස සේවනය



කරන ලද ජය ශ්‍රී මහා බෝධිරාජයාණන් වහන්සේට සාදර ගෞරවයෙන් මේ විසිතුරු මල්දම් සමූහයෙන් පූජා කරමි. පූජා වේවා!

## කොඩි පූජාව

**සේවිතං ධම්ම රාජෙන-පත්තුං සම්බෝධි මුත්තමං**
**පූජෙමි බෝධි රාජානං - ධජෙනේත්තේන සාදරං**

ධර්ම රාජයාණන් වහන්සේ විසින් උතුම් සම්මා සම්බෝධියට පැමිණීම පිණිස සේවනය කරන ලද ජය ශ්‍රී මහා බෝධිරාජයාණන් වහන්සේට සාදර ගෞරවයෙන් මේ විසිතුරු කොඩි සමූහයෙන් පූජා කරමි. පූජා වේවා!

## විලඳ පූජාව

**සේවිතං ධම්ම රාජෙන-පත්තුං සම්බෝධි මුත්තමං**
**පූජෙමි බෝධි රාජානං - ලාජා පුප්ඵෙන සාදරං**

ධර්ම රාජයාණන් වහන්සේ විසින් උතුම් සම්මා සම්බෝධියට පැමිණීම පිණිස සේවනය කරන ලද ජය ශ්‍රී මහා බෝධිරාජයාණන් වහන්සේට සාදර ගෞරවයෙන් මේ විලඳ සමූහයෙන් පූජා කරමි. පූජා වේවා!

## අට පිරිකර පූජාව

**සේවිතං ධම්ම රාජෙන-පත්තුං සම්බෝධි මුත්තමං**
**පූජෙමි බෝධි රාජානං - අට්ඨ පරික්ඛාරේන සාදරං**

ධර්ම රාජයාණන් වහන්සේ විසින් උතුම් සම්මා සම්බෝධියට පැමිණීම පිණිස සේවනය කරන ලද ජය ශ්‍රී මහා බෝධිරාජයාණන් වහන්සේට සාදර ගෞරවයෙන් මේ අෂ්ඨපරිෂ්කාර සමූහයෙන් පූජා කරමි. පූජා වේවා!

## සෙසු පිරිකර පූජාව

**සේවිතං ධම්ම රාජෙන-පත්තුං සම්බෝධි මුත්තමං**
**පූජෙමි බෝධි රාජානං - සේස පරික්ඛාරේන සාදරං**

ධර්ම රාජයාණන් වහන්සේ විසින් උතුම් සම්මා සම්බෝධියට පැමිණීම පිණිස සේවනය කරන ලද ජය ශ්‍රී මහා බෝධිරාජයාණන් වහන්සේට සාදර ගෞරවයෙන් මේ සෙසු පිරිකර සමූහයෙන් පූජා කරමි. පූජා වේවා!

**සාධු! සාධු!! සාධු!!!**

## ප්‍රතිපත්ති පූජාව

**සේවිතං ධම්ම රාජෙන-පත්තුං සම්බෝධි මුත්තමං**
**පූජෙමි බෝධි රාජානං - පටිපත්තියාහි සාදරං**

ධර්ම රාජයාණන් වහන්සේ විසින් උතුම් වූ සම්මා සම්බෝධියට පැමිණීම පිණිස සේවනය



කරන ලද ජය ශ්‍රී මහා බෝධින්වහන්සේට සාදර ගෞරවයෙන් මේ ප්‍රතිපත්ති පූජාවෙන් පූජා කරමි. පූජා වේවා!

## තුනුරුවන් වන්දනාව

**ඉතිපි සො භගවා අරහං සම්මා සම්බුද්ධො**
**විජ්ජා චරණ සම්පන්නො සුගතො**
**ලෝකවිදූ අනුත්තරො පුරිසදම්ම සාරථී**
**සත්ථා දේවමනුස්සානං බුද්ධෝ භගවාති**

''ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස,'' ඔබවහන්සේ සියලු පූජාවන්ට සුදුසුවූ හෙයින් අරහං ගුණයෙන්ද, චතුරාර්ය සත්‍ය තමන්ම අවබෝධ කළ හෙයින් සම්මා සම්බුද්ධ ගුණයෙන්ද, ත්‍රිවිද්‍යා, අෂ්ඨ විද්‍යා පසළොස්චරණ ධර්මයන්ගෙන් යුතු හෙයින් විජ්ජාචරණ ගුණයෙන්ද, මනාගති පැවැත්මෙන් නිවනට පැමිණිහෙයින් සුගත ගුණයෙන්ද, සියලු ලෝක ධාතු දැන වදාළ හෙයින් ලෝකවිදූ ගුණයෙන්ද, දමනයට සුදුසු සත්වයන් උත්තරීතර ගුණයෙන් දමනය කළ හෙයින්, අනුත්තර පුරිසධම්ම සාරථී ගුණයෙන්ද, දෙව් මිනිසුන් සසර කතරින් එතෙර කරවන හෙයින් සත්ථා දේවමනුස්සානං ගුණයෙන්ද, චතුරාර්‍ය සත්‍ය අවබෝධ කොට අන්‍යයන්ටත් අවබෝධ කරවූ හෙයින් බුද්ධ ගුණයෙන්ද, සියලු පුණ්‍ය භාග්‍යයන්ගෙන් යුතු

බැවින් භගවා ගුණයෙන්ද, හෙයින් ද, සමන්තාගත වනසේක.

**බුද්ධං ජීවිත පරියන්තං සරණං ගච්ඡාමි**
බුද්ධ රත්නය දිවිහිමියෙන් සරණයමි.

**යෙච බුද්ධා අතීතා ච - යේච බුද්ධා අනාගතා**
පච්චුප්පන්නා ච යේ බුද්ධා - අහං වන්‍දාමි සබ්බදා

අතීත බුද්ධ රත්නයටද, අනාගත බුද්ධ රත්නයටද, වර්තමාන බුද්ධ රත්නයටද, මම සෑම කල්හි නමස්කාර කරමි මාගේ නමස්කාරය වේවා!

**නත්ථි මේ සරණං අඤ්ඤං - බුද්ධො මේසරණං වරං**
**ඒතේන සච්ච වජ්ජේන - හෝතු මේ ජයමඞගලං**

බුද්ධ රත්නය හැර මට අන් සරණක් නැත්තේය.බුද්ධ රත්නය මගේ උත්තම රත්නය වන්නේය. මේ සත්‍යානුභාවයෙන් මා හට ජය මංගල්‍යයක් වේවා!

**උත්තමංගේන වන්‍දෙහං - පාදපංසුවරුත්තමං**
**බුද්ධෙ යො ඛලිතො දෝසො - බුද්ධො ඛමතු තං මමං**



භාග්‍යවතුන් වහන්සේගේ සිරිපා පහස ලද දූවිල්ලද, මම හිස මුදුනින් නමස්කාර කරමි. මාගේ නමස්කාරය වේවා ! බුද්ධ රත්නය කෙරෙහි මා අතින් සිදුවූ සියලු වරදට භාග්‍යවතුන් වහන්සේ සමාවන සේක්වා!

**සාධු !සාධු !!සාධු!!!**

**ස්වාක්ඛාතො, භගවතා ධම්මො**
**සන්‍දිට්ඨිකො, අකාලිකො,**
**ඒහිපස්සිකො, ඕපනයිකො,**
**පච්චත්තං වෙදිතබ්බො විඤ්ඤූහීති**

''ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස,'' ඔබ වහන්සේගේ ශ්‍රී සද්ධර්ම රත්නය මුල, මැද, අග යහපත් බැවින් ස්වාක්ඛාත ගුණයෙන්ද, මෙලොව මේ ජීවිතයේදීම පලවිපාක ලබාදෙන හෙයින් සන්දිට්ඨික ගුණයෙන්ද, කල්නොයවා ඵල විපාක ගෙන දෙන හෙයින් අකාලික ගුණයෙන්ද, මෙහි එව බලවැයි කියහැකි ඒහි පස්සික ගුණයෙන්ද, මගඵල ධර්මය සිතෙහි පහල කරගත යුතු හෙයින් ඕපනයික ගුණයෙන්ද, නුවණැත්තන් විසින් අවබෝධ කළ යුතු හෙයින් පච්චත්තං වේදිතබ්බෝ විඤ්ඤූහි ගුණයෙන්ද සමන්තාගත වන සේක.

**ධම්මං ජීවිත පරියන්තං සරණං ගච්ඡාමි**
ධර්ම රත්නය දිවිහිමියෙන් සරණ යමි.

**යේච ධම්මා අතීතා ච - යෙච ධම්මා අනාගතා**
**පච්චුප්පන්නා ච යෙ ධම්මා - අහං වන්දාමි සබ්බදා**

අතීත වූ ධර්ම රත්නයටද, අනාගත වූ ධර්ම රත්නයටද, වර්තමාන ධර්ම රත්නයටද, මම සැම කල්හි නමස්කාර කරමි මාගේ නමස්කාරය වේවා!

**නත්ථි මේ සරණං අඤ්ඤං - ධම්මො මේ සරණං වරං**
**ඒතේන සච්ච වජ්ජේන - හෝතු මේ ජයමඞගලං**

ධර්ම රත්නය හැර මට අන් සරණක් නැත්තේය. ධර්ම රත්නය මාගේ උතුම් සරණය වන්නේය. මේ සත්‍යානුභාවයෙන් මා හට ජය මංගල්‍යයක් වේවා!

**උත්තමංගේන වන්දේහං - ධම්මඤ්ච තිවිධං වරං**
**ධම්මෙ යො ඛලිතො දෝසෝ - ධම්මෝ ඛමතු තං මමං**

ලොව්තුරු, මගඵල, නිවන්, නැමැති ත්‍රිවිධ වූ, ධර්ම රත්නයට දොහොත් මුදුන් දී මම නමස්කාර කරමි. මාගේ නමස්කාරය වේවා. ධර්ම



රත්නය කෙරෙහි සිදුවූ පමා වරදට ධර්ම රත්නය මට සමාවන සේක්වා!

සාධු !සාධු !!සාධු!!!

**සුපටිපන්නෝ භගවතෝ සාවක සංඝෝ**
**උජුපටිපන්නෝ භගවතෝ සාවක සංඝෝ**
**ඤායපටිපන්නෝ භගවතෝ සාවක සංඝෝ**
**සාමීචිපටිපන්නෝ භගවතෝ සාවක සංඝෝ**
**යදිදං චත්තාරි පුරිස යුගානි අට්ඨපුරිස පුග්ගලා**
**ඒස භගවතෝ සාවකසංඝෝ**
**ආහුනෙය්‍යෝ පාහුනෙය්‍යෝ දක්ඛිණෙය්‍යෝ**
**අඤ්ජලිකරණීයෝ අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලෝකස්සාති**

''ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස,'' ඔබ වහන්සේගේ ශ්‍රාවක සංඝරත්නය මනාව පිළිපන් හෙයින් සුපටිපන්න ගුණයෙන්ද,ඍජු මාර්ගයට පිළිපන් හෙයින් උජුපටිපන්න ගුණයෙන්ද, නිවන් මගට පිළිපන් හෙයින් ඤායපටිපන්න ගුණයෙන්ද, ගෞරව කළ යුතු මාර්ගයට පිළිපන් හෙයින් සාමීචිපටිපන්න ගුණයෙන්ද, යොදුන් සිය දහස් ගණනකින් වුවත් පැමිණ සිව්පස පිළිගැන්වීමට සුදුසු වූ හෙයින් ආහුණෙය්‍යය ගුණයෙන්ද, ආගන්තුක සත්කාරයන්ට සුදුසු වූ හෙයින් අඤ්ජලිකරණීය ගුණයෙන්ද, මෙලොව පරලොව පින්පල අදහා දෙන දානයට සුදුසු වූ හෙයින්

දක්ඛිනෙය්‍යය ගුණයෙන්ද, දොහොත් මුදුන් දී වැඳ නමස්කාර කිරීමට සුදුසු වූ හෙයින් අඤ්ජලිකරණීය ගුණයෙන්ද, සියලු ලෝක වාසීන්ට කුසල් වැපිරීමට පින්එල නෙලාගැනීමට උතුම් පිංකෙත වූ හෙයින් අනුත්තර පුඤ්ඤක්ඛෙත්තං ගුණයෙන්ද සමන්තානගත වන සේක.

**සංඝං ජීවිත පරියන්තං සරණං ගච්ඡාමි**
සංඝ රත්නය දිවිහිමියෙන් සරණ යමි.

**යේච සංඝා අතීතා ච - යේච සංඝා අනාගතා**
**පච්චුප්පන්නා ච යෙ සංඝා - අහං වන්‍දාමි සබ්බදා**

අතීත සංඝ රත්නයටද, අනාගත සංඝ රත්නයටද, වර්තමාන සංඝ රත්නයටද, මම සැම කල්හි නමස්කාර කරමි. මාගේ නමස්කාරය වේවා!

**නත්ථි මේ සරණං අඤ්ඤං - සංඝෝ මේ සරණං වරං**
**ඒතේන සච්ච වජ්ජේන - හෝතු මේ ජයමඞගලං**

සංඝරත්නය හැර මා හට අන් සරණක් නැත්තේය. සංඝරත්නය මාගේ උතුම් සරණය වන්නේය. මේ සත්‍යානුභාවයෙන් මා හට ජය මංගල්‍යයක් වේවා!



**උත්තමංගේන වන්‍දේහං - සංඝං ච තිවිධෝත්තමං**
**සංඝේ යෝ ඛලිතෝ දෝසෝ - සංඝෝ ඛමතු තං මමං**
සම්මුති, සේඛ, අසේඛ යන ත්‍රිවිධ වූ උත්තම සංඝරත්නයට මම උත්තමාංගයෙන් නමස්කාර කරමි. මාගේ නමස්කාරය වේවා. මහා සංඝ රත්නය කෙරෙහි මාගෙන් සිදුවූ පමා වරදට මහා සංඝ රත්නය මට සමාවන සේක්වා!

**සාධු !සාධු !!සාධු!!!**

## බෝධි වන්දනාව

**යස්ස මූලේ නිසින්නෝව - සබ්බාරි විජයං අකා**
**පත්තෝ සබ්බඤ්ඤුතං සත්‍ථා - වන්‍දේ තං බෝධිපාදපං**

යම් බෝධි මූලයක වැඩහුන්නාවූ ජිනේන්ද්‍රයන් වහන්සේ කෙලෙස් සතුරන් නසා දිනූ සේක්ද, ශාස්තෘන් වහන්සේ සර්වඥබවට පත් වූයේ යම් බෝධි මූලයක සිටද ඒ ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේට මම නමස්කාර කරමි. මාගේ නමස්කාරය වේවා.!

**ඉමෙ එතෙ මහා බොධි - ලොක නාථෙන පූජිතා**
**අහංපි තෙ නමස්සාමි - බොධිරාජා නමත්‍ථු තෙ**

මේ බෝධීන් වහන්සේ ලෝකනාථයන් වහන්සේ විසින්ද පූජාලත් සේක. මමද ඒ මේ බෝධිරාජයාණන් වහන්සේට නමස්කාර කරමි. මාගේ නමස්කාරය වේවා!

**පඨමං බෝධිපල්ලංකං - දුතියං ච අනිම්මිසං**
**තතියං චංකමණං සෙට්ඨං - චතුත්ථං රතනාඝරං**
**පඤ්චමං අජපාලං ච - මුචලින්දෙන ඡට්ඨමං**
**සත්තමං රාජායතනං - වන්දෙ තං මුනිසේවිතං**

පළමුව බෝරුකමුලද, දෙවනුව අනිමිස සැයද, තෙවනුව රුවන් සක්මනද, සිව්වැනි රුවන් ගෙයද, පස්වැනි අජපල් රුකමුලද, සයවැනි මුචලින්ද සැයද, සත්වෙනි රාජායතනයද යන මුනීන්ද්‍රයන් වහන්සේ සේවනය කළ ඒ සත්සති සැයන්ට මම නමස්කාර කරමි. මාගේ නමස්කාරය වේවා!

**මහා කරුණා රස මතිමණ්ඩිතස්ස අනන්ත ඤාණස්ස අසාධාරණ පඤ්ඤස්ස දස පාරමිතා බල සමුදිතස්ස දසබලසමන්නාගතස්ස අපරිමෙය්‍ය ගුණ සාගරස්ස අම්හාකං සත්ථුනො සරසරංසිජාලපරිකිණ්ණං සම්මා සම්බුද්ධ පූජිතං සිරි බෝධි රාජං සිරසා නමාමි**

මහා කරුණා රස ප්‍රතිමණ්ඩිත වූ අනන්ත ඤාණ ඇත්තාවූ, අසාධාරණ ප්‍රඥා ඇත්තාවූ, දස



පාරමිතා බලයෙන් පහළවූ, දසබල ඤාණයෙන් සමන්විත වූ, අපරිමාණ ගුණ සාගරවූ, අප ශාස්තෘන් වහන්සේගේ සවනක් ගණ රැස් දහරින් ගැවසී ගත්තාවූ, සම්බුද්ධ පූජිත වූ, ජය ශ්‍රී මහා බෝධි රාජයාණන් වහන්සේට දොහොත් මුදුන් දී මම නමස්කාර කරමි. මාගේ නමස්කාරය වේවා !

**ඉන්ද නීල වණ්ණ පත්ත - සේතඛන්ධ භාසුරං**
**සත්ථු නෙත්ත පංකජාභි - පූජිතග්ග සාතදං**
**අග්ග බෝධි නාමවාම - දේවරුක්ඛ සන්නිභං**
**තං විසාල බෝධිපාද - පං නමාමි සබ්බදා**

ඉන්ද නීල වර්ණයෙන් බබළන පත්‍ර ඇති සුදු බෝ කඳින් බබලන්නාවූ , නේත්‍ර සඟලින් බුදුරැස් කවන්නාවූ, පූජනීය වස්තු අතර අග්‍රවූ, මිහිරි සුව ගෙනදෙන්නා වූ අග්‍රවූ දිව්‍ය වෘක්ෂයක් මෙන් බබළන්නා වූ බෝධිය නමින් ප්‍රකට වූ ඒ විශාල බෝධි වෘක්ෂයන් වහන්සේට මම සැමකල්හි පූජා පවත්වමි. මම නමස්කාර කරමි. මාගේ නමස්කාරය වේවා!

## චුද්දස බුද්ධඤාණ වන්දනාව

**1. දුක්ඛෙ ඤාණං බුද්ධ ඤාණං**
දුක්ඛ සත්‍යයෙහි පැවැති ඤාණය බුද්ධ ඤාණයයි.
**2. දුක්ඛ සමුදයේ ඤාණං බුද්ධ ඤාණං**

දුක්ඛ සමුදය සත්‍යයෙහි පැවැති ඤාණය බුද්ධ ඤාණයයි.

**3. දුක්ඛ නිරෝධේ ඤාණං බුද්ධ ඤාණං**

දුක්ඛ නිරෝධ සත්‍යයෙහි පැවැති ඤාණය බුද්ධ ඤාණයයි.

**4. දුක්ඛ නිරෝධ ගාමිණී පටිපදාය ඤාණං බුද්ධ ඤාණං**

දුක්ඛ නිරෝධ ගාමිණී පටිපදාවෙහි පැවති ඤාණය බුද්ධ ඤාණයයි.

**5. අත්ථ පටිසම්භිදෙ ඤාණං බුද්ධ ඤාණං**

අත්ථ පටිසම්භිදාවෙහි පැවැති ඤාණය බුද්ධ ඤාණයයි.

**6. ධම්ම පටිසම්භිදේ ඤාණං බුද්ධ ඤාණං**

ධම්ම පටිසම්භිදාවෙහි පැවැති ඤාණය බුද්ධ ඤාණයයි.

**7. නිරුත්ති පටිසම්භිදේ ඤාණං බුද්ධ ඤාණං**

නිරුත්ති පටිසම්භිදාවෙහි පැවැති ඤාණය බුද්ධ ඤාණයයි.

**8.පටිභාණ පටිසම්භිදේ ඤාණං බුද්ධ ඤාණං**

පටිභාන පටිසම්භිදාවෙහි පැවැති ඤාණය බුද්ධ ඤාණයයි.

**9. ඉන්ද්‍රිය පරෝපරියත්තේ ඤාණං බුද්ධ ඤාණං**

ඉන්ද්‍රිය ධර්මයන්ගේ උස් පහත් බව දන්නා ඤාණය බුද්ධ ඤාණයයි.

**10. සත්තානං ආසයානුසයේ ඤාණං බුද්ධ ඤාණං**

සත්වයන්ගේ ආශ්‍රය අනුශය දන්නා ඤාණය බුද්ධ



ඤාණයයි.

**11. යමක පාටිහාරියේ ඤාණං බුද්ධ ඤාණං**

යමාමහ පෙළහැර දක්වීමේ ඤාණය බුද්ධ ඤාණයයි.

**12. මහාකරුණා සමාපත්තියා ඤාණං බුද්ධ ඤාණං**

සත්වයන්ට මහා කරුණාව දක්වීමේ ඤාණය බුද්ධ ඤාණයයි.

**13. සබ්බඤ්ඤුත ඤාණං බුද්ධ ඤාණං**

සියල්ල අවබෝධ කළ ඤාණය බුද්ධ ඤාණයයි.

**14. අනාවරණ ඤාණං බුද්ධ ඤාණං**

අනාවරණයේ පැවැති ඤාණය බුද්ධ ඤාණයයි.

**ඉමානි චුද්දස බුද්ධ ඤාණානි ඉමේසං අට්ඨ ඤාණානි සාවක සාධාරණානි ඡඤාණානි අසාධාරණානි සාවකෙහි, ඉමේහි චුද්දස බුද්ධ ඤාණෙහි සමන්නාගතං සම්මා සම්බුද්ධං භගවන්තං සිරසා නමාමි,**

මේ දාහතර ඤාණයෝය. මෙයින් අටක් (8) ශ්‍රාවකයින්ට සාධාරණය, මෙයින් හයක්(6) ශ්‍රාවකයින්ට අසාධාරණය, මේ ඤාණ දාහතරෙන් සමන්නාගත සම්මා සම්බුදු රජාණන් වහන්සේට මම සිරසින් නමස්කාර කරමි. මාගේ නමස්කාරය වේවා!

සාධු !සාධු !!සාධු!!!

# තෙසැත්තෑ ඤාණ වන්දනාව

**1. සොතාවධානේ පඤ්ඤා සුතමයේ ඤාණං**
දහම් ඇසීමෙන් කණ යොමු කිරීමේදී ඇතිවන ප්‍රඥාව සුතමය ඤාණයයි.

**2. සුත්වාන සංවරේ පඤ්ඤා සීලමයේ ඤාණං**
දහම් අසා දැන සංවරවීමේ ප්‍රඥාව සීලමය ඤාණයයි.

**3.සංවරිත්වා සමාදහනේ පඤ්ඤා සමාධි භාවනාමයේ ඤාණං**
සංවර වීමෙන් සිත තැන්පත් කිරීමේ ප්‍රඥාව සාමාධි භාවනාමය ඤාණයයි.

**4. පච්චය පරිග්ගහෙ පඤ්ඤා ධම්මට්ඨිති ඤාණං**
නාම රූපයන්ගේ ප්‍රත්‍ය ධර්මයන් ව්‍යවස්ථා කිරීමේ පැවැති ප්‍රඥාව ධම්මට්ඨිති ඤාණයයි.

**5.අතීතානාගත පච්චුප්පන්නානං ධම්මානං සංඛිපිත්වා වවත්ථානෙ පඤ්ඤා සම්මසනෙ ඤාණං**
අතීතවූ ද, අනාගතවූ ද, වර්තමානවූ ද, පඤ්චස්කන්ධ ධර්මයන් එකොලොස් තැනෙක කැටිකොට ව්‍යවස්ථා කිරීමේ ප්‍රඥාව සම්මසන ඤාණයයි.



**6. පච්චුප්පන්නානං ධම්මානං විපරිණාමානුපස්සනේ පඤ්ඤා උදයබ්බානු පස්සනේ ඤාණං**
වර්තමාන වශයෙන් ලැබෙන්නා වූ පඤ්චස්කන්ධ ධර්මයන්ගේ භංගය නැවත නැවත නුවණින් බැලීමේ ප්‍රඥාව උදයබ්බානු පස්සනාඤාණයයි.

**7. ආරම්මණං පටිසංඛා භංගානු පස්සනේ පඤ්ඤා විපස්සනේ ඤාණං**
රූපාදී ආරම්මණයන් බිඳෙන සැටි බලන ඤාණයේ භංගය නැවත නැවත නුවණින් සැලකීමේ ප්‍රඥාව භංගානුපස්සනා නම් විදර්ශනා ඤාණයයි.

**8. භයතුපට්ඨානෙ පඤ්ඤා ආදීනවෙ ඤාණං**
භය වශයෙන් වැටහීමේ ප්‍රඥාව ආදීනව ඤාණයයි.

**9.මුඤ්චිතු කම්‍යතා පටිසංඛා සන්තිට්ඨනා පඤ්ඤා සංඛාරුපෙක්ඛාසු ඤාණං**
මිදෙනු කැමැත්ත, ඊට උපාය සැලකීම, උපෙක්‍ෂා වශයෙන් නැවතීම යන තුන් ආකාරයක් ඇති ප්‍රඥාව සංඛාරුපෙක්ඛා ඤාණයයි.

**10.බහිද්ධා වුට්ඨාන විවට්ටනේ පඤ්ඤා ගොත්‍රභූඤාණං**
බාහිර සංස්කාර නිමිත්තෙන් නැගී ආපසු හැරීමේ ප්‍රඥාව ගොත්‍රභූ ඤාණයයි.

**11.උභතො වුට්ඨාන විවට්ටනේ පඤ්ඤා මග්ගේ ඤාණං**

නිමිත්ත පවත්ත දෙකින් නැගී පරාවර්තනය වන ප්‍රඥාව මාර්ග ඤාණයයි.

**12. පයෝග පටිප්පස්සද්ධි පඤ්ඤා ඵලේඤාණං**

බලවත් යෝග ක්‍රියාවන් නිමාවෙන් වූ ප්‍රඥාව ඵලඤාණයයි.

**13.ඡින්න වටුමානු පස්සනෙ පඤ්ඤා විමුත්ති ඤාණං**

සිඳින ලද කෙලෙස් වට නැවත සලකා බලන ප්‍රඥාව විමුක්ති ඤාණයයි.

**14.තදා සමුදාගතෙ ධම්මෙ පස්සනේ පඤ්ඤා පච්චවෙක්ඛණේ ඤාණං**

එකල එකතුවට පත් මගපල ආදී ධර්මයන් දැකීමේ ප්‍රඥාව පස්විකුම් ඤාණයයි.

**15.අජ්ඣත්ත වවත්ථානේ පඤ්ඤා වත්ථු නානත්තේ ඤාණං**

අධ්‍යාත්ම ධර්මයන් ව්‍යවස්ථා කරන ප්‍රඥාව වත්ථු නානත්ත ඤාණයයි.

**16.බහිද්ධා වවත්ථානේ පඤ්ඤා ගෝචර නානත්තේ ඤාණං**

බාහිර වූ ඔවුන්ගේ විෂයයන් ව්‍යවස්ථා කරන ප්‍රඥාව ගොචර නානත්ත ඤාණයයි.



**17.චරියා වවත්ථානේ පඤ්ඤා චරියා නානත්තෙ ඤාණං**

චර්යාවන් ව්‍යවස්ථා කරන ප්‍රඥාව චරියා නානත්ත ඤාණයයි.

**18. චතු ධම්ම වවත්ථානේ පඤ්ඤා භූමි නානත්තේ ඤාණං**

සතර සතර ප්‍රභේදවත් ධර්මයන් ව්‍යවස්ථා කරන ප්‍රඥාව භූමි නානත්ත ඤාණයයි.

**19.නවධම්මවවත්ථානේ පඤ්ඤා ධම්ම නානත්තේ ඤාණං**

නව නව ප්‍රභේදවත් ධර්මයන් ව්‍යවස්ථා කරන ප්‍රඥාව ධම්ම නානත්ත ඤාණයයි.

**20. අභිඤ්ඤා පඤ්ඤා ඤාතට්ඨෙ ඤාණං**

රුප්පනාදී ස්වභාවයෙන් පංචස්කන්ධාදි ධර්මයන් දක්නා ප්‍රඥාව ඤාතස්වභාව ඤාණයයි.

**21.පරිඤ්ඤා පඤ්ඤා තීරණට්ඨෙ ඤාණං**

සාමාන්‍ය ලක්ෂණාවබෝධයෙන් පැතිර දන්නා ප්‍රඥාව තීරණ ස්වභාව ඤාණයයි.

**22.පහානේ පඤ්ඤා පරිච්චාගට්ඨෙ ඤාණං**

ප්‍රහාන ප්‍රඥාව පරිත්‍යාග ස්වභාව ඤාණයයි.

**23.භාවනා පඤ්ඤා එක රසට්ඨෙ ඤාණං**

භාවනා ප්‍රඥාව ඒකරස ස්වභාව ඤාණයයි.

**24.සච්ඡිකිරියා පඤ්ඤා ඵුසනට්ඨෙ ඤාණං**
ප්‍රත්‍යක්‍ෂ කරන ප්‍රඥාව වින්දන ස්වභාව ඤාණයයි.
**25.අත්ථ නානත්තෙ පඤ්ඤා අත්ථ පටිසම්භිදේ ඤාණං**
අර්ථයන්ගේ නානා ස්වභාවයෙහි පැවති ප්‍රඥාව අර්ථපටිසම්භිදා ඤාණයයි.

**26.ධම්ම නානත්තේ පඤ්ඤා ධම්ම පටිසම්භිදේ ඤාණං**
ධර්මයන්ගේ නානා ස්වභාවයෙහි පැවති ප්‍රඥාව ධර්මප්‍රතිසම්භිදා ඤාණයයි.

**27.නිරුත්ති නානත්තේ පඤ්ඤා නිරුත්ති පටිසම්භිදේ ඤාණං**
නිරුත්තීන්ගේ නා නා ස්වභාවයෙහි පැවති ප්‍රඥාව නිරුක්ති ප්‍රතිසම්භිදා ඤාණයයි.

**28.පටිභාන නානත්තේ පඤ්ඤා පටිභාන පටිසම්භිදේ ඤාණං**
ප්‍රතිභානයන්ගේ නානාත්වයෙහි පැවති ප්‍රඥාව පටිභාන ප්‍රතිසම්භිදා ඤාණයයි.

**29.විහාර නානත්තේ පඤ්ඤා විහාරට්ඨෙ ඤාණං**
නා නා විදර්ශනා විහරණ ප්‍රඥාව විහාර ස්වභාව ඤාණයයි.



**30. සමාපත්ති නානත්තේ පඤ්ඤා සමාපත්තට්ඨෙ ඤාණං**
අනිමිත්තාදි නා නා සමාපත්ති පිළිබඳ ප්‍රඥාව සමාපත්ති ස්වභාව ඤාණයයි.
**31.විහාර සමාපත්ති නානත්තේ පඤ්ඤා විහාර සමාපත්තට්ඨෙ ඤාණං**
විහාර සමාපත්ති දෙකම පිළිබඳව ප්‍රඥාව විහාර සමාපත්ති ස්වභාව ඤාණයයි.

**32.අවික්ඛෙප පරිසුද්ධත්තා ආසව සමුච්ඡෙදේ පඤ්ඤා ආනන්තරික සමාධිම්හි ඤාණං**
සාමාධියේම පිරිසිදුකමින් කාමාදී ආශ්‍රවන් සිඳලන්නා වූ ප්‍රඥාව ආනන්තරික සමාධියේ ඤාණයයි

**33.දස්සනාධිපතෙය්‍යං සන්තෝච විහාරාධිගමෝ පණීතාදිමුත්තතා පඤ්ඤා අරණ විහාරෙ ඤාණං**
විදර්ශනාවේ අධිපති භාවය ද අධිගත වූ ශාන්ත රහත් ඵලයද, ඵල සමවතෙහි අධිමුත්තිය ද යන මෙහි පැවති ප්‍රඥාව අරණ විහාර ඤාණයයි.
**34.ද්වීහි බලෙහි සමන්නාගතත්තා තයෝච සංඛාරානං පටිප්පස්සද්ධියා සොළසහි ඤාණ චරියාහි නවහි සමාධි චරියාහි වසී භාවතා පඤ්ඤා නිරොධ සමාපත්තියා ඤාණං**
සමථ විදසුනෙන් පිරිපුන් හෙයින් ත්‍රිවිධ සංස්කාරයන්ගේ නිරෝධය සඳහා වූ, ඤාණ

පැවතුම් සොළොසකින්ද, සමාධි පැවතුම් නවයකින්ද වසී භාවය ඇති ප්‍රඥාව නිරෝධ සමාපත්ති ඤාණයයි.

**35.සම්පජානස්ස පවත්ත පරියාදානේ පඤ්ඤා පරිනිබ්බානේ ඤාණං**

සම්‍යක් ප්‍රකාරයෙන් දන්නා ප්‍රවර්තන සිඳින ප්‍රඥාව පරිනිබ්බානෙ ඤාණයයි.

**36.සබ්බ ධම්මානං සම්මා සමුච්ඡෙදේ නිරොධෙච අනුපට්ඨානතා පඤ්ඤා සමසීසට්ඨෙ ඤාණං**

සියලු තෙබුමු දහම් පිළිබඳ සන්නතිය සිඳීමෙන් මැනවින් නිරෝධය කළ යළි නූපැත්මේ ප්‍රඥාව සමසීස ස්වභාව ඤාණයයි.

**37.පුථු නානත්තතෙජපරියාදානෙ පඤ්ඤා සල්ලෙඛට්ඨෙ ඤාණං**

ලොව්තුරු ගුණෙන් වෙන්වූ රාගාදීන් ද, නානත්තවූ කාමච්ඡන්දාදීන් ද, තවන දුස්සීල්‍යාදීන් ගෙවාලන ප්‍රඥාව සල්ලෙඛ ඤාණයයි.

**38.අසල්ලීනත්ත පහිතත්ත පග්ගහට්ඨෙ පඤ්ඤා විරියාරම්භේ ඤාණං**

නො හැකිළුනු සිතැතිවූ ද, කාය ජීවිත නිරපේක්ෂායෙන් හළාවූද, තැනැත්තාගේ උත්සාහ ස්වභාවයේ ප්‍රඥාව විරියාරම්භ ඤාණයයි.



**39.නා නා ධම්මප්පකාසනතා පඤ්ඤා අත්ථ සන්දස්සනේ ඤාණං**

නා නා ධර්මයන් ප්‍රකට කොට දක්වන ප්‍රඥාව අත්ථ සන්දස්සන ඤාණයයි.

**40.සබ්බ ධම්මානං ඒකසංගහතා නානත්තේකත්ත පටිවෙධෙ පඤ්ඤා දස්සන විසුද්ධි ඤාණං**

සියලු ධර්මයන් එකතු කොට සංග්‍රහයෙහි ද නානාත්ව ඒකත්ව ධර්මයන්ගේ ප්‍රතිවෙධයේද ප්‍රඥාව දර්ශන විසුද්ධි ඤාණයයි.

**41. විදිතත්තා පඤ්ඤා ඛන්ති ඤාණං**

රූපස්කන්ධාදිය දත් හෙයින් පැවති ප්‍රඥාව ඛන්ති ඤාණයයි

**42.ඵුට්ඨත්තා පඤ්ඤා පරියොගාහණේ ඤාණං**

රූපස්කන්ධාදිය අනිත්‍ය සංඥාදියෙන් ස්පර්ශ කළ හෙයින් පැවති ප්‍රඥාව පරියෝගාහණ ඤාණයයි.

**43.සමොදහනේ පඤ්ඤා පදේසවිහාරේ ඤාණං**

ස්කන්ධාදීන්ගේ ඒකදේශයක් වන වේදනා ධර්මය පිඬු කොට සැලකීමේ ප්‍රඥාව ප්‍රදේශ විහාර ඤාණයයි.

**44.අධිපතත්තා පඤ්ඤා සඤ්ඤ විවට්ටෙ ඤාණං**

නෙක්ඛම්මාදිය අධික වූයෙන් තදධික භාවයෙන්

පැවති ප්‍රඥාව සඤ්ඤා විවට්ට ඤාණයයි.

**45. නානත්තෙ පඤ්ඤා චෙතො විවට්ටේ ඤාණං**

වැඩිය යුතු ධර්මයෙන් අන්‍ය ස්වභාව වූ කාමච්ඡන්දාදියෙහි ආදීනව දැක්මෙන් පැවති ප්‍රඥාව චෙතො විවට්ට ඤාණයයි.

**46.අදිට්ඨානේ පඤ්ඤා චිත්ත විවට්ටේ ඤාණං**

නෙක්ඛම්මාදී වශයෙන් සිත පිහිටුවාලන ප්‍රඥාව චිත්ත විවට්ට ඤාණයයි.

**47.සුඤ්ඤතේ පඤ්ඤා ඤාණවිවට්ටේ ඤාණං**

ආත්ම ආත්මීයත්ව ශූන්‍යතායෙන් අනාත්ම අනාත්මීයත්වයෙහි පැවති ප්‍රඥාව ඤාණ විවට්ට ඤාණයයි.

**48.වොස්සග්ගේ පඤ්ඤා විමොක්ඛ විවට්ටේ ඤාණං**

කාමච්ඡන්දාදීන් හැරපීමෙන් නෙක්ඛම්මාදියෙහි පැවති ප්‍රඥාව විමොක්ඛ විවට්ට ඤාණයයි.

**49.තථට්ඨෙ පඤ්ඤා සච්ච විවට්ටේ ඤාණං**

එක් එක් සත්‍යයෙක සතර සතර වැදෑරුම්ව ලැබෙන අවිපරීත ස්වභාවයෙහි අසම්මෝහ කෘත්‍ය වශයෙන් පැවති ප්‍රඥාව සච්ච විවට්ට ඤාණයයි.



# විවට්ට ඤාණ සයයි.

**50.කායම්පි චිත්තම්පි එක වවත්ථානතා සුඛ සඤ්ඤඤ්ච ලහුසඤ්ඤඤ්ච අධිට්ඨාන වසෙන ඉජ්ඣනට්ඨෙ පඤ්ඤා ඉද්ධිවිධෙ ඤාණං**

රූප කයත් පාදක ධ්‍යාන සිතත් එකතු කොට ව්‍යවස්ථා කිරීමෙන් හා සුඛ සඤ්ඤාවටත් ලහුසඤ්ඤාවටත් ඇතුළුව සිටීමෙන්ද සිද්ධි ස්වභාවයෙහි පැවති ප්‍රඥාව ඉද්ධිවිධ ඤාණයයි.

**51. විතක්ක විප්ඵාර වසෙන නානත්තේකත්ත සද්ද නිමිත්තානං පරියොගාහණෙ පඤ්ඤා සොත ධාතු විසුද්ධි ඤාණං**

තමාගේ විතර්ක වේගයන් අනුව නා නා ස්වභාව වූ ද ඒකස්වභාව වූද ශබ්ද නිමිත්තයනට ඇතුළුවීමේ ප්‍රඥාව සෝත ධාතු විසුද්ධි ඤාණයයි.

**52. තිණ්ණන්නං චිත්තානං විප්ඵාරත්තා ඉන්ද්‍රියානං පසාදවසේන නානත්තේකත්ත වික්ඤාණචරියා පරියෝගාහණේ පඤ්ඤා චේතෝපරිය ඤාණං**

සොම්නස් දොම්නස් උපේක්ෂා යන තුන් සිතේ වේගයෙන්ද ෂඩින්ද්‍රියන්ගේ ප්‍රසන්න භාවයෙන් ද නා නා ස්වභාවවූද එක ස්වභාව වූද වික්ඤාණ චරියාවනට ඇතුලු වීමේ ප්‍රඥාව චෙතොපරිය ඤාණයයි.

**53.පච්චය පවත්තානං ධම්මානං නානත්තේකත්ත කම්ම විප්ඵාර වසේන පරියෝගාහණේ පඤ්ඤා පුබ්බෙ නිවාසානුස්සති ඤාණං**

නා නා ස්වභාව වූද, ඒක ස්වභාව වූද, කර්මයන්ගේ වේගය අනුව ප්‍රත්‍යයෙන් පැවති ධර්මයනට ඇතුළුවීමේ ප්‍රඥාව පුබ්බෙ නිවාසානුස්සති ඤාණයයි.

**54.ඔභාස වසෙන නානත්තේකත්ත රූප නිමිත්තානං දස්සනට්ඨෙ පඤ්ඤා දිබ්බචක්ඛු ඤාණං**

කසිණාලෝකයේ බලයෙන් නා නා ස්වභාවවූද, ඒක ස්වභාව වූද රූප නිමිති දන්නා ස්වභාවයෙන් පැවති ප්‍රඥා දිබ්බචක්ඛු ඤාණයයි.

**55.චතුසච්චියා ආකාරෙහි තිණ්ණන්නං ඉන්ද්‍රියානං වසීභාවතා පඤ්ඤා ආසවානං ඛයෙ ඤාණං**

සූසැට ආකාරයකින් ලෝකෝත්තර තුන් දෙනාගේ වසිභාවයෙහි පැවති ප්‍රඥාව ආසවක්ඛය ඤාණයයි.

## අභිඤ්ඤා ඤාණ සයයි

**56. පරිඤ්ඤට්ඨෙ පඤ්ඤා දුක්ඛෙ ඤාණං**

දුකෙහි පරිඤ්ඤා ස්වභාවයෙහි පැවති ප්‍රඥාව දුක්ඛෙ ඤාණයයි.



**57. පහානට්ඨෙ පඤ්ඤා සමුදයේ ඤාණං**

සමුදයේ සිවවුවැදෑරුම් ප්‍රහාතව්‍ය ස්වභාවයේ පැවති ප්‍රඥාව සමුදයේ ඤාණයයි.

**58.සච්ඡිකිරියට්ඨෙ පඤ්ඤා නිරොධෙ ඤාණං**

නිරෝධයේ සිවුවැදෑරුම් ප්‍රත්‍යක්ෂ කළයුතු ස්වභාවයෙහි පැවති ප්‍රඥාව නිරෝධයේ ඤාණයයි.

**59.භාවනට්ඨෙ පඤ්ඤා මග්ගේ ඤාණං**

මාර්ගයේ සිවුවැදෑරුම් ප්‍රත්‍යක්ෂ කළයුතු ස්වභාවයෙහි පැවති ප්‍රඥාව මාර්ගයේ ඤාණයයි.

**60.දුක්ඛෙ ඤාණං**

දුක්ඛ සත්‍යයෙහි පැවති ඤාණය

**61.දුක්ඛ සමුදයේ ඤාණං**

දුක්ඛ සමුදයාර්‍ය සත්‍යයෙහි පැවති ඤාණය

**62.දුක්ඛ නිරොධෙ ඤාණං**

දුක්ඛ නිරෝධාර්‍ය සත්‍යයෙහි පැවති ඤාණය.

**63.දුක්ඛ නිරොධ ගාමිනී පටිපදාය ඤාණං**

දුක්ඛ නිරෝධ ගාමිනී ප්‍රතිපදාර්‍ය සත්‍යයෙහි පැවති ඤාණය

**64.අත්ථ පටිසම්භිදේ ඤාණං**

අර්ථ ප්‍රතිසම්භිදාවෙහි පැවති ඤාණය

**65.ධම්ම පටිසම්භිදේ ඤාණං**
ධර්ම ප්‍රතිසම්භිදාවෙහි පැවති ඤාණය

**66.නිරුත්ති පටිසම්භිදේ ඤාණං**
නිරුත්ති ප්‍රතිසම්භිදාවෙහි පැවති ඤාණය

**67.පටිභාන පටිසම්භිදේ ඤාණං**
ප්‍රතිභාන ප්‍රතිසම්භිදාවෙහි පැවති ඤාණය

**68.ඉන්ද්‍රිය පරොපරියත්තේ ඤාණං**
විනෙ දනන්ගේ ශ්‍රද්ධාදී ඉන්ද්‍රියන් පිළිබඳ උසස් පහත් බව දන්නා ඤාණය

**69.සත්තානං ආසයානුසයේ ඤාණං**
සත්වයන්ගේ ආසය අනුසය දන්නා ඤාණය

**70.යමක පටිහාරියේ ඤාණං**
යමා මහ පෙළහැර දැක්වීමේදී පැවති ඤාණය

**71.මහා කරුණා සමාපත්ති ඤාණං**
මහා කරණා සමාපත්ති ඤාණය

**72.සබ්බඤ්ඤුත ඤාණං**
සර්වඥතා ඤාණය

**73.අනාවරණ ඤාණන්ති**



අනාවරණ ඤාණය යනුවෙන්

**ඉමානි තෙසත්තති ඤාණානි. ඉමෙසං තෙසත්තතියා ඤාණානං සත්ත සට්ඨී ඤාණානි සාවක සාධාරණානි, ඡ ඤාණානි අසාධාරණානි සාවකෙහි ඉමෙහි තෙසත්තතියා ඤාණෙහි සමන්නාගතං සම්මා සම්බුද්ධං භගවන්තං සිරසා නමාමි.**

මොවුහු තුන්සැත්තෑවක් ඥාණයෝ. (73) වෙති. මෙයින් සැට හතක් (67) ඥාණයෝ ශ්‍රාවක සාධාරණයහ. ඥාණ (6) සයක් ශ්‍රාවකයන් හා අසාධාරණයහ. මේතුන් හැත්තෑවක් 73 ඥාණයෙන් සමන්විත භාග්‍යවත් වූ සම්මා සම්බුදු රජාණන් වහන්සේට දොහොත් මුදුන් දී වැඳ මම නමස්කාර කරමි. මාගේ නමස්කාරය වේවා!

**සාධු!සාධු!!සාධු!!!**

## දන්ත ධාතූන් වැඳීම

**එකාපි දාඨා තිදසෙහි පූජිතා**
**එකාපි ගන්ධාර පුරේ මහීයති**
**කාලිංග රඤ්ඤො විජිතේ පුනේකා**
**එකංපි වෙ නාගරාජා මහේති**

එක් දන්ත ධාතූන් වහන්සේ නමක් තිදසපුර වැසි දෙවියන් විසින් පුදන ලද්දාහුය. තවත් එක දන්ත ධාතූන් වහන්සේ නමක් ගාන්ධාර පුරයෙහි පුදන ලද්දාහුය. නැවත එක දන්ත ධාතූන් වහන්සේ නමක් කාලිංග රාජ පුරයෙහි පුදන ලද්දාහුය. අනෙක් දන්ත ධාතූන් වහන්සේ නාලොව නාරජු විසින්ද පුදන ලද්දාහුය.

**එකාදාඨා තිදසපුරේ - එකා නාගපුරේ අහු**
**එකා ගන්ධාර විසයේ - එකාසි පුන සීහලේ**
**චතස්සො තා මහාදාඨා - නිබ්බාණ රසදීපිකා**
**පූජිතා නර දේවෙහි - තාපි වන්දාමි ධාතුයෝ**

එක ධාතූන් නමක් තිදස පුරයෙහිද, එක් ධාතූන් වහන්සේ නමක් නාගපුරයෙහි වූහ. එක ධාතූන් වහන්සේ නමක් ගන්ධාර පුරයෙහිද පිහිටියාහ. එක් ධාතූන් වහන්සේ නමක් ශ්‍රී ලංකාවෙහිය. නිර්වාණ රස දෙන්නා වූ ඒ මහා ධාතූන් හතර නම දිව්‍ය මනුෂ්‍යයන් විසින් පුදන ලද්දාහුය. මමද ඒ ධාතූන් වහන්සේලාට වන්දනා කරමි.

**ලොකේක නාථ වදනම් -භුජරාජ හංසං**
**වෙනෙය්‍ය කෝමුද වනං - සුවිකාස යන්තං (වලිසීතලම්හි)**
**අද්ධින්දුකාර වර රූප - විරාජ මානං -**
**වන්දාමි සාධු මමලං - ජින දන්ත ධාතුං**



තුන් ලොවට එකම පිහිට වූ සර්වඥයන් වහන්සේගේ මුව පියුමෙහි රාජ හංසයකු වූ විනෙයජනයා නැමැති කුමුදු වනය විශේෂයෙන් පුබුදු වන්නාවූ අඩ සඳක් වැනිවූ මනොඥවූ බබලන්නා වූ නිර්මල වූ ජිනේන්ද්‍ර සර්වඥදන්ත ධාතූන් වහන්සේට සාධු සාධු මම නමස්කාර කරමි. මාගේ නමස්කාරය වේවා.

## සියලු ධාතු වැඳීම

**බුද්ධං ධම්මංච සංඝං සුගත තනු භවා**
**ධාතුයො ධාතු ගබ්භෙ**
**ලංකායං ජම්බු දීපෙ තිදස පුරවරෙ**
**නාග ලෝකෙච ථූපෙ**

බුද්ධ රත්නය, ධම්ම රත්නය, සංඝ රත්නය සර්වඥශාරීරික ධාතූන් වහන්සේලාටද ලංකාව, දඹදිව, දෙව්ලොව නාලොව ධාතු ගර්භයන්ටද, ස්ථූපයන්ටද

**සබ්බෙ බුද්ධස්ස බිම්බෙ සකල දසදිසෙ**
**කේස ලෝමාදී ධාතුං**
**වන්දෙ සබ්බෙ පී බුද්ධං දසබල තනුජං**
**බෝධි චෙතියං නමාමි**

ශ්‍රී බුද්ධ දේහයට අයත්වූ කෙස්, ලොම්, අසදෑශවූ සර්වඥධාතූන් වහන්සේලාට අයත් වූ

දසබල ධාරීන් වහන්සේගේ ශ්‍රී දේහයට අයත්වූ සියලුම ධාතුන් වහන්සේලාටද, සියලු චෛත්‍යයන්ටද, සියලු බෝධීන් වහන්සේලාටද, මම නමස්කාර කරමි. මාගේ නමස්කාරය වේවා.

**වන්දාමි චේතියං සබ්බං**
**සබ්බ ඨානෙසු පතිට්ඨිතං**
**සාරීරික ධාතු මහා බෝධිං**
**බුද්ධ රූපං සකලං සදා**

සියලු තැන්හි මනාකොට පිහිටියා වූ සියලු ශාරීරික ධාතු, සියලු චෛත්‍යයද, සියලු මහා බෝධිරාජයන් වහන්සේලාද, සියලු බුද්ධ රූපයන්ටද, සැම කල්හි මම නමස්කාර කරමි. මාගේ නමස්කාර වේවා.!

## ධාතු වන්දනාව

**උණ්හීසං චතුරෝ දාඨා**
**අක්ඛ ද්වයං ච උත්තමං**
**අසම්භිණ්ණාව තා සත්ත**
**සේසා භිණ්ණාව ධාතුයො**

උතුම් වූ ලලාට ධාතුන් වහන්සේ, අකුධාතුන් වහන්සේලා, සතර දළදා වහන්සේද යන ඒ ධාතුන් වහන්සේලා හත්නම



නොවිසුරුනාහ. සෙසු ධාතුන් වහන්සේලා විසුරුනාහ.

**මහන්තා සොණ්ණ වණ්ණාච**
**මජ්ඣිමා මුත්තිකා පභා**
**බුද්දකා මකුල වණ්ණා ච**
**සබ්බා වන්දාමි ධාතුයො**

මහත්වූ ධාතුන් වහන්සේලා රන්වන් පැහැයෙන්ද, මධ්‍යම ධාතුන් වහන්සේලා මුතු වන් පැහැයෙන්ද, කුඩා ධාතුන් වහන්සේලා මකුල වර්ණයෙන්ද, යුත්තාහ. ඒ සියලු ධාතුන් වහන්සේලාට මම නමස්කාර කරමි. මාගේ නමස්කාරය වේවා.

**භිණ්ණා මුග්ගප්පමාණාච**
**භිණ්ණා තණ්ඩුල සන්නිභා**
**මහන්තා මජ්ඣිමා චෙති**
**බුද්දකා සාසූපූපමා**

බිදුනාවූ ධාතුන් වහන්සේලා මුං පියලි ප්‍රමාණයෙන්ද බිඳුනු සහල් ප්‍රමාණයෙන්ද මහත්වූ මධ්‍යම වූ ප්‍රමාණයෙන්ද අබ ඇට තරම් කුඩා ප්‍රමාණයෙන්ද වූහ.

**මහන්තා පංච නාළීච**
**මජ්ඣිමා පංච නාලියෝ**
**ඡ නාලිකා ඛුද්දකා චේති**
**සබ්බා වන්දාමි ධාතුයෝ**

මහත්වූ ධාතුන් වහන්සේලා නැලි පහක්ද (5) මධ්‍යම වූ ධාතුන් වහන්සේලා නැලි පහක්ද (5) කුඩා වූ ධාතුන් වහන්සේලා නැලි හයක්ද (6) වූහ. ඒ සියලු ධාතුන් වහන්සේලාට මම නමස්කාර කරමි. මාගේ නමස්කාරය වේවා.

සාධු! සාධු!! සාධු!!!

## අටලොස් බුද්ධ ඤාණ වන්දනාව

**අතීතංසේ බුද්ධස්ස භගවතෝ අප්පටිහතං ඤාණං**
**අනාගතංසේ බුද්ධස්ස භගවතෝ අප්පටිහතං ඤාණං**
**පච්චුප්පන්නංසේ බුද්ධස්ස භගවතෝ අප්පටිහතං ඤාණං**

භාග්‍යවතුන් වහන්සේගේ ඥාණය අතීත කොටසෙහි නොපැකිල පැවැත්තේය. භාග්‍යවතුන් වහන්සේගේ ඥාණය අනාගත කොටසෙහි නොපැකිල පවතින්නේය. භාග්‍යවතුන් වහන්සේගේ ඥාණය වර්තමාන කොටසෙහිද නොපැකිලිව පවතින්නේය.



**ඉමෙහි තීහි ධම්මෙහි සමන්නාගතස්ස බුද්ධස්ස භගවතෝ සබ්බං කාය කම්මං ඤාණ පුබ්බංගමං ඤාණානු පරිවත්තං, සබ්බං වචී කම්මං ඤාණ පුබ්බංගමං ඤාණානු පරිවත්තං, සබ්බං මනෝ කම්මං ඤාණ පුබ්බංගමං ඤාණානු පරිවත්තං.**

මේ ධර්ම තුනෙන් සමන්වාගත වූ භාග්‍යවත් බුදුරජාණන් වහන්සේගේ කාය කර්මය නුවණ පෙරදැරිකොට ඇත්තේය. නුවණ අනුව පවත්නේය. වාක් කර්මයද, නුවණ පෙරදැරි කොට ඇත්තේය. නුවණ අනුව පවත්නේය. මනො කර්මයද, නුවණ පෙරදැරි කොට ඇත්තේය. නුවණ අනුව පවත්නේය.

**ඉමෙහි ඡහි ධම්මෙහි සමන්නාගතස්ස**
**බුද්ධස්ස භගවතෝ, නත්ථි ඡන්දස්ස හානි, නත්ථි ධම්මදේසනාය හානි, නත්ථි විරියස්ස හානි, නත්ථි සමාධිස්ස හානි, නතථි පඤ්ඤාය හානි, නත්ථි විමුත්තියා හානි.**

මේ ධර්ම හයෙන් සමන්වාගත වූ භාග්‍යවත් බුදුරජාණන් වහන්සේගේ ලෝවැඩ කිරීමෙහි වූ ඡන්දයේ පිරිහීමක් නැත්තේය. ධර්ම දේශනාවේ පිරිහීමක් නැත්තේය. වීර්යයයේ පිරිහීමක් නැත්තේය. සමාධියේ පිරිහීමක් නැත්තේය. ප්‍රඥාවගේ පිරිහීමක් නැත්තේය. අර්හත් ඵල

විමුක්තියේ පිරිහීමක් නැත්තේය.

**ඉමෙහි ද්වාදසහි ධම්මෙහි සමන්නාගතස්ස**
**බුද්ධස්ස භගවතෝ නත්ථි දවා නත්ථි රවා නත්ථි**
**අප්ඵුටං නත්ථි වෙගායිත ත්තං, නත්ථි අබ්‍යාවට**
**මනො, නත්ථි අප්පටිසංඛානු පෙක්ඛා.**

මේ ධර්ම දොලොසින් සමන්වාගත වූ භාග්‍යවත් බුදුරජාණන් වහන්සේගේ නුවණින් තොර වූ වාචසික ක්‍රීඩා විකාරාදියක් නැත්තේය. නුවණින් තොරවූ යුහුසුළු ක්‍රියා ද නැත්තේය. නුවණින් ස්පර්ශ නොකළ ක්‍රියාවක්ද නැත්තේය. සිහියෙන් තොරව කරනු ලබන වේගවත් ක්‍රියා නැත්තේය. නිරර්ථක චිත්ත සමුදාචාර නැත්තේය. අඥාන උපේක්ෂා නැත්තේය.

**ඉමෙහි අට්ඨාරස්හි ධම්මෙහි සමන්නාගතං**
**සම්මා සම්බුද්ධං භගවන්තං සිරසා නමාමි.**

මේ අටලොස් ධර්මයන්ගෙන් සමන්වාගත වූ භාග්‍යවත් වූ බුදුරජාණන් වහන්සේට මම දොහොත් මුදුන් දී නමස්කාර කරමි. මාගේ නමස්කාරය වේවා.

**සාධු! සාධු!! සාධු!!!**



# දඹදිව බුද්ධ වන්දනාව

## දඹදිව බුද්ධගයා විහාරය වැඳීම.

**තිලෝක නාථො දීප දුත්තමෝ සෝ**
**යස්මිං අජෙසි සකිලේස මාරං**
**රඤ්ඤො අසෝකේන සුසංඛතං**
**වන්දාමහං බුද්ධගයා විහාරං**

තුන්ලොවට පිහිටවූ තුන්ලොව උතුම් ප්‍රදීපයක් බඳු වූ ඒ බුදුරජාණන් වහන්සේ යම් තැනක කෙලෙස් මාරයන් පැරදූවේද, එම ස්ථානයෙහි අශෝක රජතුමා විසින් මනාසේ සකස් කරණ ලද බුද්ධගයා මහා විහාරයට මම නමස්කාර කරමි. මාගේ නමස්කාරය වේවා.!

## ලුම්බිනි චෛත්‍යය වැඳීම

**මායා සුතො සුගත සාකිය සීහනාථො**
**ජාතක්ඛණෙ සපදසා වහිසංකමිත්වා**
**යස්මිං උදීරයිගිරං වරලුම්බිනිම්හි**
**තං ජාත චේතිය මහං සිරසා නමාමි**

මහාමායා දේවියගේ පුත් වූ සෝභන ගමන් ඇති ශාක්‍ය සීහෝත්තම වූ ඒ සිද්ධාර්ථ නම් ගෞතමයන් වහන්සේ උපන් ඇසිල්ලෙහිදී සිය පයින් උතුරට සත් පියවරක් වැඩ අවසන්හි ලුම්බිණි උයනෙහි යම් තැනක සිට අග්ගෝ

හමස්මි යන ආදී වචනයන් ප්‍රකාශ කළේද එහි කරවන ලද චෛත්‍යයද ඒ පූජනීය ස්ථානයද මම මස්තක ප්‍රණාමයෙන් නමස්කාර කරමි. මාගේ නමස්කාරය වේවා.!

## දඹදිව ශ්‍රී මහා බෝධිය වැඳීම

**යස්මිං නිසජ්ජ වජිරාසන බන්ධනේන**
**ජෙත්වා සවාසන කිලේස බලං මුනින්දො**
**සම්බෝධි ඤාණ මව ගම්ම විහාසි සම්මා**
**තං බෝධි චෙතියමහං සිරසා නමාමි**

මුනීන්ද්‍රයන් වහන්සේ යම් තැනක වජිරාසනය බැඳීමෙන් වැඩහිඳ වාසනා සහිත කෙලෙස් බලමුලුව ජයගෙන සර්වඥතා ඥානය ප්‍රත්‍යක්ෂ වශයෙන් මැනවින් අත්පත් කොට ගෙන වාසය කළසේක්ද, ඒ පූජනීය ස්ථානයත් එහි කරවන ලද චෛත්‍යයත් ශීර්ෂ ප්‍රණාමයෙන් මම නමස්කාර කරමි. මාගේ නමස්කාරය වේවා.!

## දඹදිව දම්සක් චෛත්‍යය වැඳීම

**සංකම්පයං දසසහස්සිය ලෝක ධාතුං**
**දේසෙසි යත්‍ර භගවා වර ධම්ම චක්කං**
**බාරාණසීපුර සමීප වනේමිගානං**
**තං ධම්ම චෙතිය මහං සිරසා නමාමි**

භාග්‍යවතුන් වහන්සේ යම් තැනක වැඩහිද



ගෙන දස දහසක් ලොකධාතුන් කම්පා කරවමින් උතුම් වූ ධර්ම චක්‍රය දෙසූ සේක්ද, බරණැස් නුවර සමීපයෙහි මුව වනයෙහි වූ ඒ පූජ්‍ය ස්ථානයද එහි කරවන ලද චෛත්‍යයද ශීර්ෂ ප්‍රණාමයෙන් මම නමස්කාර කරමි. මාගේ නමස්කාරය වේවා.!

## දඹදිව පරිනිර්වාණ චෛත්‍යය වැඳීම

**කත්වාන ලෝක හිතමත්ත හිතඤ්ච නාථෝ**
**ආසීතිකෝව උපවත්තන කානනම්හි**
**යස්මිං නිපජ්ජගතවා නිරුපාධි සේසං**
**නිබ්බාන චේතියමහං සිරසා නමාමි**

**සාධු! සාධු!! සාධු!!!**

ඒ ලොකනාථ වූ සම්මා සම්බුදුරජාණන් වහන්සේ තම වැඩ සහ සකල ලෝකවාසීන්ගේ වැඩද කොට සියලු බුදු කිස නිමවා උපතින් අසූ අවුරුදු ඇතිව උපවත්තන නම් සල්වනයෙහි යම් තැනක වැඩ හිඳ නිරුපාධිශේෂ පරිනිර්වාණ ධාතුවට පත්වූ සේක්ද, ඒ ස්ථානයද, එහි බැඳි චෛත්‍යයද, ශීර්ෂ ප්‍රණාමයෙන් මම නමස්කාර කරමි. මාගේ නමස්කාරය වේවා.!

## සෙත් ගාථා

ශාක්‍ය මුනීන්ද්‍ර වූ භාග්‍යවත් අර්හත් සම්‍යක් සම්බුද්ධ සර්වඥසම්මා සම්බුදුරජාණන් වහන්සේ

බෝධි සම්භාර ධර්මයන් වශයෙන් සොළසා සංඛ්‍ය කල්ප ලක්‍ෂයක් අනියත වශයෙන් පාරමී ධර්මයන් වැඩූ බව ඒකාන්ත සත්‍යයි. එම සත්‍යානුභාව බලයෙන්ද, සාරාසංඛ්‍ය කල්ප ලක්‍ෂයක් සමත්‍රිංශත් ආකාරයෙන් දස පාරමී ධර්මයන් වැඩූ බව සත්‍යයි එම සත්‍යානුභාව බලයෙන්ද, දඹදිව බුද්ධගයා ශුද්ධ භූමියේදී සපරි වාර මාර පරාජය කොට ලොවුතුරා බුද්ධත්වයට පැමිණි බව ඒකාන්ත සත්‍යයි. එම සත්‍යානුභාව බලයෙන්ද, බෝධි මූලයේදී ප්‍රතිලාභ කරගන්නා ලද සතර මාර්ග ඥාණානුභාව බලයෙන්ද, ෂඩ් අසාධාරණ ඥාණානුභාව බලයෙන්ද, දසබල ඥාණානුභාව බලයෙන්ද, චුද්දස බුද්ධ ඥාණ බලයෙන්ද, සොළස මහා ඥාණානුභාව බලයෙන්ද, අට්ඨාරස බුද්ධ ඥාණානුභාව බලයෙන්ද, සූවිසි කෝටි වාර සමාපත්ති සංචාරක අරහත් ඵල වජ්‍රඥානානුභාව බලයෙන්ද, අනන්ත නය සමන්නාගත සමන්ත පට්ඨාන ප්‍රකරණ විෂයන්තර්ගත ගම්භීර ඥාණානුභාව බලයෙන්ද, තෙසැත්තෑ ඥාණානුභාව බලයෙන්ද, සත්සැත්තෑ ඥාණානුභාව බලයෙන්ද, ඉන්ද්‍රිය පරොපරිය ඥාණානුභාව බලයෙන්ද, ආසයානුසය ඥාණානුභාව බලයෙන්ද, යමකපාටිහාරිය ඥාණානුභාව බලයෙන්ද, මහා කරුණා සමාපත්ති ඥාණානුභාව බලයෙන්ද, සබ්බඤ්ඤුත ඥාණානුභාව බලයෙන්ද, අනාවරණ ඥාණානුභාව බලයෙන්ද, සම්මා සම්බුදුරජාණන්



වහන්සේගේ නව අරහාදී අනන්ත බුදුගුණ බලයෙන්ද, සත් බුදුවරයින් වහන්සේලාගේද, අටවිසි බුදුවරයින් වහන්සේලාගේද, පන්ලක්‍ෂ දොළොස් දහසක් බුදුවරයින් වහන්සේලාගේද, ලොව පහළ වූ සියළුම සර්වඥයින් වහන්සේලාගේද, නවඅරහාදී අනන්ත බුදුගුණ බලයෙන්ද, අනන්ත ඥාණානුභාව බලයෙන්ද, අනන්ත ඉද්ධියානුභාව බලයෙන්ද, අනන්ත තෙජානුභාවබලයෙන්ද, ජය ශ්‍රී මහා බෝධිරාජයාණන් වහන්සේගේ මහා ගුණානුභාව බලයෙන්ද, ශ්‍රී දන්ත ධාතුන් වහන්සේගේ ආනුභාව බලයෙන්ද, ලලාට ධාතුන් වහන්සේගේ අකුධාතුන් වහන්සේලාගේ, රුවන්වැලි මහා චෛත්‍ය රාජයන් වහන්සේගේ ද්‍රෝණයක් පමණ සර්‍වඥ ධාතුන් වහන්සේගේ ආනුභාව බලයෙන්ද, බුද්ධ පූජා, බෝධි පූජා, ඥාණ පූජා, වන්දනා මානාදියෙන් ලත් කුසලානුභාව බලයෙන්ද, පින් අනුමෝදන් වන සම්මා දිට්ඨික දෙවියන්ගේ රැකවරණින්ද, කල්‍යාණමිත්‍ර උතුමන් වහන්සේලාගේ මෛත්‍රී පූර්වාංගම ආශිර්වාද බලයෙන්ද, මෙ වන්දනාමය පුණ්‍ය කර්මය කරන සියලු දෙනාටම සෙතක් ශාන්තියක් සැනසිල්ලක් උදාවේවා! සර්ව උපද්‍රව නිවාරණය වී කායික මානසික සැනසිල්ල ඇතිවේවා. ආයුරාරෝග්‍ය සැප සම්පත් සැලසී සියවස් කලක් ආයු වින්දනය කරන්නට වාසනාව උදාවේවා! කරන කියන රැකී රක්ෂා වෙළද ව්‍යාපාර, ගොවිතැන්, අධ්‍යාපන

කටයුතු ආදිය ද අනාගත උතුම් පැතුම් සහ සසර පාරමී ධර්මයන් සුවසේම සපුරාගැනීමට සියලු පහසු විහරණ සැලසේවා! සියලු දෙනාගේ සම්‍යක් ප්‍රාර්ථනා ඉෂ්ඨ වී පතන බෝධියකින් ලෝකෝත්තර නිවන් සුවය අවබෝධ වේවායි යන ප්‍රාර්ථනය සිතෙහි දරාගෙන සෙත් ගාථා සජ්ඣායනා කරමු.

**ජයෝ මුනින්දස්ස සුබෝධි මුලේ**
**අහෝසි මාරස්ස පරාජයෝහි**
**උග්සෝසයුං බොධි මණ්ඩේපමෝදිතා**
**ජයං තදා නාග ගණා මහේසිනෝ**
**එතේන සච්චේන සුවත්ථි හෝතු**

ජය ශ්‍රී මහා බෝධි මූලයේදී මුනීන්ද්‍රයන් වහන්සේට ජය අත්විය. වසවත් දේව පුත්‍රයා සහිත මාරසේනාවට පරාජය අත් විය යැයි බෝධි මණ්ඩලය තුළ ප්‍රමුදිතව එකල්හි එහි රැස්වූ නාගරාජ සමූහයා මුනීන්ද්‍රයන් වහන්සේට ජය උත්ඝෝෂණය කළහ. එම සත්‍යානුභාව බලයෙන් සියලු සත්ත්වයෝ සුවපත් වෙත්වා!

**ජයෝ මුනින්දස්ස සුබෝධි මුලේ**
**අහෝසි මාරස්ස පරාජයෝහි**
**උග්සෝසයුං බෝධි මණ්ඩේපමෝදිතා**
**සුපණ්ණ සංසාපි ජයං මහේසිනෝ**
**එතේන සච්චේන සුවත්ථි හෝතු**



ජය ශ්‍රී මහා බෝධි මූලයේදී මුනීන්ද්‍රයන් වහන්සේට ජය අත්විය වසවත් දේව පුත්‍රයා සහිත මාරසේනාවට පරාජය අත් විය යැයි බෝධි මණ්ඩලය තුල පමුදිතව එකල්හි එහි රැස්වූ සුපණ්ණ සමූහය මුනීන්ද්‍රයන් වහන්සේට ජය උත්ඝෝෂණය කලහ. එම සත්‍යානුභාව බලයෙන් සියලු සත්ත්වයෝ සුවපත් වෙත්වා !

**ජයෝ මුනින්දස්ස සුබෝධි මුලේ**
**අහෝසි මාරස්ස පරාජයෝහි**
**උග්සෝසයුං බොධි මණ්ඩේපමෝදිතා**
**ජයං තදා දෙව ගණා මහේසිනෝ**
**එතේන සච්චේන සුවත්ථි හෝතු**

ජය ශ්‍රී මහා බෝධි මූලයේදී මුනින්ද්‍රයන් වහන්සේට ජය අත්විය වසවත් දේව පුත්‍රයා සහිත මාරසේනාවට පරාජය අත් විය යැයි බෝධි මණ්ඩලය තුළ ප්‍රමුදිතව එකල්හි එහි රැස්වූ දේව ගණ සමූහය මුනීන්ද්‍රයන් වහන්සේට ජය උත්ඝෝෂණය කළහ. එම සත්‍යානුභාව බලයෙන් සියලු සත්ත්වයෝ සුවපත් වෙත්වා !

**ජයෝ මුනින්දස්ස සුබෝධි මුලේ**
**අහෝසි මාරස්ස පරාජයෝහි**
**උග්සෝසයුං බොධි මණ්ඩේපමෝදිතා**
**ජයං තදා බ්‍රහ්ම ගණා මහේසිනෝ**
**එතේන සච්චේන සුවත්ථි හෝතු**

ජය ශ්‍රී මහා බෝධි මූලයේදී මුනින්ද්‍රයන් වහන්සේට ජය අත්විය වසවත් දේව පුත්‍රයා සහිත මාරසේනාවට පරාජය අත් විය යැයි බෝධි මණ්ඩලය තුළ ප්‍රමුදිතව එකල්හි එහි රැස්වූ බ්‍රහ්ම සමූහය මුනීන්ද්‍රයන් වහන්සේට ජය උත්සෝෂණය කලහ. එම සත්‍යානුභාව බලයෙන් සියලු සත්ත්වයෝ සුවපත් වෙත්වා !

## සිංහල පූජා වාක්‍ය

නිරෝධ සමාපත්තියෙන් නැගී සිටියාක් මෙන්, මහා කරුණා සමාපත්තියෙන් නැගී සිටියාක් මෙන්, අර්හත් ඵල සමාපත්තියෙන් නැගී සිටියාක් මෙන්, වැඩ හිඳින්නා වූ, දෙතිසක් මහා පුරුෂ ලක්ෂණයෙන්ද, අසූවක් අනුව්‍යඤ්ජන ලක්ෂණයෙන්ද, ව්‍යාමප්‍රභාවෙන්ද, සවණක් ඝණ බුදුරැස් මාලාවෙන්ද, හිරුමඬලක් මෙන් බබලන්නාවූ, දේවාති දේව වූ, ශක්‍රාති ශක්‍ර වූ, බ්‍රහ්මාති බ්‍රහ්ම වූ දසබලධාරී වූ, කරුණා නිධාන වූ, සමත්ත භද්‍ර වූ, අසම සම වූ, ත්‍රෛලෝක්‍ය තිලක වූ, ප්‍රදීපායමාන වූ, මාරපරාජය කළා වූ, මාගේම බුදු පියාණන් වූ, මාගේම බුදු මෑණියන් වූ, තුන්ලෝක වාසින්ගේ ආමිස පූජා, ප්‍රතිපත්ති පූජා, පිළිගැනීමට යෝග්‍ය වූ, අග්‍ර දක්ෂිණාර්හ වූ, භාග්‍යවත් වූ, අර්හත් වූ, සම්මා සම්බුදු රජාණන් වහන්සේට ද, ධර්ම රාජයාණන් වහන්සේ විසින් සර්වඥතා ඥානයට පැමිණීම පිණිස, සේවනය



කරන ලද ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේට ද, සතර මාර්ග ඥාන බෝධියටද, සර්වඥතා ඥාන බෝධියටද, ශාන්ත නිර්වාණ ධාතු බෝධියට ද, සතර දළදා වහන්සේලාටද, ලලාට ධාතුන් වහන්සේටද, අකු ධාතුන් වහන්සේලාට ද්‍රෝණයක් සර්වඥ ධාතුන් වහන්සේලාටද, ලොව සියලු පූජනීය ස්ථානයන්ටද, මේ පහන් ආලෝකයෙන් ද, විදුලි බුබුළු ආලෝකයෙන්ද, සුගන්ධ ධූපයෙන්ද, වර්ණවත් මල් සමූහයෙන්ද, සිසිල් පැන් උණු පැන් සමූහයෙන්ද, ප්‍රණීත ගිලන්පසින්ද, ප්‍රණීත අෂ්ඨපාන ගිලන්පසින්ද, ප්‍රණීත චතුමධුරෙන්ද, දහැත් බෙහෙත් ඖෂධයෙන්ද, විළඳ සමූහයෙන්ද, මල්දම් සමූහයෙන්ද, විසිතුරු කොඩි සමූහයෙන්ද, අෂ්ඨපරිෂ්කාර සමූහයෙන්ද, සෙසු පරිෂ්කාර සමූහයෙන්ද, සුවඳ පැන් අභිෂේකයෙන්ද, ආමිස ප්‍රතිපත්ති පූජාවෙන්ද, සමථ විපස්සනාවෙන්ද පූජා කරමි. පූජා වේවා. මෙසේ බුද්ධ පූජා කිරීම, බෝධි පූජා කිරීම, ලොව පහළ වී වදාළා වූ අනත්ත අප්‍රමාණ වූ බුදු පසේ බුදු අගසවු, මහා සවු මහරහතන් වහන්සේලාගේ චාරිත්‍ර සීලයකි. මමද ඒ උතුම් චාරිත්‍ර ශීලය මෙසේ අනුගමනය කරමි. මේ ප්‍රණීත පූජා වස්තු සමූහය තව ස්වල්ප මොහොතකින් අනිත්‍යත්වයට යන්නාසේ සියලු සංස්කාරයෝ අනිත්‍යයෝය. සියලු සංස්කාරයෝ දුක්ඛයෝය, සියලු ධර්මයෝ අනාත්මයෝ ය, මෙම

බුද්ධ පූජාමය, බෝධි පූජාමය, බුද්ධ වන්දනාමය, බෝධි වන්දනාමය, ඥාණ වන්දනාමය, සත්බුදු පූජාමය, අටවිසි බුද්ධ පූජාමය, දස පාරමිතාමය, දසබල ඥාණමය, චුද්දස බුද්ධ ඥාණමය, ෂඩ්අසාධාරණ ඥාණමය, සත්සතිමය, සුවිසි මහා ගුණමය, සුවිසි පට්ඨානමය, තෙසැත්තෑඥාණමය, ආමිස ප්‍රතිපත්තිමය, සමථ විපස්සනාමය, කුසලානිසංස ධර්මය ලොව පහළ වී වදාළ වූ අනන්ත අපරිමාණ වූ බුදු පසේ බුදු මහ රහතන් වහන්සේලා නිවී සැනසී පැමිණ වදාළා වූ පරම රමණීය වූ ශාන්ති ලක්‍ෂණ වූ, නිර්වාණ අවබෝධයට සුවසේ පැමිණීම පිණිසම හේතු වේවා! වාසනා වේවා !

සාධු! සාධු!! සාධු !!!

## සොළොස් මහා පූජනීය ස්ථාන වැඳීම

**මහියංගණං නාගදීපං**
**කල්‍යාණං පද ලාඤ්ඡනං**
**දිවාගුහං දීඝවාපි**
**චේතියංච මුතිංගණං**
**තිස්ස මහා විහාරංච**
**බොධිං මරිච වට්ටියං**
**සොණ්ණමාලි මහා චෙතිං**
**ථූපාරාම හයාගිරිං**



**ජේතවනං සේල චෙතිං**
**තථා කාජර ගාමකං**
**එතේ සොළස ඨානානි**
**අහං වන්‍දාමි සබ්බදා**

මහියංගණය, නාගදීපය, කැළණිය, ශ්‍රී පාදය, දිවාගුහාව, දීඝවාපිය, මුතියංගණය, තිස්ස මහා විහාරය, ජය ශ්‍රී මහා බෝධිය, මිරිසවැටිය, රුවන්වැලිසෑය, ථූපාරාමය, අභයගිරිය, ජේතවනය, සේල චෛත්‍යය, කිරිවෙහෙර යන මේ සොළොස් ස්ථානයන්ට මම සැම කල්හිම නමස්කාර කරමි. මාගේ නමස්කාරය වේවා!

## මහියංගණ චෛත්‍යය වැඳීම

**ලංකාය යත්‍ථ පඨමං සුගතෝ නිසජ්ජ**
**යක්ඛෙ දමෙසි නිජ සාසන පාලනාය**
**ඨානෙ තහිං නිහිත කුන්තල ගීවධාතුං**
**වන්‍දාමි සාධු මහියංගණ ථූප රාජං**

බුදුරජාණන් වහන්සේ පළමුකොට ලක්දිවට පැමිණ යම් තැනක වැඩ හිඳ යක්ෂයන් දමනය කළ සේක්ද? ඉදිරියේ සාසනය පිහිටවනු (රකිනු) සඳහා ඒ ස්ථානයන්හි කේශධාතූන් හා ග්‍රීවා ධාතූන්ද නිධන් කොට පිහිටවන ලද මහියංගණ චෛත්‍ය රාජයාන් වහන්සේට මම නමස්කාර කරමි. මාගේ නමස්කාරය වේවා.!

## නාගදීප චෛත්‍යය වැඳීම

**හගිනි සුත මාතුලේහි දින්නේ**
**මණිපල්ලංකවරෙ යහිං නිසින්නෝ**
**මුනි ධම්ම මදෙසයි එනීනං**
**සිරසා තං පණමාමි නාගදීපං**

යම් තැනක මාතුල භාගිනෙය්‍යය දෙදෙනා විසින් දෙන ලද උතුම් වූ මිණි පළඟයෙහි වැඩ හිඳ සර්වඥයන් වහන්සේ (මුනින්ද්‍රයන් වහන්සේ) විසින් නාගයන්ට ධර්මය දේශනා කළසේක. මිනිපලඟ පිහිටුවා සාදන ලද නාග දීප චෛත්‍යය රාජයාණන් වහන්සේට මම නමස්කාර කරමි. මාගේ නමස්කාරය වේවා !

## කැළණි චෛත්‍යය වැඳීම

**ආයාචනාය මණි අක්ඛි මහෝරසස්ස**
**යස්මිං නිසීදි භගවා මණිමණ්ඩ පස්මිං**
**තත්‍රේව කාරිතමිදං මණිපීඨ යුත්තං**
**කළ්‍යාණි චෙතිය මහං සිරසා නමාමි**

මණි අක්ඛික නම් නාග රාජයාගේ ආරාධනයෙන් බුදු රජාණන් වහන්සේ යම් තැනක මැණික් මණ්ඩපයෙහි වැඩ හුන් සේක්ද එහිම කරවන ලද මේ මැණික් පුටුව සහිත කැළණි චෛත්‍ය රාජයාණන් වහන්සේට මම මස්තකයෙන් නමස්කාර කරමි. මාගේ



නමස්කාරය වේවා!

**ආයාචනාය මණි අක්ඛි මහොරසස්ස**
**යස්මිං නිසීදි භගවා මණිමණ්ඩ පස්මිං**
**තස්සො පරිට්ඨිත මුපට්ඨිත වීතරාගං**
**කළ්‍යාණි චෙතිය මහං සිරසා නමාමි**

මණි අක්ඛික නම් නාග රාජයාගේ ආරාධනයෙන් බුදුරජාණන් වහන්සේ යම් තැනක මැණික් පුටුවෙහි (මණ්ඩපයෙහි) වැඩ හුන්සේක. ඒ මතුවෙහි කරණ ලද කැලණි චෛත්‍ය රාජයාණන් වහන්සේට මම නමස්කාර කරමි. මාගේ නමස්කාරය වේවා !

## ශ්‍රී පාදය වැඳීම

**කල්‍යාණිතෝ ගගනතෝ මුනියත්‍ථ ගන්ත්වා**
**දද්සේසි චක්ක වරලක්ඛණ පාද ලඤ්ඡං**
**ලංකා මහී වරවධූ මකුටෝපමානං**
**වන්‍දාමහං සුමනකූට සිලුච්චයං තං**

බුදුරජාණන් වහන්සේ කැළණියේ සිට අහසින් වැඩ යම් තැනක චක්‍ර ලක්ෂණ ශ්‍රී පාද ලාඤ්ඡනය පිහිටවූ සේක්ද ලංකාභූමියෙහි සමන්ත කූට පර්වතයෙහි පිහිටි ශ්‍රී පාදය (ශ්‍රී පාදස්ථානයට) මම නමස්කාර කරමි.මාගේ නමස්කාරය වේවා !

**යංනම්මදාය නදියා පුලිනේච තීරේ**
**යං සච්ච බද්ධ ගිරිකෙ සුමනා චලග්ගේ**
**යං තත්‍ථ යෝනක පුරේ මුනිනෝච පාදං**
**තං පාද ලාඤ්ඡන මහං සිරසා නමාමි**

නර්මදා නදී තීරයෙහි වැලිතලාවෙහි සච්චබද්ධ පර්වත මස්තකයෙහි සමන්ත කූට පර්වතයෙහි යෝනකපුරයෙහි යන ස්ථාන සතරෙහි මුනින්ද්‍රයන් වහන්සේගේ යම් ශ්‍රී පාද ලාඤ්ඡනයක් වේද ඒ හැම සිරිපා සටහනක්ම මම නමස්කාර කරමි.මාගේ නමස්කාරය වේවා !

## දිවා ගුහාව වැඳීම

**ලංකා මහී වර වධූ මකුටාය මානේ**
**අස්මිං සමන්ත ගිරි මුද්ධනියත්‍ථ ලෙණේ**
**සත්‍ථා දිවා විහරණං හි විහාසි තස්මා**
**වන්දාමි දේව මහිතංහි දිවාගුහං තං**

උතුම් ලක් මිහිකත පළන් කිරුළක් බඳු වූ මේ සමන්ගිරි මුදුන්හි යම් ලෙනක ශාස්තෲන් වහන්සේ දිවා විහරණය කළසේක්ද, එබැවින් ඒ දෙවියන් විසිනිදු පුදන ලද දිවා ගුහාවට මම නමස්කාර කරමි. මාගේ නමස්කාරය වේවා!

**ඛීණාසවෙහි සහ පඤ්ච සතෙහි ගන්ත්වා**
**යස්මිං අකාසි භගවා සදිවා විහාරං**
**සංඵුල්ලසාල සුමනාචල පාද දේසේ**
**වන්දේ සුසීතල මහං භගවා ගුහං තං**



බුදුරජාණන් වහන්සේ යම් තැනෙක්හි පන්සීයක් රහතුන් වහන්සේලා සමඟ දිවා විහරණය කළසේක්ද, පිපී ගිය සල්ගස් ඇති සමන්තකූට පර්වත ප්‍රාන්තයෙහි වූ ඒ භගවා ලෙනට මම නමස්කාර කරමි.මාගේ නමස්කාරය වේවා !

## දීඝවාපිය වැඳීම

**යත්‍ථ නිසීදිය භගවා**
**ස සාවකො සාධු සමප්පයි**
**සමාධිතං දීඝවාපි ථූපං**
**රොහණ පුර මණ්ඩනං වන්දෙ**

යම් තැනක වැඩ හිඳ ශ්‍රාවකයන් සහිත වූ බුදුරජාණන් වහන්සේ සමාධියට සමවත් සේක්ද රුහුණු රට පිහිටි ඒ දීඝවාපි චෛත්‍යය රාජයාණන් වහන්සේට මම නමස්කාර කරමි.මාගේ නමස්කාරය වේවා !

**නිසජ්ජ යස්මිං භගවා සසාවකො**
**ඛණං සමාපත්ති සුඛං සමප්පයි**
**සරීර ධාතුංහි නිධාය කාරිතං**
**නමාමි චෙතිං සිරි දීඝවාපිකං**

ශ්‍රාවකයන් සහිත වූ බුදුරදුන් යම් තැනෙක්හි වැඩ හිඳ මොහොතක් සමවත් සුවයෙන් වැඩ සිටි සේක්ද ශාරීරික ධාතූන් පවා නිදන් කොට කරවන ලද උතුම් වූ දීඝවාපි චෛත්‍යය රාජයාණන්

වහන්සේට මම නමස්කාර කරමි.මාගේ නමස්කාරය වේවා !

## මුතියංගණ චෛත්‍යය වැඳීම

**විමල සුසීතල භූරිජලාසයප්**
**පහවකකඤ්ජ රජෝහරී පඤ්ජරං**
**ගිරි නදීවන දෙව පූජිතං**
**නමාමි තුංග මුතිංගණ චෙතියං**

නිමල වූ සීතල වූ බොහෝ ජලාශයන්ගෙන් යුක්ත වන දෙවියන් විසින් පුදන ලද උස් වූ මුතියංගන චෛත්‍ය රාජයාණන් වහන්සේට මම නමස්කාර කරමි.මාගේ නමස්කාරය වේවා !

**සතුනාධි වුසිතම්පි සමාධිනා**
**ධාතු යුත්තමහ බොධි විරාජිතං**
**ජෙට්ඨ තිස්ස නරවරෙන කාරිතං**
**තං නමාමි මුතියංගණ චෙතියං**

තථාගතයන් වහන්සේ සමාධියෙන් වැඩ හුන්නාවූද දෙතිස් ඵල රුහ බෝධීන් වහන්සේ නමක්ද රෝපණය කරන ලද තන්හි ජෙට්ඨතිස්ස රජතුමන් විසින් විශාල කොට බඳවන ලද මුතියංගන චෛත්‍යය රාජයාණන් වහන්සේට මම නමස්කාර කරමි.මාගේ නමස්කාරය වේවා !



## තිස්සමහාරාම චෛත්‍යය වැඳීම

**නික්ඛිත්ත සම්පූණ්ණ සසංක බිම්බ**
**සංකාස භාසන්ත ලලාට ධාතුං**
**අකාරයි තිස්ස නරිස්සරෝයං (නරිසසරොතං)**
**ථූපං නමෙ තිස්ස මහා විහාරේ**

සම්පූර්ණ චන්‍ද්‍ර මණ්ඩලය බඳු වූ ලලාට ධාතූන් වහන්සේ නිදන් කොට කාවන්තිස්ස නරේශ්වරයන් (රජතුමා) විසින් කරවූ තිස්ස මහාරාම චෛත්‍යය රාජයාණන් වහන්සේට මම නමස්කාර කරමි.මාගේ නමස්කාරය වේවා !

**නිධාය සො වණ්ණ මුනින්‍ද බිම්බෙ**
**පුණ්ණින්ද සංකාස ලලාට ධාතුං (සදන්ත ධාතුං)**
**අකාරයි තිස්ස නරිස්සරො තං**
**ථූපං නමෙ තිස්ස මහා විහාරෙ**

ස්වර්ණමය බුද්ධ රූපයෙහි සර්වඥධාතූන් වහන්සේ නිදන් කොට කාවන්තිස්ස නරේශ්වරයන්(රජතුමා) විසින් කරවන ලද තිස්ස මහා විහාරයෙහි වූ චෛත්‍ය රාජයාණන් වහන්සේට මම නමස්කාර කරමි.මාගේ නමස්කාරය වේවා !

## ජය ශ්‍රී මා බෝධීන් වහන්සේ වැඳීම

**සුපතිට්ඨිත රට්ඨනුරාධපුරේ**
**සමධිට්ඨිත දක්ඛිණ සාඛ භවං**
**සුභ මෙඝ වණ්ණම්බර මේඝ නිභං**
**ජය බෝධි මහං පණ මාමි වරං**

අනුරාධපුරයෙහි මනාව පිහිටුවන ලද මනාව අධිට්ඨාන කරණ ලද දඹදිව ශ්‍රී මහා බෝධියෙහි දක්ෂිණ ශාඛාව මේඝවන අහසෙහි මේඝයක් බඳු උතුම් ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේට මම නමස්කාර කරමි.මාගේ නමස්කාරය වේවා !

## මිරිසවැටිය චෛත්‍යය වැඳීම

**අභය රාජ සධාතුක කේතුවරං (කුන්තවරං)**
**සුනිධාය කතං බහුමානිතං**
**සකල (ලෝක) හිතං පනමෙ සදා**
**මරිච වට්ටික චේතිය මුත්තමං**

දුටුගැමුණු රජු විසින් සර්වඥධාතු සහිත ජයකුන්තය මනා කොට නිදන් කොට කරවන ලද බොහෝ දෙනා විසින් බුහුමන් කරන ලද සියලු සත්ත්වයන්ට හිත සුව පිණිස පවත්වන්නාවූ උතුම් වූ මිරිස වැටි චෛත්‍ය රාජයාණන් වහන්සේට මම සැම කල්හිම නමස්කාර කරමි.මාගේ නමස්කාරය වේවා !



## රුවන්මැලි චෛත්‍යය වැඳීම

**සයිංසු යස්මිං සුගතස්ස ධාතුං**
**නිම්මාය රංසුජ්ජල බුද්ධ රූපං**
**සුවණ්ණ මාලීති පතීත නාමං**
**වන්‍දා මහං ථූපවරං මහග්ඝං**

යම් සර්වඥධාතු කෙනෙක් බුද්ධ රූපය මවා ප්‍රාතිහාර්ය පා රුවන්මැලි නම් වූ යම් චෛත්‍යයක සැතපුණු සේක්ද දුටුගැමුණු මහ රජු විසින් කරවන ලද ඒ චෛත්‍ය රාජයාණන් වහන්සේට මම නමස්කාර කරමි.මාගේ නමස්කාරය වේවා !

## ථූපාරාම චෛත්‍යය වැඳීම

**යස්මිං දක්ඛිණ මක්ඛකද්ච - මුනිනො පත්තප්පමානාතනු**
**ධාතුංචාපි නිධාය ලොක මහිතං -ජබ්බණ්ණ සොභාකුලෙ**
**දෙවානම් පියතිස්ස භූපතිවරො - කාරෙසි සද්ධාධනො**
**ථූපාරාම වරං නමාමි තමහං - අජ්ඣායිතං සත්ථුනා**

දෙවනපෑතිස් රජු විසින් බුදුරජුන්ගේ දකුණු අකු ධාතුව නිදන් කොට කරවූ සියලු ලෝකයා විසින් පුදනු ලැබුවා වූ ථූපාරාම චෛත්‍ය රාජයාණන් වහන්සේට මම නමස්කාර කරමි.මාගේ නමස්කාරය වේවා !

**පත්තප්පමාණං මුනිරාජ ධාතුයො**
**නිධාය ධාතුම්පිච දක්ඛිණක්කං**
**දෙවාදි තිස්සෙන කතං හි ථූපා**
**රාමාභිධානං පණමාමි භත්‍යා**

දකුණු අකුධාතුවද පතක් පමණ සර්වඥධාතුද නිදන්කොට දෙවනපෑතිස් රජතුමා විසින් කරවන ලද ථූපාරාම චෛත්‍ය රාජයාණන් වහන්සේට මම නමස්කාර කරමි.මාගේ නමස්කාරය වේවා !

## අභය ගිරි චෛත්‍යය වැඳීම

**කතනවමණිකම්මේ ධාතු ගබ්භේ සුරම්මේ**
**කනක වසභ කුච්ඡිං - ධාතුනං පූරයිත්වා**
**විහිතමභය රඤ්ඤෝ ධඤ්ඤ පුඤ්ඤාධි වාසෝ**
**අභයගිරි විහාරෙ චාරු ථූපං නමාමි**

කරණ ලද මාණික්‍ය කර්ම ඇති ධාතු ගර්භයෙහි ස්වර්ණ වෘෂභ රාජයකුගේ කුක්ෂියෙහි ධාතු පුරවා නිදන් කොට වළගම්බා මහ රජු විසින් කරවන ලද අභයගිරි විහාරයෙහි චෛත්‍යය රාජයාණන් වහන්සේට මම නමස්කාර කරමි.මාගේ නමස්කාරය වේවා !



## ජේතවනාරාම චෛත්‍යය වැඳීම

**පතිට්ඨ පෙත්වා ජින කාය බන්ධනං**
**සකේස ධාතුං සහ දෙහ ධාතුයො**
**මහා මහාසේන නරින්ද කාරිතං**
**සුචේතියං ජේතවනං නමාමහං**

සර්වඥයන් වහන්සේගේ පටි ධාතුව හා කේශධාතුවද ශාරීරික ධාතුන්ද නිදන්කොට මහසෙන් රජු විසින් කරවන ලද ජේතවන චෛත්‍යය රාජයාණන් වහන්සේට මම නමස්කාර කරමි. නමස්කාර වේවා !

## සේල චෛත්‍යය වැඳීම

**මහාදයෝ දේවගණේච නාගේ**
**නුසාසයි යත්ථ ඨිතෝ මුනින්දෝ**
**සද්ධම්ම හේම ද්ධජ භාසමානං**
**වන්දෙ සිලාචෙතිය මබ්භූතං තං**

මහත් දයා ඇත්තා වූ සර්වඥයන් වහන්සේ යම් තැනක වැඩහිඳ දෙවියන්ට සහ නාගයනට අනුශාසනා කළසේක්ද, සද්ධර්ම නැමැති ස්වර්ණමය ධජයෙන් බබලන්නා වූ අද්භූත වූ ශිලා චෛත්‍ය රාජයාණන් වහන්සේට මම නමස්කාර කරමි.මාගේ නමස්කාරය වේවා !

සසාවකෝ යත්‍ර නිසජ්ජ සත්‍රා
වරං සමාපත්ති සුඛං පවින්දි
ධාතුං පතිට්ඨාපිත මුණ්ණ ලොමං
සිලා මහා ථූප මහං නමාමි.

ශ්‍රාවකයන් සහිත සර්වඥයන් වහන්සේ සමවත් සුවයෙන් වැඩ සිටි තැන්හි ඌර්ණරෝම ධාතුව පිහිටුවා කළ ශෛල චෛත්‍ය රාජයාණන් වහන්සේට මම නමස්කාර කරමි.මාගේ නමස්කාරය වේවා !

## කතරගම කිරි වෙහෙර වැඳීම

මුනින්දො නිසින්නො යහිං දේවතානං
සමෙතාන මග්ගං සුදේසෙසි ධම්මං
මහාසේන දෙවස්ස සම්මානනීයං
නමෙ කාචරග්ගාම ථූපස්සඨානං

බුදුරජාණන් වහන්සේ යම් තැනක වැඩ හිඳ දෙවියන්ට ධර්මදේශනා කළසේක්ද ඒ ස්ථානයෙහි බඳනා ලද මහසෙන් දේවියන් විසින් පිදිය යුතුවූ කතරගම කිරිවෙහෙර චෛත්‍ය රාජයාණන් වහන්සේට මම නමස්කාර කරමි.මාගේ නමස්කාරය වේවා !



යහිං සමාධිං භගවා තහිං මුනි
නිසින්න සොණ්ණාසන කේසධාතුකං
ලද්ධා මහාසෙන නරින්ද කාරිතං
නමා මහං කාචරගාම චෙතියං

යම් තැනක වැඩ හිඳ සර්වඥයන් වහන්සේ සමාධියට සමවත් සේක්ද එතැන්හි වැඩහුන් ස්වර්ණාසනයද බුදුරජුන්ගෙන් ලත් කේශ ධාතුන් වහන්සේද නිදන්කොට මහසෙන් රජු විසින් කරවන ලද කතරගම කිරි වෙහෙර චෛත්‍ය රාජයාණන් වහන්සේට මම නමස්කාර කරමි.මාගේ නමස්කාරය වේවා !

## සෝමාවති චෛත්‍ය වන්දනාව

සම්බුද්ධ රාජවර පංකජ ධම්මරේණු
ඵස්සං මනුඤ්ඤ සිතරංසි විරාජමානං
බ්‍රහ්මාමරා සුරනරෙහි සුපූජිතං තං
වන්දාමහං සුගත දක්ඛිණ දන්ත ධාතුං

සම්මා සම්බුදු රජාණන් වහන්සේගේ මුඛ නැමැති පත්මයෙහි ධම්ම නැමැති රේණු ස්පර්ශයෙන් මනොඥවූ (සිත් කළු වූ) සිසිල් රැසින් බබලන්නා වූ බ්‍රහ්මයන් දෙවියන් මනුෂ්‍යයන් විසින් මනාව පුද සත්කාර කරන්නාවූ සුගතයන් වහන්සේගේ දකුණු දන්ත ධාතුන් වහන්සේට මම නමස්කාර කරමි.මාගේ නමස්කාරය වේවා !

# සත් බුදු පූජාව
# සහ
# සත් බුදු වන්දනාව

සම්පාදනය මාකෙළියේ අරිය ශීල හිමි.

## 01. විපස්සී බුදුරජාණන් වහන්සේට පූජාව

**දීපේහි ගන්‍ධ ධූපේහි - ගිලාන පච්ච යේහිච**
**පුප්ඵාදි වත්‍ථු ජාතෙහි - සුද්ධෙහි කප්පි යේහිච**
**විපස්සිං වර සම්බුද්ධං - ලෝක ජෙට්ඨං නරාසභං**
**පූජෙමි සුද්ධ චිත්තේන - නිබ්බානසුඛ සිද්ධියා**

ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස! හාත්පස අඳුර නසමින් බැබලෙන පහනින්ද, දසත පැතිරෙන මනහර සුගන්ධ ධූපයෙන්ද, අෂ්ඨපානාදී ප්‍රණීත ගිලන් පසින්ද, විසිතුරු මල් ආදී ශුද්ධ කැප වස්තු සමූහයෙන්ද, නිවන් සැප ලැබීම පිණිස පිරිසිදු සිතින් මුළු ලොවට ශ්‍රේෂ්ඨ විපස්සි බුදුරජාණන් වහන්සේට පූජා කරමි. පූජා වේවා!

**සාධු! සාධු !! සාධු !!!**



## විපස්සී බුදුරජාණන් වහන්සේට වන්දනාව

**විපස්සි නාථං චතුසච්ච දස්සිං**
**විසුද්ධ චිත්තං තිභවෙක කේතුං**
**සමන්ත සංක්ලෙස නුදං උදාරං**
**සුබත්‍ථිකො තං පණමෙ සදාහං**

ස්වයම්භූ ඥානයෙන් සර්වාකාරයෙන් චතුරාර්‍ය්‍ය සත්‍ය ධර්මයන් අවබෝධ කළා වූද, තුන්ලොවට අසහාය ධජයක් බඳු වූද, සතර මාර්ග ඥානයෙන් සියළු සංක්ලේස ධර්මයන් ප්‍රහාරණය කළා වූද, රහසිනුත් පවක් නැති බැවින් විසුද්ධ සිත් ඇත්තා වූද, ඒ විපස්සී සම්මා සම්බුදු රජාණන් වහන්සේට මම ලොව්තුරු සුව කැමතිව දොහොත් මුදුනේ තබා ආදර ගෞරවයෙන් නමස්කාර කරමි. මාගේ නමස්කාරය වේවා!

**සාධු! සාධු !! සාධු !!!**

## විපස්සී බුදුරජාණන් වහන්සේට වන්දනාව

**සො භගවා ඉතිපි විපස්සි සම්මා සම්බුද්ධො, විපස්සි සම්මා සම්බුද්ධෝ වත සෝ භගවා, තං භගවන්තං විපස්සිං සම්මා සම්බුද්ධං සරණං ගච්ඡාමි, තං භගවන්තං විපස්සිං සම්මා සම්බුද්ධං සිරසා නමාමි.**

ඒ විපස්සි බුදුරජාණන් වහන්සේ මෙසේද

සම්මා සම්බුද්ධ නම් වන සේක. ඒ විපස්සී බුදුරජාණන් වහන්සේ ඒකාන්තයෙන්ම සම්මා සම්බුද්ධ නම් වන සේක. ඒ විපස්සී බුදුරජාණන් වහන්සේ මම සරණ යමි. ඒ විපස්සී බුදුරජාණන් වහන්සේට මාගේ නමස්කාරය වේවා!

**සාධු! සාධු !! සාධු !!!**

**විජ්ජාචරණ සම්පන්නං - විපස්සිං විගතෝපමං**
**පාඨලිංච මහා බොධිං - නමාමි සිරසාදරං**

නැවත බුද්ධ ශූන්‍ය වූ එක් කල්පයකින් පසුව සාර නම් කල්පයෙහිදී ලොව පහළ වී වදාළ අෂ්ඨ විද්‍යා පසළොස් චරණ ධර්මයන්ගෙන් යුක්ත වූ ප්‍රමාණාතික්‍රාන්ත වූ රූපකාය සම්පත්තියෙන් හා ධර්මකාම සම්පත්තියෙන් යුක්ත වූ විපස්සි නම් යම් මුනින්ද්‍රයන් වහන්සේ නමක් ලොව පහළ වූ සේක්ද, ඒ බුදුරජාණන් වහන්සේටද, උන්වහන්සේට බුදුවීම සඳහා පිහිට වූ ''පලොල්'' නම් ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේටද මම නමස්කාර කරමි. මාගේ නමස්කාරය වේවා!

**සාධු! සාධු !! සාධු !!!**

## 02. සිඛී බුදුරජාණන් වහන්සේට පූජාව

**දීපේහි ගන්ධ ධූපේහි - ගිලාන පච්ච යේහිච**
**පුප්ඵාදි වත්‍ථු ජාතේහි - සුද්ධේ හි කප්පි යේහිච**
**සිඛී දසබලං සෙට්ඨං - සල්ල කත්තං අනුත්තරං**
**අජරාමර සුඛත්‍ථාය පූජේමි සුද්ධ චේතසා**



ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස! හාත්පස අඳුර නසමින් බැබලෙන පහනින්ද, දසත පැතිරෙන මනහර සුගන්ධ ධූපයෙන්ද, අෂ්ඨපානාදී ප්‍රණීත ගිලන් පසින්ද, විසිතුරු මල් ආදී ශුද්ධ කැප වස්තු සමූහයෙන්ද, අජරාමර නිවන් සුවය පිණිස දෙව් මිනිසුන්ගේ කෙළෙස් මුල් උදුරා දැමූ බැවින්, උතුම් ශල්‍ය වෛද්‍යවරයාණන් වූ සිඛී නම් වූ සුගත තථාගතයන් වහන්සේට අජරාමර නිවන් සුව පිණිස පිරිසිදු සිතින් පූජා කරමි. පූජා වේවා!

**සාධු! සාධු !! සාධු !!!**

## සිඛී බුදුරජාණන් වහන්සේට වන්දනාව

**සිද්ධංසිඛී සබ්බඤ්ඤු මනෝම පඤ්ඤං**
**දේවාති දේවං යතිනාථ භූතං**
**සන්තාරිතාවිං ජනතං භවණ්ණවා**
**වන්දාමි තං ලෝක ගරුං මුදාභං**

සියළු ගුණයෙන් සමෘධ වූ අලාමක ප්‍රඥාවක් ඇති දේවාති දේව වූ යතිසමූහයාට ප්‍රතිෂ්ටාධාර වූ ජන සමූහයා සංසාර සාගරයෙන් එතෙර කළා වූ ඒ මාගේ සිඛී නම් වූ සර්වඥරාජෝත්තමයාණන් වහන්සේට මම ශුද්ධ අධ්‍යාසයෙන් නමස්කාර කරමි. නමස්කාර වේවා!

**සාධු! සාධු !! සාධු !!!**

## සිඛී බුදුරජාණන් වහන්සේට වන්දනාව

**සෝ භගවා ඉතිපි සිඛී සම්මා සම්බුද්ධෝ, සිඛී සම්මා සම්බුද්ධෝ වත සෝ භගවා, තං භගවන්තං සිඛීං සම්මා සම්බුද්ධං සරණං ගච්ඡාමි. තං භගවන්තං සිඛිං සම්මා සම්බුද්ධං සිරසා නමාමි.**

ඒ සිඛී බුදුරජාණන් වහන්සේ මෙසේද සම්මා සම්බුද්ධ නම් වන සේක. ඒ සිඛී බුදුරජාණන් වහන්සේ ඒකාන්තයෙන්ම සම්මා සම්බුද්ධ නම් වන සේක. ඒ සිඛී බුදුරජාණන් වහන්සේ මම සරණ යමි. ඒ සිඛී බුදුරජාණන් වහන්සේට මාගේ නමස්කාරය වේවා!

**සාධු! සාධු !! සාධු !!!**

**සිඛී නාමං මහා වීරං - මහේසිං ජින පුංගවං**
**පුණ්ඩරිකංච තං බෝධිං - නමාමි සිරසාදරං**

නැවත බුද්ධ ශූන්‍ය වූ සැට කල්පයකින් පසුව මණ්ඩ නම් කල්පයෙහිදී ලොව පහළ වී වදාළ දිනන ලද ඉඳුරන් ඇත්තා වූ ද, මහත් ඍෂි සමූහයා විසින් පෙරටු කොට ගත්තා වූද, මහත් වීර්යය පරාක්‍රමයකින් යුක්ත වූ ''සිඛී'' නම් යම් මුනීන්ද්‍රයන් වහන්සේ නමක් ලොව පහළ වූ සේක්ද, ඒ බුදුරජාණන් වහන්සේට ද, උන්වහන්සේට බුදුවීම සඳහා පිහිට වී වදාළ



''ඇටඹ'' නම් ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේට ද, මෙම සියළු පූජාවෙන්ද පූජා කරමි. මම නමස්කාර කරමි. නමස්කාර වේවා.

**සාධු! සාධු !! සාධු !!!**

## 03. වෙස්සභූ බුදුරජාණන් වහන්සේට පූජාව

**දීපේහි ගන්ධ ධූපේහි - ගිලාන පච්ච යේහිච**
**පුප්ඵාදි වත්‍ථු ජාතේහි - සුද්ධේහි කප්පි යෙහිච**
**වෙස්සභුං නාම සම්බුද්ධං - ලෝක නාථං මහාමුනිං, සන්ති වර පදත්‍ථාය - භක්තියාදරේන පූජයෙ**

ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස! හාත්පස අඳුර නසමින් බැබලෙන පහනින්ද, දසත පැතිරෙන මනහර සුගන්ධ ධූපයෙන්ද, අෂ්ඨපානාදී ප්‍රණීත ගිලන් පසින්ද, විසිතුරු මල් ආදී ශුද්ධ කැප වස්තු සමූහයෙන්ද, ශාන්ත සීතල නිර්වාන සැප ලැබීම පිණිස, ලෝකස්වාමි වු වෙස්සභූ සම්මා සම්බුදු රජාණන් වහන්සේට භක්ත්‍යාදරයෙන් පූජා කරමි. පූජා වේවා!

**සාධු! සාධු !! සාධු !!!**

## වෙස්සභූ බුදුරජාණන් වහන්සේට වන්දනාව

**රත්තිංදිවංදේහ පභාව භාසං**
**සංඥාලිතං නේක කිලේස ජාලං**
**ලොකාතිගං නිච්ච ජනානු කම්පිං**
**වන්දේ මුදාහං මුනිවෙස්සභුංතං**

දිවා රෑ දෙකෙහි ශරීර ප්‍රභාවයෙන් බැබලුනා වූ සියළු කෙලෙසුන් මුලසුන් කොට ලොව්තුරා පදවියට පත් වූ මහා කාරුණික මුණිඳුයන් වහන්සේට මම ශ්‍රද්ධා භක්තියෙන් දොහොත් මුදුනේ තබා වැඳ නමස්කාර කරමි. මාගේ නමස්කාරය වේවා!

සාධු! සාධු !! සාධු !!!

## වෙස්සභූ බුදුරජාණන් වහන්සේට වන්දනාව

**සෝ භගවා ඉතිපි වෙස්සභූ සම්මා සම්බුද්ධෝ, වෙස්සභූ සම්මා සම්බුද්ධෝ වත සො භගවා, තං භගවන්තං වෙස්සභුං සම්මා සම්බුද්ධං සරණං ගච්ඡාමි, තං භගවන්තං වෙස්සභුං සම්මා සම්බුද්ධං සිරසා නමාමි.**

ඒ වෙස්සභූ බුදුරජාණන් වහන්සේ මෙසේද සම්මා සම්බුද්ධ නම් වන සේක. ඒ වෙස්සභූ බුදුරජාණන් වහන්සේ ඒකාන්තයෙන්ම සම්මා



සම්බුද්ධ නම් වන සේක. ඒ වෙස්සභූ බුදුරජාණන් වහන්සේ මම සරණ යමි. ඒ වෙස්සභූ බුදුරජාණන් වහන්සේට මාගේ නමස්කාරය වේවා!

**සාධු! සාධු !! සාධු !!!**

**ලෝක විදුං ලෝක නාථං - වෙස්සභුං සුඛ දායකං**
**සාල බෝධිංච කල්‍යාණං - නමාමි සිරසාදරං**

එම මණ්ඩ නම් කල්පයෙහිදීම නැවත බුද්ධාන්තරයකින් පසුව ලොව පහළ වී වදාළ සකල ලෝකය ඇතැඹුලක් සේ මැනවින් දැන වදාළ වූ සියලු ලෝ වැසියන්ට අසහාය පිහිටක් වූ දෙව් මිනිසුන්ට තිවර්ග සම්පත් සලසා දුන්නා වූ ''වෙස්සභූ'' නම් යම් මුනීන්ද්‍රයන් වහන්සේ නමක් පහළ වූ සේක් ද, ඒ බුදුරජාණන් වහන්සේට ද, උන්වහන්සේට බුදුවීම සඳහා පිහිට වී වදාළ සාල කල්‍යාණ නම් ජය ශ්‍රී මා බෝධීන් වහන්සේට ද, මම නමස්කාර කරමි. නමස්කාර වේවා!

**සාධු! සාධු !! සාධු !!!**

## 04. කකුසඳ බුදුරජාණන් වහන්සේට පූජාව

**දීපේහි ගන්ධ ධූපේහි - ගිලාන පච්ච යේහිච**
**පුප්ඵාදි වත්‍ථු ජාතෙහි - සුද්ධෙහි කප්පි යෙහිච**
**ලොකේක්ක ලොක නාථං - තං කකුසන්‍ධං මහාමුනිං**
**කිලෙසාමය නාසාය - භත්‍යාදරේන පූජයේ**

ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස! හාත්පස

අඳුර නසමින් බැබලෙන පහනින්ද, දසත පැතිරෙන මනහර සුගන්ධ ධූපයෙන්ද, අෂ්ඨපානාදී ප්‍රණීත ගිලන් පසින්ද, විසිතුරු මල් ආදී ශුද්ධ කැප වස්තු සමූහයෙන්ද, කෙලෙස් රෝග නැසීම සඳහා මුළු ලොවට ඇසක් බඳු වූ කකුසද සම්මා සම්බුදු රජාණන් වහන්සේට පූජා කරමි. පූජා වේවා!

**සාධු! සාධු !! සාධු !!!**

## කකුසඳ බුදුරජාණන් වහන්සේට වන්දනාව

**පඨමේව අස්මිං වරභද්ද කප්පේ**
**දිපදුත්තමත්තං සමුපාගතෝ යෝ**
**අමතංදදං තං කකුසන්‍ධ නාථං**
**පමුදාව වන්‍දෙ වර සන්ති කාමො**

මේ මහා භද්‍ර කල්පයෙහි පළමුව ලොවට අමා සුව දුන් ඒ කකුසඳ දීපදොත්තමයාණන් වහන්සේට මම ශ්‍රද්ධා ප්‍රමෝදයෙන් දොහොත් මුදුනේ තබා වැඳ නමස්කාර කරමි. මාගේ නමස්කාරය වේවා!

**සාධු! සාධු !! සාධු !!!**



## කකුසඳ බුදුරජාණන් වහන්සේට වන්දනාව

**සෝ භගවා ඉතිපි කකුසන්‍ධෝ සම්මා සම්බුද්ධෝ කකුසන්‍ධෝ සම්මා සම්බුද්ධෝ වත සෝ භගවා තං භගවන්තං කකුසන්‍ධං සම්මා සම්බුද්ධං සරණං ගච්ඡාමි තං භගවන්තං කකුසන්‍ධං සම්මා සම්බුද්ධං සිරසා නමාමි.**

ඒ කකුසඳ බුදුරජාණන් වහන්සේ මෙසේද සම්මා සම්බුද්ධ නම් වන සේක. ඒ කකුසඳ බුදුරජාණන් වහන්සේ ඒකාන්තයෙන්ම සම්මා සම්බුද්ධ නම් වන සේක. ඒ කකුසඳ බුදුරජාණන් වහන්සේ මම සරණ යමි. ඒ කකුසඳ බුදුරජාණන් වහන්සේට මාගේ නමස්කාරය වේවා!

**සාධු! සාධු !! සාධු !!!**

**කකුසන්‍ධං සත්ථ වාහං - මුනින්‍දං සුසමාහිතං**
**සිරීසං තස්ස බොධිංතං - නමාමි සිරසාදරං**

නැවත බුද්ධ ශූන්‍ය වූ තිස් එක් කල්පයකින් පසුව මේ මහා භද්‍ර කල්පයෙහි ප්‍රථම අනතඃකල්පයෙහිදීම ලොව පහළ වී වදාළ දමනය කරන ලද ඉඳුරන් ඇත්තා වූ මාර්ග දේශකත්වයෙන් සත්ථා වාහක නම් වූ ''කකුසඳ'' නම් යම් මුනීන්ද්‍රයන් වහන්සේ නමක් ලොව පහළ වූ සේක්ද, ඒ බුදුරජාණන් වහන්සේට ද, උන්වහන්සේට බුදුවීම සඳහා පිහිට වී වදාළ

''මහරී'' නම් ජය ශ්‍රී මහා බෝධින් වහන්සේට ද, මම නමස්කාර කරමි.නමස්කාර වේවා!

සාධු! සාධු !! සාධු !!!

## 05. කෝණාගමණ බුදුරජාණන් වහන්සේට පූජාව

**දීපේහි ගන්‍ධ ධූපේහි - ගිලාන පච්ච යේහිච**
**පුප්ඵාදි වත්‍ථු ජාතේහි - සුද්ධෙහි කප්පි යේහිච**
**කෝණාගමණං සම්බුද්ධං- වීතරාගං ගුණාලයං**
**සද්ධා පපුණ්ණ හදයෝ - නිබ්බානත්‍ථාය පුජයෙ**

ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස! හාත්පස අඳුර නසමින් බැබලෙන පහනින්ද, දසත පැතිරෙන මනහර සුගන්ධ ධූපයෙන්ද, අෂ්ඨපානාදී ප්‍රණීත ගිලන් පසින්ද, විසිතුරු මල් ආදී ශුද්ධ කැප වස්තු සමූහයෙන්ද, උත්තරීතර නිවන් සුව ලැබීම සඳහා අසම සම ගුණ ඇති ඒ කෝණාගමණ සම්මා සම්බුදු රජාණන් වහන්සේට පූජා කරමි. පූජා වේවා!

සාධු! සාධු !! සාධු !!!

## කෝණාගමණ බුදුරජාණන් වහන්සේට වන්දනාව

**භවණ්ණවා නිත්‍ථරණේ ජනානං**
**සුපාතු භූතං තරණී සමානං**



**භවන්තගුං ලොක හිතං මුනින්‍දං**
**නමාමි කොණාගම නාභිධානං**

ලෝක සත්වයා සංසාර සාගරයෙන් එතර වීමට තරණී භූත වූ සසර කෙළවර කළා වූ ලොවට හිත වූ, ඒ කෝණාගමන මුනිද්‍රයන් වහන්සේට මම නමස්කාර කරමි. මාගේ නමස්කාරය වේවා!

සාධු! සාධු !! සාධු !!!

## කෝණාගමණ බුදුරජාණන් වහන්සේට වන්දනාව

**සෝ භගවා ඉතිපි කෝණාගමණො සම්මා සම්බුද්ධෝ, කෝණාගමණෝ සම්මා සමබුද්ධො වත සෝ භගවා, තං භගවන්තං කෝණාගමණං සම්මා සම්බුද්ධං සරණං ගච්ඡාමි, තං භගවන්තං කෝණාගමණං සම්මා සම්බුද්ධං සිරසා නමාමි.**

ඒ කොණාගමණ බුදුරජාණන් වහන්සේ මෙසේද සම්මා සම්බුද්ධ නම් වන සේක. ඒ කොණාගමණ බුදුරජාණන් වහන්සේ ඒකාන්තයෙන්ම සම්මා සම්බුද්ධ නම් වන සේක. ඒ කොණාගමණ බුදුරජාණන් වහන්සේ මම සරණ යමි. ඒ කොණාගමණ බුදුරජාණන් වහන්සේට මාගේ නමස්කාරය වේවා!

සාධු! සාධු !! සාධු !!!

**මහේසිං කෝණාගමණං - බුද්ධං දස විලෝචනං**
**උදුම්බරංච තං බෝධිං - නමාමි සිරසාදරං**

නැවත බුද්ධාන්තරයකින් පසුව මේ භද්‍ර කල්පයෙ දෙවන අන්තඃකල්පයෙහිදී ලොව පහළ වී වදාළ සකල ධර්මයන් මනාව අවබෝධ කළා වූ නොපැකිල දක්නා වූ අනාවරණ ඥානයෙන් සමන්නාගත වූ ''කෝණාගමණ'' නම් යම් මුනීන්ද්‍රයන් වහන්සේ නමක් වූ සේක්ද ඒ බුදුරජාණන් වහන්සේටද, උන්වහන්සේට බුදුවීම සඳහා පිහිට වී වදාළ ''දිඹුල්'' නම් ජය ශ්‍රී මහා බෝධින් වහන්සේට ද, මම නමස්කාර කරමි. නමස්කාර වේවා!

**සාදු! සාදු!! සාදු!!!**

## 06. කස්සප බුදුරජාණන් වහන්සේට පූජාව

**දීපේහි ගන්ධ ධූපේහි - ගිලාන පච්ච යේහිච**
**පුප්ඵාදි වත්‍ථු ජාතේහි - සුද්ධෙ හි කප්පි යේහිච**
**කස්සපං නාම සම්බුද්ධං - මෝහක්ඛන්ධ විනෝදකං**
**අනුත්තරං සුඛත්‍ථාය - පීති භාරෙන පූජයේ**

ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස! හාත්පස අඳුර නසමින් බැබලෙන පහනින්ද, දසත පැතිරෙන මනහර සුගන්ධ ධූපයෙන්ද, අෂ්ඨපානාදී ප්‍රණීත ගිලන් පසින්ද, විසිතුරු මල් ආදී ශුද්ධ කැප වස්තු සමූහයෙන්ද,අනුත්තර නිර්වානය ලැබීම පිණිස මහා මොහස්කන්දය දුරුකළා වූ ඒ කාශ්‍යප බුදුරජාණන් වහන්සේට චිත්තප් ප්‍රසාදයෙන් පූජා කරමි. පූජා වේවා!

**සාධු! සාධු !! සාධු !!!**

## කාශ්‍යප බුදුරජාණන් වහන්සේට වන්දනාව

**වේනෙය්‍ය ජන්තු කමලාකර බෝධනාරිං**
**සද්ධම්ම රංසිං නිකාරාකර රංසිමාලිං**
**ලෝකුත්තරාමිත ගුණොදය ඤාණසාලිං**
**වන්දාමි කස්සප සමව්භව සන්ති නාථං**

සදහම් රැසින් විනේය සිත නැමති පද්මාකර ප්‍රබෝධ කළ දිවාකර සදෘශ වූ ඒ කාශ්‍යප ශාන්ති නායකයාණන් වහන්සේට දොහොත් මුදුනේ තබා නමස්කාර කරමි. නමස්කාර වේවා!

### කස්සප බුදුරජාණන් වහන්සේට වන්දනාව

**සො භගවා ඉතිපි කස්සපො සම්මා සම්බුදෙධා, කස්සපො සම්මා සම්බුද්ධො වත සො භගවා, තං භගවන්තං කස්සපං සම්මා සම්බුද්ධං සරණං ගච්ඡාමි, තං භගවන්තං කස්සපං සමම්මා සම්බුද්ධං සිරසා නමාමි.**

ඒ කස්සප බුදුරජාණන් වහන්සේ මෙසේද සම්මා සම්බුද්ධ නම් වන සේක. ඒ කස්සප බුදුරජාණන් වහන්සේ ඒකාන්තයෙන්ම සම්මා සම්බුද්ධ නම් වන සේක. ඒ කස්සප බුදුරජාණන් වහන්සේ මම සරණ යමි. ඒ කස්සප බුදුරජාණන් වහන්සේට මාගේ නමස්කාරය වේවා!

**සාධු! සාධු !! සාධු !!!**

**කස්සපං නාම සම්බුද්ධං - මරජිං පුරිසුත්තමං**
**නිග්‍රෝධංභායස බෝධිංච - නමාමි සිරසාදරං**

නැවත බුද්ධාන්තරයකින් පසුව මෙම භද්‍ර කල්පයෙහි තෙවන අන්තඃකල්පයෙහිදී ලොව පහළ වී වදාළ සියලු කෙලෙස් සතුරන් නැසුවාවූ ද මනා කොට පස් මරුන් පරදවන ලද්දාවූ ද සියලු සත්වයනට උත්තම වූ ''කස්සප'' නම් යම් මුනීන්ද්‍රයන් වහන්සේ නමක් ලොව පහළ වූ සේක්ද, ඒ බුදුරජාණන් වහන්සේට ද උන්වහන්සේට බුදුවීම සඳහා පිහිට වී වදාළ ''නුග'' නම් ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේට ද මම නමස්කාර කරමි. නමස්කාර වේවා !

**සාධු! සාධු !! සාධු !!!**



## 7. ගෞතම බුදුරජාණන් වහන්සේට පූජාව

**දීපේහි ගන්ධ ධූපේහි - ගිලාන පච්ච යේහිච**
**පුප්ඵාදි වත්ථු ජාතේහි - සුද්ධේහි කප්පි යේහිච**
**පඤ්ච මාර ජිතං වීරං - ගොතම සක්‍යං පුංගවං**
**විමුක්ති සුඛ ලාභාය - පූජෙමි ගාර වෙනහං**

ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස! හාත්පස අඳුර නසමින් බැබලෙන පහනින්ද, දසත පැතිරෙන මනහර සුගන්ධ ධූපයෙන්ද, අෂ්ඨපානාදී ප්‍රණීත ගිලන් පසින්ද, විසිතුරු මල් ආදී ශුද්ධ කැප වස්තු සමූහයෙන්ද,විමුක්ති සැප ලැබීම පිණිස ඒ ගෞතම ශාක්‍ය මුණින්ද්‍රයන් වහන්සේද මම ගෞරවයෙන් පූජා කරමි. පූජා වේවා!

**සාධු! සාධු !! සාධු !!!**

## ගෞතම සම්මා සම්බුදුරජාණන් වහන්සේට වන්දනාව

**යාවජ්ජ දිප්පති සුභං භුවනත්ත යස්මිං**
**යස්සානු සාසන වරංවිපුලත්ථ කාරිං**
**සම්පූත කිත්ති විසරං ජන සෙවනීයං**
**තං ගෝතමං නධි වරං සතතං නමාමි**

මහත් අර්ථයන් සිදුකරන්නාවූ යම් බුදුරජාණන් වහන්සේ කෙනෙකුගේ නිර්මල

සාසනය අද දක්වා තුන් ලොව බැබලේද, ඉතා පිරිසිදු කීර්තියක් ඇති, ජනයා විසින් සේවනය කළ යුතු වූ ඒ ගෞතම සර්වඥරාජෝත්තමන් වහන්සේට මම නිරන්තරයෙන් නමස්කාර කරමි. නමස්කාර වේවා!

සාධු! සාධු !! සාධු !!!

## ගෞතම බුදුරජාණන් වහන්සේට වන්දනාව

**සෝ භගවා ඉතිපි ගොතමෝ සම්මා සම්බුද්ධෝ, ගොතමෝ සම්මා සම්බුද්ධෝ වත සෝ භගවා, තං භගවන්තං ගොතමං සම්මා සම්බුද්ධං සරණං ගච්ඡාමි, තං භගවන්තං ගෝතමං සම්මා සම්බුද්ධං සිරසා නමාමි.**

ඒ ගෞතම බුදුරජාණන් වහන්සේ මෙසේද සම්මා සම්බුද්ධ නම් වන සේක. ඒ ගෞතම බුදුරජාණන් වහන්සේ ඒකාන්තයෙන්ම සම්මා සම්බුද්ධ නම් වන සේක. ඒ ගෞතම බුදුරජාණන් වහන්සේ මම සරණ යමි. ඒ ගෞතම බුදුරජාණන් වහන්සේට මාගේ නමස්කාරය වේවා!

සාධු! සාධු !! සාධු !!!

**අංගීරසං භූරිපඤ්ඤං - ගෝතමං සක්‍ය පුංගවං**
**අස්සත්ථංච මහා බෝධිං - නමාමි සිරසාදරං**



නැවත බුද්ධාන්තරයකින් පසුව මේ මහා භද්‍ර කල්පයෙහිම සතර වන අනතඃකල්පය වන මෙම බුද්ධාන්තරයෙහි ලොව පහළ වී වදාළ මහා ප්‍රඥා වූ ශාක්‍ය පුත්‍රයන් පිරිවරා ගත්තා වූ ලෝක සත්වයාට එකම පිහිටක් වූ ''ගෞතම'' නම් ගොත්‍ර නාමයෙන් ජනාදරයට පත් වූ අප සිද්ධාර්ථ ගෞතම බුදුරජාණන් වහන්සේට ද උන්වහන්සේට බුදුවීම සඳහා පිහිට වී වදාළ ''අස්සත්ථ'' නම් ජය ශ්‍රී මහා බෝධින් වහන්සේටද මෙම සියලු පූජාවන්ද සාදර ගෞරවයෙන් පූජා කරමී. පූජාවේවා! මම නමස්කාර කරමි.

සාධු! සාධු !! සාධු !!!

# අටවිසි බුද්ධ පූජාව
# සහ
# අටවිසි බුද්ධ වන්දනා

**නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස**
**නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස**
**නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස**

ඒ භාග්‍යවත් අරහත් සම්මා සම්බුදු රජාණන් වහන්සේට මාගේ නමස්කාරය වේවා!!!

## ආරාධනාව

**යාවතා භගවා ලෝකේ**
**තිට්ඨෙය්‍ය තව**
**සාසනංතාවතා පතිගණ්හාතු**
**පූජා ලොකානු කම්පයා**

''ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස'' යම්තාක් ඔබ වහන්සේගේ ශාසනය ලොව පවතීද ඒතාක් ලෝකානුකම්පාවෙන් සියලු පූජාවන් පිළිගන්නා



සේක්වා!

## 01. තණ්හංකර බුදුරජාණන් වහන්සේට පූජාව

**දීපේහි ගන්ධ ධූපේහි - ගිලාන පච්චයේහිච**
**පුප්ඵාදි වත්ථු ජාතේහි - සුද්ධේහි කප්පියේහිච**
**අනන්ත ගුණ ධාරෙන්තං- නාථං තණ්හංකරං ජිනං**
**සුද්ධ චිත්ත ප්ප සාදෙන - භත්‍යාදරෙන පූජයේ**

ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස ! හාත්පස අඳුර නසමින් බැබලෙන පහනින්ද, දසත පැතිරෙන මනහර සුගන්ධ ධූපයෙන්ද, අෂ්ඨපානාදී ප්‍රණීත ගිලන් පසින්ද, විසිතුරු මල් ආදී ශුද්ධ කැප වස්තු සමූහයෙන්ද, පස්මරුන් දිනූ සත්ත්වයන්ට පිහිට වූ අනන්ත මහා ගුණ දරන්නා වූ තණ්හංකර බුදුරජාණන් වහන්සේට පිරිසිදු වූ ප්‍රසන්න සිතින් භත්‍යාදරයෙන් පූජා කරමි. පූජා වේවා!

**සාධු ! සාධු !! සාධු !!!**

**තණ්හංකර බුදුරජාණන් වහන්සේ වන්දනාව**

**සෝ භගවා ඉතිපි තණ්හංකරෝ සම්මා සම්බුද්ධෝ, තණ්හංකරෝ සම්මා සම්බුද්ධෝ වත සෝ භගවා, තං භගවන්තං තණ්හංකරං සම්මා සම්බුද්ධං සරණං ගච්ඡාමි. තං භගවන්තං තණ්හංකරං සම්මා සම්බුද්ධං සිරසා නමාමි.**

ඒ තණ්හංකර බුදුරජාණන් වහන්සේ මෙසේද සම්මා සම්බුද්ධ නම් වන සේක. ඒ තණ්හංකර බුදුරජාණන් වහන්සේ ඒකාන්තයෙන්ම සම්මා සම්බුද්ධ නම් වන සේක. ඒ තණ්හංකර බුදුරජාණන් වහන්සේ මම සරණ යමි. ඒ තණ්හංකර බුදුරජාණන් වහන්සේට මාගේ නමස්කාරය වේවා!

**තණ්හංකර බුදුරජාණන් වහන්සේට වන්දනා කිරීම**

**තණ්හංකරං මහා වීරං -මුනින්දං ලෝක නායකං**
**සත්තපණ්ණිං මහා බෝධිං - නමාමි සිරසාදරං**

මේ මහා භද්‍ර කල්පයට සාරාසංඛ්‍ය කල්ප ලක්ෂයකින් මත්තෙහි සේල නම් අසංඛ්‍ය තුළ සාරමණ්ඩ නම් කල්පයෙහි දී ලොව පහළ වී වදාළ තුන් ලොවට නායක වූ, මහත් වීරියකින් යුක්ත වූ, ''තණ්හංකර'' නම් යම් මුනීන්ද්‍රයාණන් වහන්සේ නමක් වූ සේක්ද? ඒ බුදු රජාණන් වහන්සේටද උන්වහන්සේට බුදුවීම සඳහා පිහිට වී වදාළ ''සත්තපණ්ණී'' නම් ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේටද මම නමස්කාර කරමි. මෙම සියළු පූජාවන් ද සාදරයෙන් පූජා කරමි. පූජා වේවා!

**සාධු ! සාධු !! සාධු !!!**



## 02. මේධංකර බුදුරජාණන් වහන්සේට පූජාව

**දීපේහි ගන්ධ ධූපේහි - ගිලාන පච්චයේහිච**
**පුප්ඵාදි වත්ථු ජාතේහි - සුද්ධේහි කප්පියේහිච**
**අනන්ත ගුණ ධාරෙන්තං- නාථං මේධංකරං ජිනං**
**සුද්ධ චිත්තප්ප සාදෙන - භත්‍යාදරෙන පූජයෙ**

ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස ! හාත්පස අඳුර නසමින් බැබලෙන පහනින්ද, දසත පැතිරෙන මනහර සුගන්ධ ධූපයෙන්ද, අෂ්ඨපානාදී ප්‍රණීත ගිලන් පසින්ද, විසිතුරු මල් ආදී ශුද්ධ කැප වස්තු සමූහයෙන්ද, පස්මරුන් දිනූ සත්ත්වයන්ට පිහිට වූ අනන්ත මහා ගුණය දරන්නා වූ මේධංකර බුදුරජාණන් වහන්සේට පිරිසිදු වූ ප්‍රසන්න සිතින් භත්‍යාදරයෙන් පූජා කරමි. පූජා වේවා!

**සාධු ! සාධු !! සාධු !!!**

**මේධංකර බුදුරජාණන් වහන්සේට වන්දනාව**

**සො භගවා ඉතිපි මේධංකරෝ සම්මා සමබුද්ධෝ, මේධංකරෝ සම්මා සම්බුද්ධෝ වත සෝ භගවා, තං භගවන්තං මේධංකරං සම්මා සම්බුද්ධං සරණං ගච්ඡාමි. තං භගවන්තං මේධංකරං සම්මා සම්බුද්ධං සිරසා නමාමි.**

ඒ මේධංකර බුදුරජාණන් වහන්සේ මෙසේද

සම්මා සම්බුද්ධ නම් වන සේක. ඒ මේධංකර බුදුරජාණන් වහන්සේ ඒකාන්තයෙන්ම සම්මා සම්බුද්ධ නම් වන සේක. ඒ මේධංකර බුදුරජාණන් වහන්සේ මම සරණ යමි. ඒ මේධංකර බුදුරජාණන් වහන්සේට මාගේ නමස්කාරය වේවා!

**මේධංකර බුදුරජාණන් වහන්සේට වන්දනාව**

**මහායසං ලෝකනාථං - මේධංකරං විනායකං**
**කිංසු කංච තස්ස බෝධිං - නමාමි සිරසාදරං**

එම සාරමණ්ඩ නම් කල්පයෙහිදීම නැවත බුද්ධාන්තරයකින් පසුව ලෝක සත්වයන් මනා කොට හික්මන ලද්දා වූ, මහත් යස පිරිවරින් යුක්ත වූ, තුන් ලෝකවාසීන්ට මහත් පිටුවහලක් වූ ''මේධංකර'' නම් යම් මුනීන්ද්‍රයන් වහන්සේ නමක් ලොව පහළ වී වදාළ සේක් ද, ඒ බුදුරජාණන් වහන්සේට ද උන්වහන්සේ බුදුවීම සඳහා පිහිට වී වදාළ ''කැළ'' නම් ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේට ද මම නමස්කාර කරමි. මේ සියළු පූජාවන් ද සාදරයෙන් ගෞරවයෙන් පූජා කරමි. පූජාවේවා!

**සාධු ! සාධු !! සාධු !!!**



## 03. සරණංකර බුදුරජාණන් වහන්සේට පූජාව

**දීපේහි ගන්ධ ධූපේහි - ගිලාන පච්චයේහිච**
**පුප්ඵාදි වත්‍ථු ජාතේහි - සුද්ධේහි කප්පියේහිච**
**අනන්ත ගුණ ධාරෙන්තං- ජිනංච සරණංකරං**
**සුද්ධ චිත්තප්ප සාදෙන - භත්‍යාදරෙන පූජයෙ**

ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස ! හත්පස අඳුර නසමින් බැබලෙන පහනින්ද, දසත පැතිරෙන මනහර සුගන්ධ ධූපයෙන්ද, අෂ්ඨපානාදී ප්‍රණීත ගිලන් පසින්ද, විසිතුරු මල් ආදී ශුද්ධ කැප වස්තු සමූහයෙන්ද, පස්මරුන් දිනූ සත්ත්වයන්ට පිහිට වූ අනන්ත සෘද්ධිය දරන්නා වූ සරණංකර බුදුරජාණන් වහන්සේටද පිරිසිදු වූ ප්‍රසන්න සිතින් භත්‍යාදරයෙන් පූජා කරමි. පූජා වේවා!

**සාධු ! සාධු !! සාධු !!!**

**සරණංකර බුදුරජාණන් වහන්සේට වන්දනාව**

**සෝ භගවා ඉතිපි සරණංකරෝ සම්මා සම්බුද්ධෝ, සරණංකරෝ සම්මා සම්බුද්ධෝ වත සෝ, භගවා, තං භගවන්තං සරණංකරං සම්මා සම්බුද්ධං සරණං ගච්ඡාමි. තං භගවන්තං සරණංකරං සම්මා සම්බුද්ධං සිරසා නමාමි.**

ඒ සරණංකර බුදුරජාණන් වහන්සේ මෙසේද සම්මා සම්බුද්ධ නම් වන සේක. ඒ සරණංකර

බුදුරජාණන් වහන්සේ ඒකාන්තයෙන්ම සම්මා සම්බුද්ධ නම් වන සේක. ඒ සරණංකර බුදුරජාණන් වහන්සේ මම සරණ යමි. ඒ සරණංකර බුදුරජාණන් වහන්සේට මාගේ නමස්කාරය වේවා!

**සරණංකර බුදුරජාණන් වහන්සේට වන්දනාව**

**දේව දේවං මහා වීරං - මහේසිං සරණංකරං**<br>**පිප්ඵලිංච මහා බෝධිං - නමාමි සිරසාදරං**

එම සාරමණ්ඩ නම් කල්පයේදීම නැවත බුද්ධාන්තරයකින් පසුව ලොව පහළ වී වදාළ වූ දෙවියන් ට දෙවි වූ මහත් වික්‍රමයකින් යුක්ත වූ මහත් ඍෂි සමූහයා විසින් පිරිවරා ගන්නා ලද ''සරණංකර'' නම් යම් මුනීන්ද්‍රයන් වහන්සේටද, උන්වහන්සේට බුදුවීම සඳහා පිහිට වී වදාළ ''පුලිල'' නම් ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේටද මම නමස්කාර කරමි. මෙම සියළු පූජාවන් ද සාදරයෙන් ගෞරවයෙන් පූජා කරමි. පූජා වේවා!

**සාධු ! සාධු !! සාධු !!!**

## 04. දීපංකර බුදුරජාණන් වහන්සේට පූජාව

**දීපේහි ගන්ධ ධූපේහි - ගිලාන පච්චයේහිච**<br>**පුප්ඵාදි වත්‍ථු ජාතේහි - සුද්ධේහි කප්පියේහිච**<br>**අනන්ත ගුණ ධාරෙන්තං- නාථං දීපංකරං මුනිං**<br>**සුද්ධ චිත්තප්ප සාදේන - භත්‍යාදරේන පූජයේ**



ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස! හත්පස අඳුර නසමින් බැබලෙන පහනින්ද, දසත පැතිරෙන මනහර සුගන්ධ ධූපයෙන්ද, අෂ්ඨපානාදී ප්‍රණීත ගිලන් පසින්ද, විසිතුරු මල් ආදී ශුද්ධ කැප වස්තු සමූහයෙන්ද, පස්මරුන් දිනූ සත්ත්වයන්ට පිහිට වූ අනන්ත ඥාණය දරන්නා වූ දීපංකර බුදුරජාණන් වහන්සේට පිරිසිදු වූ ප්‍රසන්න සිතින් භත්‍යාදරයෙන් පූජා කරමි. පූජා වේවා!

**සාධු ! සාධු !! සාධු !!!**

**දීපංකර බුදුරජාණන් වහන්සේ වන්දනා ගාථාව**

**සො භගවා ඉතිපි දීපංකරෝ සම්මා සම්බුද්ධෝ දීපංකරෝ සම්මා සම්බුද්ධෝ වත සෝ භගවා තං භගවන්තං දීපංකරං සම්මා සම්බුද්ධං සරණං ගච්ඡාමි. තං භගවන්තං දීපංකරං සම්මා සම්බුද්ධං සිරසා නමාමි.**

ඒ දීපංකර බුදුරජාණන් වහන්සේ මෙසේද සම්මා සම්බුද්ධ නම් වන සේක. ඒ දීපංකර බුදුරජාණන් වහන්සේ ඒකාන්තයෙන්ම සම්මා සම්බුද්ධ නම් වන සේක. ඒ දීපංකර බුදුරජාණන් වහන්සේ මම සරණ යමි. ඒ දීපංකර බුදුරජාණන් වහන්සේට මාගේ නමස්කාරය වේවා!

දීපංකර බුදුරජාණන් වහන්සේට වන්දනාව

**ජුතිංධරං මහා නාගං - දීපංකරං මහා මුනිං**
**පිප්ඵලිංච මහා බෝධිං - නමාමි සිරසාදරං**

එම සාර මණ්ඩ නම් කල්පයේදීම නැවත බුද්ධාන්තරයකින් පසුව මහානර්ඝ වූ ප්‍රඥා ලෝකයෙන් මෝහන්ධ කාරය දුරුකොට තුන් ලොව එකෙළි කළා වූ ''දීපංකර'' නම් මුනීන්ද්‍රයන් වහන්සේට ද උන්වහන්සේට බුදුවීම සඳහා පිහිට වී වදාළ ''පුලිල'' නම් ජය ශ්‍රී මහා බෝධින් වහන්සේටද මම නමස්කාර කරමි. මෙම සියලු පූජාවන්ද සාදරයෙන් ගෞරවයෙන් පූජා කරමි. පූජා වේවා!

**සාධු ! සාධු !! සාධු !!!**

## 05. කොණ්ඩඤ්ඤ බුදුරජාණන් වහන්සේට පූජාව

**දීපේහි ගන්ධ ධූපේහි - ගිලාන පච්චයේහිච**
**පුප්ඵාදි වත්‍ථු ජාතේහි - සුද්ධේහි කප්පියේහිච**
**අනන්ත පුඤ්ඤං ධාරෙන්තං - කොණ්ඩඤ්ඤං ද්විපදුත්තමං**
**සුද්ධ චිත්තප්ප සාදෙන - භත්‍යාදරෙන පූජයෙ**

ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස! හාත්පස අඳුර නසමින් බැබලෙන පහනින්ද, දසත පැතිරෙන මනහර සුගන්ධ ධූපයෙන්ද, අෂ්ඨපානාදී ප්‍රණීත ගිලන් පසින්ද, විසිතුරු මල් ආදී ශුද්ධ කැප වස්තු



සමූහයෙන්ද, පස්මරුන් දිනූ සත්ත්වයන්ට පිහිට වූ අනන්ත පිං ගුණය දරන්නා වූ කොණ්ඩඤ්ඤ දීපදෝත්තමයන් වහන්සේට පිරිසිදු වූ ප්‍රසන්න සිතින් භත්‍යාදරයෙන් පූජා කරමි. පූජා වේවා!

**සාධු ! සාධු !! සාධු !!!**

කොණ්ඩඤ්ඤ බුදුරජාණන් වහන්සේට වන්දනාව

**සෝ භගවා ඉතිපි කොණ්ඩඤ්ඤො සම්මා සම්බුද්ධො, කොණ්ඩඤ්ඤො සම්මා සම්බුද්ධො වත සෝ භගවා, තං භගවන්තං කොණ්ඩඤ්ඤං සම්මා සම්බුද්ධං සරණං ගච්ඡාමි. තං භගවන්තං කොණ්ඩඤ්ඤං සම්මා සම්බුද්ධංසිරසා නමාමි.**

ඒ කොණ්ඩඤ්ඤ බුදුරජාණන් වහන්සේ මෙසේද සම්මා සම්බුද්ධ නම් වන සේක. ඒ කොණ්ඩඤ්ඤ බුදුරජාණන් වහන්සේ ඒකාන්තයෙන්ම සම්මා සම්බුද්ධ නම් වන සේක. ඒ කොණ්ඩඤ්ඤ බුදුරජාණන් වහන්සේ මම සරණ යමි. ඒ කොණ්ඩඤ්ඤ බුදුරජාණන් වහන්සේට මාගේ නමස්කාරය වේවා!

කොණ්ඩඤ්ඤ බුදුරජාණන් වහන්සේට වන්දනාව

**මුනින්දං ජන පාමොක්ඛං - කොණ්ඩඤ්ඤං ලෝකපූජිතං**
**සාල බෝධිංච කල්‍යාණං - නමාමි සිරසාදරං**

නැවත බුද්ධ ශූන්‍ය වූ කල්ප අසංඛ්‍යයකින් පසුව සාර නම් වූ කල්පයෙහි සියලු ජනයාට ශ්‍රේෂ්ඨ වූ සියලු ලෝවැසියන් විසින් පුදන ලද්දා වූ කොණ්ඩඤ්ඤ නම් යම් මුනීන්ද්‍රයන් වහන්සේ නමක් ලොව පහළ වූ සේක් ද, ඒ බුදුරජාණන් වහන්සේටද උන්වහන්සේට බුදු වීම සඳහා පිහිට වී වදාළ ''සාල කල්‍යාණ'' නම් ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේටද මම නමස්කාර කරමි. සියලු පූජාවන්ද සාදර ගෞරවයෙන් පූජා කරමි. පූජා වේවා!

**සාධු ! සාධු !! සාධු !!!**

## 06. මංගල බුදුරජාණන් වහන්සේට පූජාව

**දීපේහි ගන්ධ ධූපේහි - ගිලාන පච්චයේහිච**
**පුප්ඵාදි වත්‍ථු ජාතේහි - සුද්ධේහි කප්පියේහිච**
**අනන්ත ගුණ ධාරෙන්තං- මංගලං පවරං ජිනං**
**සුද්ධ චිත්තප්ප සාදේන - භත්‍යාදරේන පූජයේ**

ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස ! හාත්පස අඳුර නසමින් බැබලෙන පහනින්ද, දසත පැතිරෙන මනහර සුගන්ධ ධූපයෙන්ද, අෂ්ඨපානාදී ප්‍රණීත ගිලන් පසින්ද, විසිතුරු මල් ආදී ශුද්ධ කැප වස්තු සමූහයෙන්ද, පස්මරුන් දිනූ සත්ත්වයන්ට පිහිට වූ අනන්ත පිං ගුණ දරන්නා වූ මංගල බුදුරජාණන් වහන්සේට පිරිසිදු වූ ප්‍රසන්න සිතින් භත්‍යාදරයෙන් පූජා කරමි. පූජා වේවා!



### මංගල බුදුරජාණන් වහන්සේට වන්දනාව

**සො භගවා ඉතිපි මංගලෝ සම්මා සම්බුද්ධෝ, මංගලෝ සම්මා සම්බුද්ධෝ වත සෝ භගවා, තං භගවන්තං මංගලං සම්මා සම්බුද්ධං සරණං ගච්ඡාමි. තං භගවන්තං මංගලං සම්මා සම්බුද්ධං සිරසා නමාමි.**

ඒ මංගල බුදුරජාණන් වහන්සේ මෙසේද සම්මා සම්බුද්ධ නම් වන සේක. ඒ මංගල බුදුරජාණන් වහන්සේ ඒකාන්තයෙන්ම සම්මා සම්බුද්ධ නම් වන සේක. ඒ මංගල බුදුරජාණන් වහන්සේ මම සරණ යමි. ඒ මංගල බුදුරජාණන් වහන්සේට මාගේ නමස්කාරය වේවා!

### මංගල බුදුරජාණන් වහන්සේට වන්දනාව

**ලෝකාලෝක කරං සෙට්ඨං-මංගලං පුරිසුත්තමං**
**නාග බෝධිංච කල්‍යාණං - නමාමි සිරසාදරං**

නැවත බුද්ධ ශූන්‍ය වූ කල්ප අසංඛ්‍යයකින් පසුව ලොව පහළ වූ සාර මණ්ඩ නම් කල්පයෙහි තුන් ලොව ඒකාලෝක කළා වූ නර ශ්‍රේෂ්ඨ වූ නරෝත්තම වූ ''මංගල'' නම් බුදුරජාණන් වහන්සේටද උන්වහන්සේට බුදු වීම සඳහා පිහිට වී වදාළ ''නාග කල්‍යාණ'' නම් ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේට ද මම නමස්කාර කරමි. මෙම සියළු පූජාවන් ද සාදර ගෞරවයෙන් පූජා කරමි. පූජා වේවා!

**සාධු ! සාධු !! සාධු !!!**

## 07. සුමන බුදුරජාණන් වහන්සේට පූජාව

**දීපේහි ගන්ධ ධූපේහි - ගිලාන පච්චයේහිච**
**පුප්ඵාදි වත්‍ථු ජාතේහි - සුද්ධේහි කප්පියේහිච**
**අනන්ත තේජ ධාරෙන්තං- සුගතං සුමනං ජිනං**
**සුද්ධ චිත්තප්ප සාදේන - භත්‍යාදරේන පූජයේ**

ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස ! හත්පස අඳුර නසමින් බැබලෙන පහනින්ද, දසත පැතිරෙන මනහර සුගන්ධ ධූපයෙන්ද, අෂ්ඨපානාදී ප්‍රණීත ගිලන් පසින්ද, විසිතුරු මල් ආදී ශුද්ධ කැප වස්තු සමූහයෙන්ද, පස්මරුන් දිනූ සත්ත්වයන්ට පිහිට වූ අනන්ත තේජස් දරන්නා වූ තණ්හංකර බුදුරජාණන් වහන්සේට පිරිසිදු වූ ප්‍රසන්න සිතින් භක්‍ත්‍යාදරයෙන් පූජා කරමි. පූජා වේවා!

සාධු ! සාධු !! සාධු !!!

### සුමන බුදුරජාණන් වහන්සේට වන්දනාව

**සො භගවා ඉතිපි සුමනෝ සම්මා සම්බුද්ධො, සුමනෝ සම්මා සම්බුද්ධෝ වත සො භගවා, තං භගවන්තං සුමනං සම්මා සම්බුද්ධං සරණං ගච්ඡාමි. තං භගවන්තං සුමනං සම්මා සම්බුද්ධං සිරසා නමාමි.**

ඒ සුමන බුදුරජාණන් වහන්සේ මෙසේද සම්මා සම්බුද්ධ නම් වන සේක. ඒ සුමන බුදුරජාණන් වහන්සේ ඒකාන්තයෙන්ම සම්මා සම්බුද්ධ නම් වන සේක. ඒ සුමන බුදුරජාණන් වහන්සේ මම සරණ යමි. ඒ සුමන බුදුරජාණන් වහන්සේට මාගේ නමස්කාරය වේවා!



### සුමන බුදුරජාණන් වහන්සේට වන්දනා කිරීම

**සුමනාතී සුමනං ධීරං - සම්බුද්ධං සුමනං ජිනං**
**නාගං බෝධිංච කල්‍යාණං - නමාමි සිරසාදරං**

එම සාරමණ්ඩ නම් කල්පයේදීම නැවත බුද්ධාන්තරයකින් පසුව ලොව පහළ වී වදාළ නික්ලේෂී භාවයෙන් අතිපාරිශුද්ධ වූ ස්වයංභූ ඥානයෙන් සියළු ධර්මයෙන් අවබෝධ කොට වදාළ වූ පස්මරුන් දිනූ බැවින් ජිනෙන්ද්‍ර වූ ''සුමන'' නම් යම් බුදුරජාණන් වහන්සේ නමක් ලොව පහළ වූ සේක්ද, ඒ බුදුරජාණන් වහන්සේටද, උන්වහන්සේට බුදුවීම සඳහා පිහිට වී වදාළ නාග කල්‍යාණ නම් ''ජය ශ්‍රී මහා බෝධීන්'' වහන්සේට ද මම නමස්කාර කරමි. මෙම සියළු පූජාවන් ද සාදර ගෞරවයෙන් පූජා කරමි. පූජා වේවා!

සාධු ! සාධු !! සාධු !!!

## 08.රේවත බුදුරජාණන් වහන්සේට පූජා ගාථාව

**දීපේහි ගන්ධ ධූපේහි - ගිලාන පච්චයේහිච**
**පුප්ඵාදි වත්ථු ජාතේහි - සුද්ධේහි කප්පියේහිච**
**අනන්ත තේජ ධාරෙන්තං- නාථං රේවත මුත්තමං**
**සුද්ධ චිත්තප්ප සාදේන - භත්‍යාදරේන පූජයේ**

ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස ! හාත්පස අඳුර නසමින් බැබලෙන පහනින්ද, දසත පැතිරෙන මනහර සුගන්ධ ධූපයෙන්ද, අෂ්ඨපානාදී ප්‍රණීත ගිලන් පසින්ද, විසිතුරු මල් ආදී ශුද්ධ කැප වස්තු සමූහයෙන්ද, සත්ත්වයන්ට ශ්‍රේෂ්ඨ වූ අනන්ත ගුණය දරන්නා වූ රේවත බුදුරජාණන් වහන්සේට පිරිසිදු වූ ප්‍රසන්න සිතින් භක්ත්‍යාදරයෙන් පූජා කරමි. පූජා වේවා!

සාධු ! සාධු !! සාධු !!!

### රේවත බුදුරජාණන් වහන්සේට වන්දනාව

**සෝ භගවා ඉතිපි රෙවතෝ සම්මා සම්බුද්ධෝ, රෙවතෝ සම්මා සම්බුද්ධෝ වත සෝ භගවා, තං භගවන්තං රේවතං සම්මා සම්බුද්ධං සරණං ගච්ඡාමි. තං භගවන්තං රේවතං සම්මා සම්බුද්ධං සිරසා නමාමි.**



ඒ රේවත බුදුරජාණන් වහන්සේ මෙසේද සම්මා සම්බුද්ධ නම් වන සේක. ඒ රේවත බුදුරජාණන් වහන්සේ ඒකාන්තයෙන්ම සම්මා සම්බුද්ධ නම් වන සේක. ඒ රේවත බුදුරජාණන් වහන්සේ මම සරණ යමි. ඒ රේවත බුදුරජාණන් වහන්සේට මාගේ නමස්කාරය වේවා!

### රේවත බුදුරජාණන් වහන්සේට වන්දනාව

**තිලෝකදීපං සම්බුද්ධං - රේවතං රති වඩ්ඪනං**
**නාග බෝධිං ච කල්‍යාණං - නමාමි සිරසාදරං**

එම සාරමණ්ඩ නම් කල්පයේදීම නැවත බුද්ධාන්තරයකින් පසුව ලොව පහළ වී වදාළ තුන් ලොවට උතුම් ප්‍රදීපස්ථම්භයක් බඳු වූ චතුස් සත්‍ය ධර්මයන් මනාව අවබෝධ කළා වූ සියළු ලෝවැසියන්ගේ සිත් පහන් කළා වූ ''රේවත'' නම් යම් බුදුරජාණන් වහන්සේ නමක් ලොව පහළ වූ සේක් ද ඒ බුදුරජාණන් වහන්සේටද, උන්වහන්සේට බුදුවීම සඳහා පිහිට වී වදාළ ''නාග කල්‍යාණ'' නම් ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේටද මම නමස්කාර කරමි. මෙම සියළු පූජාවන්ද සාදර ගෞරවයෙන් පූජා කරමි. පූජා වේවා!

සාධු ! සාධු !! සාධු !!!

## 09. සෝභිත බුදුරජාණන් වහන්සේට පූජාව

**දීපේහි ගන්ධ ධූපේහි - ගිලාන පච්චයේහිච**
**පුප්ඵාදි වත්‍ථු ජාතේහි - සුද්ධෙහි කප්පියේහිච**
**අනන්ත තේජ ධාරෙන්තං- සොභිතං ජින පුංගවං**
**සුද්ධ චිත්තප්ප සාදේන - භත්‍යාදරේන පූජයේ**

ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස ! හාත්පස අඳුර නසමින් බැබලෙන පහනින්ද, දසත පැතිරෙන මනහර සුගන්ධ ධූපයෙන්ද, අෂ්ඨපානාදී ප්‍රණීත ගිලන් පසින්ද, විසිතුරු මල් ආදී ශුද්ධ කැප වස්තු සමූහයෙන්ද, පස්මරුන් දිනූ ලොවට නායක වූ අනන්ත ගුණ සම්පන්න වූ සෝභිත බුදුරජාණන් වහන්සේට පිරිසිදු වූ ප්‍රසන්න සිතින් භත්‍යාදරයෙන් පූජා කරමි. පූජා වේවා!

සාධු ! සාධු !! සාධු !!!

**සෝභිත බුදුරජාණන් වහන්සේට වන්දනාව**

**සො භගවා ඉතිපි සෝභිතො සම්මා සම්බුද්ධෝ, සොභිතෝ සම්මා සම්බුද්ධෝ වත සො භගවා, තං භගවන්තං සෝභිතං සම්මා සම්බුද්ධං සරණං ගච්ඡාමි. තං භගවන්තං සෝභිතං සම්මා සම්බුද්ධං සිරසා නමාමි.**



ඒ සෝභිත බුදුරජාණන් වහන්සේ මෙසේද සම්මා සම්බුද්ධ නම් වන සේක. ඒ සෝභිත බුදුරජාණන් වහන්සේ ඒකාන්තයෙන්ම සම්මා සම්බුද්ධ නම් වන සේක. ඒ සෝභිත බුදුරජාණන් වහන්සේ මම සරණ යමි. ඒ සෝභිත බුදුරජාණන් වහන්සේට මාගේ නමස්කාරය වේවා!

**සෝභිත බුදුරජාණන් වහන්සේට වන්දනාව**

**ගුණාකරං මහා පුඤ්ඤං -සෝභිතං කරුණාධරං**
**නාග බෝධිංච කල්‍යාණං - නමාමි සිරසාදරං**

එම සාරමණ්ඩ නම් කල්පයේදීම නැවත බුද්ධාන්තරයකින් පසුව ලොව පහළ වී වදාළ සියළු ගුණයන්ට ආකාරයක් බඳු වූ, මහත් පුණ්‍ය තේජසින් යුක්ත වූ, සියළු ලෝක සත්ත්වයන් වෙත පතළ මහා කරුණා ගුණයෙන් යුක්ත වූ ''සෝභිත'' නම් යම් මුනීන්ද්‍රයන් වහන්සේ නමක් ලොව පහළ වූ සේක්ද, ඒ බුදුරජාණන් වහන්සේටද, උන්වහන්සේ බුදුවීම සඳහා පිහිට වී වදාළ ''නාග කල්‍යාණ'' නම් ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේට ද, මම නමස්කාර කරමි. මෙම සියළු පූජාවන්ද සාදර ගෞරවයෙන් පූජා කරමි. පූජා වේවා.

සාධු ! සාධු !! සාධු !!!

## 10. අනෝමදස්සී බුදුරජාණන් වහන්සේට පූජාව

**දීපේහි ගන්ධ ධූපේහි - ගිලාන පච්චයේහිච**
**පුප්ඵාදි වත්‍ථු ජාතේහි - සුද්ධේහි කප්පියේහිච**
**අනන්ත තේජං ධාරෙන්තං- අනෝමදස්සි ජිනුත්තමං**
**සුද්ධ චිත්තප්ප සාදේන - භත්‍යාදරේන පූජයේ**

ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස ! හාත්පස අඳුර නසමින් බැබලෙන පහනින්ද, දසත පැතිරෙන මනහර සුගන්ධ ධූපයෙන්ද, අෂ්ඨපානාදී ප්‍රණීත ගිලන් පසින්ද, විසිතුරු මල් ආදී ශුද්ධ කැප වස්තු සමූහයෙන්ද, පස්මරුන් දිනූ ලොවට නායක වූ අනන්ත ගුණ සම්පන්න වූ අනෝමදස්සී බුදුරජාණන් වහන්සේට පිරිසිදු වූ ප්‍රසන්න සිතින් භත්‍යාදරයෙන් පූජා කරමි. පූජා වේවා!

### අනෝමදස්සී බුදුරජාණන් වහන්සේට වන්දනාව

**සෝ භගවා ඉතිපි අනෝමදස්සි සම්මා සම්බුද්ධෝ අනෝමදස්සි සම්මා සම්බුද්ධෝ වත සෝ භගවා, තං භගවන්තං අනෝමදස්සිං සම්මා සම්බුද්ධං සරණං ගච්ඡාමි. තං භගවන්තං අනෝමදස්සිං සම්මා සම්බුද්ධං සිරසා නමාමි.**



ඒ අනෝමදස්සී බුදුරජාණන් වහන්සේ මෙසේද සම්මා සම්බුද්ධ නම් වන සේක. ඒ අනෝමදස්සී බුදුරජාණන් වහන්සේ ඒකාන්තයෙන්ම සම්මා සම්බුද්ධ නම් වන සේක. ඒ අනෝමදස්සී බුදුරජාණන් වහන්සේ මම සරණ යමි. ඒ අනෝමදස්සී බුදුරජාණන් වහන්සේට මාගේ නමස්කාරය වේවා!

### අනෝමදස්සී බුදුරජාණන් වහන්සේට වන්දනාව

**අනෝමදස්සිං සම්බුද්ධං - ලෝකනාථං ජනුත්තමං**
**අජ්ජුනංනාම තං බෝධිං - නමාමි සිරසාදරං**

නැවත බුද්ධ ශූන්‍ය වූ කල්ප අසංඛ්‍යයකින් පසුව වරනම් කල්පයෙහිදී ලොව පහළ වී වදාළ තුන් ලොවට එකම පිහිටක් වූ සියළු සත්ත්වයන්ට උත්තම වූ, සියල්ල මැනවින් අවබෝධ කළාවූ ''අනෝමදස්සී'' නම් යම් මුනීන්ද්‍රයන් වහන්සේ නමක් ලොව පහළ වූ සේක්ද, ඒ බුදුරජාණන් වහන්සේටද, උන්වහන්සේට බුදුවීම සඳහා පිහිට වී වදාළ ''කුඹුක්'' නම් ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේටද මම නමස්කාර කරමි. මෙම සියළු පූජාවන් ද සාදර ගෞරවයෙන් පූජා කරමි. පූජා වේවා.

**සාධු ! සාධු !! සාධු !!!**

## 11. පදුම බුදුරජාණන් වහන්සේට පූජාව

**දීපේහි ගන්ධ ධූපේහි - ගිලාන පච්චයේහිච**
**පුප්ඵාදි වත්ථු ජාතේහි - සුද්ධේහි කප්පියේහිච**
**අනන්ත තේජංධාරෙන්තං- පදුමං ලෝක නායකං**
**සුද්ධ චිත්තප්ප සාදෙන - භත්‍යාදරේන පූජයේ**

ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස ! හාත්පස අඳුර නසමින් බැබලෙන පහනින්ද, දසත පැතිරෙන මනහර සුගන්ධ ධූපයෙන්ද, අෂ්ඨපානාදී ප්‍රණීත ගිලන් පසින්ද, විසිතුරු මල් ආදී ශුද්ධ කැප වස්තු සමූහයෙන්ද, පස්මරුන් දිනූ ලොවට නායක වූ අනන්ත ගුණ සම්පන්න වූ පදුම බුදුරජාණන් වහන්සේට පිරිසිදු වූ ප්‍රසන්න සිතින් භත්‍යාදරයෙන් පූජා කරමි. පූජා වේවා!

සාධු ! සාධු !! සාධු !!!

### පදුම බුදුරජාණන් වහන්සේට වන්දනාව

**සෝ භගවා ඉතිපි පදුමෝ සම්මා සම්බුද්ධෝ, පදුමෝ සම්මා සම්බුද්ධෝ වත සෝ භගවා, තං භගවන්තං පදුමං සම්මා සම්බුද්ධං සරණං ගච්ඡාමි. තං භගවන්තං පදුමං සම්මා සම්බුද්ධං සිරසා නමාමි.**

ඒ පදුම බුදුරජාණන් වහන්සේ මෙසේද



සම්මා සම්බුද්ධ නම් වන සේක. ඒ පදුම බුදුරජාණන් වහන්සේ ඒකාන්තයෙන්ම සම්මා සම්බුද්ධ නම් වන සේක. ඒ පදුම බුදුරජාණන් වහන්සේ මම සරණ යමි. ඒ පදුම බුදුරජාණන් වහන්සේට මාගේ නමස්කාරය වේවා!

### පදුම බුදුරජාණන් වහන්සේට වන්දනාව

**පදුමං නාම සම්බුද්ධං - ලෝකනාථං ජනුත්තමං**
**සෝණංච නාම තංබෝධිං - නමාමි සිරසාදරං**

එම වරනම් කල්පයෙහිදීම නැවත බුද්ධාන්තරයකින් පසුව ලොව පහළ වී වදාළ තුන් ලොවට පිහිට වූ සියලු සත්ත්වයනට උතුම් වූ, සියල්ල මැනවින් අවබෝධ කළාවූ ''පදුම'' නම් යම් මුනීන්ද්‍රයන් වහන්සේ නමක් ලොව පහළ වූ සේක්ද, ඒ බුදුරජාණන් වහන්සේටද, උන්වහන්සේට බුදුවීම සඳහා පිහිට වී වදාළ ''මහ මුරුත'' නම් ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේටද මම නමස්කාර කරමි. මෙම සියලු පූජාවන්ද සාදර ගෞරවයෙන් පූජා කරමි. පූජා වේවා!

සාධු ! සාධු !! සාධු !!!

## 12. නාරද බුදුරජාණන් වහන්සේට පූජා ගාථාව

**දීපේහි ගන්‍ධ ධූපේහි - ගිලාන පච්චයේහිච**
**පුප්ඵාදි වත්‍ථු ජාතේහි - සුද්ධේහි කප්පියේහිච**
**අරහාදී මහා ගුණං - ධාරෙන්තං නාරදං ජිනං**
**සුද්ධ චිත්තප්ප සාදේන - භත්‍යාදරේන පූජයේ**

ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස ! හාත්පස අඳුර නසමින් බැබලෙන පහනින්ද, දසත පැතිරෙන මනහර සුගන්ධ ධූපයෙන්ද, අෂ්ඨපානාදී ප්‍රණීත ගිලන් පසින්ද, විසිතුරු මල් ආදී ශුද්ධ කැප වස්තු සමූහයෙන්ද, සත්වයන් දමනය කළා වූ අනන්ත මහා ගුණ සම්පන්න වූ නාරද බුදුරජාණන් වහන්සේට පිරිසිදු වූ ප්‍රසන්න සිතින් භක්‍යදරයෙන් පූජා කරමි. පූජා වේවා!

**සාධු ! සාධු !! සාධු !!!**

නාරද බුදුරජාණන් වහන්සේට වන්දනාව

**සෝ භගවා ඉතිපි නාරදෝ සම්මා සමම්බුද්ධෝ, නාරදෝ සම්මා සම්බුද්ධෝ වත සෝ භගවා තං භගවන්තං නාරදං සම්මා සම්බුද්ධං සරණං ගච්ඡාමි. තං භගවන්තං නාරදං සම්මා සම්බුද්ධං සිරසා නමාමි.**

ඒ නාරද බුදුරජාණන් වහන්සේ මෙසේද සම්මා



සම්බුද්ධ නම් වන සේක. ඒ නාරද බුදුරජාණන් වහන්සේ ඒකාන්තයෙන්ම සම්මා සම්බුද්ධ නම් වන සේක. ඒ නාරද බුදුරජාණන් වහන්සේ මම සරණ යමි. ඒ නාරද බුදුරජාණන් වහන්සේට මාගේ නමස්කාරය වේවා!

නාරද බුදුරජාණන් වහන්සේට වන්දනාව

**සත්තසාරං මහා භිඤ්ඤං-නාරදං ලෝක නායකං**
**සන්තිදං සෝණ බොධිංච - නමාමි සිරසාදරං**

එම වරනම් කල්පයේදීම නැවත බුද්ධාන්තරයකින් පසුව ලොව පහළ වී වදාළ මහත් අභිඥා බලයෙන් යුක්ත වූ සත්ත්වයනට උතුම් රත්නයක් වූ, තුන් ලොවට නායක වූ ''නාරඳ'' නම් යම් මුනීන්ද්‍රයන් වහන්සේ නමක් ලොව පහළ වූ සේක්ද, ඒ බුදුරජාණන් වහන්සේට ද, උන්වහන්සේට බුදුවීම සඳහා පිහිට වී වදාළ ''සුළු මුරුත'' නම් ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේටද මම නමස්කාර කරමි. මෙම සියලු පූජාවන්ද සාදර ගෞරවයෙන් පූජා කරමි. පූජා වේවා!

**සාධු ! සාධු !! සාධු !!!**

## 13. පදුමුත්තර බුදුරජාණන් වහන්සේට පූජාව

**දීපේහි ගන්ධ ධූපේහි - ගිලාන පච්චයේහිච**
**පුප්ඵාදි වත්‍ථු ජාතේහි - සුද්ධෙහි කප්පියේහිච**
**අනන්ත ගුණ සමපන්නං - පදුමුත්තර නේතාරං**
**සුද්ධ චිත්තප්පසාදේන - භත්‍යාදරේන පූජයේ**

ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස ! හත්පස අඳුර නසමින් බැබලෙන පහනින්ද, දසත පැතිරෙන මනහර සුගන්ධ ධූපයෙන්ද, අෂ්ඨපානාදී ප්‍රණීත ගිලන් පසින්ද, විසිතුරු මල් ආදී ශුද්ධ කැප වස්තු සමූහයෙන්ද, සත්ත්වයන් පුදන ලද්දා වූ අනන්ත ගුණ සම්පන්න වූ පදුමුත්තර බුදුරජාණන් වහන්සේට පිරිසිදු වූ ප්‍රසන්න සිතින් භක්‍ත්‍යාදරයෙන් පූජා කරමි. පූජා වේවා!

**සාධු ! සාධු !! සාධු !!!**

### පදුමුත්තර බුදුරජාණන් වහන්සේට වන්දනාව

**සෝ භගවා ඉතිපි පදුමුත්තරෝ සම්මා සම්බුද්ධෝ, පදුමුත්තරෝ සම්මා සම්බුද්ධෝ වත සෝ භගවා, තං භගවන්තං පදුමුත්තරං සම්මා සම්බුද්ධං සරණං ගච්ඡාමි. තං භගවන්තං පදුමුත්තරං සම්මා සම්බුද්ධං සිරසා නමාමි.**



ඒ පදුමුත්තර බුදුරජාණන් වහන්සේ මෙසේද සම්මා සම්බුද්ධ නම් වන සේක. ඒ පදුමුත්තර බුදුරජාණන් වහන්සේ ඒකාන්තයෙන්ම සම්මා සම්බුද්ධ නම් වන සේක. ඒ පදුමුත්තර බුදුරජාණන් වහන්සේ මම සරණ යමි. ඒ පදුමුත්තර බුදුරජාණන් වහන්සේට මාගේ නමස්කාරය වේවා!

### පදුමුත්තර බුදුරජාණන් වහන්සේට වන්දනාව

**මහා කාරුණිකං නාථං - මුනින්දං පදුමුත්තරං**
**සාල බෝධිංච කල්‍යාණං - නමාමි සිරසාදරං**

නැවත බුද්ධ ශූන්‍ය වූ කල්ප අසංඛ්‍යයකින් පසුව සාරනම් කල්පයෙහිදී ලොව පහළ වී වදාළ මහා කරුණා ගුණයෙන් ලෝක සත්වයනට පිහිට වී වදාළ වූ ''පදුමුත්තර'' නම් යම් මුනීන්ද්‍රයන් වහන්සේ නමක් ලොව පහළ වූ සේක්ද, ඒ බුදුරජාණන් වහන්සේට ද, උන්වහන්සේට බුදුවීම සඳහා පිහිට වී වදාළ සාල නම් ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේටද මම නමස්කාර කරමි. මෙම සියලු පූජාවන්ද සාදර ගෞරවයෙන් පූජා කරමි. පූජා වේවා!

**සාධු ! සාධු !! සාධු !!!**

## 14. සුමේධ බුදුරජාණන් වහන්සේට පූජාව

**දීපේහි ගන්ධ ධූපේහි - ගිලාන පච්චයේහිච**
**පුප්ඵාදි වත්‍ථු ජාතේහි - සුද්ධේහි කප්පියේහිච**
**අනන්ත ගුණ සම්පන්නං - සුමෙධං ලොක නායකං**
**සුද්ධ චිත්ත ප්පසාදේන - භත්‍යාදරේන පූජයේ**

ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස! හාත්පස අඳුර නසමින් බැබලෙන පහනින්ද, දසත පැතිරෙන මනහර සුගන්ධ ධූපයෙන්ද, අෂ්ඨපානාදී ප්‍රණීත ගිලන් පසින්ද, විසිතුරු මල් ආදී ශුද්ධ කැප වස්තු සමූහයෙන්ද, ලෝකයට නායක වූ අනන්ත ගුණ සම්පන්න වූ සුමේධ බුදුරජාණන් වහන්සේට පිරිසිදු වූ ප්‍රසන්න සිතින් භත්‍යාදරයෙන් පූජා කරමි. පූජා වේවා!

සාධු ! සාධු !! සාධු !!!

සුමේධ බුදුරජාණන් වහන්සේට වන්දනාව

**සෝ භගවා ඉතිපි සුමෙධෝ සම්මා සම්බුද්ධෝ සුමෙධෝ සම්මා සම්බුද්ධෝ වත සෝ භගවා තං භගවන්තං සුමේධං සම්මා සම්බුද්ධං සරණං ගච්ඡාමි. තං භගවන්තං සුමේධං සම්මා සම්බුද්ධං සිරසා නමාමි.**

ඒ සුමේධ බුදුරජාණන් වහන්සේ මෙසේද සම්මා සම්බුද්ධ නම් වන සේක. ඒ සුමේධ



බුදුරජාණන් වහන්සේ ඒකාන්තයෙන්ම සම්මා සම්බුද්ධ නම් වන සේක. ඒ සුමේධ බුදුරජාණන් වහන්සේ මම සරණ යමි. ඒ සුමේධ බුදුරජාණන් වහන්සේට මාගේ නමස්කාරය වේවා!

සුමේධ බුදුරජාණන් වහන්සේට වන්දනාව

**මහා මතිං මහා තේජං - සුමේධං නාම නායකං**
**නීප බෝධිංච කල්‍යාණං - නමාමි සිරසාදරං**

නැවත බුද්ධ ශුන්‍ය වූ කල්ප හැත්තෑ දහසකින් පසුව මණ්ඩ නම් කල්පයෙහිදී ලොව පහළ වී වදාළ මනා සිහියෙන් හා නුවණින් යුක්ත වූ මහත් තේජස් ඇත්තා වූ තුන් ලොවට නායක වූ සේක්ද, ඒ බුදුරජාණන් වහන්සේට ද, උන්වහන්සේට බුදුවීම සඳහා පිහිට වී වදාළ ''මිදෙල්ල'' නම් ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේටද මම නමස්කාර කරමි. මෙම සියලු පූජාවන්ද සාදර ගෞරවයෙන් පූජා කරමි. පූජා වේවා.

සාධු ! සාධු !! සාධු !!!

## 15. සුජාත බුදුරජාණන් වහන්සේට පූජාව

**දීපේහි ගන්ධ ධූපේහි - ගිලාන පච්චයේහිච**
**පුප්ඵාදි වත්‍ථු ජාතේහි - සුද්ධේහි කප්පියේහිච**
**අනන්ත ගුණ සම්පන්නං- සුජාතං ලෝක පූජිතං**
**සුද්ධ චිත්ත ප්පසාදේන - භත්‍යාදරේන පූජයෙ**

ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස ! හාත්පස

අඳුර නසමින් බැබලෙන පහනින්ද, දසත පැතිරෙන මනහර සුගන්ධ ධූපයෙන්ද, අෂ්ඨපානාදී ප්‍රණීත ගිලන් පසින්ද, විසිතුරු මල් ආදී ශුද්ධ කැප වස්තු සමූහයෙන්ද, ලෝකයා විසින් පුදන ලද්දා වූ අනන්ත ගුණ සම්පන්න වූ සුජාත බුදුරජාණන් වහන්සේට පිරිසිදු වූ ප්‍රසන්න සිතින් භක්‍යාදරයෙන් පූජා කරමි. පූජා වේවා!

සාධු ! සාධු !! සාධු !!!

සුජාත බුදුරජාණන් වහන්සේට වන්දනාව

**සෝ භගවා ඉතිපි සුජාතෝ සම්මා සම්බුද්ධෝ, සුජාතෝ සම්මා සම්බුද්ධෝ වත සෝ භගවා, තං භගවන්තං සුජාතං සම්මා සම්බුද්ධං සරණං ගච්ඡාමි. තං භගවන්තං සුජාතං සම්මා සම්බුද්ධං සිරසා නමාමි.**

ඒ සුජාත බුදුරජාණන් වහන්සේ මෙසේද සම්මා සම්බුද්ධ නම් වන සේක. ඒ සුජාත බුදුරජාණන් වහන්සේ ඒකාන්තයෙන්ම සම්මා සම්බුද්ධ නම් වන සේක. ඒ සුජාත බුදුරජාණන් වහන්සේ මම සරණ යමි. ඒ සුජාත බුදුරජාණන් වහන්සේට මාගේ නමස්කාරය වේවා!

සාධු ! සාධු !! සාධු !!!



## සුජාත බුදුරජාණන් වහන්සේට වන්දනාව

**සුජාතං සබ්බ ලොකග්ගං - චක්ඛු මන්තං මහා මුනිං**
**වෙළු බෝධිංච කල්‍යාණං - නමාමි සිරසාදරං**

එම මණ්ඩ නම් කල්පයෙහිදීම නැවත බුද්ධාන්තරයකින් පසුව ලොව පහළ වී වදාළ පසැස් ඇත්තා වූ සියලු ලෝක වාසීන්ට අග්‍ර වූ ''සුජාත'' නම් යම් මුනීන්ද්‍රයන් වහන්සේ නමක් ලොව පහළ වූ සේක් ද, ඒ බුදුරජාණන් වහන්සේටද උන්වහන්සේට බුදුවීම සඳහා පිහිට වී වදාළ ''උණ තුරු'' නම් ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේටද මම නමස්කාර කරමි. මෙම සියළු පූජාවන් ද සාදර ගෞරවයෙන් පූජා වේවා. පූජා වේවා.

සාධු ! සාධු !! සාධු !!!

## 16. පියදස්සී බුදුරජාණන් වහන්සේට පූජාව

**දීපේහි ගන්ධ ධූපේහි - ගිලාන පච්චයේහිච**
**පුප්ඵාදි වත්‍ථු ජාතේහි - සුද්ධේහි කප්පියේහිච**
**අනන්ත ගුණ සම්පන්නං- පියදස්සිං නරාසභං**
**සුද්ධ චිත්ත ප්පසාදේන - භත්‍යාදරේන පූජයේ**

ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස ! භාත්පස අඳුර නසමින් බැබලෙන පහනින්ද, දසත පැතිරෙන මනහර සුගන්ධ ධූපයෙන්ද, අෂ්ඨපානාදී ප්‍රණීත ගිලන් පසින්ද, විසිතුරු මල් ආදී ශුද්ධ කැප වස්තු සමූහයෙන්ද, දෙව්

මිනිසුන්ට ශ්‍රේෂ්ඨ වූ අනන්ත ගුණ සම්පන්න වූ පියදස්සී බුදුරජාණන් වහන්සේට පිරිසිදු වූ ප්‍රසන්න සිතින් භත්‍යාදරයෙන් පූජා කරමි. පූජා වේවා!

**සාධු ! සාධු !! සාධු !!!**

## පියදස්සී බුදුරජාණන් වහන්සේට වන්දනාව

**සෝ භගවා ඉතිපි පියදස්සී සම්මා සම්බුද්ධෝ පියදස්සි සම්මා සම්බුද්ධෝ වත සෝ භගවා තං භගවන්තං පියදස්සිං සම්මා සම්බුද්ධං සරණං ගච්ඡාමි. තං භගවන්තං පියදස්සිං සම්මා සම්බුද්ධං සිරසා නමාමි.**

ඒ පියදස්සී බුදුරජාණන් වහන්සේ මෙසේද සම්මා සම්බුද්ධ නම් වන සේක. ඒ පියදස්සී බුදුරජාණන් වහන්සේ ඒකාන්තයෙන්ම සම්මා සම්බුද්ධ නම් වන සේක. ඒ පියදස්සි බුදුරජාණන් වහන්සේ මම සරණ යමි. ඒ පියදස්සී බුදුරජාණන් වහන්සේට මාගේ නමස්කාරය වේවා!

## පියදස්සි බුදුරජාණන් වහන්සේට වන්දනාව

**අංගී රසං ජුතී මන්තං පියදස්සිං නරා සභං**
**සෙට්ඨං පියංගු බෝධිංච නමාමි සිරසාදරං**



නැවත බුද්ධ ශූන්‍ය වූ කල්ප විසි නව දහස් අටසිය දෙඅසූවකින් පසුව වර නම් කල්පයෙහිදීම ලොව පහළ වී වදාළ ප්‍රඥා ලෝකයෙන් බබළන්නා වූ දෙව් මිනිසුන්ට ශ්‍රේෂ්ඨ වූ ''අංගීරස පියදස්සී'' නම් යම් මුනීන්ද්‍රයන් වහන්සේ නමක් ලොව පහළ වූ සේක්ද, ඒ බුදු රජාණන් වහන්සේටද, උන්වහන්සේට බුදුවීම සඳහා පිහිට වී වදාළ ''පුවඟු'' නම් ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේටද මම නමස්කාර කරමි. සියළු පූජාවන්ද සාදර ගෞරවයෙන් පූජා කරමි. පූජා වේවා.!

**සාධු ! සාධු !! සාධු !!!**

## 17. අත්ථදස්සී බුදුරජාණන් වහන්සේට පූජාව

**දීපේහි ගන්ධ ධූපේහි - ගිලාන පච්චයේහිච**
**පුප්ඵාදි වත්‍ථු ජාතේහි - සුද්ධේහි කප්පියේහිච**
**අනන්ත ගුණ සම්පන්නං - අත්ථදස්සිං විනායකං**
**සුද්ධ චිත්තප්ප සාදේන - භත්‍යාදරේන පූජයේ**

ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස ! හාත්පස අඳුර නසමින් බැබලෙන පහනින්ද, දසත පැතිරෙන මනහර සුගන්ධ ධූපයෙන්ද, අෂ්ඨපානාදී ප්‍රණීත ගිලන් පසින්ද, විසිතුරු මල් ආදී ශුද්ධ කැප වස්තු සමූහයෙන්ද, සත්වයන් මනා කොට හික්මන ලද්දා වූ අනන්ත ගුණ සම්පන්න වූ අත්ථදස්සී බුදුරජාණන් වහන්සේට පිරිසිදු වූ ප්‍රසන්න සිතින් භත්‍යාදරයෙන් පූජා

කරමි.පූජා වේවා!

සාධු ! සාධු !! සාධු !!!

අත්ථදස්සී බුදුරජාණන් වහන්සේට වන්දනාව

**සො භගවා ඉතිපි අත්ථදස්සී සම්මා සම්බුද්ධො අත්ථදස්සී සම්මා සම්බුද්ධො වත සො භගවා තං භගවන්තං අත්ථදස්සිං සම්මා සම්බුද්ධං සරණං ගච්ඡාමි. තං භගවන්තං අත්ථදස්සිං සම්මා සම්බුද්ධං සිරසා නමාමි.**

ඒ අත්ථදස්සී බුදුරජාණන් වහන්සේ මෙසේද සම්මා සම්බුද්ධ නම් වන සේක. ඒ අත්ථදස්සී බුදුරජාණන් වහන්සේ ඒකාන්තයෙන්ම සම්මා සම්බුද්ධ නම් වන සේක. ඒ අත්ථදස්සී බුදුරජාණන් වහන්සේ මම සරණ යමි. ඒ අත්ථදස්සී බුදුරජාණන් වහන්සේට මාගේ නමස්කාරය වේවා!

අත්ථදස්සී බුදුරජාණන් වහන්සේට වන්දනාව

**අත්ථදස්සිං කාරුණිකං - මහෙසිං ජින පුංගවං**
**චම්පකං නාම තස්ස බෝධිං -නමාමි සිරසාදරං**

එම වරනම් කල්පයෙහිදීම නැවත බුද්ධාන්තරයකින් පසුව ලොව පහළ වී වදාළ මහත් කාරුණික ගුණයෙන් යුක්ත වූ සියලු සෘෂීන්ට නායක වූ මහත් යසස් ඇති



''අත්ථදස්සි'' නම් යම් මුනීන්ද්‍රයන් වහන්සේ නමක් ලොව පහළ වූ සේක්ද, ඒ බුදුරජාණන් වහන්සේට ද උන්වහන්සේට බුදුවීම සඳහා පිහිට වී වදාළ ''සපු'' නම් ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේට ද මම නමස්කාර කරමි. මෙම සියළු පූජාවන්ද සාදර ගෞරවයෙන් පූජා කරමි. පූජා වේවා.

සාධු ! සාධු !! සාධු !!!

## 18. ධම්මදස්සී බුදුරජාණන් වහන්සේට පූජාව

**දීපේහි ගන්ධ ධූපේහි - ගිලාන පච්චයේහිච**
**පුප්ඵාදි වත්‍ථු ජාතේහි - සුද්ධේහි කප්පියේහිච**
**අනන්ත ගුණ සම්පන්නං-ධම්මදස්සිං ජනුත්තමං**
**සුද්ධ චිත්තප්ප සාදේන - භත්‍යාදරේන පූජයේ**

ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස ! හාත්පස අඳුර නසමින් බැබලෙන පහනින්ද, දසත පැතිරෙන මනහර සුගන්ධ ධූපයෙන්ද, අෂ්ඨපානාදී ප්‍රණීත ගිලන් පසින්ද, විසිතුරු මල් ආදී ශුද්ධ කැප වස්තු සමූහයෙන්ද, පස්මරුන් දිනූ උත්තම වූ අනන්ත ගුණ සම්පන්න වූ ධම්මදස්සී බුදුරජාණන් වහන්සේට පිරිසිදු වූ ප්‍රසන්න සිතින් භත්‍යාදරයෙන් පූජා කරමි. පූජා වේවා!

සාධු ! සාධු !! සාධු !!!

ධම්මදස්සී බුදුරජාණන් වහන්සේට වන්දනාව

**සෝ භගවා ඉතිපි ධම්මදස්සී සම්මා සම්බුද්ධෝ, ධම්මදස්සී සම්මා සම්බුද්ධෝ වත සෝ භගවා, තං භගවන්තං ධම්මදස්සිං සම්මා සම්බුද්ධං සරණං ගච්ඡාමි. තං භගවන්තං ධම්මදස්සිං සම්මා සම්බුද්ධං සිරසා නමාමි.**

ඒ ධම්මදස්සී බුදුරජාණන් වහන්සේ මෙසේද සම්මා සම්බුද්ධ නම් වන සේක. ඒ ධම්මදස්සී බුදුරජාණන් වහන්සේ ඒකාන්තයෙන්ම සම්මා සම්බුද්ධ නම් වන සේක. ඒ ධම්මදස්සී බුදුරජාණන් වහන්සේ මම සරණ යමි. ඒ ධම්මදස්සී බුදුරජාණන් වහන්සේට මාගේ නමස්කාරය වේවා!

ධම්මදස්සි බුදුරජාණන් වහන්සේට වන්දනාව

**බ්‍රහ්මාති බ්‍රහ්මං පවරං - ධම්මදස්සිං තමෝනුදං**
**කදම්බං නාම තං බෝධිං - නමාමි සිරසාදරං**

එම වර නම් කල්පයේදීම නැවත බුද්ධාන්තරයකින් පසුව ලොව පහළ වී වදාළ මොහඳුරට ළහිරු මඬලක් බඳු වූ බ්‍රහ්මාති බ්‍රහ්ම ශ්‍රේෂ්ඨ ගුණයන්ගෙන් යුක්ත වූ ''ධම්ම දස්සී'' නම් යම් මුනීන්ද්‍රයන් වහන්සේ නමක් ලොව පහළ වූ සේක්ද, ඒ බුදුරජාණන් වහන්සේට ද, උන්වහන්සේට බුදුවීම සඳහා පිහිට වී වදාළ



කොළොම්තුර නම් ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේට ද මම නමස්කාර කරමි, මෙම සියළු පූජාවන්ද සාදර ගෞරවයෙන් පූජා කරමි. පූජා වේවා.

**සාධු ! සාධු !! සාධු !!!**

## 19. සිද්ධත්ථ බුදුරජාණන් වහන්සේට පූජාව

**දීපේහි ගන්ධ ධූපේහි - ගිලාන පච්චයේහිච**
**පුප්ඵාදි වත්ථු ජාතේහි - සුද්ධෙහි කප්පියේහිච**
**අනන්ත ගුණ සම්පන්නං- සිද්ධත්ථං අසමං ජිනං**
**සුද්ධ චිත්තප්ප සාදේන - භත්‍යාදරේන පූජයේ**

ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස ! හාත්පස අඳුර නසමින් බැබලෙන පහනින්ද, දසත පැතිරෙන මනහර සුගන්ධ ධූපයෙන්ද, අෂ්ඨපානාදී ප්‍රණීත ගිලන් පසින්ද, විසිතුරු මල් ආදී ශුද්ධ කැප වස්තු සමූහයෙන්ද, පස්මරුන් දිනූ අසමසම අනන්ත ගුණ සම්පන්න වූ සිදධත්ථ බුදුරජාණන් වහන්සේට පිරිසිදු වූ ප්‍රසන්න සිතින් භත්‍යදරයෙන් පූජා කරමි. පූජා වේවා!

**සාධු ! සාධු !! සාධු !!!**

### සිද්ධත්ථ බුදුරජාණන් වහන්සේට වන්දනාව

**සෝ භගවා ඉතිපි සිද්ධත්ථෝ සම්මා සම්බුද්ධෝ, සිද්ධත්ථෝ සම්මා සම්බුද්ධෝ වත සෝ භගවා, තං භගවන්තං සිද්ධත්ථං සම්මා සම්බුද්ධං සරණං ගච්ඡාමි. තං භගවන්තං සිද්ධත්ථං සම්මා සම්බුද්ධං සිරසා නමාමි.**

ඒ සිද්ධත්ථ බුදුරජාණන් වහන්සේ මෙසේද සම්මා සම්බුද්ධ නම් වන සේක. ඒ සිද්ධත්ථ බුදුරජාණන් වහන්සේ ඒකාන්තයෙන්ම සම්මා සම්බුද්ධ නම් වන සේක. ඒ සිද්ධත්ථ බුදුරජාණන් වහන්සේ මම සරණ යමි. ඒ සිද්ධත්ථ බුදුරජාණන් වහන්සේට මාගේ නමස්කාරය වේවා!

## සිද්ධත්ථ බුදුරජාණන් වහන්සේට වන්දනාව

**සිද්ධත්ථං පටි විද්ධත්ථං - සබ්බ ලෝකෙක නායකං**
**තස්ස බෝධිංච කණිකාරං - නමාමි සිරසාදරං**

නැවත බුද්ධ ශූන්‍ය වූ විසි හතර කල්පයකින් පසුව සාර නම් කල්පයෙහිදි ලොව පහළ වී වදාළ තුන් ලෝක ධාතුවට අසහාය නායක වූ ප්‍රතිවේධ කළ යුතු සකල ධර්මයන් මනා කොට ප්‍රතිවේධ කළා වූ ''සිද්ධාර්ථ'' නම් යම් මුනීන්ද්‍රයන් වහන්සේ නමක් ලොව පහළ වූ සේක්ද ඒ බුදුරජාණන් වහන්සේටද උන්වහන්සේට බුදුවීම සඳහා පිහිට වී වදාළ ''කිණිහිරි'' නම් ජය ශ්‍රී මහා බෝධීන්



වහන්සේටද මම නමස්කාර කරමි. මෙම සියලු පූජාවන්ද සාදර ගෞරවයෙන් පූජා කරමි. පූජා වේවා.

**සාධු ! සාධු !! සාධු !!!**

## 20. තිස්ස බුදුරජාණන් වහන්සේට පූජාව

**දීපේහි ගන්ධ ධූපේහි - ගිලාන පච්චයේහිච**
**පුප්ඵාදි වත්‍ථු ජාතේහි - සුද්ධේහි කප්පියේහිච**
**අනන්ත ගුණ සම්පන්නං- තිස්සං ලොකේක නායකං**
**සුද්ධ චිත්තප්ප සාදේන - භත්‍යාදරේන පූජයේ**

ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස ! හාත්පස අඳුර නසමින් බැබලෙන පහනින්ද, දසත පැතිරෙන මනහර සුගන්ධ ධූපයෙන්ද, අෂ්ඨපානාදී ප්‍රණීත ගිලන් පසින්ද, විසිතුරු මල් ආදී ශුද්ධ කැප වස්තු සමූහයෙන්ද, තුන් ලොවට නායක වූ අනන්ත ගුණ සම්පන්න වූ තිස්ස බුදුරජාණන් වහන්සේට පිරිසිදු වූ ප්‍රසන්න සිතින් භත්‍යදරයෙන් පූජා කරමි. පූජා වේවා!

**සාධු ! සාධු !! සාධු !!!**

### තිස්ස බුදුරජාණන් වහන්සේට වන්දනාව

**සෝ භගවා ඉතිපි තිස්සෝ සම්මා සම්බුද්ධෝ, තිස්සෝ සම්මා සම්බුද්ධෝ වත සෝ භගවා තං භගවන්තං තිස්සං සම්මා සම්බුද්ධං සරණං**

**ගච්ඡාමි. තං භගවන්තං තිස්සං සම්මා සම්බුද්ධං සිරසා නමාමි.**

ඒ තිස්ස බුදුරජාණන් වහන්සේ මෙසේද සම්මා සම්බුද්ධ නම් වන සේක. ඒ තිස්ස බුදුරජාණන් වහන්සේ ඒකාන්තයෙන්ම සම්මා සම්බුද්ධ නම් වන සේක. ඒ තිස්ස බුදුරජාණන් වහන්සේ මම සරණ යමි. ඒ තිස්ස බුදුරජාණන් වහන්සේට මාගේ නමස්කාරය වේවා!

**තිස්ස බුදුරජාණන් වහන්සේට වන්දනාව**

**සත්ථාරං තිස්ස සම්බුද්ධං - සබ්බඤ්ඤුං ලෝක පූජිතං**
**අසනං නාම තං බෝධිං - නමාමි සිරසාදරං**

නැවත බුද්ධ ශූන්‍ය වූ එක් කල්පයක් ගිය තැන මණ්ඩ නම් කල්පයෙහිදි ලොව පහළ වී වදාළ සියලු ලෝක වාසීන් විසින් පුදන ලද්දා වූ සියලු ධර්මයන් මැනවින් අවබෝධ කළා වූ විනෙය්‍ය ජනයා මනාකොට හික්මන ලද්දා වූ ''තිස්ස'' නම් යම් මුනීන්ද්‍රයන් වහන්සේ නමක් ලොව පහළ වූ සේක්ද ඒ බුදුරජාණන් වහන්සේට ද, උන්වහන්සේට බුදුවීම සඳහා පිහිට වී වදාළ ''පියාල'' නම් ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේටද මම නමස්කාර කරමි. මෙම සියළු පූජාවන්ද සාදර ගෞරවයෙන් පූජා කරමි. පූජා වේවා.

සාධු ! සාධු !! සාධු !!!



# 21. ඵුස්ස බුදුරජාණන් වහන්සේට පූජාව

**දීපේහි ගන්ධ ධූපේහි - ගිලාන පච්චයේහිච**
**පුප්ඵාදි වත්ථු ජාතෙහි - සුද්ධේහි කප්පියේහිච**
**අනන්ත ගුණ සම්පන්නං- ඵුස්සව්හයං ජිනං වරං**
**සුද්ධ චිත්තප්පසාදේන - භත්‍යාදරේන පූජයේ**

ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස ! හාත්පස අඳුර නසමින් බැබලෙන පහනින්ද, දසත පැතිරෙන මනහර සුගන්ධ ධූපයෙන්ද, අෂ්ඨපානාදී ප්‍රණීත ගිලන් පසින්ද, විසිතුරු මල් ආදී ශුද්ධ කැප වස්තු සමූහයෙන්ද, පස්මරුන් දිනූ සත්ත්වයන්ගේ පුද වරම් ලැබූ අනන්ත ගුණ සම්පන්න වූ ඵුස්ස බුදුරජාණන් වහන්සේට පිරිසිදු වූ ප්‍රසන්න සිතින් භත්‍යාදරයෙන් පූජා කරමි. පූජා වේවා!

සාධු ! සාධු !! සාධු !!!

## ඵුස්ස බුදුරජාණන් වහන්සේට වන්දනාව

**සෝ භගවා ඉතිපි ඵුස්සෝ සම්මා සම්බුද්ධෝ ඵුස්සෝ සම්මා සම්බුද්ධෝ වත සෝ භගවා තං භගවන්තං ඵුස්සං සම්මා සම්බුද්ධං භගවන්තං ඵුස්සං සරණං ගච්ඡාමි. තං භගවන්තං ඵුස්සං සම්මා සම්බුද්ධං සිරසා නමාමි.**

ඒ ඵුස්ස බුදුරජාණන් වහන්සේ මෙසේද සම්මා සම්බුද්ධ නම් වන සේක. ඒ ඵුස්ස බුදුරජාණන් වහන්සේ ඒකාන්තයෙන්ම සම්මා සම්බුද්ධ නම් වන සේක. ඒ ඵුස්ස බුදුරජාණන් වහන්සේ මම සරණ යමි. ඒ ඵුස්ස බුදුරජාණන් වහන්සේට මාගේ නමස්කාරය වේවා!

## ඵුස්ස බුදුරජාණන් වහන්සේට වන්දනාව

**මුනින්දං ඵුස්ස සම්බුද්ධං - මහිද්ධිං සුගුණාකරං**
**ආමලකං තස්ස බෝධිං - නමාමි සිරසාදරං**

එම මණ්ඩ නම් කල්පයෙහිදීම නැවත බුද්ධාන්තරයකින් පසුව ලොව පහළ වී වදාළ සියලු ගුණයන්ට ආකාරයක් බඳු වූ මහත් සෘද්ධි බල ඇත්තා වූ ස්වයම්භූ ඥාණයෙන් සත්‍ය ධර්මයන් අවබෝධ කළාවූ ''ඵුස්ස'' නම් යම් මුනීන්ද්‍රයන් වහන්සේ නමක් ලොව පහළ වූ සේක්ද ඒ බුදුරජාණන් වහන්සේට ද උන් වහන්සේට බුදුවීම සඳහා පිහිට වී වදාළ ''ආමලක'' නම් ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේටද මම නමස්කාර කරමි. මෙම සියළු පූජාවන්ද සාදර ගෞරවයෙන් පූජා කරමි. පූජා වේවා.

සාධු ! සාධු !! සාධු !!!



## 22. විපස්සී බුදුරජාණන් වහන්සේට පූජාව

**දීපේහි ගන්ධ ධූපේහි - ගිලාන පච්චයේහිච**
**පුප්ඵාදි වත්ථු ජාතේහි - සුද්ධේහි කප්පියේහිච**
**අනන්ත ගුණ සම්පන්නං- විපස්සිං ච විනායකං**
**සුද්ධ චිත්තප්ප සාදේන - භත්‍යාදරේන පූජයේ**

ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස ! භාත්පස අඳුර නසමින් බැබලෙන පහනින්ද, දසත පැතිරෙන මනහර සුගන්ධ ධූපයෙන්ද, අෂ්ඨපානාදී ප්‍රණීත ගිලන් පසින්ද, විසිතුරු මල් ආදී ශුද්ධ කැප වස්තු සමූහයෙන්ද, ලෝක සත්ත්වයා හික්මවූවා වූ අනන්ත ගුණ සම්පන්න වූ විපස්සී බුදුරජාණන් වහන්සේට පිරිසිදු වූ ප්‍රසන්න සිතින් භත්‍යාදරයෙන් පූජා කරමි. පූජා වේවා!

සාධු ! සාධු !! සාධු !!!

## විපස්සී බුදුරජාණන් වහන්සේට වන්දනාව

**සෝ භගවා ඉතිපි විපස්සි සම්මා සම්බුද්ධෝ, විපස්සි සම්මා සම්බුද්ධෝ වත සෝ භගවා, තං භගවන්තං විපස්සිං සම්මා සම්බුද්ධං සරණං ගච්ඡාමි. තං භගවන්තං විපස්සිං සම්මා සම්බුද්ධං සිරසා නමාමි.**

ඒ විපස්සී බුදුරජාණන් වහන්සේ මෙසේද

සම්මා සම්බුද්ධ නම් වන සේක. ඒ විපස්සි බුදුරජාණන් වහන්සේ ඒකාන්තයෙන්ම සම්මා සම්බුද්ධ නම් වන සේක. ඒ විපස්සි බුදුරජාණන් වහන්සේ මම සරණ යමි. ඒ විපස්සි බුදුරජාණන් වහන්සේට මාගේ නමස්කාරය වේවා!

## විපස්සි බුදුරජාණන් වහන්සේට වන්දනාව

**විජ්ජාචරණ සම්පන්නං විපස්සිං විගතෝපමං**
**පාඨලිංච මහා බෝධිං නමාමි සිරසාදරං**

නැවත බුද්ධ ශූන්‍ය වූ එක් කල්පයකින් පසුව සාර නම් කල්පයෙහිදි ලොව පහළ වී වදාළ අෂ්ඨ විද්‍යා පසළොස් චරණ ධර්මයන් ගෙන් යුක්ත වූ ප්‍රමාණාතික්‍රාන්ත වූ රූපකාය සම්පත්තියෙන් හා ධර්මකාය සම්පත්තියෙන් යුක්ත වූ ''විපස්සී'' නම් යම් මුනීන්ද්‍රයන් වහන්සේ නමක් ලොව පහළ වූ සේක්ද, ඒ බුදුරජාණන් වහන්සේටද උන්වහන්සේට බුදුවීම සඳහා පිහිට වී වදාළ ''පලොල්'' නම් ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේට ද මම නමස්කාර කරමි. මෙම සියලු පූජාවන්ද සාදර ගෞරවයෙන් පූජා කරමි. පූජා වේවා.

සාධු ! සාධු !! සාධු !!!



## 23. සිඛී බුදුරජාණන් වහන්සේට පූජාව

**දීපේහි ගන්ධ ධූපේහි - ගිලාන පච්චයේහිච**
**පුප්ඵාදි වත්ථු ජාතේහි - සුද්ධේහි කප්පියේහිච**
**අනන්ත ගුණ සම්පන්නං- සිඛිං ලොක හිතං ජිනං**
**සුද්ධ චිත්තප්ප සාදේන - භත්‍යාදරේන පූජයේ**

ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස ! හාත්පස අඳුර නසමින් බැබලෙන පහනින්ද, දසත පැතිරෙන මනහර සුගන්ධ ධූපයෙන්ද, අෂ්ඨපානාදී ප්‍රණීත ගිලන් පසින්ද, විසිතුරු මල් ආදී ශුද්ධ කැප වස්තු සමූහයෙන්ද, පස්මරුන් දිනූ ලෝකයාට හිතකර වූ අනන්ත ගුණ සම්පන්න වූ ඒ සිඛී බුදුරජාණන් වහන්සේට පිරිසිදු වූ ප්‍රසන්න සිතින් භත්‍යාදරයෙන් පූජා කරමි. පූජා වේවා!

සාධු ! සාධු !! සාධු !!!

## සිඛී බුදුරජාණන් වහන්සේට වන්දනාව

**සෝ භගවා ඉතිපි සිඛී සම්මා සම්බුද්ධෝ, සිඛී සම්මා සම්බුද්ධෝ වත සෝ භගවා, තං භගවන්තං සිඛිං සම්මා සම්බුද්ධං සරණං ගච්ඡාමි. තං භගවන්තං සිඛිං සම්මා සම්බුද්ධං සිරසා නමාමි.**

ඒ සිඛී බුදුරජාණන් වහන්සේ මෙසේද සම්මා සම්බුද්ධ නම් වන සේක. ඒ සිඛි

බුදුරජාණන් වහන්සේ ඒකාන්තයෙන්ම සම්මා සම්බුද්ධ නම් වන සේක. ඒ සිඛී බුදුරජාණන් වහන්සේ මම සරණ යමි. ඒ සිඛී බුදුරජාණන් වහන්සේට මාගේ නමස්කාරය වේවා!

## සිඛී බුදුරජාණන් වහන්සේට වන්දනාව

**සිඛී නාමං මහා වීරං මහෙසිං ජින පුංගවං**
**පුණ්ඩරිකංච තං බෝධිං නමාමි සිරසාදරං**

නැවත බුද්ධ ශූන්‍ය වූ සැට කල්පයකින් පසුව මණ්ඩ නම් කල්පයෙහිදී ලොව පහළ වී වදාළ දිනන ලද ඉඳුරන් ඇත්තා වූ ද මහත් ඍෂි සමූහයා විසින් පෙරටු කොට ගත්තා වූද මහත් වීර්යය පරාක්‍රමයකින් යුක්ත වූ ''සිඛී'' නම් යම් මුනීන්ද්‍රයන් වහන්සේ නමක් ලොව පහළ වූ සේක්ද ඒ බුදුරජාණන් වහන්සේට ද උන්වහන්සේට බුදුවීම සඳහා පිහිට වී වදාළ ''ඇටඹ'' නම් ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේට ද මම නමස්කාර කරමි. මෙම සියළු පූජාවන්ද සාදර ගෞරවයෙන් පූජා කරමි. පූජා වේවා.

සාධු ! සාධු !! සාධු !!!



# 24. වෙස්සභූ බුදුරජාණන් වහන්සේට පූජාව

**දීපේහි ගන්ධ ධූපේහි - ගිලාන පච්චයේහිච**
**පුප්ඵාදි වත්‍ථු ජාතේහි - සුද්ධේහි කප්පියේහිච**
**අනන්ත ගුණ සම්පන්නං- වෙස්සභූං ලොක නායකං**
**සුද්ධ චිත්තප්පසාදේන - භත්‍යාදරේන පූජයේ**

ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස ! හාත්පස අඳුර නසමින් බැබලෙන පහනින්ද, දසත පැතිරෙන මනහර සුගන්ධ ධූපයෙන්ද, අෂ්ටපානාදී ප්‍රණීත ගිලන් පසින්ද, විසිතුරු මල් ආදී ශුද්ධ කැප වස්තු සමූහයෙන්ද, ලොවට නායක වූ අනන්ත ගුණ සම්පන්න වූ ඒ වෙස්සභූ බුදුරජාණන් වහන්සේට පිරිසිදු වූ ප්‍රසන්න සිතින් භත්‍යාදරයෙන් පූජා කරමි. පූජා වේවා!

සාධු ! සාධු !! සාධු !!!

## වෙස්සභූ බුදුරජාණන් වහන්සේට වන්දනාව

**සෝ භගවා ඉතිපි වෙස්සභූ සම්මා සම්බුද්ධෝ, වෙස්සභූ සම්මා සම්බුද්ධෝ වත සෝ භගවා, තං භගවන්තං වෙස්සභූං සම්මා සම්බුද්ධං සරණං ගච්ඡාමි. තං භගවන්තං වෙස්සභූං සම්මා සම්බුද්ධං සිරසා නමාමි.**

ඒ වෙස්සභූ බුදුරජාණන් වහන්සේ මෙසේද සම්මා සම්බුද්ධ නම් වන සේක. ඒ වෙස්සභූ

බුදුරජාණන් වහන්සේ ඒකාන්තයෙන්ම සම්මා සම්බුද්ධ නම් වන සේක. ඒ වෙස්සභූ බුදුරජාණන් වහන්සේ මම සරණ යමි. ඒ වෙස්සභූ බුදුරජාණන් වහන්සේට මාගේ නමස්කාරය වේවා!

## වෙස්සභූ බුදුරජාණන් වහන්සේට වන්දනාව

**ලෝක විදූං ලෝක නාථං -වෙස්සභූං සුඛ දායකං**
**සාල බෝධිංච කල්‍යාණං - නමාමි සිරසාදරං**

එම මණ්ඩ නම් කල්පයෙහිදීම නැවත බුද්ධාන්තරයකින් පසුව ලොව පහළ වී වදාළ සකල ලෝකය ඇතැඹුලක් සේ මැනවින් දන වදාළ වූ සියලු ලෝ වැසියන්ට අසහාය පිහිටක් වූ දෙව් මිනිසුන්ට තිවර්ග සම්පත් සලසා දුන්නා වූ ''වෙස්සභූ'' නම් යම් මුනීන්ද්‍රයන් වහන්සේ නමක් පහළ වූ සේක් ද, ඒ බුදුරජාණන් වහන්සේට ද උන්වහන්සේට බුදුවීම සඳහා පිහිට වී වදාළ සාල කල්‍යාණ නම් ජය ශ්‍රී මා බෝධීන් වහන්සේට ද මම නමස්කාර කරමි. මෙම සියලු පූජාවන් ද සාදර ගෞරවයෙන් පූජා කරමි. පූජා වේවා.

සාධු ! සාධු !! සාධු !!!



## 25. කකුසඳ බුදුරජාණන් වහන්සේට පූජාව

**දීපේහි ගන්ධ ධූපේහි - ගිලාන පච්චයේහිච**
**පුප්ඵාදි වත්ථු ජාතේහි - සුද්ධේහි කප්පියේහිච**
**අනන්ත ගුණ සම්පන්නං- කකුසන්ධං මහා මුනිං**
**සුද්ධ චිත්තප්ප සාදේන - භත්‍යාදරේන පූජයේ**

ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස ! හාත්පස අඳුර නසමින් බැබලෙන පහනින්ද, දසත පැතිරෙන මනහර සුගන්ධ ධූපයෙන්ද, අෂ්ඨපානාදී ප්‍රණීත ගිලන් පසින්ද, විසිතුරු මල් ආදී ශුද්ධ කැප වස්තු සමූහයෙන්ද, ලොවට නායක වූ අනන්ත ගුණ සම්පන්න වූ කකුසඳ බුදුරජාණන් වහන්සේට පිරිසිදු වූ ප්‍රසන්න සිතින් භත්‍යාදරයෙන් පූජා කරමි. පූජා වේවා!

සාධු ! සාධු !! සාධු !!!

## කකුසඳ බුදුරජාණන් වහන්සේට වන්දනාව

**සෝ භගවා ඉතිපි කකුසන්ධෝ සම්මා සම්බුද්ධෝ, කකුසන්ධෝ සම්මා සම්බුද්ධෝ වත සෝ භගවා, තං භගවන්තං කකුසන්ධං සම්මා සම්බුද්ධං සරණං ගච්ඡාමි. තං භගවන්තං කකුසන්ධං සම්මා සම්බුද්ධං සිරසා නමාමි.**

ඒ කකුසඳ බුදුරජාණන් වහන්සේ මෙසේද

සම්මා සම්බුද්ධ නම් වන සේක. ඒ කකුසඳ බුදුරජාණන් වහන්සේ ඒකාන්තයෙන්ම සම්මා සම්බුද්ධ නම් වන සේක. ඒ කකුසඳ බුදුරජාණන් වහන්සේ මම සරණ යමි. ඒ කකුසඳ බුදුරජාණන් වහන්සේට මාගේ නමස්කාරය වේවා!

## කකුසඳ බුදුරජාණන් වහන්සේට වන්දනා කිරීම

**කකුසන්ධං සත්ථ වාහං - මුනින්දං සුසමාහිතං**
**සිරීසං නාම තං බෝධිං - නමාමි සිරසාදරං**

නැවත බුද්ධ ශූන්‍ය වූ තිස් එක් කල්පයකින් පසුව මේ මහා භද්‍ර කල්පයෙහි ප්‍රථම අන්තඃකල්පයෙහිදීම ලොව පහළ වී වදාළ දමනය කරන ලද ඉඳුරන් ඇත්තා වූ මාර්ග දේශකත්වයෙන් සත්ථ වාහක නම් වූ ''කකුසඳ'' නම් යම් මුනීන්ද්‍රයන් වහන්සේ නමක් ලොව පහළ වූ සේක්ද ඒ බුදුරජාණන් වහන්සේට ද උන්වහන්සේට බුදුවීම සඳහා පිහිට වී වදාළ ''මහරී'' නම් ජය ශ්‍රී මහා බෝධින් වහන්සේට ද මම නමස්කාර කරමි. මෙම සියලු පූජාවන්ද සාදර ගෞරවයෙන් පූජා කරමි. පූජා වේවා.

**සාධු ! සාධු !! සාධු !!!**



## 26. කෝණාගමණ බුදුරජාණන් වහන්සේට පූජාව

**දීපේහි ගන්ධ ධූපේහි - ගිලාන පච්චයේහිච**
**පුප්ඵාදි වත්‍ථු ජාතේහි - සුද්ධේහි කප්පියේහිච**
**අනන්ත ගුණ සම්පන්නං- කෝණාගමන සම්බුද්ධං**
**සුද්ධ චිත්තප්ප සාදේන - භත්‍යාදරේන පූජයේ**

ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස! හාත්පස අඳුර නසමින් බැබලෙන පහනින්ද, දසත පැතිරෙන මනහර සුගන්ධ ධූපයෙන්ද, අෂ්ඨපානාදී ප්‍රණීත ගිලන් පසින්ද, විසිතුරු මල් ආදී ශුද්ධ කැප වස්තු සමූහයෙන්ද, සම්මා සම්බුද්ධා දී ගුණයෙන් අනන්ත ගුණ සම්පන්න වූ ඒ කොණාගමන බුදුරජාණන් වහන්සේට පිරිසිදු වූ ප්‍රසන්න සිතින් භත්‍යාදරයෙන් පූජා කරමි. පූජා වේවා!

**සාධු ! සාධු !! සාධු !!!**

## කෝණාගමණ බුදුරජාණන් වහන්සේට වන්දනාව

**සෝ භගවා ඉතිපි කොණාගමණෝ සම්මා සම්බුද්ධෝ, කොණාගමණෝ සම්මා සම්බුද්ධෝ වත සෝ භගවා, තං භගවන්තං කොණාගමණං සම්මා සම්බුද්ධං සරණං ගච්ඡාමි. තං භගවන්තං කොණාගමණං සම්මා සම්බුද්ධං සිරසා නමාමි.**

ඒ කෝණාගමණ බුදුරජාණන් වහන්සේ මෙසේද සම්මා සම්බුද්ධ නම් වන සේක. ඒ කෝණාගමණ බුදුරජාණන් වහන්සේ ඒකාන්තයෙන්ම සම්මා සම්බුද්ධ නම් වන සේක. ඒ කෝණාගමණ බුදුරජාණන් වහන්සේ මම සරණ යමි. ඒ කෝණාගමණ බුදුරජාණන් වහන්සේට මාගේ නමස්කාරය වේවා!

**කෝණාගමන බුදුරජාණන් වහන්සේට වන්දනා කිරීම**

**මහේසිං කෝණාගමණං - බුද්ධං දස විලෝචනං**
**උදුම්බරංච තං බෝධිං - නමාමි සිරසාදරං**

නැවත බුද්ධාන්තරයකින් පසුව මේ භද්‍ර කල්පයෙ දෙවන අන්තඃකල්පයෙහිදී ලොව පහළ වී වදාළ සකල ධර්මයන් මනාව අවබෝධ කළා වූ නොපැකිල දක්නා වූ අනාවරණ ඥානයෙන් සමන්නාගත වූ ''කෝණාගමන'' නම් යම් මුනීන්ද්‍රයන් වහන්සේ නමක් වූ සේක්ද ඒ බුදුරජාණන් වහන්සේටද, උන්වහන්සේට බුදුවීම සඳහා පිහිට වී වදාළ ''දිඹුල්'' නම් ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේට ද මම නමස්කාර කරමි. මෙම සියළු පූජාවන්ද සාදර ගෞරවයෙන් පූජා කරමි. පූජා වේවා.

සාධු ! සාධු !! සාධු !!!



## 27. කස්සප බුදුරජාණන් වහන්සේට පූජාව

**දීපේහි ගන්ධ ධූපේහි - ගිලාන පච්චයේහිච**
**පුප්ඵාදි වත්ථු ජාතේහි - සුද්ධේහි කප්පියේහිච**
**අනන්ත ගුණ සමපන්නං- කස්සපං ජින පුංගවං**
**සුද්ධ චිත්තප්පසාදේන - භත්‍යාදරේන පූජයේ**

ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස ! හාත්පස අඳුර නසමින් බැබලෙන පහනින්ද, දසත පැතිරෙන මනහර සුගන්ධ ධූපයෙන්ද, අෂ්ඨපානාදී ප්‍රණීත ගිලන් පසින්ද, විසිතුරු මල් ආදී ශුද්ධ කැප වස්තු සමූහයෙන්ද, පස්මරුන් දිනූ මහත් යසස් ඇති අනන්ත ගුණ සම්පන්න වූ කස්සප බුදුරජාණන් වහන්සේට පිරිසිදු වූ ප්‍රසන්න සිතින් භත්‍යාදරයෙන් පූජා කරමි. පූජා වේවා!

සාධු ! සාධු !! සාධු !!!

**කස්සප බුදුරජාණන් වහන්සේට වන්දනාව**

**සෝ භගවා ඉතිපි කස්සපෝ සම්මා සම්බුද්ධෝ, කස්සපෝ සම්මා සම්බුද්ධෝ වත සෝ භගවා, තං භගවන්තං කස්සපං සම්මා සම්බුද්ධං සරණං ගච්ඡාමි. තං භගවන්තං කස්සපං සම්මා සම්බුද්ධං සිරසා නමාමි.**

ඒ කස්සප බුදුරජාණන් වහන්සේ මෙසේද

සම්මා සම්බුද්ධ නම් වන සේක. ඒ කස්සප බුදුරජාණන් වහන්සේ ඒකාන්තයෙන්ම සම්මා සම්බුද්ධ නම් වන සේක. ඒ කස්සප බුදුරජාණන් වහන්සේ මම සරණ යමි. ඒ කස්සප බුදුරජාණන් වහන්සේට මාගේ නමස්කාරය වේවා!

## කස්සප බුදුරජාණන් වහන්සේට වන්දනාව

**කස්සපං නාම සම්බුද්ධං - මරජිං පුරිසුත්තමං**
**නිග්‍රොධංච තං බෝධිං - නමාමි සිරසාදරං**

නැවත බුද්ධාන්තරයකින් පසුව මෙම භද්‍ර කල්පයෙහි තෙවන අන්තඃකල්පයෙහිදී ලොව පහළ වී වදාළ සියලු කෙලෙස් සතුරන් නැසුවාවූ ද මනා කොට පස් මරුන් පරදවන ලද්දාවූ ද සියලු සත්වයනට උත්තම වූ ''කස්සප'' නම් යම් මුනීන්ද්‍රයන් වහන්සේ නමක් ලොව පහළ වූ සේක්ද ඒ බුදුරජාණන් වහන්සේට ද උන්වහන්සේට බුදුවීම සඳහා පිහිට වී වදාළ ''නුග'' නම් ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේට ද මම නමස්කාර කරමි. මෙම සියලු පූජාවන්ද සාදර ගෞරවයෙන් පූජා කරමි. පූජා වේවා.

**සාධු ! සාධු !! සාධු !!!**



## 28. ගෞතම බුදුරජාණන් වහන්සේට පූජාව

**දීපේහි ගන්ධ ධූපේහි - ගිලාන පච්චයේහිච**
**පුප්ඵාදි වත්‍ථු ජාතේහි - සුද්ධෙහි කප්පියේහිච**
**අනන්ත ගුණ සම්පන්නං - ගෝතමං ලෝකනායකං**
**සුද්ධ චිත්තප්පසාදේන - භත්‍යාදරේන පූජයේ**

ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස ! හත්පස අඳුර නසමින් බැබලෙන පහනින්ද, දසත පැතිරෙන මනහර සුගන්ධ ධූපයෙන්ද, අෂ්ඨපානාදී ප්‍රණීත ගිලන් පසින්ද, විසිතුරු මල් ආදී ශුද්ධ කැප වස්තු සමූහයෙන්ද, ලෝකයට නායක වූ අනන්ත ගුණ සම්පන්න වූ ගෞතම බුදුරජාණන් වහන්සේට පිරිසිදු වූ ප්‍රසන්න සිතින් භත්‍යාදරයෙන් පූජා කරමි. පූජා වේවා!

**සාධු ! සාධු !! සාධු !!!**

## ගෞතම බුදුරජාණන් වහන්සේ වන්දනා ගාථාව

**සෝ භගවා ඉතිපි ගෝතමෝ සම්මා සම්බුද්ධෝ, ගෝතමෝ සම්මා සම්බුද්ධෝ වත සෝ භගවා, තං භගවන්තං ගෝතමං සම්මා සම්බුද්ධං සරණං ගච්ඡාමි. තං භගනවන්තං ගෝතමං සම්මා සම්බුද්ධං සිරසා නමාමි.**

ඒ ගෞතම බුදුරජාණන් වහන්සේ මෙසේද

සම්මා සම්බුද්ධ නම් වන සේක. ඒ ගෞතම බුදුරජාණන් වහන්සේ ඒකාන්තයෙන්ම සම්මා සම්බුද්ධ නම් වන සේක. ඒ ගෞතම බුදුරජාණන් වහන්සේ මම සරණ යමි. ඒ ගෞතම බුදුරජාණන් වහන්සේට මාගේ නමස්කාරය වේවා!

## ගෞතම බුදුරජාණන් වහන්සේට වන්දනාව

**අංගීරසං භූරිපඤ්ඤං - ගොතමං සක්‍ය පුංගවං**
**අස්සත්ථංච මහා බෝධිං - නමාමි සිරසාදරං**

නැවත බුද්ධාන්තරයකින් පසුව මේ මහා භද්‍ර කල්පයෙහිම සතර වන අනතඃකල්පය වන මෙම බුද්ධාන්තරයෙහි ලොව පහළ වී වදාළ මහා ප්‍රඥා වූ ශාක්‍ය පුත්‍රයන් පිරිවරා ගත්තා වූ ලෝක සත්වයාට එකම පිහිටක් වූ ''ගෞතම'' නම් ගොත්‍ර නාමයෙන් ජනාදරයට පත් වූ අප සිද්ධාර්ථ ගෞතම බුදුරජාණන් වහන්සේට ද උන්වහන්සේට බුදුවීම සඳහා පිහිට වී වදාළ ''අස්සත්ථ'' නම් ජය ශ්‍රී මහා බෝධින් වහන්සේටද මම නමස්කාර කරමි. මෙම සියළු පූජාවන් ද සාදර ගෞරවයෙන් පූජා කරමි. පූජා වේවා.

**සාධු ! සාධු !! සාධු !!!**



# දස පාරමි ඥාණ පූජාව
# සහ
# දසපාරමී ඥාණ වන්දනාව

**හන්ද බුද්ධ කරෙ ධම්මෙ -විචිනාමි ඉතො චිතො**
**උද්ධං අධො දසදිසා - යාවතා ධම්ම ධාතුයා**

දස දිසාවෙහි බුද්ධ කාරක ධර්ම සොයන්නා වූ බෝසතුන් හට ලෝක ධාතුවෙහි පූර්ව බෝසතුන් සොයන ලද බුද්ධ කාරක ධර්ම සොයන්නේ නම් මැනවැයි සිතීය.

## 1. දාන පාරමිතා ඥාණ පූජාව

**දීපේහි ගන්ධ ධූපේහි - ගිලාන පච්චයේහිච**
**පුප්ඵාදි වත්ථු ජාතේහි - සුද්ධේහි කප්පියේහිච**
**දාන පාරමි ඥාණං තං - පූරෙන්තං ගොතමං ජිනං**
**පාරමි පූර නත්ථාය - නිබ්බානත්ථාය පූජයේ**

ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස හාත්පස අඳුර නසමින් බැබළෙන පහනින් ද, දසත පැතිරෙන මනහර සුගන්ධ ධූපයෙන්ද, අෂ්ඨපානාදි ප්‍රණීත ගිලන් පසෙන්ද, විසිතුරු මල් ආදී ශුද්ධ කැප වස්තු සමූහයෙන්ද, පස්මරුන් දිනූ ගෞතම ජිනෙන්ද්‍රයන් වහන්සේ පුරන ලද දාන පාරමී ඥාණයට මම පාරමී පූරණය පිණිස නිවන් අවබෝධය පිණිස

පූජා කරමි පූජා වේවා!

**සාධු ! සාධු !! සාධු !!!**

## දාන පාරමිතා ඤාණ වන්දනාව

**සෝ භගවා ඉතිපි දාන පාරමිතා ඤාණේන සමන්නාගතෝ, දාන පාරමිතා ඤාණේන සමන්නාගතෝ වත සෝ භගවා, තං භගවන්තං දාන පාරමිතා ඤාණේන සමන්නාගතං සරණං ගච්ඡාමි තං භගවන්තං දාන පාරමිතා ඤාණේන සමන්නා ගතං සිරසා නමාමි.**

ඒ භාග්‍යවතුන් වහන්සේ මෙසේද දාන පාරමිතා ඤාණයෙන් සමන්නාගත වනසේක. ඒ භාග්‍යවතුන් වහන්සේ ඒකාන්තයෙන් දාන පාරමිතා පිරීමේ ඤාණයෙන් සමන්නාගත වන සේක. ඒ දාන පාරමිතා ඤාණයෙන් සමන්නාගත භාග්‍යවතුන් වහන්සේ මම සරණ යමි. ඒ දාන පාරමිතා ඤාණයෙන් සමන්නාගත භාග්‍යවතුන් වහන්සේට මාගේ නමස්කාරය වේවා!

**සාධු ! සාධු !! සාධු !!!**



## දාන පාරමිතා ඤාණ වන්දනාව

**විචිනන්තෝ තදා දක්ඛිං - පඨමං දාන පාරමිං**
**පුබ්බකේහි මහේසීහි - ආසේවිත නිසේවිතං**
**ඉමං ත්වං පඨමං තාව- දළහං කත්වා සමාදිය**
**දාන පාරමිතං ගච්ඡ-යදි බොධිං පත්තු මිච්ඡසි**

බුද්ධ කාරක ධර්ම විමසන්නේ අතීත බෝසතුන් වහන්සේලා විසින් භාවිතා කල ප්‍රථම දාන පාරමිතාව දුටුවෙමි. කලයක් යටිකුරු කල කල්හි දිය නොරැදෙන්නා සේ සිදුකරන පරිත්‍යාගයෙන් පළමුව දාන පාරමිතාවෙන් සම්මා සම්බෝධියට පැමිණෙන්නයැයි අධිෂ්ඨාන කළසේක.

**සාදු! සාදු!! සාදු!!!**

## 2. සීල පාරමිතා ඤාණ පූජාව

**දීපේහි ගන්ධ ධූපේහි - ගිලාන පච්චයේහිච**
**පුප්ඵාදි වත්ථු ජාතේහි - සුද්ධේහි කප්පියේහිච**
**සීල පාරමි ඤාණං තං - පූරෙන්තං ගෝතමං ජිනං**
**පාරමී පූර නත්ථාය - නිබ්බානත්ථාය පූජයේ.**

''ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස'' හාත්පස අඳුර නසමින් බැබළෙන පහනින්ද, දසත පැතිරෙන මනහර සුගන්ධ ධූපයෙන්ද,

අෂ්ඨපානාදී ප්‍රනීත ගිලන් පසෙන්ද විසිතුරු මල් ආදි ශුද්ධ කැප වස්තු සමූහයෙන්ද, පස්මරුන් දිනූ ගෞතම ජිනෙන්ද්‍රයන් වහන්සේ පුරන ලද සීල පාරමී ඤාණයට මම පාරමී පූරණය පිණිස නිවන් අවබෝධය පිණිස පූජා කරමි පූජා වේවා!

## සීල පාරමිතා ඤාණ වන්දනාව

**සො භගවා ඉතිපි සීල පාරමිතා ඤාණේන සමන්නාගතො, සීල පාරමිතා ඤාණේන සමන්නාගතො වත සො භගවා, තං භගවන්තං සීල පාරමිතා ඤාණේන සමනාගතං සරණං ගච්ඡාමි තං භගවන්තං සීල පාරමිතා ඤාණේන සමන්නාගතං සිරසා නමාමි**

ඒ භාග්‍යවතුන් වහන්සේ මෙසේද සීල පාරමිතා ඤාණයෙන් සමන්නාගත වනසේක. ඒ භාග්‍යවතුන් වහන්සේ ඒකාන්තයෙන් සීල පාරමිතා ඤාණයෙන් සමන්නාගත වන සේක. ඒ සීල පාරමිතා ඤාණයෙන් සමන්නාගත භාග්‍යවතුන් වහන්සේ මම සරණ යමි. ඒ සීල පාරමිතා ඤාණයෙන් සමන්නාගත භාග්‍යවතුන් වහන්සේට මාගේ නමස්කාරය වේවා!

**සාධු ! සාධු !! සාධු !!!**



## සීල පාරමිතා ඤාණ වන්දනාව

**විචින්තො තදා දක්ඛිං - දුතියං සීල පාරමිං**
**පුබ්බකේහි මහේසීහි - ආසේවිත නිසේවිතං**
**ඉමං ත්වං දුතියං තාව - දළ්හං කත්වා සමාදිය**
**සීල පාරමිතං ගච්ඡ -යදි බෝධිං පත්තු මිච්ඡසි**

බුද්ධ කාරක ධර්ම විමසන්නේ අතීත බෝසතුන් වහන්සේලා විසින් භාවිතා කළ දෙවන සීල පාරමිතාව දුටුවෙමි. සෙමර මුවා වලිගය රක්නාක් මෙන් චතුපාරි සුද්ධි සීල නැමැති දෙවෙනි සීල පාරමිතාවෙන් සම්මා සම්බෝධියට පැමිණෙන්නයැයි අධිෂ්ඨාන කළසේක.

**සාධු ! සාධු !! සාධු !!!**

## 3. නෙක්ඛම්ම පාරමිතා ඤාණ පූජාව

**දීපේහි ගන්ධ ධූපේහි - ගිලාන පච්චයේහිච**
**පුප්ඵාදි වත්ථු ජාතේහි - සුද්ධේහි කප්පියේහිච**
**නෙක්ඛම්ම පාරමි ඤාණං තං - පූරෙන්තං ගෝතමං ජිනං**
**පාරමි පූර නත්ථාය - නිබ්බානත්ථාය පූජයේ.**

''ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස'' හත්පස අඳුර නසමින් බැබලෙන පහනින්ද, දසත පැතිරෙන මනහර සුගන්ධ ධූපයෙන්ද, අෂ්ඨපානාදී ප්‍රනීත ගිලන් පසෙන්ද විසිතුරු මල්

ආදි ශුද්ධ කැප වස්තු සමූහයෙන්ද, පස්මරුන් දිනූ ගෞතම ජිනේන්ද්‍රයන් වහන්සේ පුරන ලද නෙක්ඛම්ම පාරමී ඥාණයට මම පාරමී පූරණය පිණිස නිවන් අවබෝධය පිණිස පූජා කරමි පූජා වේවා!

සාධු ! සාධු !! සාධු !!!

## නෙක්ඛම්ම පාරමිතා ඥාණ වන්දනාව

**සෝ භගවා ඉතිපි නෙක්ඛම්ම පාරමිතා ඥාණේන සමන්නාගතෝ, නෙක්ඛම්ම පාරමිතා ඥාණේන සමන්නාගතෝ වත සෝ භගවා, තං භගවන්තං නෙක්ඛම්ම පාරමිතා ඥාණේන සමනාගතං සරණං ගච්ඡාමි තං භගවන්තං නෙක්ඛම්ම පාරමිතා ඥාණේන සමන්නාගතං සිරසා නමාමි.**

ඒ භාග්‍යවතුන් වහන්සේ මෙසේද නෙක්ඛම්ම පාරමිතා ඥාණයෙන් සමන්නාගත වනසේක. ඒ භාග්‍යවතුන් වහන්සේ ඒකාන්තයෙන් නෙක්ඛම්ම පාරමිතා ඥාණයෙන් සමන්නාගත වන සේක. ඒ නෙක්ඛම්ම පාරමිතා ඥාණයෙන් සමන්නාගත භාග්‍යවතුන් වහන්සේ මම සරණ යමි. ඒ නෙක්ඛම්ම පාරමිතා ඥාණයෙන් සමන්නාගත භාග්‍යවතුන් වහන්සේට මාගේ නමස්කාරය වේවා!

සාධු ! සාධු !! සාධු !!!



## නෙක්ඛම්ම පාරමිතා ඥාණ වන්දනාව

**විචිනන්තෝ තදා දක්ඛිං-තතියං නෙක්ඛම්ම පාරමිං**
**පුබ්බකේහි මහේසීහි -ආසේවිත නිසේවිතං**
**ඉමං ත්වං තතියං තාව- දළ්හං කත්වා සමාදිය**
**නෙක්ඛම්ම පාරමිතං ගච්ඡ - යදි බෝධිං පත්තු මිච්ඡසි**

බුද්ධ කාරක ධර්ම සොයන්නේ අතීත බෝසතුන් වහන්සේලා විසින් භාවිතා කළ තුන්වෙනි නෙක්ඛම්ම පාරමිතාව දුටුවෙමි. බන්ධනාගාරයෙන් මිදුනු කෙනෙක් මෙන් සියළු කාමාදි භවයන් ගෙන් නිදහස් වෙන තුන්වෙනි නෙක්ඛම්ම පාරමිතාවෙන් සම්මා සම්බෝධියට පැමිණෙන්නයැයි අධිෂ්ඨාන කළසේක.

සාදු! සාදු!! සාදු!!!

## 4. ප්‍රඥා පාරමිතා ඥාණ පූජාව

**දීපේහි ගන්ධ ධූපේහි - ගිලාන පච්චයේහිච**
**පුප්ඵාදි වත්ථු ජාතේහි - සුද්ධේහි කප්පියේහිච**
**පඤ්ඤා පාරමි ඥාණං තං - පූරෙන්තං ගොතමං ජිනං**
**පාරමි පූර නත්ථාය - නිබ්බානත්ථාය පූජයේ**

''ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස'' හාත්පස

අඳුර නසමින් බැබළෙන පහනින්ද, දසත පැතිරෙන මනහර සුගන්ධ ධූපයෙන්ද, අෂ්ඨපානාදී ප්‍රනීත ගිලන් පසෙන්ද විසිතුරු මල් ආදි ශුද්ධ කැප වස්තු සමූහයෙන්ද, පස්මරුන් දිනූ ගෞතම ජිනෙන්ද්‍රයන් වහන්සේ පුරන ලද ප්‍රඥා පාරමී ඥාණයට මම පාරමී පූරණය පිණිස නිවන් අවබෝධය පිණිස පූජා කරමි පූජා වේවා!

**සාධු ! සාධු !! සාධු !!!**

## ප්‍රඥා පාරමිතා ඥාණ වන්දනාව

**සෝ භගවා ඉතිපි පඤ්ඤා පාරමිතා ඤාණේන සමන්නාගතෝ ප්‍රඥා පාරමිතා ඤාණේන සමන්නාගතෝ වත සෝ භගවා, තං භගවන්තං පඤ්ඤා පාරමිතා ඤාණේන සමන්නාගතං සරණං ගච්ඡාමි. තං භගවන්තං පඤ්ඤා පාරමිතා ඤාණෙන සමන්නාගතං සිරසා නමාමි.**

ඒ භාග්‍යවතුන් වහන්සේ මෙසේද ප්‍රඥා පාරමිතා ඥාණයෙන් සමන්නාගත වනසේක. ඒ භාග්‍යවතුන් වහන්සේ ඒකාන්තයෙන් ප්‍රඥා පාරමිතා ඥාණයෙන් සමන්නාගත වන සේක. ඒ ප්‍රඥා පාරමිතා ඥාණයෙන් සමන්නාගත භාග්‍යවතුන් වහන්සේ මම සරණ යමි. ඒ ප්‍රඥා පාරමිතා ඥාණයෙන් සමන්නාගත භාග්‍යවතුන් වහන්සේට මාගේ නමස්කාරය වේවා!



## ප්‍රඥා පාරමිතා ඥාණ වන්දනාව

**විචිනන්තෝ තදා දක්ඛිං - චතුත්ථං පඤ්ඤා පාරමිං**
**පුබ්බකේහි මහේසීහි - ආසේවිත නිසේවිතං**
**ඉමං ත්වං චතුත්ථං තාව - දළ්හං කත්වා සමාදිය**
**පඤ්ඤාය පාරමිතං ගච්ඡ - යදි බෝධිං පත්තු මිච්ඡසි**

බුද්ධ කාරක ධර්ම විමසන්නේ අතීත බෝසතුන් වහන්සේලා විසින් භාවිතා කළ හතර වෙනි දාන පාරමිතාව දුටුවෙමි. පිඬු පිණිස ගෙපිලි වලින් යන භික්ෂුව හීන, මධ්‍යම උත්කෘෂ්ට කුලයන් කෙරෙහි සම සිත යොදා යැපෙන පමණට ආහාර ලබා ගන්නා සේ හීන මධ්‍යම උත්කෘෂ්ට සියලු උගතුන් වෙතින් දත යුතු දේ උගෙන සතරවෙනි ප්‍රඥා පාරමිතාවෙන් සම්මා සම්බෝධියට පැමිණෙන්නයැයි අධිෂ්ඨාන කළසේක

**සාධු ! සාධු !! සාධු !!!**

## 5. විරිය පාරමි ඥාණ පූජාව

**දීපේහි ගන්ධ ධූපේහි - ගිලාන පච්චයේහිච**
**පුප්ඵාදි වත්ථු ජාතේහි - සුද්ධේහි කප්පියේහිච**
**විරිය පාරමි ඤාණං තං -පූරෙන්තං ගොතමං ජිනං**
**පාරමි පූර නත්ථාය - නිබ්බානත්ථාය පූජයේ.**

''ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස'' හාත්පස අඳුර නසමින් බැබළෙන පහනින්ද, දසත පැතිරෙන මනහර සුගන්ධ ධූපයෙන්ද, අෂ්ඨපානාදී ප්‍රනීත ගිලන් පසෙන්ද විසිතුරු මල් ආදි ශුද්ධ කැප වස්තු සමූහයෙන්ද, පස්මරුන් දිනූ ගෞතම ජිනෙන්‍ද්‍රයන් වහන්සේ පුරන ලද වීරිය පාරමී ඥාණයට මම පාරමී පූර්ණය පිණිස නිවන් අවබෝධය පිණිස පූජා කරමි පූජා වේවා!

**සාධු ! සාධු !! සාධු !!!**

## විරිය පාරමිතා ඥාණ වන්දනාව

**සෝ භගවා ඉතිපි විරිය පාරමිතා ඥාණේන සමන්නාගතො.විරිය පාරමිතා ඥාණේන සමන්නාගතෝ වත සෝ භගවා. තං භගවන්තං විරිය පාරමිතා ඥාණේන සමනාගතං සරණං ගච්ඡාමි, තං භගවන්තං විරිය පාරමිතා ඥාණේන සමන්නාගතං සිරසා නමාමි**

ඒ භාග්‍යවතුන් වහන්සේ මෙසේද වීරිය පාරමිතා ඥාණයෙන් සමන්නාගත වනසේක. ඒ භාග්‍යවතුන් වහන්සේ ඒකාන්තයෙන් වීරිය පාරමිතා ඥාණයෙන් සමන්නාගත වන සේක. ඒ වීරිය පාරමිතා ඥාණයෙන් සමන්නාගත භාග්‍යවතුන් වහන්සේ මම සරණ යමි. ඒ වීරිය පාරමිතා ඥාණයෙන් සමන්නාගත භාග්‍යවතුන්



වහන්සේට මාගේ නමස්කාරය වේවා!

**සාධු ! සාධු !! සාධු !!!**

## වීරිය පාරමිතා ඥාණ වන්දනාව

**විචිනන්තෝ තදා දක්ඛිං - පඤ්චමං විරිය පාරමිං**
**පුබ්බකේහි මහේසීහි - ආසේවිත නිසේවිතං**
**ඉමං ත්වං පඤ්චමං තාව - දළහං කත්වා සමාදිය**
**විරිය පාරමිතං ගච්ඡ - යදි බෝධිං පත්තු මිච්ඡසි**

බුද්ධ කාරක ධර්ම විමසන්නේ අතීත බෝසතුන් වහන්සේලා විසින් භාවිතා කළ පස් වෙනි වීර්ය පාරමිතාව දුටුවෙමි. සිංහ රාජයෙක් සතර ඉරියව් නොපසුබස්නා වීර්‍යයෙන් සම්පූර්ණ කරන්නාක් මෙන් සතර ඉරියව් හි නොපසුබස්නා පස්වෙනි වීර්ය පාරමිතාවෙන් සම්මා සම්බෝධියට පැමිණෙන්නයැයි අධිෂ්ඨාන කළසේක

**සාධු ! සාධු !! සාධු !!!**

## 6. ඛන්ති පාරමිතා ඥාණ පූජාව

**දීපේහි ගන්ධ ධූපේහි - ගිලාන පච්චයේහිච**
**පුප්ඵාදි වත්ථු ජාතේහි - සුද්ධේහි කප්පියේහිච**
**ඛන්ති පාරමි ඥාණංතං-පූරෙන්තං ගෝතමං ජිනං**
**පාරමි පූර නත්ථාය - නිබ්බානත්ථාය පූජයේ.**

''ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස'' හාත්පස

අඳුර නසමින් බැබළෙන පහනින්ද දසත පැතිරෙන මනහර සුගන්ධ ධූපයෙන්ද, අෂ්ඨපානාදී ප්‍රනීත ගිලන් පසෙන්ද විසිතුරු මල් ආදි ශුද්ධ කැප වස්තු සමූහයෙන්ද, පස්මරුන් දිනූ ගෞතම ජිනෙන්ද්‍රයන් වහන්සේ පුරන ලද ඛන්ති පාරමී ඤාණයට මම පාරමී පූර්ණය පිණිස නිවන් අවබෝධය පිණිස පූජාකරමි පූජා වේවා!

**සාධු ! සාධු !! සාධු !!!**

## ඛන්ති පාරමිතා ඤාණ වන්දනාව

**සෝ භගවා ඉතිපි ඛන්ති පාරමිතා ඤාණේන සමන්නාගතෝ. ඛන්ති පාරමිතා ඤාණේන සමන්නාගතෝ වත සෝ භගවා. තං භගවන්තං ඛන්ති පාරමිතා ඤාණේන සමනාගතං සරණං ගච්ඡාමි. තං භගවන්තං ඛන්ති පාරමිතා ඤාණේන සමන්නාගතං සිරසා නමාමි**

ඒ භාග්‍යවතුන් වහන්සේ මෙසේද ඛන්ති පාරමිතා ඤාණයෙන් සමන්නාගත වනසේක. ඒ භාග්‍යවතුන් වහන්සේ ඒකාන්තයෙන් ඛන්ති පාරමිතා ඤාණයෙන් සමන්නාගත වන සේක. ඒ ඛන්ති පාරමිතා ඤාණයෙන් සමන්නාගත භාග්‍යවතුන් වහන්සේ මම සරණ යමි. ඒ ඛන්ති පාරමිතා ඤාණයෙන් සමන්නාගත භාග්‍යවතුන් වහන්සේට මාගේ නමස්කාරය වේවා!**ඛන්ති**



## පාරමිතා ඤාණ වන්දනාව

**විචිනන්තෝ තදා දක්ඛිං - ඡට්ඨමං ඛන්ති පාරමිං**
**පුබ්බකේහි මහේසීහි - ආසේවිත නිසේවිතං**
**ඉමං ත්වං ඡට්ඨමං තාව - දළ්හං කත්වා සමාදිය**
**ඛන්ති පාරමිතං ගච්ඡ - යදි බෝධිං පත්තු මිච්ඡසි**

බුද්ධ කාරක ධර්ම විමසන්නේ අතීත බෝසතුන් වහන්සේලා විසින් භාවිතා කළ හය වෙනි ඛන්ති පාරමිතාව දුටුවෙමි. මහපොළොවට දමන ලද පවිත්‍ර අපවිත්‍ර සියල්ල ඉවසන්නාක් මෙන් ලොව සියල්ලන්ගේ බුහුමන් අවමන් සියල්ල ඉවසන හයවෙනි ඛන්ති පාරමිතාවෙන් සම්මා සම්බෝධියට පැමිණෙන්නයැයි අධිෂ්ඨාන කළසේක.

**සාධු! සාධු!! සාධු!!!**

## 7. සත්‍ය පාරමිතා ඤාණ පූජාව

**දීපේහි ගන්ධ ධූපේහි - ගිලාන පච්චයේහිච**
**පුප්ඵාදි වත්ථු ජාතේහි - සුද්ධේහි කප්පියේහිච**
**සච්ච පාරමී ඤාණං තං-පූරෙන්තං ගෝතමං ජිනං**
**පාරමී පූර නත්ථාය - නිබ්බානත්ථාය පූජයේ.**

''ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස'' හාත්පස අඳුර නසමින් බැබළෙන පහනින්ද, දසත පැතිරෙන මනහර සුගන්ධ ධූපයෙන්ද, අෂ්ඨපානාදී ප්‍රනීත ගිලන් පසෙන්ද විසිතුරු මල්

ආදි ශුද්ධ කැප වස්තු සමූහයෙන්ද, පස්මරුන් දිනූ ගෞතම ජිනෙන්‍ද්‍රයන් වහන්සේ පුරන ලද සත්‍ය පාරමී ඤාණයට මම පාරමී පූර්ණය පිණිස නිවන් අවබෝධය පිණිස පූජා කරමි පූජා වේවා!

සාධු ! සාධු !! සාධු !!!

## සත්‍ය පාරමිතා ඥාණ වන්දනාව

**සෝ භගවා ඉතිපි සච්ච පාරමිතා ඤාණේන සමන්නාගතෝ, සච්ච පාරමිතා ඤාණේන සමන්නාගතෝ වත සෝ භගවා, තං භගවන්තං සච්ච පාරමිතා ඤාණේන සමනාගතං සරණං ගච්ඡාමි, තං භගවන්තං සච්ච පාරමිතා ඤාණේන සමන්නාගතං සිරසා නමාමි.**

ඒ භාග්‍යවතුන් වහන්සේ මෙසේද සත්‍ය පාරමිතා ඥාණයෙන් සමන්නාගත වනසේක. ඒ භාග්‍යවතුන් වහන්සේ ඒකාන්තයෙන් සත්‍ය පාරමිතා ඥාණයෙන් සමන්නාගත වන සේක. ඒ සත්‍ය පාරමිතා ඥාණයෙන් සමන්නාගත භාග්‍යවතුන් වහන්සේ මම සරණ යමි. ඒ සත්‍ය පාරමිතා ඥාණයෙන් සමන්නාගත භාග්‍යවතුන් වහන්සේට මාගේ නමස්කාරය වේවා!

සාධු ! සාධු !! සාධු !!!



## සත්‍ය පාරමිතා ඥාණ වන්දනාව

**විචිනන්තෝ තදා දක්ඛිං - සත්තමං සච්ච පාරමිං**
**පුබ්බකේහි මහේසීහි - ආසේවිත නිසේවිතං**
**ඉමං ත්වං සත්තමං තාව - දළහං කත්වා සමාදිය**
**සච්ච පාරමිතං ගච්ඡ - යදි බෝධිං පත්තු මිච්ඡසි**

බුද්ධ කාරක ධර්ම විමසන්නේ අතීත බෝසතුන් වහන්සේලා විසින් භාවිතා කළ හත් වෙනි සත්‍ය පාරමිතාව දුටුවෙමි.ඔසදි තාරකාව ලෝකයට තුලාවක් මෙන් වැසිකල්හිද, ගිම්හාන කල්හිද, ගමන් වීථිය වෙනස් නොකරන්නා සේ සත්‍යයෙහි වීථියෙන් නොයික්ම පවතින්නේ සත්වෙනි සත්‍ය පාරමිතාවෙන් සම්මා සම්බෝධියට පැමිණෙන්නයැයි අධිෂ්ඨාන කලසේක.

සාධු ! සාධු !! සාධු !!!

## 8. අධිෂ්ඨාන පාරමිතා ඥාණ පූජාව

**දීපේහි ගන්ධ ධූපේහි - ගිලාන පච්චයේහිච**
**පුප්ඵාදි වත්ථු ජාතේහි - සුද්ධේහි කප්පියේහිච**
**අධිට්ඨාන පාරමි ඤාණං තං - පූරේන්තං ගෝතමං ජිනං**
**පාරමි පූර නත්ථාය - නිබ්බානත්ථාය පූජයේ.**

''ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස'' හාත්පස අඳුර නසමින් බැබළෙන පහනින්ද, දසත පැතිරෙන මනහර සුගන්ධ ධූපයෙන්ද, අෂ්ඨපානාදී ප්‍රනීත ගිලන් පසෙන්ද, විසිතුරු මල් ආදි ශුද්ධ කැප වස්තු සමූහයෙන්ද, පස්මරුන් දිනූ ගෞතම ජිනේන්ද්‍රයන් වහන්සේ පුරන ලද අධිෂ්ඨාන පාරමී ඤාණයට මම පාරමී පූරණය පිණිස නිවන් අවබෝධය පිණිස පූජා කරමි පූජා වේවා!

සාධු ! සාධු !! සාධු !!!

## අධිෂ්ඨාන පාරමිතා ඤාණ වන්දනාව

**සෝ භගවා ඉතිපි අධිට්ඨාන පාරමිතා ඤාණේන සමන්නාගතෝ, අධිට්ඨාන පාරමිතා ඤාණේන සමන්නාගතෝ වත සෝ භගවා, තං භගවන්තං අධිට්ඨාන පාරමිතා ඤාණේන සමනාගතං සරණං ගච්ඡාමි, තං භගවන්තං අධිට්ඨාන පාරමිතා ඤාණේන සමන්නාගතං සිරසා නමාමි.**

ඒ භාග්‍යවතුන් වහන්සේ මෙසේද අධිෂ්ඨාන පාරමිතා ඤාණයෙන් සමන්නාගත වනසේක. ඒ භාග්‍යවතුන් වහන්සේ ඒකාන්තයෙන් අධිෂ්ඨාන පාරමිතා ඤාණයෙන් සමන්නාගත වන සේක. ඒ අධිෂ්ඨාන පාරමිතා ඤාණයෙන් සමන්නාගත භාග්‍යවතුන් වහන්සේ මම සරණ යමි. ඒ අධිෂ්ඨාන පාරමිතා ඤාණයෙන් සමන්නාගත භාග්‍යවතුන් වහන්සේට මාගේ නමස්කාරය වේවා!



## අධිෂ්ඨාන පාරමිතා ඤාණ වන්දනාව

**විචිනන්තෝ තදා දක්ඛිං-අට්ඨමං අධිට්ඨාන පාරමිං**
**පුබ්බකේහි මහේසීහි - ආසේවිත නිසේවිතං**
**ඉමං ත්වං අට්ඨමං තාව - දළ්හං කත්වා සමාදිය**
**අධිට්ඨාන පාරමිතං ගච්ඡ - යදි බෝධිං පත්තු මිච්ඡසි**

බුද්ධ කාරක ධර්ම විමසන්නේ අතීත බෝසතුන් වහන්සේලා විසින් භාවිතා කළ අට වෙනි අධිෂ්ඨාන පාරමිතාව දුටුවෙමි. ශෛලමය පර්වතයක් නිශ්චල වූයෙද එමෙන් අධිෂ්ඨානය සැමකල්හිම නිශ්චලව පවත්වමින් අධිෂ්ඨාන පාරමිතාවෙන් සම්මා සම්බෝධියට පැමිණෙන්නයැයි අධිෂ්ඨාන කළසේක.

සාධු ! සාධු !! සාධු !!!

## 9. මෙත්තා පාරමිතා ඤාණ පූජාව

**දීපේහි ගන්ධ ධූපේහි - ගිලාන පච්චයේහිච**
**පුප්ඵාදි වත්ථු ජාතේහි - සුද්ධේහි කප්පියේහිච**
**මෙත්තා පාරමී ඤාණං තං- පූරේන්තං ගෝතමං ජිනං**
**පාරමී පූර නත්ථාය - නිබ්බානත්ථාය පූජයේ.**

''ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස'' හාත්පස අඳුර නසමින් බැබළෙන පහනින්ද, දසත පැතිරෙන මනහර සුගන්ධ ධූපයෙන්ද,

අෂ්ඨපානාදී ප්‍රනීත ගිලන් පසෙන්ද විසිතුරු මල් ආදි ශුද්ධ කැප වස්තු සමූහයෙන්ද, පස්මරුන් දිනූ ගෞතම ජිනෙන්ද්‍රයන් වහන්සේ පුරන ලද මෙත්තා පාරමී ඤාණයට මම පාරමී පූර්ණය පිණිස නිවන් අවබෝධය පිණිස පූජා කරමි පූජා වේවා!

**සාධු ! සාධු !! සාධු !!!**

## මෙත්තා පාරමී ඤාණ වන්දනාව

**සෝ භගවා ඉතිපි මෙත්තා පාරමිතා ඤාණේන සමන්නාගතෝ මෙත්තා පාරමිතා ඤාණේන සමන්නාගතෝ වත සෝ භගවා තං භගවන්තං මෙත්තා පාරමිතා ඤාණේන සමනාගතං සරණං ගච්ඡාමි තං භගවන්තං මෙත්තා පාරමිතා ඤාණේන සමන්නාගතං සිරසා නමාමි**

ඒ භාග්‍යවතුන් වහන්සේ මෙසේද මෙත්තා පාරමිතා ඤාණයෙන් සමන්නාගත වනසේක. ඒ භාග්‍යවතුන් වහන්සේ ඒකාන්තයෙන් මෙත්තා පාරමිතා ඤාණයෙන් සමන්නාගත වන සේක. ඒ මෙත්තා පාරමිතා ඤාණයෙන් සමන්නාගත භාග්‍යවතුන් වහන්සේ මම සරණ යමි. ඒ මෙත්තා පාරමිතා ඤාණයෙන් සමන්නාගත භාග්‍යවතුන් වහන්සේට මාගේ නමස්කාරය වේවා!

**සාධු ! සාධු !! සාධු !!!**



## මෙත්තා පාරමිතා ඤාණ වන්දනාව

**විචිනන්තෝ තදා දක්ඛිං - නවමං මෙත්තා පාරමිං**
**පුබ්බකේහි මහේසීහි - ආසේවිත නිසේවිතං**
**ඉමං ත්වං නවමං තාව - දළ්හං කත්වා සමාදිය**
**මෙත්තා පාරමිතං ගච්ඡ - යදි බෝධිං පත්තු මිච්ඡසි**

බුද්ධ කාරක ධර්ම විමසන්නේ අතීත බෝසතුන් වහන්සේලා විසින් භාවිතා කල නව වෙනි මෙත්තා පාරමිතාව දුටුවෙමි. ජලය යහපත් වූ අයහපත් වූ ජනයන්ට සිසිල් ගුණයෙන් සමව ස්පර්ශය ලබා දෙමින් රජස්මල පවිත්‍ර කෙරේද, එසේම හිත අහිතයන් කෙරෙහි සම මෙත වඩමින් නවවෙනි මෙත්තා පාරමිතාවෙන් සම්මා සම්බෝධියට පැමිණෙන්නයැයි අධිෂ්ඨාන කලසේකී

## 10. උපෙක්ඛා පාරමිතා ඤාණ පූජාව

**දීපේහි ගන්ධ ධූපේහි - ගිලාන පච්චයේහිච**
**පුප්ඵාදි වත්ථු ජාතේහි - සුද්ධෙහි කප්පියේහිච**
**උපේක්ඛා පාරමි ඤාණං තං -පූරේන්තං ගෝතමං ජිනං**
**පාරමි පූර නත්ථාය - නිබ්බානත්ථාය පූජයෙ.**

''ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස'' හාත්පස අඳුර නසමින් බැබළෙන පහනින්ද, දසත

පැතිරෙන මනහර සුගන්ධ ධූපයෙන්ද, අෂ්ඨපානාදී ප්‍රනීත ගිලන් පසෙන්ද විසිතුරු මල් ආදි ශුද්ධ කැප වස්තු සමූහයෙන්ද, පස්මරුන් දිනූ ගෞතම ජිනෙන්ද්‍රයන් වහන්සේ පුරන ලද උපෙක්ඛා පාරමී ඤාණයට මම පාරමී පූර්ණය පිණිස නිවන් අවබෝධය පිණිස පූජා කරමි පූජා වේවා!

**සාධු ! සාධු !! සාධු !!!**

## උපෙක්ඛා පාරමිතා ඤාණ වන්දනාව

**සෝ භගවා ඉතිපි උපෙක්ඛා පාරමිතා ඤාණේන සමන්නාගතෝ. උපේක්ඛා පාරමිතා ඤාණේන සමන්නාගතෝ වත සෝ භගවා. තං භගවන්තං උපෙක්ඛා පාරමිතා ඤාණේන සමනාගතං සරණං ගච්ඡාමි. තං භගවන්තං උපෙක්ඛා පාරමිතා ඤාණේන සමන්නාගතං සිරසා නමාමි.**

ඒ භාග්‍යවතුන් වහන්සේ මෙසේද උපෙක්ඛා පාරමිතා ඤාණයෙන් සමන්නාගත වනසේක. ඒ භාග්‍යවතුන් වහන්සේ ඒකාන්තයෙන් උපෙක්ඛා පාරමිතා ඤාණයෙන් සමන්නාගත වන සේක. ඒ උපෙක්ඛා පාරමිතා ඤාණයෙන් සමන්නාගත භාග්‍යවතුන් වහන්සේ මම සරණ යමි. ඒ උපෙක්ඛා පාරමිතා ඤාණයෙන් සමන්නාගත භාග්‍යවතුන් වහන්සේට මාගේ නමස්කාරය වේවා!

**සාධු ! සාධු !! සාධු !!!**



## උපෙක්ඛා පාරමිතා ඤාණ වන්දනාව

**විචිනන්තෝ තදා දක්ඛිං -දසමං උපෙක්ඛා පාරමිං**
**පුබ්බකේහි මහේසීහි - ආසේවිත නිසේවිතං**
**ඉමං ත්වං දසමං තාව - දළ්හං කත්වා සමාදිය**
**උපෙක්ඛා පාරමිතං ගච්ඡ - යදි බෝධිං පත්තු මිච්ඡසි**

බුද්ධ කාරක ධර්ම විමසන්නේ අතීත බෝසතුන් වහන්සේලා විසින් භාවිතා කළ දස වෙනි උපෙකඛා පාරමිතාව දුටුවෙමි. පෘතුවිය තමා වෙත බහාලන ලද පවිත්‍ර අපවිත්‍ර යන දෙකින් කෝපය හෝ අනුරාගය ඇති නොකරන්නා සේ දුක සැප දෙකෙහි තුලාවක් මෙන් මධ්‍යස්ථ වී දසවෙනි උපෙකඛා පාරමිතාවෙන් සම්මා සම්බෝධියට පැමිණෙන්නයැයි අධිෂ්ඨාන කලසේක.

# දසබල ඤාණ පූජාව
# සහ
# දසබල ඤාණ වන්දනාව

## 1. ඨානා ඨාණ ඤාණ පූජාව

**දීපේහි ගන්ධ ධූපේහි - ගිලාන පච්චයේහිච**
**පුප්ඵාදි වත්ථු ජාතේහි - සුද්ධේහි කප්පියේහිච**
**ඨානා ඨාන ඤාණං තං-ධාරෙන්තං ගෝතමං ජිනං**
**අජරාමර සුඛත්ථාය- භත්‍යාදරේන පූජයේ.**

''ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස'' හාත්පස අඳුර නසමින් බැබළෙන පහනින්ද, දසත පැතිරෙන මනහර සුගන්ධ ධූපයෙන්ද, අෂ්ඨපානාදී ප්‍රනීත ගිලන් පසෙන්ද, විසිතුරු මල් ආදි ශුද්ධ කැප වස්තු සමූහයෙන්ද, සියලු කෙලෙසුන් නැසූ පස්මරුන් දිනූ හේතු අහේතු දැනගන්නා ඥාණය දරන්නා වූ ගෞතම ජිනේන්ද්‍රයන් වහන්සේට අරජාමර නිවන් සුව පිණිස භක්ත්‍යාදරයෙන් පූජා කරමි පූජා වේවා!

සාධු ! සාධු !! සාධු !!!

## ඨානා ඨාන ඥාණ වන්දනාව

**සෝ භගවා ඉතිපි ඨානාඨාන ඥාණේන සමන්නාගතෝ. ඨානාඨාන ඥාණේන සමන්නාගතෝ වත සෝ භගවා. තං භගවන්තං ඨානාඨාන ඥාණේන සමනාගතං සරණං ගච්ඡාමි. තං භගවන්තං ඨානාඨාන ඥාණේන සමන්නාගතං සිරසා නමාමි.**

ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස, ඔබ වහන්සේ මෙසේද ස්ථාන අස්ථාන දන්නා ඥාණයෙන් සමන්නාගත වනසේක. ඒ භාග්‍යවතුන් වහන්සේ ඒකාන්තයෙන් ස්ථාන අස්ථාන දන්නා ඥාණයෙන් සමන්නාගත වන සේක. ඒ ස්ථාන අස්ථාන දන්නා ඥාණයෙන්



සමන්නාගත භාග්‍යවතුන් වහන්සේ මම සරණ යමි. ඒ ස්ථාන අස්ථාන දන්නා ඥාණයෙන් සමන්නාගත භාග්‍යවතුන් වහන්සේට මාගේ නමස්කාරය වේවා!

සාධු ! සාධු !! සාධු !!!

## 2. කම්ම විපාක ඥාණ පූජාව

**දීපේහි ගන්ධ ධූපේහි - ගිලාන පච්චයේහිච**
**පුප්ඵාදි වත්ථු ජාතේහි - සුද්ධේහි කප්පියේහිච**
**කම්ම විපාක ඥාණං තං-ධාරෙන්තං ගෝතමං ජිනං**
**අජරාමර සුඛත්ථාය - භත්‍යාදරේන පූජයේ.**

''ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස'' හාත්පස අඳුර නසමින් බැබළෙන පහනින්ද, දසත පැතිරෙන මනහර සුගන්ධ ධූපයෙන්ද, අෂ්ඨපානාදී ප්‍රණීත ගිලන් පසෙන්ද, විසිතුරු මල් ආදි ශුද්ධ කැප වස්තු සමූහයෙන්ද, සියලු කෙලෙසුන් නැසූ පස්මරුන් දිනූ හෙයින්ද,කර්ම විපාක දන්නා ඥාණය දරන්නා වූ ගෞතම ජිනේන්ද්‍රයන් වහන්සේට අරජාමර නිවන් සුව පිණිස භක්ත්‍යාදරයෙන් පූජා කරමි පූජා වේවා!

සාධු ! සාධු !! සාධු !!!

## කම්ම විපාක ඤාණයට වන්දනාව

**සෝ භගවා ඉතිපි කම්ම විපාක ඤාණේන සමන්නාගතෝ, කම්ම විපාක ඤාණේන සමන්නාගතෝ වත සෝ භගවා, තං භගවන්තං කම්ම විපාක ඤාණේන සමනාගතං සරණං ගච්ඡාමි. තං භගවන්තං කම්ම විපාක ඤාණේන සමන්නාගතං සිරසා නමාමි.**

ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස, ඔබ වහන්සේ මෙසේද කම්ම විපාක ඤාණයෙන් සමන්නාගත වනසේක. ඒ භාග්‍යවතුන් වහන්සේ ඒකාන්තයෙන් කම්ම විපාක දන්නා ඤාණයෙන් සමන්නාගත වන සේක. ඒ කම්ම විපාක දන්නා ඤාණයෙන් සමන්නාගත භාග්‍යවතුන් වහන්සේ මම සරණ යමි. ඒ කම්ම විපාක දන්නා ඤාණයෙන් සමන්නාගත භාග්‍යවතුන් වහන්සේට මාගේ නමස්කාරය වේවා!

සාධු ! සාධු !! සාධු !!!

## 3. සබ්බත්ථ ගාමිණී පටිපදා ඤාණයට පූජාව

**දීපේහි ගන්ධ ධූපේහි - ගිලාන පච්චයේහිච**
**පුප්ඵාදි වත්‍ථු ජාතේහි - සුද්ධේහි කප්පියේහිච**
**සබ්බත්‍ථ පටිපදා ඤාණං - ධාරෙන්තං ගෝතමං ජිනං**
**අජරාමර සුඛත්‍ථාය - භත්‍යාදරේන පූජයේ.**



''ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස'' හාත්පස අඳුර නසමින් බැබළෙන පහනින්ද දසත පැතිරෙන මනහර සුගන්ධ ධූපයෙන්ද, අෂ්ඨපානාදී ප්‍රනීත ගිලන් පසෙන්ද, විසිතුරු මල් ආදි ශුද්ධ කැප වස්තු සමූහයෙන්ද, සියලු කෙලෙසුන් නැසූ පස්මරුන් දිනූ සුගති දුගති, අර්හත් මාර්ග වලට පැමිණෙන මාර්ගයන් සර්වප්‍රකාරයෙන් දරන්නා වූ ගෞතම ජිනේන්ද්‍රයන් වහන්සේට අරජාමර නිවන් සුව පිණිස භක්ත්‍යාදරයෙන් පූජා කරමි පූජා වේවා!

සාධු ! සාධු !! සාධු !!!

## සබ්බත්ථ ගාමිණී ප්‍රතිපදා ඤාණ වන්දනාව

**සෝ භගවා ඉතිපි සබ්බත්‍ථ ගාමිණී පටිපදා ඤාණේන සමන්නාගතෝ, සබ්බත්‍ථ ගාමිණී පටිපදා ඤාණේන සමනනාගතෝ වත සෝ භගවා, තං භගවන්තං සබ්බත්‍ථ ගාමිණී පටිපදා ඤාණේන සමනාගතං සරණං ගච්ඡාමි. තං භගවන්තං සබ්බත්‍ථ ගාමිණී පටිපදා ඤාණේන සමන්නාගතං සිරසා නමාමි.**

ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස, ඔබ වහන්සේ මෙසේද සුගති දුගති නිවන් මාර්ගයන් සර්වප්‍රකාරයෙන් දන වදාළ ඤාණයෙන් සමන්නාගත වනසේක. ඒ භාග්‍යවතුන් වහන්සේ ඒකාන්තයෙන් සුගති දුගති නිවන් මාර්ගයන්

සර්වප්‍රකාරයෙන් දැන වදාළ ඤාණයෙන් සමන්නාගත වන සේක. ඒ සුගති දුගති නිවන් මාර්ගය සර්වප්‍රකාරයෙන් දැන වදාළ ඤාණයෙන් සමන්නාගත භාග්‍යවතුන් වහන්සේ මම සරණ යමි. ඒ සුගති දුගති නිවන් මාර්ගයන් සර්වප්‍රකාරයෙන් දැන වදාළ ඤාණයෙන් සමන්නාගත භාග්‍යවතුන් වහන්සේට මාගේ නමස්කාරය වේවා!

සාධු ! සාධු !! සාධු !!!

## 4. අනේක ධාතු නානා ධාතු ඤාණ පූජාව

**දීපේහි ගන්ධ ධූපේහි - ගිලාන පච්චයේහිච**
**පුප්ඵාදි වත්ථු ජාතේහි - සුද්ධේහි කප්පියේහිච**
**අනේක නානාධාතු ඤාණං - ධාරෙන්තං ගෝතමං**
**ජිනංඅජරාමර සුඛත්ථාය - භත්‍යාදරේන පූජයේ.**

''ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස'' හාත්පස අඳුර නසමින් බැබළෙන පහනින්ද දසත පැතිරෙන මනහර සුගන්ධ ධූපයෙන්ද, අෂ්ඨපානාදී ප්‍රනීත ගිලන් පසෙන්ද විසිතුරු මල් ආදි ශුද්ධ කැප වස්තු සමූහයෙන්ද, සියලු කෙලෙසුන් නැසූ පස්මරුන් දිනූ අනේක ධාතු නානාධාතු ඤාණය දරන්නා වූ ගෞතම ජිනේන්ද්‍රයන් වහන්සේට අරජාමර නිවන් සුව පිණිස භක්ත්‍යාදරයෙන් පූජා කරමි පූජා වේවා!

සාධු ! සාධු !! සාධු !!!



## අනේක ධාතු නානා ධාතු ඤාණ වන්දනාව

**සෝ භගවා ඉතිපි අනේක ධාතු නානා ධාතු ලෝක ඤාණේන සමන්නාගතෝ, අනේකධාතු නානා ධාතු ලෝකේ ඤාණේන සමන්නාගතෝ වත සෝ භගවා, තං භගවන්තං අනේකධාතු නානා ධාතු ලෝක ඤාණේන සමනාගතං සරණං ගච්ඡාමි තං භගවනතං අනේක ධාතු නානා ධාතු ලෝක ඤාණේන සමන්නාගතං සිරසා නමාමි.**

ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස, ඔබ වහන්සේ මෙසේද ස්කන්ධ, ධාතු, ආයතන පිළිබඳව ධාතු නානත්වය දක්නා ඤාණයෙන් සමන්නාගත වනසේක. ඒ භාග්‍යවතුන් වහන්සේ ඒකාන්තයෙන් ස්කන්ධ, ධාතු, ආයතන පිළිබඳව ධාතු නානත්වය දන්නා ඤාණයෙන් සමන්නාගත වන සේක. ඒ ස්කන්ධ, ධාතු, ආයතන පිළිබඳව ධාතු නානත්වය දන්නා ඤාණයෙන් සමන්නාගත භාග්‍යවතුන් වහන්සේ මම සරණ යයි. ඒ ස්කන්ධ, ධාතු, ආයතන පිළිබඳ ධාතු නානත්වය දන්නා ඤාණයෙන් සමන්නාගත භාග්‍යවතුන් වහන්සේට මාගේ නමස්කාරය වේවා!

සාධු ! සාධු !! සාධු !!!

## 5. නානාධිමුත්තික ඤාණ පූජාව

**දීපේහි ගන්ධ ධූපේහි - ගිලාන පච්චයේහිච**
**පුප්ඵාදි වත්ථු ජාතේහි - සුද්ධේහි කප්පියේහිච**
**නානාධිමුත්තික ඤාණං තං -ධාරේන්තං ගෝතමං ජිනං**
**අජරාමර සුඛත්ථාය - භත්‍යාදරේන පූජයේ.**

"ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස" හාත්පස අඳුර නසමින් බැබළෙන පහනින්ද, දසත පැතිරෙන මනහර සුගන්ධ ධූපයෙන්ද, අෂ්ඨපානාදී ප්‍රනීත ගිලන් පසෙන්ද, විසිතුරු මල් ආදි ශුද්ධ කැප වස්තු සමූහයෙන්ද, සියලු කෙලෙසුන් නැසූ පස්මරුන් දිනූ සත්වයන්ගේ සද්ධාදී ඉන්ද්‍රියන්ගේ උස් පහත් බව දනගන්නා ඤාණය දරන්නා වූ ගෞතම ජිනේන්ද්‍රයන් වහන්සේට අරජාමර නිවන් සුව පිණිස භක්ත්‍යාදරයෙන් පූජා කරමි පූජා වේවා!

**සාධු ! සාධු !! සාධු !!!**

## නානාධි මුත්තික ඤාණ වන්දනාව

**සෝ භගවා ඉතිපි නානාධිමුත්තික ඤාණේන සමන්නාගතෝ, නානාධිමුත්තික ඤාණේන සමන්නාගතෝ වත සෝ භගවා තං භගවන්තං නානාධිමුත්තික ඤාණේන සමනාගතං සරණං**



**ගච්ඡාමි තං භගවන්තං නානාධිමුත්තික ඤාණේන සමන්නාගතං සිරසා නමාමි**

ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස, ඔබ වහන්සේ මෙසේද සත්වයන්ගේ හීන, ප්‍රනීත අදහස් දැනගන්නා වූ ඤාණයෙන් සමන්නාගත වනසේක. ඒ භාග්‍යවතුන් වහන්සේ ඒකාන්තයෙන් සත්වයන්ගේ හීන ප්‍රනීත අදහස් දනගන්නා වූ ඤාණයෙන් සමන්නාගත වන සේක. ඒ ඒ සත්වයන්ගේ හීන, ප්‍රනීත අදහස් දනගන්නා වූ ඤාණයෙන් සමන්නාගත භාග්‍යවතුන් වහන්සේ මම සරණ යමි. ඒ ඒ සත්වයන්ගේ හීන, ප්‍රනීත අදහස් දනගන්නා වූ ඤාණයෙන් සමන්නාගත භාග්‍යවතුන් වහන්සේට මාගේ නමස්කාරය වේවා!

**සාධු ! සාධු !! සාධු !!!**

## 6. ඉන්ද්‍රිය පරොපරියතා ඤාණ පූජාව

**දීපේහි ගන්ධ ධූපේහි - ගිලාන පච්චයේහිච**
**පුප්ඵාදි වත්ථු ජාතේහි - සුද්ධේහි කප්පියේහිච**
**ඉන්ද්‍රිය පරෝපරිත්තේ ඤාණං-ධාරේන්තං ගෝතමං ජිනං**
**අජරාමර සුඛත්ථාය - භත්‍යාදරේන පූජයේ.**

"ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස" හාත්පස අඳුර නසමින් බැබළෙන පහනින්ද, දසත පැතිරෙන මනහර සුගන්ධ ධූපයෙන්ද,

අෂ්ඨපානාදී ප්‍රනීත ගිලන් පසෙන්ද, විසිතුරු මල් ආදි ශුද්ධ කැප වස්තු සමූහයෙන්ද, සියලු කෙලෙසුන් නැසූ පස්මරුන් දිනූ සත්වයන්ගේ ඉන්ද්‍රිය ධර්මයන්ගේ උස්පහත් බව හීන, ප්‍රනීත බව දැනගන්නා ඤාණය දරන්නා වූ ගෞතම ජිනේන්ද්‍රයන් වහන්සේට අරජාමර නිවන් සුව පිණිස භක්ත්‍යාදරයෙන් පූජා කරමි පූජා වේවා!

සාධු ! සාධු !! සාධු !!!

## ඉන්ද්‍රිය පරොපරියතා ඤාණ වන්දනාව

**සෝ භගවා ඉතිපි ඉන්ද්‍රිය පරොපරිත්තේ ඤාණේන සමන්නාගතෝ, ඉන්ද්‍රිය පරොපරිත්තේ ඤාණේන සමන්නාගතෝ වත සෝ භගවා, තං භගවන්තං ඉන්ද්‍රිය පරොපරිත්තේ ඤාණේන සමනාගතං සරණං ගච්ඡාමි තං භගවන්තං ඉන්ද්‍රිය පරොපරිත්තේ ඤාණේන සමන්නාගතං සිරසා නමාමි.**

ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස, ඔබ වහන්සේ මෙසේද සත්වයන්ගේ ඉන්ද්‍රිය ධර්මයන් අඩු වැඩි බව දැනගන්නා ඤාණයෙන් සමන්නාගත වනසේක. ඒ භාග්‍යවතුන් වහන්සේ ඒකාන්තයෙන් සත්වයන්ගේ ඉන්ද්‍රිය ධර්මයන් අඩු වැඩි බව දැනගන්නා ඤාණයෙන් සමන්නාගත වන සේක. ඒ සත්වයන්ගේ ඉන්ද්‍රිය ධර්මයන් අඩු වැඩි බව



දැනගන්නා ඤාණයෙන් සමන්නාගත භාග්‍යවතුන් වහන්සේ මම සරණ යයි. ඒ සත්වයන්ගේ ඉන්ද්‍රිය ධර්මයන් අඩු වැඩි බව දැනගන්නා ඤාණයෙන් සමන්නාගත භාග්‍යවතුන් වහන්සේට මාගේ නමස්කාරය වේවා!

සාධු ! සාධු !! සාධු !!!

## 7. ධ්‍යාන සංක්ලෙස ඤාණ පූජාව

**දීපේහි ගන්ධ ධූපේහි - ගිලාන පච්චයේහිච**
**පුප්ඵාදි වත්‍ථු ජාතේහි - සුද්ධේහි කප්පියේහිච**
**ධ්‍යාන සංක්ලෙස ඤාණං - ධාරේන්තං ගෝතමං ජිනං**
**අජරාමර සුඛත්‍ථාය - භත්‍යාදරේන පූජයේ.**

''ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස'' හාත්පස අඳුර නසමින් බැබළෙන පහනින්ද, දසත පැතිරෙන මනහර සුගන්ධ ධූපයෙන්ද, අෂ්ඨපානාදී ප්‍රනීත ගිලන් පසෙන්ද විසිතුරු මල් ආදි ශුද්ධ කැප වස්තු සමූහයෙන්ද, සියලු කෙලෙසුන් නැසූ පස්මරුන් දිනූ ධ්‍යාන සමාධියෙහි කිලුටු බව දැනගන්නා වූ ඤාණය දරන්නා වූ ගෞතම ජිනේන්ද්‍රයන් වහන්සේට අරජාමර නිවන් සුව පිණිස භක්ත්‍යාදරයෙන් පූජා කරමි පූජා වේවා!

සාධු ! සාධු !! සාධු !!!

## ධ්‍යාන සංක්ලෙස ඥාණයට වන්දනාව

**සෝ භගවා ඉතිපි ධ්‍යාන විමොක්ඛාදි ඥාණේන සමන්නාගතෝ, ධ්‍යාන විමොක්ඛාදි ඥාණේන සමන්නාගතෝ වත සෝ භගවා, තං භගවන්තං ධ්‍යාන විමොක්ඛාදි ඥාණේන සමනාගතං සරණං ගච්ඡාමි තං භගවන්තං ධ්‍යාන විමොක්ඛාදි ඥාණේන සමන්නාගතං සිරසා නමාමි.**

ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස, ඔබ වහන්සේ මෙසේද සත්වයන්ගේ ධ්‍යාන සමාධියෙහි කිලුටු බව පිරිසිදු බව දැනගන්නා ඥාණයෙන් සමන්නාගත වනසේක. ඒ භාග්‍යවතුන් වහන්සේ ඒකාන්තයෙන් සත්වයන්ගේ ධ්‍යාන සමාධියෙහි කිලුටු බව පිරිසිදු බව දැනගන්නා ඥාණයෙන් සමන්නාගත වන සේක. ඒ සත්වයන්ගේ ධ්‍යාන සමාධියෙහි කිලුටු බව පිරිසිදු බව දැනගන්නා ඥාණයෙන් සමන්නාගත භාග්‍යවතුන් වහන්සේ මම සරණ යයි. ඒ සත්වයන්ගේ ධ්‍යාන සමාධියෙහි කිලුටු බව පිරිසිදු බව දැනගන්නා ඥාණයෙන් සමන්නාගත භාග්‍යවතුන් වහන්සේට මාගේ නමස්කාරය වේවා!

**සාධු ! සාධු !! සාධු !!!**



## 8. පුබ්බේනිවාස ඥාණ පූජාව

**දීපේහි ගන්ධ ධූපේහි - ගිලාන පච්චයේහිච**
**පුප්ඵාදි වත්‍ථු ජාතේහි - සුද්ධේහි කප්පියේහිච**
**පුබ්බෙ නිවාස ඥාණං තං - ධාරෙන්තං ගෝතමං ජිනං**
**අජරාමර සුඛත්‍ථාය - භත්‍යාදරේන පූජයේ.**

''ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස'' හාත්පස අඳුර නසමින් බැබළෙන පහනින්ද දසත පැතිරෙන මනහර සුගන්ධ ධූපයෙන්ද, අෂ්ඨපානාදී ප්‍රනීත ගිලන් පසෙන්ද විසිතුරු මල් ආදි ශුද්ධ කැප වස්තු සමූහයෙන්ද, සියලු කෙලෙසුන් නැසූ පස්මරුන් දිනූ පෙර විසූ කඳ පිළිවෙළ දැනගන්නා වූ ඥාණය දරන්නා වූ ගෞතම ජිනේන්‍ද්‍රයන් වහන්සේට අරජාමර නිවන් සුව පිණිස භක්ත්‍යාදරයෙන් පූජා කරමි පූජා වේවා!

**සාධු ! සාධු !! සාධු !!!**

## පුබ්බේනිවාස ඥාණ වන්දනාව

**සෝ භගවා ඉතිපි පුබ්බේ නිවාසානුස්සති ඥාණේන සමන්නාගතෝ. පුබ්බේ නිවාසානුස්සති ඥාණේන සමන්නාගතෝ වත සෝ භගවා. තං භගවන්තං පුබ්බේ නිවාසානුස්සති ඥාණේන සමනාගතං සරණං ගච්ඡාමි. තං භගවන්තං පුබ්බේ නිවාසානුස්සති ඥාණේන සමන්නාගතං සිරසා නමාමි.**

ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස, ඔබ වහන්සේ මෙසේද ඒ.ඒ. සත්වයන්ගේ පෙර විසූ කඳ පිළිවෙල දන්නා ඤාණයෙන් සමන්නාගත වනසේක. ඒ භාග්‍යවතුන් වහන්සේ ඒකාන්තයෙන් ඒ.ඒ. සත්වයන්ගේ පෙර විසූ කඳ පිළිවෙල දන්නා ඤාණයෙන් සමන්නාගත වන සේක. ඒ ඒ සත්වයන්ගේ පෙර විසූ කඳ පිළිවෙළ දැනගන්නා වූ භාග්‍යවතුන් වහන්සේ මම සරණ යමි. ඒ.ඒ සත්වයන්ගේ පෙර විසූ කඳ පිළිවෙත දන්නා ඤාණයෙන් සමන්නාගත භාග්‍යවතුන් වහන්සේට මාගේ නමස්කාරය වේවා!

සාධු ! සාධු !! සාධු !!!

## 9. දිබ්බචකබු ඤාණ පූජාව

**දීපේහි ගන්ධ ධූපේහි - ගිලාන පච්චයේහිච**
**පුප්ඵාදි වත්‍ථු ජාතේහි - සුද්ධේහි කප්පියේහිච**
**දිබ්බචක්ඛු ඤාණං තං -ධාරෙන්තං ගෝතමං ජිනං**
**අජරාමර සුඛත්‍ථාය - භත්‍යාදරේන පූජයේ.**

''ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස'' හාත්පස අඳුර නසමින් බැබළෙන පහනින්ද, දසත පැතිරෙන මනහර සුගන්ධ ධූපයෙන්ද, අෂ්ඨපානාදී ප්‍රනීත ගිලන් පසෙන්ද විසිතුරු මල් ආදි ශුද්ධ කැප වස්තු සමූහයෙන්ද, සියලු කෙලෙසුන් නැසූ පස්මරුන් දිනූ කර්මානුරූප



මිය යන උපදින සත්වයන් දැනගන්නා ඤාණය දරන්නා වූ ගෞතම ජිනේන්ද්‍රයන් වහන්සේට අරජාමර නිවන් සුව පිණිස භක්ත්‍යාදරයෙන් පූජා කරමි පූජා වේවා!

සාධු ! සාධු !! සාධු !!!

## දිබ්බචක්ඛු ඤාණ වන්දනාව

**සෝ භගවා ඉතිපි දිබ්බ චක්ඛු ඤාණේන සමන්නාගතෝ. දිබ්බ චක්ඛු ඤාණේන සමන්නාගතෝ වත සෝ භගවා. තං භගවන්තං දිබ්බ චක්ඛු ඤාණේන සමනාගතං සරණං ගච්ඡාමි. තං භගවන්තං දිබ්බ චක්ඛු ඤාණේන සමන්නාගතං සිරසා නමාමි.**

ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස, ඔබ වහන්සේ මෙසේද කර්මානුකූලව මිය යන උපදින ඒ ඒ සත්වයන් ගැන දැනගන්නා ඤාණයෙන් සමන්නාගත වනසේක. ඒ භාග්‍යවතුන් වහන්සේ ඒකාන්තයෙන් ම කර්මානුකූලව මිය යන උපදින සත්වයන් දැනගන්නා ඤාණයෙන් සමන්නාගත වන සේක. ඒ ඒ සත්වයන්ගේ කර්මානුකූලව මිය යන උපදින ඒ ඒ සත්වයන් දැනගන්නා ඤාණයෙන් සමන්නාගත භාග්‍යවතුන් වහන්සේ මම සරණ යයි. ඒ ඒ සත්වයන්ගේ කර්මානුකූලව මිය යන උපදින ඒ ඒ සත්ත්වයන් දැනගන්නා

ඥාණයෙන් සමන්නාගත භාග්‍යවතුන් වහන්සේට මාගේ නමස්කාරය වේවා!

සාධු ! සාධු !! සාධු !!!

## 10. ආසවක්‍ෂයකර ඥාණ පූජාව

**දීපේහි ගන්ධ ධූපේහි - ගිලාන පච්චයේහිච**
**පුප්ඵාදි වත්ථු ජාතේහි - සුද්ධේහි කප්පියේහිච**
**ආසවක්ඛය ඥාණං තං - ධාරෙන්තං ගෝතමං ජිනං**
**අරජාමර සුඛත්ථාය - භත්‍යාදරේන පූජයේ.**

''ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස'' හාත්පස අඳුර නසමින් බැබළෙන පහනින්ද, දසත පැතිරෙන මනහර සුගන්ධ ධූපයෙන්ද, අෂ්ඨපානාදී ප්‍රනීත ගිලන් පසෙන්ද විසිතුරු මල් ආදි ශුද්ධ කැප වස්තු සමූහයෙන්ද, සියලු කෙලෙසුන් නැසූ පස්මරුන් දිනූ සියලු ආශ්‍රව ධර්ම ක්‍ෂය කළ ඥාණය දරන්නා වූ ගෞතම ජිනේන්ද්‍රයන් වහන්සේට අරජාමර නිවන් සුව පිණිස භක්ත්‍යාදරයෙන් පූජා කරමි පූජා වේවා!

සාධු ! සාධු !! සාධු !!!



## ආසවක්‍ෂය කර ඥාණ වන්දනාව

**සෝ භගවා ඉතිපි ආසවක්ඛය ඥාණේන සමන්නාගතෝ, ආසවක්ඛය ඥාණේන සමන්නාගතෝ වත සෝ භගවා, තං භගවන්තං ආසවක්ඛය ඥාණේන සමනාගතං සරණං ගච්ඡාමි. තං භගවන්තං ආසවක්ඛය ඥාණේන සමන්නාගතං සිරසා නමාමි**

ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස, ඔබ වහන්සේ මෙසේද ආශ්‍රවයන් ක්‍ෂය කිරීමේ ඥාණයෙන් සමන්නාගත වනසේක. ඒ භාග්‍යවතුන් වහන්සේ ඒකාන්තයෙන් ආශ්‍රවයන් ක්‍ෂය කිරීමේ ඥාණයෙන් සමන්නාගත වන සේක. ඒ ආශ්‍රවයන් ක්‍ෂය කිරීමේ ඥාණයෙන් සමන්නාගත භාග්‍යවතුන් වහන්සේ මම සරණ යමි. ඒ ආශ්‍රවයන් ක්‍ෂය කිරීමේ ඥාණයෙන් සමන්නාගත භාග්‍යවතුන් වහන්සේට මාගේ නමස්කාරය වේවා!

සාධු ! සාධු !! සාධු !!!

# චුද්දස බුද්ධ ඥාණ පූජාව
# සහ
# චුද්දස බුද්ධ ඥාණ වන්දනාව

**01. දීපේහි ගන්ධ ධූපේහි - ගිලාන පච්චයෙහිච**
**පුප්ඵාදි වත්ථු ජාතේහි - සුද්ධේහි කප්පියේහිච**
**තථාපි දුක්ඛයෙ ඥාණං - දෙසෙන්තං ගොතමං මුනිං**
**සුද්ධ චිත්තප්පසාදෙන - නිබ්බානත්ථාය පූජයෙ.**

''ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස'' හාත්පස අඳුර නසමින් බැබලෙන පහනින්ද, දසත පැතිරෙන මනහර සුගන්ධ ධූපයෙන්ද, අෂ්ඨපානාදී ප්‍රනීත ගිලන් පසෙන්ද, විසිතුරු මල් ආදි ශුද්ධ කැප වස්තු සමූහයෙන්ද, සියලු කෙලෙස් බලමුළුව සිඳලූ ගෞතම මුනිදුන් මනාව දේශන කරන ලද සංසාර දුක දූනගත්තාවූ දුක්ඛයේ ඥාණයට සුද්ධ චිත්තප්පසාදයෙන් නිවන් අවබෝධය පිණිස පූජා කරමි පූජා වේවා!

**සාධු ! සාධු !! සාධු !!!**

## දුක්ඛ ඥාණයට වන්දනාව

**සො භගවා ඉතිපි දුක්ඛ ඥාණේන සමන්නාගතො, දුක්ඛ ඥාණේන සමන්නාගතො වත සො භගවා. තං භගවන්තං දුක්ඛ ඥාණේන සමනාගතං සරණං ගච්ඡාමි තං භගවන්තං දුක්ඛ ඥාණේන සමන්නාගතං සිරසා නමාමි**



ඒ භාග්‍යවතුන් වහන්සේ, ඔබ වහන්සේ මෙසේද දුක්ඛයේ ඥාණයෙන් සමන්නාගත වනසේක. ඒ භාග්‍යවතුන් වහන්සේ ඒකාන්තයෙන් දුක්ඛයේ ඥාණයෙන් සමන්නාගත වන සේක. ඒ දුකඛයේ ඥාණයෙන් සමන්නාගත භාග්‍යවතුන් වහන්සේ මම සරණ යමි. ඒ දුක්ඛයේ ඥාණයෙන් සමන්නාගත භාග්‍යවතුන් වහන්සේට මාගේ නමස්කාරය වේවා!

**සාධු ! සාධු !! සාධු !!!**

## දුක්ඛ ඥාණ වන්දනාව

**භාවේ චයං භවති බන්ධ පරම්පරාය**
**යඤ්චානු පූරියති සංඛරණේ ව්‍යපායේ**
**පච්චක්ඛතො ච ගති මස්ස විතන්වමානං**
**වන්දාමි සන්ති පද මුත්තම දුක්ඛ ඥාණං**

''ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස'' ඔබ වහන්සේ අතරක් නැර සන්තති පරම්පරා වශයෙන් පවත්නා ස්කන්ධ දුක්ඛ යද, ඒ ස්කන්ධයන් රැස්කිරීමෙහි හා විපරිණාමයෙහි හට ගන්නා වූ දුක්ඛයද, ප්‍රත්‍යක්ෂ වශයෙන් අවබෝධ කරගන්නා වූ දුක්ඛෙ ඥාණයෙන් සමන්නාගත වනසේක. ශාන්ත පද නිර්වාණ ධාතුවට පැමිණීමේ හේතුවූ ඒ උතුම් දුක්ඛෙ ඥාණයෙන් අගතැන්පත් වූ ශාන්ති නායකයන් වහන්සේට මාගේ නමස්කාරය වේවා!

## 02. දුක්ඛ සමුදයෙ ඤාණයට පූජාව

**දීපේහි ගන්ධ ධූපේහි - ගිලාන පච්චයේහිච**
**පුප්ඵාදි වත්‍ථු ජාතේහි - සුද්ධෙහි කප්පියේහිච**
**දුක්ඛ සමුදයේ ඤාණං- දෙසෙන්තං ගෝතමං මුනිං**
**සුද්ධ චිත්තප්පසාදේන - නිබ්බානත්‍ථාය පූජයේ**
.

''ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස'' හාත්පස අඳුර නසමින් බැබලෙන පහනින්ද දසත පැතිරෙන මනහර සුගන්ධ ධූපයෙන්ද, අෂ්ඨපානාදී ප්‍රනීත ගිලන් පසෙන්ද විසිතුරු මල් ආදි ශුද්ධ කැප වස්තු සමූහයෙන්ද, සියලු කෙලෙස් බල මුළුව සිදලු ගෞතම මුනිදුන් මනාව දේශනා කරන ලද දුක්ඛ සමුදය දැනගත්තාවූ දුක්ඛ සමුදයෙ ඤාණයට සුද්ධ චිත්තප්පසාදයෙන් නිවන් අවබෝධය පිණිස පූජා කරමි පූජා වේවා!

සාධු ! සාධු !! සාධු !!!

## දුක්ඛ සමුදයේ ඤාණයට වන්දනාව

**සෝ භගවා ඉතිපි දුක්ඛ සමුදයේ ඤාණේන සමන්නාගතෝ. දුක්ඛ සමුදයේ ඤාණේන සමන්නාගතෝ වත සෝ භගවා, තං භගවන්තං දුක්ඛ සමුදයේ ඤාණේන සමන්නාගතං සරණං ගච්ඡාමි. තං භගවන්තං දුක්ඛ සමුදයේ ඤාණේන සමන්නාගතං සිරසා නමාමි**



ඒ භාග්‍යවතුන් වහන්සේ, ඔබ වහන්සේ මෙසේද දුක්ඛ සමුදයෙ ඤාණයෙන් සමන්නාගත වනසේක. ඒ භාග්‍යවතුන් වහන්සේ ඒකාන්තයෙන් දුක්ඛ සමුදයෙ ඤාණයෙන් සමන්නාගත වන සේක. ඒ දුක්ඛ සමුදයෙ ඤාණයෙන් සමන්නාගත භාග්‍යවතුන් වහන්සේ මම සරණ යමි. ඒ දුක්ඛ සමුදයෙ ඤාණයෙන් සමන්නාගත භාග්‍යවතුන් වහන්සේට මාගේ නමස්කාරය වේවා!

සාධු ! සාධු !! සාධු !!!

## දුක්ඛ සමුදයේ ඤාණයට වන්දනාව

**ආයුහනේ නිදනෙ පළිබොධනේච**
**සංයොජනේ ච බලු යා පහවා ජනෙත්ති**
**තස්සා සභාවමභිලං පරිජෝත යන්තං**
**දුක්ඛස්ස තං සමුදයෙ පණමාමි ඤාණං**

''ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ'' ඔබ වහන්සේ සියලු දුකට මුල හේතුව වූ තෘෂ්ණාවේ ආයුහන රැස්කිරීමය. නිදාන දුකට හේතුවීමයි. සංයෝග දුකෙන් දුක ගැළපීමය. පළිබෝධ දුකෙන් මිදීය නොදීමය යන සියල්ල තත්වාකාරයෙන් අවබෝධ කරගන්නා වූ දුක්ඛ සමුදය ඤාණයෙන් සමන්නා ගත වනසේක. ඒ උතුම් දුක්ඛ සමුදය ඤාණයෙන් අගතැන් පත් වූ සර්වඥරාජෝත්තමයන් වහන්සේට මාගේ නමස්කාරය වේවා!

සාධු ! සාධු !! සාධු !!!

## 03. දුක්ඛ නිරොධයෙ ඥාණයට පූජාව

**දීපේහි ගන්ධ ධූපේහි - ගිලාන පච්චයේහිච**
**පුප්ඵාදි වත්ථු ජාතේහි - සුද්ධේහි කප්පියේහිච**
**දුක්ඛ නිරෝධෙ ඥාණං -දෙසෙන්තං ගෝතමං මුනිං**
**සුද්ධ චිත්තප්පසාදේන - නිබ්බානත්ථාය පූජයේ.**

''ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස'' හාත්පස අඳුර නසමින් බැබලෙන පහනින්ද, දසත පැතිරෙන මනහර සුගන්ධ ධූපයෙන්ද, අෂ්ඨපානාදී ප්‍රනීත ගිලන් පසෙන්ද, විසිතුරු මල් ආදි ශුද්ධ කැප වස්තු සමූහයෙන්ද, සියලු කෙලෙස් බලමුළුව සිදලු ගෞතම මුනිදුන් මනාව දේශනා කරන ලද නමරූප නිරෝධය දනගත්තාවූ දුක්ඛ නිරොධයෙ ඥාණයට සුද්ධ චිත්තප්පසාදයෙන් නිවන් අවබෝධය පිණිස පූජා කරමි පූජා වේවා!

**සාධු ! සාධු !! සාධු !!!**

## දුක්ඛ නිරොධයෙ ඥාණයට වන්දනාව

**සෝ භගවා ඉතිපි දුක්ඛ නිරොධේ ඥාණේන සමන්නාගතෝ, දුක්ඛ නිරොධේ ඥාණේන සමන්නාගතෝ වත සෝ භගවා, තං භගවන්තං දුක්ඛ නිරොධේ ඥාණේන සමනාගතං සරණං ගච්ඡාමි තං භගවන්තං දුක්ඛ නිරොධේ ඥාණේන සමන්නාගතං සිරසා නමාමි.**

ඒ භාග්‍යවතුන් වහන්සේ, ඔබ වහන්සේ



මෙසේද දුක්ඛ නිරොධයේ ඥාණයෙන් සමන්නාගත වනසේක. ඒ භාග්‍යවතුන් වහන්සේ ඒකාන්තයෙන් දුක්ඛ නිරොධයේ ඥාණයෙන් සමන්නාගත වන සේක. ඒ දුකඛ නිරොධයේ ඥාණයෙන් සමන්නාගත භාග්‍යවතුන් වහන්සේ මම සරණ යමි. ඒ දුක්ඛ නිරොධයේ ඥාණයෙන් සමන්නාගත භාග්‍යවතුන් වහන්සේට මාගේ නමස්කාරය වේවා!

**සාධු ! සාධු !! සාධු !!!**

## දුක්ඛ නිරොධෙ ඥාණයට වන්දනාව

**යා සච්ච වෙදන රසා විමුඛා පවත්තා**
**තණ්හාය නෙව විසයා චතු මග්ග ගය්හා**
**තස්සා සභාව මඛිලං පරිජෝතයන්තං**
**වන්දාමි තං පවර දුක්ඛ නිරෝධ ඥාණං**

''ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස'' ඔබ වහන්සේ අවේදයිත සුඛයෙන් මිහිරිවූද, ස්කන්ධ දුක්ඛයෙන් තොරවූද, තෘෂ්ණාවට අරමුණු නොවන්නාවූද, සිව්මග නුවණින් දතයුතු වූද, ශාන්ති ලක්ෂණ නිර්වාණ ධාතුව පිළිබඳ තත්වාකාරයෙන් අවබෝධ කරන්නා වූ දුක්ඛ නිරෝධෙ ඥාණයෙන්, සමන්නාගත වනසේක. ඒ උතුම් දුක්ඛ නිරෝධෙ ඥාණයෙන් සමන්විත වූ ශාන්ති නායක සර්වඥ තථාගතයන් වහන්සේට

මාගේ නමස්කාරය වේවා!

**සාධු ! සාධු !! සාධු !!!**

## 4. නිරොධ මග්ගයෙ ඥාණයට පූජාව

**දීපේහි ගන්ධ ධූපේහි - ගිලාන පච්චයේහිච**
**පුප්ඵාදි වත්‍ථු ජාතේහි - සුද්ධේහි කප්පියේහිච**
**නිරොධ මග්ගසම්ං ඥාණං-දේසෙන්තං ගෝතමං මුනිං**
**සුද්ධ චිත්තප්පසාදේන - නිබ්බානත්‍ථාය පූජයේ.**

''ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස'' හාත්පස අඳුර නසමින් බැබලෙන පහනින්ද, දසත පැතිරෙන මනහර සුගන්ධ ධූපයෙන්ද, අෂ්ඨපානාදී ප්‍රනීත ගිලන් පසෙන්ද, විසිතුරු මල් ආදි ශුද්ධ කැප වස්තු සමූහයෙන්ද, සියලු කෙලෙස් බල මුළුව සිදලූ ගෞතම මුනිඳුන් මනාව දේශනා කරන ලද දුක්ඛ නිරෝධ මාර්ගය දැනගත්තාවූ නිරොධ මග්ග ඥාණයට සුද්ධ චිත්තප්පසාදයෙන් නිවන් අවබෝධය පිණිස පූජා කරමි පූජා වේවා!

**සාධු ! සාධු !! සාධු !!!**



## දුක්ඛ නිරොධ ගාමිණී පටිපදා ඥාණයට වන්දනාව

**සෝ භගවා ඉතිපි දුක්ඛ නිරෝධ ගාමිණී පටිපදා ඥාණේන සමන්නාගතෝ. දුක්ඛ නිරෝධ ගාමිණී පටිපදා ඥාණේන සමන්නාගතෝ වත සෝ භගවා. තං භගවන්තං දුක්ඛ නිරෝධ ගාමිණී පටිපදා ඥාණේන සමනාගතං සරණං ගච්ඡාමි. තං භගවන්තං දුක්ඛ නිරෝධ ගාමිණී පටිපදා ඥාණේන සමන්නාගතං සිරසා නමාමි**

ඒ භාග්‍යවතුන් වහන්සේ, ඔබ වහන්සේ මෙසේද දුක්ඛ නිරෝධ ගාමිණී පටිපදා ඥාණයෙන් සමන්නාගත වනසේක. ඒ භාග්‍යවතුන් වහන්සේ ඒකාන්තයෙන් දුක්ඛ නිරෝධ ගාමිණී පටිපදා ඥාණයෙන් සමන්නාගත වන සේක. ඒ දුකඛ නිරෝධ ගාමිණී පටිපදා ඥාණයෙන් සමන්නාගත භාග්‍යවතුන් වහන්සේ මම සරණ යමි. ඒ දුක්ඛ නිරෝධ ගාමිණී පටිපදා ඥාණයෙන් සමන්නාගත භාග්‍යවතුන් වහන්සේට මාගේ නමස්කාරය වේවා!

**සාධු ! සාධු !! සාධු !!!**

## දුක්ඛ නිරෝධ ගාමිණී පටිපදා ඤාණයට වන්දනාව

**යා පාපණේ පවර සන්ති පදස්ස හේතු**
**නිය්‍යානිකා ච පටිපත්ති යදාධි පච්චා**
**තස්සා විභාවකර දස්සනතා සනාථං**
**වුත්ත්‍යා නිරෝධ පටිපත්ති මතිං නමාමි**

''ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස'' ඔබ වහන්සේ උත්තම ශාන්ති පදවියට පැමිණීමේ හේතුව වුව නෛය්‍යාර්නික ප්‍රතිපත්තිය වූද, අධිපති වූද සත්‍ය දර්ශනයෙන්ම සනාථවූද, ආර්‍ය මාර්ගය පිළිබඳ සියල්ල තත්වාකාරයෙන් දන්නාවූ දුක්ඛ නිරෝධ ගාමිනී ප්‍රතිපදා ඤාණයෙන් සමන්නාගත වනසේක. ඒ දුක්ඛ නිරෝධ ගාමිණී ප්‍රතිපදා ඤාණයෙන් අගතැන්පත් වූ තිලෝක නාථ සර්වඥයන් වහන්සේට මාගේ නමස්කාරය වේවා!

**සාධු ! සාධු !! සාධු !!!**

## 05. අත්ථ පටිසම්භිද ඤාණයට පූජාව

**දීපේහි ගන්ධ ධූපේහි - ගිලාන පච්චයේහිච**
**පුප්ඵාදි වත්ථු ජාතේහි - සුද්ධෙහි කප්පියේහිච**
**අත්ථ පටිසම්භිද ඤාණං -දෙසෙන්තං ගෝතමං මුනිං**
**සුද්ධ චිත්තප්පසාදේන - නිබ්බානත්ථාය පූජයේ.**

''ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස'' හාත්පස



අඳුර නසමින් බැබලෙන පහනින්ද, දසත පැතිරෙන මනහර සුගන්ධ ධූපයෙන්ද, අෂ්ඨපානාදී ප්‍රනීත ගිලන් පසෙන්ද, විසිතුරු මල් ආදි ශුද්ධ කැප වස්තු සමූහයෙන්ද, සියලු කෙලෙස් බලමුළුව සිදලූ ගෞතම මුනිඳුන් මනාව දේශනා කරන ලද අර්ථ රසය ගෙන දෙන්නා වූ අත්ථ පටිසම්භිද ඤාණයට සුද්ධ චිත්තප්පසාදයෙන් නිවන් අවබෝධය පිණිස පූජා කරමි පූජා වේවා!

**සාධු ! සාධු !! සාධු !!!**

## අත්ථ පටිසම්භිද ඤාණයට වන්දනාව

**සෝ භගවා ඉතිපි අත්ථ පටිසම්භිදෙ ඤාණේන සමන්නාගතෝ. අත්ථ පටිසම්භිදෙ ඤාණේන සමන්නාගතෝ වත සෝ භගවා, තං භගවන්තං අත්ථ පටිසම්භිදෙ ඤාණේන සමනාගතං සරණං ගච්ඡාමි. තං භගවන්තං අත්ථ පටිසම්භිදෙ ඤාණේන සමන්නාගතං සිරසා නමාමි.**

ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, ඔබ වහන්සේ මෙසේද අත්ථ පටිසම්භිදා ඤාණයෙන් සමන්නාගත වනසේක. ඒ භාග්‍යවතුන් වහන්සේ ඒකාන්තයෙන් අත්ථ පටිසම්භිදා ඤාණයෙන් සමන්නාගත වන සේක. ඒ අත්ථ පටිසම්භිදා ඤාණයෙන් සමන්නාගත භාග්‍යවතුන් වහන්සේ

මම සරණ යමි. ඒ අත්ථ පටිසම්භිදා ඤාණයෙන් සමන්නාගත භාග්‍යවතුන් වහන්සේට මාගේ නමස්කාරය වේවා!

**සාධු ! සාධු !! සාධු !!!**

## සුද්ධික අත්ථපටිසම්භිදා ඤාණයට වන්දනාව

**මග්ගක්ඛණෙසු සකලාරිය පුග්ගලානං**
**සංසිජ්ඣමාන මඛිලත්ථ චයං වහන්තිං**
**සුද්ධං තමත්ථ පටිසම්භිද මජ්ඣගා යෝ**
**තාහං නමාමි සුගතං විදිතත්ථ සාරං**

ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස, ඔබ වහන්සේ සියලු ආර්ය පුද්ගලයන්ට මාර්ගක්ෂණයෙහි ලැබෙන්නාවූද, සියළු අර්ථ සමූහය උසුලන්නාවූද, විසුද්ධ වූ අත්ථපටිසම්භිදා ඤාණයෙන් සමන්නාගත වනසේක. විශේෂයෙන් දක්නා ලද අර්ථසාරය ඇත්තාවූ අත්ථ පටිසම්භිද ඤාණයෙන් අගතැන්පත් වූ ශ්‍රී සුගත තථාගතයන් වහන්සේට මාගේ නමස්කාරය වේවා!

**සාධු ! සාධු !! සාධු !!!**



## 06. ධමම පටිසමභිදා ඤාණයට පූජාව

**දීපේහි ගන්ධ ධූපේහි - ගිලාන පච්චයේහිච**
**පුප්ඵාදි වත්ථු ජාතේහි - සුද්ධේහි කප්පියෙහිච**
**ධම්ම පටිසමභිද ඤාණං -දෙසෙන්තං ගෝතමං මුනිං**
**සුද්ධ චිත්තප්පසාදේන - නිබ්බානත්ථාය පූජයේ.**

''ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස'' හාත්පස අඳුර නසමින් බැබළෙන පහනින්ද දසත පැතිරෙන මනහර සුගන්ධ ධූපයෙන්ද, අෂ්ඨපානාදී ප්‍රනීත ගිලන් පසෙන්ද විසිතුරු මල් ආදි ශුද්ධ කැප වස්තු සමූහයෙන්ද, සියලු කෙලෙස් බලමුළුව සිදළු ගෞතම මුනිඳුන් මනාව දේශනා කරන ලද ධම්ම රසය ගෙන දෙන්නා වූ ධම්ම පටිසමභිද ඤාණයට සුද්ධ චිත්තප්පසාදයෙන් නිවන් සුව පිණිස පූජා කරමි පූජා වේවා!

**සාධු ! සාධු !! සාධු !!!**

## ධමම පටිසම්භිදා ඤාණයට වන්දනාව

**සෝ භගවා ඉතිපි ධම්ම පටිසම්භිදේ ඤාණේන සමන්නාගතෝ. ධම්ම පටිසම්භිදේ ඤාණේන සමන්නාගතෝ වත සෝ භගවා, තං භගවන්තං ධම්ම පටිසම්භීදේ ඤාණේන සමනාගතං සරණං ගච්ඡාමි. තං භගවන්තං ධම්ම පටිසම්භිදේ**

**ඤාණේන සමන්නාගතං සිරසා නමාමි.**

ස්වාමීනි භාග්‍යවතුන් වහන්සෙ, ඔබ වහන්සේ මෙසේද ධමම පටිසම්භිදා ඤාණයෙන් සමන්නාගත වනසේක. ඒ භාග්‍යවතුන් වහන්සේ ඒකාන්තයෙන් ධමම පටිසම්භිදා ඤාණයෙන් සමන්නාගත වන සේක. ඒ ධමම පටිසම්භිදා ඤාණයෙන් සමන්නාගත භාග්‍යවතුන් වහන්සේ මම සරණ යමි. ඒ ධමම පටිසම්භිදා ඤාණයෙන් සමන්නාගත භාග්‍යවතුන් වහන්සේට මාගේ නමස්කාරය වේවා!

**සාධු ! සාධු !! සාධු !!!**

## සුද්ධික ධම්මපටිසම්භිදා ඤාණයට වන්දනාව

**මග්ගක්ඛණේසු සකලාරිය පුග්ගලානං**
**සංසිජ්ඣමාන මිහ ධම්මචයං වහනතිං**
**සුද්ධන්තු ධම්ම පටිසම්භිද මජ්ඣ ගායෝ**
**තාහං නමාමි සුගතං සුත ධම්ම දෙහං**

''ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස'' ඔබ වහන්සේ සියලු ආර්යෝත්තමයනට මාර්ගක්ෂණයෙහි දී ලැබෙන්නාවූද සියලු ධර්ම සමූහය උසුලන්නාවූද, විසුද්ධ වූ ධම්මපටිසම්භිදා ඤාණයෙන් සමන්නාගත වනසේක. පරිපූර්ණ



ධර්මකාය සම්පත්තියෙන් ආඪ්‍යවූ ධම්ම පටිසම්භිදා ඤාණයෙන් අගතැන්පත් වූ සද්ධර්මචර චක්‍රවර්ති සර්වඥරාජෝත්තමයන් වහන්සේට මාගේ නමස්කාරය වේවා!

**සාධු ! සාධු !! සාධු !!!**

## 07. නිරුත්ති පටිසම්භිදා ඤාණයට පූජාව

**01. දීපේහි ගන්ධ ධූපේහි - ගිලාන පච්චයේහිච**
**පුප්ඵාදි වත්ථු ජාතේහි - සුද්ධේහි කප්පියේහිච**
**නිරුත්ති පටිසමභිද ඤාණං - දේසෙන්තං ගෝතමං මුනිං**
**සුද්ධ චිත්තප්පසාදේන - නිබ්බානත්ථාය පූජයේ.**

''ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස'' හාත්පස අඳුර නසමින් බැබළෙන පහනින්ද, දසත පැතිරෙන මනහර සුගන්ධ ධූපයෙන්ද, අෂ්ඨපානාදී ප්‍රනීත ගිලන් පසෙන්ද, විසිතුරු මල් ආදි ශුද්ධ කැප වස්තු සමූහයෙන්ද, සියලු කෙලෙස් බල මුළුව සිදලූ ගෞතම මුනිඳුන් මනාව දේශනා කරන ලද ධර්මයෙහි නිරුක්තිරසය වූ නිරුතති පටිසම්භිදා ඤාණයට සුද්ධ චිත්තප්පසාදයෙන් නිවන් සුව පිණිස පූජා කරමි පූජා වේවා!

**සාධු ! සාධු !! සාධු !!!**

## නිරුත්ති පටිසම්භිදා ඤාණයට වන්දනාව

**සො භගවා ඉතිපි නිරුත්ති පටිසම්භිදේ ඤාණේන සමන්නාගතෝ නිරුත්ති පටිසම්භිදේ ඤාණේන සමන්නාගතෝ, වත සො භගවා, තං භගවන්තං නිරුත්ති පටිසම්භිදේ ඤාණේන සමනාගතං සරණං ගච්ඡාමි තං භගවන්තං නිරුත්ති පටිසම්භිදේ ඤාණේන සමන්නාගතං සිරසා නමාමි.**

ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, ඔබ වහන්සේ මෙසේද නිරුක්ති පටිසම්භිද ඤාණයෙන් සමන්නාගත වනසේක. ඒ භාග්‍යවතුන් වහන්සේ ඒකාන්තයෙන් නිරුක්ති පටිසම්භිදෙ ඤාණයෙන් සමන්නාගත වන සේක. ඒ නිරුක්ති පටිසම්භිද ඤාණයෙන් සමන්නාගත භාග්‍යවතුන් වහන්සේ මම සරණ යමි. ඒ නිරුක්ති පටිසම්භිද ඤාණයෙන් සමන්නාගත භාග්‍යවතුන් වහන්සේට මාගේ නමස්කාරය වේවා!

**සාධු ! සාධු !! සාධු !!!**

## සුද්ධික නිරුත්ති පටිසම්භිදා ඤාණයට වන්දනාව

**මග්ගක්ඛණේසු සකලාරිය පුග්ගලානං**
**සාමං නිරුත්ති සරණිං විසදී කරොන්තිං**
**සුද්ධං නිරුත්ති පටිසම්භිද මජ්ඣගා යෝ**
**තාහං නිරුත්තර මතිං සුගතං නමාමි**



''ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස,'' ඔබ වහන්සේ ආර්ය මාර්ගක්ෂණයෙහිදී සියලු ආර්යෝත්තමයන්ට ලැබෙන්නාවූද නිරුත්ති පත්තිය සුවිසද කරන්නාවූද, විසුද්ධ වූ නිරුත්ති පටිසම්භිදා ඤාණයෙන් සමන්නාගත වනසේක. ස්වභාව නිරුත්තිය ලොවට පහදා වදාළාවූ නිරුත්ති ප්‍රතිසම්භිදා ඤාණයෙන් අගතැන්පත් වූ සර්වඥමහර්ෂීන් වහන්සේට මාගේ නමස්කාරය වේවා.

**සාධු ! සාධු !! සාධු !!!**

## 08. පටිභාන පටිසම්භිදා ඤාණයට පූජාව

**01. දීපේහි ගන්ධ ධූපෙහි - ගිලාන පච්චයේහිච**
**පුප්ඵාදි වත්‍ථු ජාතේහි - සුද්ධේහි කප්පියේහිච**
**පටිභාන පටිසම්භිද ඤාණං -දෙසෙන්තං ගෝතමං මුනිං**
**සුද්ධ චිත්තප්පසාදේන - නිබ්බානත්‍ථාය පූජයේ.**

''ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස'' හාත්පස අඳුර නසමින් බැබළෙන පහනින්ද, දසත පැතිරෙන මනහර සුගන්ධ ධූපයෙන්ද, අෂ්ඨපානාදී ප්‍රනීත ගිලන් පසෙන්ද, විසිතුරු මල් ආදි ශුද්ධ කැප වස්තු සමූහයෙන්ද, යම් සේ ගෞතම මුනිඳුන් දරන්නා වූ පටිභාන පටිසමභිදා ඤාණයට සුද්ධ චිත්තප්පසාදයෙන් නිවන් සුව

පිණිස පූජා කරමි පූජා වේවා!

සාධු ! සාධු !! සාධු !!!

## පටිභාන පටිසම්භිදා ඥාණයට වන්දනාව

**සෝ භගවා ඉතිපි පටිභාන පටිසම්භිදේ ඥාණේන සමන්නාගතෝ. පටිභාන පටිසම්භිදේ ඥාණේන සමන්නාගතෝ වත සෝ භගවා, තං භගවන්තං පටිභාන පටිසම්භිදේ ඥාණේන සමනාගතං සරණං ගච්ඡාමි තං භගවන්තං පටිභාන පටිසම්භිදා ඥාණේන සමන්නාගතං සිරසා නමාමි.**

ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, ඔබ වහන්සේ මෙසේද පටිභාන පටිසම්භිදා ඥාණයෙන් සමන්නාගත වනසේක. ඒ භාග්‍යවතුන් වහන්සේ ඒකාන්තයෙන් පටිභාන පටිසම්භිදා ඥාණයෙන් සමන්නාගත වන සේක. ඒ පටිභාන පටිසම්භිදා ඥාණයෙන් සමන්නාගත භාග්‍යවතුන් වහන්සේ මම සරණ යමි. ඒ පටිභාන පටිසම්භිදා ඥාණයෙන් සමන්නාගත භාග්‍යවතුන් වහන්සේට මාගේ නමස්කාරය වේවා!

සාධු ! සාධු !! සාධු !!!



## සුද්ධික පටිභාන පටිසම්භිදා ඥාණයට වන්දනාව

**මග්ගක්ඛණෙසු සකලාරිය පුග්ගලානං**
**සබ්බත්ථ ඥාණ විසයෙසු සමිජ්ඣමානං**
**සුද්ධං සමාදිසි මතිං පටිභානකං යෝ**
**ඥාණං නමාමි සුගතං පටිභානිනග්ගං**

''ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස,'' ඔබ වහන්සේ අර්ථ ධර්ම නිරුක්ති යන ඥාණත්‍රය අරමුණු කරන්නාවූද, ආර්ය මාර්ග ක්ෂණයෙහි දී සියලු ආර්යයන් වහන්සේලාට ලැබෙන්නාවූද පටිසම්භිදා ඥාණයෙන් සමන්නාගත වනසේක. පටිභාන පටිසම්භිද ඥාණයෙන් අගතැන්පත් වූ ඥානේශ්වර සර්වඥරාජයන් වහන්සේට මාගේ නමස්කාරය වේවා!

සාධු ! සාධු !! සාධු !!!

## 09. ඉන්ද්‍රිය පරෝ පරියන්ත ඥාණයට පූජාව

**01. දීපේහි ගන්ධ ධූපේහි - ගිලාන පච්චයේහිච**
**පුප්ඵාදි වත්ථු ජාතේහි - සුද්ධේහි කප්පියේහිච**
**ඉන්ද්‍රිය පරෝ පරියත්ත ඥාණං-දෙසෙන්තං ගොතමං මුනිං**
**සුද්ධ චිත්තප්පසාදේන - නිබ්බානත්ථාය පූජයේ.**

''ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස'' හාත්පස අඳුර නසමින් බැබළෙන පහනින්ද, දසත පැතිරෙන මනහර සුගන්ධ ධූපයෙන්ද, අෂ්ඨපානාදී ප්‍රනීත ගිලන් පසෙන්ද, විසිතුරු මල් ආදි ශුද්ධ කැප වස්තු සමූහයෙන්ද, සියලු කෙලෙස් බල මුළුව සිදළු ගෞතම මුනිඳුන් මනාව දේශනා කරන ලද ඉන්ද්‍රිය ධර්මයන්ගේ වැඩුණු නොවැඩුණු බව දැනගන්නා වූ ඉන්ද්‍රිය පරෝ පරියත්ත ඤාණයට සුද්ධ චිත්තප්පසාදයෙන් නිවන් අවබෝධය පිණිස පූජා කරමි පූජා වේවා!

**සාධු ! සාධු !! සාධු !!!**

## ඉන්ද්‍රිය පරෝ පරියතත ඤාණයට වන්දනාව

**සෝ භගවා ඉතිපි ඉන්ද්‍රියපරෝපරියත්ත ඤාණේන සමන්නාගතෝ, ඉන්ද්‍රියපරෝපරියත්තේ ඤාණේන සමන්නාගතෝ වත සෝ භගවා, තං භගවන්තං ඉන්ද්‍රිය පරෝපරියත්තේ ඤාණේන සමනාගතං සරණං ගච්ඡාමි තං භගවන්තං ඉන්ද්‍රිය පරෝපරියත්තේ ඤාණේන සමන්නාගතං සිරසා නමාමි.**

ඒ භාග්‍යවතුන් වහන්සේ, ඔබ වහන්සේ මෙසේද ඉන්ද්‍රිය පරෝපරියත්තේ ඤාණයෙන් සමන්නාගත වනසේක. ඒ භාග්‍යවතුන් වහන්සේ ඒකාන්තයෙන් ඉන්ද්‍රිය පරෝපරියත්තේ ඤාණයෙන් සමන්නාගත වන සේක. ඒ ඉන්ද්‍රිය



පරෝපරියත්තේ ඤාණයෙන් සමන්නාගත භාග්‍යවතුන් වහන්සේ මම සරණ යමි. ඒ ඉන්ද්‍රිය පරෝපරියත්තේ ඤාණයෙන් සමන්නාගත භාග්‍යවතුන් වහන්සේට මාගේ නමස්කාරය වේවා!

**සාධු ! සාධු !! සාධු !!!**

## ඉන්ද්‍රිය පරෝ පරියත්ත ඤාණයට වන්දනාව

**වේනෙය්‍ය මානස තළන්තර ජායමාන**
**සද්ධා සතිප්පභූති පඤ්ච විධින්ද්‍රියානං**
**හෙදංපරාවරතයා පරිතීරයන්තං**
**ඤාණං නමාමි සුගතස්ස විසේසභූතං**

''ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස,'' ඔබ වහන්සේ මගඵල නිවන් සුව ලැබීමේ හේතු සම්පත් ඇත්තාවූ විනේ දනන් ගේ සද්ධා-විරිය-සති-සමාධි-පඤ්ඤා යන ඉන්ද්‍රිය ධර්මයන් පිළිබඳ වැඩුණු-නොවැඩුණු උස් පහත් බව හා හීන-ප්‍රහීණ තාදිය ද තත්වාකාරයෙන් දන්නාවූ ඉන්ද්‍රිය පරොපරියත්තේ ඤාණයෙන් සමන්නාගත වනසේක.සුගත තථාගතයන් වහන්සේට පමණක් ලැබෙන්නා වූ සුවිශේෂ බුද්ධ චක්‍ෂු නම් ලත් ඉන්ද්‍රිය පරොපරියත්තේ ඤාණයෙන් සමන්විත වූ භාවිතේන්ද්‍රිය ඇති සර්වඥරාජයාණන් වහන්සේට මාගේ නමස්කාරය වේවා!

**සාධු ! සාධු !! සාධු !!!**

## 10. ආසයානුසය ඤාණයට පූජාව

**දීපේහි ගන්ධ ධූපේහි - ගිලාන පච්චයේහිච**
**පුප්ඵාදි වත්ථු ජාතේහි - සුද්ධේහි කප්පියේහිච**
**ආසයානුසයේ ඤාණං - දෙසෙන්තං ගෝතමං මුනිං**
**සුද්ධ චිත්තප්පසාදේන - නිබ්බානත්ථාය පූජයේ.**

''ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස'' හාත්පස අඳුර නසමින් බැබළෙන පහනින්ද දසත පැතිරෙන මනහර සුගන්ධ ධූපයෙන්ද, අෂ්ඨපානාදී ප්‍රනීත ගිලන් පසෙන්ද විසිතුරු මල් ආදි ශුද්ධ කැප වස්තු සමූහයෙන්ද, සියලු කෙලෙස් බල මුළුව සිඳළු ගෞතම මුනිඳුන් මනාව දේශනා කරන ලද බුද්ධ චක්ඛු නම් ලත් ඤාණයෙන් සත්වයන්ගේ චරිත දැනගත්තා වූ ආසයානුසයෙ ඤාණයට සුද්ධ චිත්තප්පසාදයෙන් නිවන් අවබෝධය පිණිස පූජා කරමි පූජා වේවා!

**සාධු ! සාධු !! සාධු !!!**

## ආසයානුසය ඤාණයට වන්දනාව

**සෝ භගවා ඉතිපි ආසයානුසයඤාණේන සමන්නාගතෝ. ආසයානුසයඤාණේන සමන්නාගතෝ වත සෝ භගවා, තං භගවන්තං ආසයානුසයඤාණේන සමනාගතං සරණං ගච්ඡාමි. තං භගවන්තං ආසයානුසය ඤාණේන**



**සමන්නාගතං සිරසා නමාමි.**

ස්වාමීනි භාග්‍යවතුන් වහන්සේ, ඔබ වහන්සේ මෙසේද ආසයානුසයේ ඤාණයෙන් සමන්නාගත වනසේක. ඒ භාග්‍යවතුන් වහන්සේ ඒකාන්තයෙන් ආසයානුසයේ ඤාණයෙන් සමන්නාගත වන සේක. ඒ ආසයානුසයේ ඤාණයෙන් සමන්නාගත භාග්‍යවතුන් වහන්සේ මම සරණ යමි. ඒ ආසයානුසයේ ඤාණයෙන් සමන්නාගත භාග්‍යවතුන් වහන්සේට මාගේ නමස්කාරය වේවා!

**සාධු ! සාධු !! සාධු !!!**

## ආසයානුසය ඤාණයට වන්දනාව

**සත්තාන මාසය මථෝනුසයං සමත්තං**
**යේනාඤ්ඤගා තදනුගා චරිතාධි මුත්ති**
**සත්පුස්ස සත්ත හිත සිද්ධි සමිද්ධි හෙතු**
**වන්දෙ සයා නුසය ඤාණ මනඤ්ඤ සේවිං**

''ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස,'' ඔබ වහන්සේ සත්ව සන්තානයෙහි විද්‍යාමාන වන්නාවූ සම්මාදිට්ඨි නෙක්ඛම්ම මනසිකාරාදි පරිභාවිත ස්වාභාව නම්වූ ආසය දන්නාවූ ද,සත්ව සන්තානයෙහි අප්‍රහීණතාවෙන් නැවත නැවත හටගන්නා වූ ථාමගත ක්ලෙශ නම් වූ අනුශය

දන්නාවූද, ඒවා අනුව ගිය චරිත හා අධිමුත්ති දන්නාවූද, ආසයානුසය ඤාණයෙන් සමන්නාගත වනසේක. ලෝවැඩ පිණිස අතිශයින් උපකාරීවූ අනන්‍ය සාධාරණද වූ බුද්ධ චක්ෂු නම් වූ ආසයානුසය ඤාණයෙන් සමන්විත සර්වඥසම්මා සම්බුදුරජාණන් වහන්සේට මාගේ නමස්කාරය වේවා !

සාධු ! සාධු !! සාධු !!!

## 11. යමක පාටිහාරියේ ඤාණයට වන්දනාව

**දීපේහි ගන්ධ ධූපේහි - ගිලාන පච්චයේහිච**
**පුප්ඵාදි වත්ථු ජාතේහි - සුද්ධේහි කප්පියේහිච**
**යමක පාටිහාරියේඤාණං - දෙසෙන්තං ගෝතමං මුනිං**
**සුද්ධ චිත්තප්පසාදේන - නිබ්බානත්ථාය පූජයේ.**

''ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස'' හාත්පස අඳුර නසමින් බැබළෙන පහනින්ද, දසත පැතිරෙන මනහර සුගන්ධ ධූපයෙන්ද, අෂ්ඨපානාදී ප්‍රනීත ගිලන් පසෙන්ද, විසිතුරු මල් ආදි ශුද්ධ කැප වස්තු සමූහයෙන්ද, සියලු කෙලෙස් බල මුළුව සිදලු ගෞතම මුනිදුන් මනාව දේශනා කරන ලද ස්වභාවික සෘද්ධි බලයෙන් සත්වයන් දමනය කලා වූ යමක පාටිහාරියේ ඤාණයට සුද්ධ චිත්තප්පසාදයෙන් නිවන් අවබෝධය පිණිස පූජා කරමි පූජා වේවා!



## යමක පාටිහාරියේ ඤාණයට වන්දනාව

**සෝ භගවා ඉතිපි යමක පාටිහාරියේ ඤාණේන සමන්නාගතෝ, යමක පාටිහාරියේ ඤාණේන සමන්නාගතෝ වත සෝ භගවා, තං භගවන්තං යමක පාටිහාරියේ ඤාණේන සමනාගතං සරණං ගච්ඡාමි තං භගවන්තං යමක පාටිහාරියේ ඤාණේන සමන්නාගතං සිරසා නමාමි.**

ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, ඔබ වහන්සේ මෙසේද යමක පාටිහාරියේ ඤාණයෙන් සමන්නාගත වනසේක. ඒ භාග්‍යවතුන් වහන්සේ ඒකාන්තයෙන් යමක පාටිහාරියේ ඤාණයෙන් සමන්නාගත වන සේක. ඒ යමක පාටිහාරියේ ඤාණයෙන් සමන්නාගත භාග්‍යවතුන් වහන්සේ මම සරණ යමි. ඒ යමක පාටිහාරියේ ඤාණයෙන් සමන්නාගත භාග්‍යවතුන් වහන්සේට මාගේ නමස්කාරය වේවා!

සාධු ! සාධු !! සාධු !!!

## යමක පාටිහාරියේ ඤාණයට වන්දනාව

**ඒකක්ඛණේ ච යමකේ යමකා ච ධානා**
**සංසෙවිතිද්ධි ජනිතාය ධියෝදයෙන්තං**
**සද්ධාදී සංජනනකං යමකන්තු පාටි**
**හේරං නමාමි මුනිරාජ වරස්ස ඤාණං**

''ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස'' ඔබ වහන්සේ අතිශයින් සුභාවිත සෘද්ධි බලයෙන් හෙට්ඨිමකාය උපරිම කායාදි සකල ශරීර ප්‍රදේශයෙන් ගිනිකඳ යුගල යුගලව එක් සැණෙහි විහිදුවමින් අතිශයින් විසිතුරු වූ යමාමහ පෙළහැර පෑමේ යමක පාටිහාරිය ඥාණයෙන් සමන්නාගත වනසේක. දුටුවන් සිත් සතන් සැදැහයෙන් ඉපිළ යන්නාවූ අසිරිමත් යමාමහ පෙළහැර පාන්නාවූ අනන්‍ය සාධාරණ වූ යමක පාටිහාරිය ඥාණයෙන් සමන්විත වූ චිතෙත්ශ්වර දශබලධාරීමුනීන්ද්‍රයන් වහන්සේට මාගේ නමස්කාරය වේවා!

සාධු ! සාධු !! සාධු !!!

## 12. මහා කරුණා සමාපත්ති ඥාණයට පූජාව

**දීපේහි ගන්ධ ධූපේහි - ගිලාන පච්චයේහිච**
**පුප්ඵාදි වත්‍ථු ජාතේහි - සුද්ධේහි කප්පියේහිච**
**මහා කරුණා සමාපත්ති ඥාණං - දෙසෙන්තං ගෝතමං මුනිං**
**සුද්ධ චිත්තප්පසාදේන - නිබ්බානත්‍ථාය පූජයේ.**

''ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස'' හාත්පස අඳුර නසමින් බැබළෙන පහනින්ද, දසත පැතිරෙන මනහර සුගන්ධ ධූපයෙන්ද, අෂ්ඨපානාදී ප්‍රනීත ගිලන් පසෙන්ද, විසිතුරු මල් ආදි ශුද්ධ කැප වස්තු සමූහයෙන්ද, සියලු කෙලෙස් බල මුළුව සිදලු ගෞතම මුනිදුන් මනාව



දේශනා කරන ලද කරුණාවෙන් සත්වයන් සසරින් එතෙර කරන්නට පිහිට වන්නා වූ මහා කරුණා සමාපත්ති ඥාණයට සුද්ධ චිත්තප්පසාදයෙන් නිවන් අවබෝධය පිණිස පූජා කරමි පූජා වේවා!

සාධු ! සාධු !! සාධු !!!

## මහා කරුණා සමාපත්ති ඥාණයට වන්දනාව

**සෝ භගවා ඉතිපි මහාකරුණා සමාපත්ති ඥාණේන සමන්නාගතෝ, මහාකරුණා සමාපත්ති ඥාණේන සමන්නාගතෝ වත සෝ භගවා, තං භගවන්තං මහාකරුණා සමාපත්ති ඥාණේන සමනාගතං සරණං ගච්ඡාමි. තං භගවන්තං මහාකරුණා සමාපත්ති ඥාණේන සමන්නාගතං සිරසා නමාමි.**

ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, ඔබ වහන්සේ මෙසේ මහා කරුණා සමාපත්ති ඥාණයෙන් සමන්නාගත වනසේක. ඒ භාග්‍යවතුන් වහන්සේ ඒකාන්තයෙන් මහාකරුණා සමාපත්ති ඥාණයෙන් සමන්නාගත වන සේක. ඒ මහාකරුණා සමාපත්ති ඥාණයෙන් සමන්නාගත භාග්‍යවතුන් වහන්සේ මම සරණ යමි. ඒ මහා කරුණා සමාපත්ති ඥාණයෙන් සමන්නාගත

භාග්‍යවතුන් වහන්සේට මාගේ නමස්කාරය වේවා!

සාධු ! සාධු !! සාධු !!!

## මහා කරුණා සමාපත්ති ඤාණයට වන්දනාව

**සම්පස්සතෝ සුමහ දුක්ඛ පපාත පාතා**
**පීළා පරං නිඛිත සත්ත ගණං හමන්තං**
**සඤ්ජායමාන මුපයොගි තරං ගුණානං**
**වන්දෙ මුනිස්සර මහා කරුණාඛ්‍ය ඤාණං**

''ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස'' ඔබ වහන්සේ අගමුල පරතෙර නොපෙනෙන්නාවූ බියකරු සසර කතරෙහි වැටී අතරමං වී අනේක දුක්ඛයෙන් පෙළෙන්නා වූ අසරණ සත්ත්වයන් දකීමෙන් බුදුහිත උණුවෙන්නාවූද, ඒ ඒ සත්ව නිකාය යන්හි ඉපදෙමින් මැරෙමින් සැරිසරන්නා වූ සත්වයන් එදුකින් මුදවා ගන්නෙමියි නිරතුරු මෙනෙහි කරන්නාවූද සියලු බුදුගුණයට අතිශයින් උපකාරී වූ මහා කරුණා සමාපත්ති ඤාණයෙන් සමන්නාගත වනසේක. දිනපතා සූවිසි කෙළ ලක්ෂවාරයක් සමවතට සමවැදී ලොවට වැඩ සැදූ මහා කරුණා සමාපත්ති ඤාණයෙන් සමන්විත ශාන්ති නායක සම්බුදු පියාණන් වහන්සේට මාගේ නමස්කාරය වේවා.

සාධු ! සාධු !! සාධු !!!



## 13. සබ්බඤ්ඤුත ඤාණයට පූජාව

**දීපේහි ගන්ධ ධූපේහි - ගිලාන පච්චයේහිච**
**පුප්ඵාදි වත්‍ථු ජාතේහි - සුද්ධේහි කප්පියේහිච**
**සබ්බඤ්ඤුත ඤාණං තං - දේසෙන්තං ගෝතමං මුනිං**
**සුද්ධ චිත්තප්පසාදේන - නිබ්බානත්‍ථාය පූජයේ.**

''ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස'' හාත්පස අඳුර නසමින් බැබළෙන පහනින්ද, දසත පැතිරෙන මනහර සුගන්ධ ධූපයෙන්ද, අෂ්ඨපානාදී ප්‍රනීත ගිලන් පසෙන්ද, විසිතුරු මල් ආදි ශුද්ධ කැප වස්තු සමූහයෙන්ද, සියලු කෙලෙස් බල මුළුව සිදලු ගෞතම මුනිදුන් මනාව දේශනා කරන ලද හේතුවෙන් හටගත් හා හේතුවෙන් හට නොගත් ධර්මය අවබෝධ කලා වූ සබ්බඤ්ඤුත ඤාණයට සුද්ධ චිත්තප්පසාදයෙන් නිවන් අවබෝධය පිණිස පූජා කරමි පූජා වේවා!

සාධු ! සාධු !! සාධු !!!

## සබ්බඤ්ඤුත ඤාණයට වන්දනාව

**සෝ භගවා ඉතිපි සබ්බඤ්ඤුත ඤාණේන සමන්නාගතෝ. සබ්බඤ්ඤුත ඤාණේන සමන්නාගතෝ වත සෝ භගවා. තං භගවන්තං සබ්බඤ්ඤුත ඤාණේන සමනාගතං සරණං ගච්ඡාමි තං භගවන්තං සබ්බඤ්ඤුත ඤාණේන**

සමන්නාගතං සිරසා නමාමි.

ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, ඔබ වහන්සේ මෙසේද සබ්බඤ්ඤුත ඤාණයෙන් සමන්නාගත වනසේක. ඒ භාග්‍යවතුන් වහන්සේ ඒකාන්තයෙන් සබ්බඤ්ඤුත ඤාණයෙන් සමන්නාගත වන සේක. ඒ සබ්බඤ්ඤුත ඤාණයෙන් සමන්නාගත භාග්‍යවතුන් වහන්සේ මම සරණ යමි. ඒ සබ්බඤ්ඤුත ඤාණයෙන් සමන්නාගත භාග්‍යවතුන් වහන්සේට මාගේ නමස්කාරය වේවා!

**සාධු ! සාධු !! සාධු !!!**

## සබ්බඤ්ඤුත ඤාණයට වන්දනාව

**සබ්බම්පි සංඛත මසඞ්ඛත මත්ථජාතං**
**පච්චක්ඛ තික්ඛ ගතියා මවගාහමානං**
**සංසිද්ධපාරමි ලතා ඵලතා සරූපං**
**සබ්බඤ්ඤුතං පවර ඤාණ මහං නමාමි**

''ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස'' ඔබ වහන්සේ ජයසිරි මහබෝමැඩදී අවබෝධ කොට වදාළා වූ අනන්ත ඤාණධාතු අතුරෙන් අග්‍රවූද, හේතුවෙන් හටගන්නා වූ සංඛත ධර්මයන් හා හේතුවෙන් හට නොගන්නාවූ අසංඛත නිර්වාණ ධර්මයන්ද තියුණු ලෙස තත්වාකාරයෙන් දැනගන්නාවූද, සර්වඥතා ඥානයෙන්



සමන්නාගත වනසේක. අතිශයින් දීර්ඝ කාලාන්තරයෙහි වැඩුනා වූ පාරමිතා කල්ප ලතාවේ හටගත් අමාඵලයක් වැනිවූද, අනන්‍ය සාධාරණ සර්වඥතා ඤාණයෙන් සමලංකෘතවූ සර්වකාර පරිපූර්ණ සුසමෘද්ධ ධර්මකාය සම්පත්තියෙන් සමන්විත වූ ලෝකස්වාමි වූ සද්ධර්මචර චක්‍රවර්ති භාග්‍යවත් අර්හත් සම්මා සම්බුදු රජාණන් වහන්සේට දොහොත් මුදුන් තබා වැද නමස්කාර කරමි. නමස්කාර වේවා.

**සාධු ! සාධු !! සාධු !!!**

## 14. අනාවරණ ඤාණයට පූජාව

**දීපේහි ගන්ධ ධූපේහි - ගිලාන පච්චයේහිච**
**පුප්ඵාදි වත්ථු ජාතේහි - සුද්ධේහි කප්පියේහිච**
**අනාවරණ ඤාණං තං -දෙසෙන්තං ගෝතමං මුනිං**
**සුද්ධ චිත්තප්පසාදේන - නිබ්බානත්ථාය පූජයේ.**

''ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස'' හාත්පස අඳුර නසමින් බැබළෙන පහනින්ද, දසත පැතිරෙන මනහර සුගන්ධ ධූපයෙන්ද, අෂ්ඨපානාදී ප්‍රනීත ගිලන් පසෙන්ද විසිතුරු මල් ආදි ශුද්ධ කැප වස්තු සමූහයෙන්ද, සියළු කෙලෙස් බල මුළුව සිඳලූ ගෞතම මුනිඳුන් මනාව දේශනා කරන ලද නිවනට අවරණ නොවන්නා වූ

අණාවරණ ඤාණයට සුද්ධ චිත්තප්පසාදයෙන් නිවන් අවබෝධය පිණිස පූජා කරමි පූජා වේවා!

## අනාවරණ ඤාණයට වන්දනාව

**සෝ භගවා ඉතිපි අනාවරණ ඤාණේන සමන්නාගතෝ. අනාවරණ ඤාණේන සමන්නාගතෝ වත සෝ භගවා. තං භගවන්තං අනාවරණ ඤාණේන සමනාගතං සරණං ගච්ඡාමි. තං භගවන්තං අනාවරණ ඤාණේන සමන්නාගතං සිරසා නමාමි**

ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, ඔබ වහන්සේ මෙසේද අනාවරණ ඤාණයෙන් සමන්නාගත වනසේක. ඒ භාග්‍යවතුන් වහන්සේ ඒකාන්තයෙන් අනාවරණ ඤාණයෙන් සමන්නාගත වන සේක. ඒ අනාවරණ ඤාණයෙන් සමන්නාගත භාග්‍යවතුන් වහන්සේ මම සරණ යමි. ඒ අනාවරණ ඤාණයෙන් සමන්නාගත භාග්‍යවතුන් වහන්සේට මාගේ නමස්කාරය වේවා!

## අනාවරණ ඤාණයට වන්දනාව

**සබ්බඤ්ඤුතාය මතියා පතිතාය තාය**
**සබ්බප්පකාර විසතායිධ සබ්බ ධම්මේ**
**තත්ථේව කත්ථචි යතෝ චරණං කථම්පි**
**වන්දේ අනාවරණ ඤාණ මනෝම මේතං**



''ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස'' ඔබ වහන්සේ සැමතැන පැතිරගෙන ආවර්ජනා කළ මාත්‍රයෙන් සියල්ල අරමුණු කරන්නාවූ සර්වඥතා ඥානයට කිසිතැනකදී කිසිලෙසකිනුත් ආවරණ නොමවන්නාවූ අනාවරණ ඤාණයෙන් සමන්නාගත වනසේක. අනන්‍ය සාධාරණවූ සයවෙනි අනාවරණ ඤාණයෙන් සමන්නාගත වූ දේවාතිදේව වූ ශක්‍රාතිශක්‍රවූ බ්‍රහ්මාති බ්‍රහ්ම වූ මාරපරාජය කළාවූ අසමවූ අසම සම වූ, අප්‍රතිමවූ අප්‍රතිභාගවූ, වන්‍දනෙයයාහි වන්‍දනීය වූ, පූජනෙයයාහි පූජනීයවූ දශබලධාරී වූ, ශාක්‍ය සිංහ වූ සමන්තභද්‍ර, වූ ත්‍රෛලෝක්‍ය තිලකවූ, සර්වඥරාජෝත්තමයන් වහන්සේට දොහොත් මුදුන් තබා මස්තක ප්‍රමාණයෙන් වැද නමස්කාර කරමි. නමස්කාර වේවා. මාගේ ජීවිතයද පූජා වේවා. අනන්ත බුදු නුවණින් මා සිත එළියවේවා. බුදු නැණ පහනින් මා සිත පහන් වේවා. බුදු නැණ තේජසින් මා සිත නිකෙලෙස් වේවා. බුදු නැණ අනුහසින් මාහට පරම රමණීය වූ ශාන්ති ලක්ෂණවූ අමෘත මහා නිර්වාණ ධාතුව ඒකාන්තයෙන් සාක්ෂාත් වේවා!

**සාධු! සාධු !! සාධු !!!**

# සත් සති බුද්ධ ඤාන පූජාව
# සහ
# සත් සති බුද්ධ ඤාණ වන්දනාව
## බෝධිමූල වජ්‍රාසන චෛත්‍ය වන්දනාව

## 01. බෝධි මූල වජිරාසන චෙතිය පූජාව

**දීපේහි ගන්ධ ධූපේහි - ගිලාන පච්ච යේහි ච**
**පුප්ඵාදි වත්‍ථු ජාතේහි - සුද්ධේහි කප්පි යේහි ච**
**වජිරාසන චෙතිංච - සම්බුද්ධෙන සුසේවිතං**
**අජරාමර සුඛත්‍ථාය - භත්‍යාදරේන පූජයේ.**

''ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස'' හාත්පස අඳුර නසමින් බැබළෙන පහනින්ද, දසත පැතිරෙන මනහර සුගන්ධ ධූපයෙන්ද, අෂ්ඨපානාදී ප්‍රනීත ගිලන් පසෙන්ද, විසිතුරු මල් ආදි ශුද්ධ කැප වස්තු සමූහයෙන්ද, ගෞතම ශාක්‍යසිංහ බුදුරජාණන් වහන්සේ පරිභොගකරණ ලද වජිරාසන චෛත්‍ය ස්ථානයට අජරාමර නිවන් සුව පිණිස භක්‍යාදරයෙන් පූජා කරමි පූජා වේවා!

**සාධු! සාධු !! සාධු !!!**

**සම්පූණ්ණ පාරමී බලෝ වර බෝධි මූලේ**
**සම්බුඬ භාව මධිගම්ම සමන්ත ඤාණෝ**
**යස්මිං විහාසි සුසුභං නුභවං සසාමා**
**පත්තිං සුඛං වහිනමේ විජයාසනං තං**



මාගේ ස්වාමි වූ සම්මා භාග්‍යවතුන් වහන්ස ඔබ වහන්සේ සමන්ත ඤාණ ඇත්තා වූ සම්‍යක් සම්බුද්ධ සර්වඥරාජෝත්තමයාණන් වහන්සේ සම්පූර්ණ වූ බෝධිසම්භාර පාරමී බල ඇති සේක. ජයසිරි මහා බෝමැඩ දී සම්මා සම්බෝධියට විශේෂයෙන් පැමිණ, අති උත්තම සමාපත්ති රස වින්දනය කරමින් පළඟ නොබිඳ සතියක් මුළුල්ලේ යම් ඒ වජ්‍රාසනයෙක්හි වැඩහුන් සේක්ද, ඒ උතුම් වජ්‍රාසනයට ද, සර්වඥසම්මා සම්බුදු රජාණන් වහන්සේට ද, මම දොහොත් මුදුනේ තබා වැඳ නමස්කාර කරමි. මාගේ නමස්කාරය වේවා!

**සාධු! සාධු !! සාධු !!!**

## 02. අනිමිස ලෝචන චෙතිය පූජා ගාථාව

**දීපේහි ගන්ධ ධූපේහි - ගිලාන පච්ච යේහි ච**
**පුප්ඵාදි වත්‍ථු ජාතේහි - සුද්ධේහි කප්පි යේහි ච**
**අනිමිස චේතියට්ඨාන - ගෝතමං ජිනසේවිතං**
**අජරාමර සුඛත්‍ථාය - භත්‍යාදරේන පූජයේ.**

''ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස'' හාත්පස අඳුර නසමින් බැබළෙන පහනින්ද, දසත පැතිරෙන මනහර සුගන්ධ ධූපයෙන්ද, අෂ්ඨපානාදී ප්‍රනීත ගිලන් පසෙන්ද, විසිතුරු මල්

ආදි ශුද්ධ කැප වස්තු සමූහයෙන්ද, පස්වරුන් දිනූ ගෞතම ජින නායක වූ බුදුරජාණන් වහන්සේ පරිභොගකරණ ලද අනිමිස ලෝචන චෙත්‍ය ස්ථානයට අජරාමර නිවන් සුව පිණිස භක්‍යාදරයෙන් පූජා කරමි පූජා වේවා!

**සාධු! සාධු !! සාධු !!!**

## අනිමිස ලෝචන චෛත්‍ය වන්දනාව

**සත්ථා සුදං සමවිචින්තිය කප්පකෝටි**
**සම්පත්ති තං විජය බෝධි මහෝපකාරං**
**සත්තාහ මච්ඡි නිමිසක්ඛි යුගේන යස්මිං**
**සම්මා නමේ නිමිස චෙතිය මේත මග්ගං**

මාගේ ස්වාමී වූ ගෞතම භාග්‍යවතුන් වහන්ස ඔබ වහන්සේ කල්ප කෝටි ශත සහශ්‍රයන්හි දී කරන ලද අධිකාර ප්‍රාර්ථනාවෙන් ලබන ලද ජය සිරි මහා බෝධීන් වහන්සේගේ මහෝපකාර බව සිතා වදාරා පස් පෑ දිස්නා නේත්‍ර යුග්මයෙන් පූජා කරමින් සතියක් මුළුල්ලේ යම් තැනක වැඩහුන් සේක්ද, ඒ අත්‍යුත්තම වූ අනිමිස ලෝචන පූජා චෛත්‍යය ස්ථානයට මම දොහොත් මුදුනේ තබා වැඳ නමස්කාර කරමි. මාගේ නමස්කාරය වේවා!

**සාධු! සාධු !! සාධු !!!**



## 03. රතන චංක්‍රමන චේතිය පූජා ගාථාව

**දීපේහි ගන්ධ ධූපේහි - ගිලාන පච්ච යේහි ච**
**පුප්ඵාදි වත්‍ථු ජාතේහි - සුද්ධෙහි කප්පි යේහි ච**
**රතන චංකම චේතිංච - ගොතම ජිනසේවිතං**
**අජරාමර සුඛත්‍ථාය - භත්‍යාදරේන පූජයේ.**

''ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස'' හාත්පස අඳුර නසමින් බැබළෙන පහනින්ද, දසත පැතිරෙන මනහර සුගන්ධ ධූපයෙන්ද, අෂ්ඨපානාදී ප්‍රනීත ගිලන් පසෙන්ද විසිතුරු මල් ආදි ශුද්ධ කැප වස්තු සමූහයෙන්ද, අසමසම ගුණයෙන් කෙලෙස් දිනූ ගෞතම බුදුරජාණන් වහන්සේ පරිභොගකරණ ලද රතනචංකමන චෛත්‍ය ස්ථානයට අජරාමර නිවන් සුව පිණිස භත්‍යාදරයෙන් පූජා කරමි පූජා වේවා!

**සාධු! සාධු !! සාධු !!!**

## රත්න චංක්‍රමන චෛත්‍ය වන්දනාව

**පල්ලංකතෝ නිමිසචේතිය තෝ ච සත්‍ථා**
**මජ්ඣෙහි නිම්මිත සුවිම්භය චංකමස්මිං**
**යස්මිං දිනානි වසි චංකම මේව සත්ත**
**වන්දා මහං රතන චංකමනං සුභං තං**

මාගේ ස්වාමී වූ ගෞතම ශාස්තෘන් වහන්ස,

ඔබ වහන්සේ වජ්‍රාසනයට හා අනිමිස චෛත්‍යයටත් මධ්‍යයෙහි මවා ගන්නා ලද අතිශයින් විශ්මය ජනක වූ යම් රුවන් සක්මනෙක්හි සක්මන් කරමින් සත් දිනක් සමවත් සුවයෙන් වැඩසිටි සේක් ද, ඒ අත්‍යුත්තම වූ රත්න චංක්‍රමන චෛත්‍යස්ථානයට ද සර්වඥසම්මා සම්බුදු රජාණන් වහන්සේට ද, මම දොහොත් මුදුනේ තබා වැඳ නමස්කාර කරමි. මාගේ නමස්කාර වේවා!

**සාධු! සාධු !! සාධු !!!**

## 04. රතනාඝර චෙතිය පූජා ගාථාව

**දීපේහි ගන්ධ ධූපේහි - ගිලාන පච්ච යේහි ච**
**පුප්ඵාදි වත්ථු ජාතේහි - සුද්ධේහි කප්පි යේහි ච**
**රතනාඝර චේත්‍යංච - ගෝතම මුනිසේවිතං**
**අජරාමර සුඛත්ථාය - භත්‍යාදරේන පූජයේ.**

''ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස'' හාත්පස අඳුර නසමින් බැබළෙන පහනින්ද දසත පැතිරෙන මනහර සුගන්ධ ධූපයෙන්ද, අෂ්ඨපානාදී ප්‍රනීත ගිලන් පසෙන්ද විසිතුරු මල් ආදි ශුද්ධ කැප වස්තු සමූහයෙන්ද, කෙලෙස් බල මුළුව බිඳලු ගෞතම වූ බුදුරජාණන් වහන්සේ පරිභොගකරණ ලද රතනාඝර චෛත්‍ය ස්ථානයට



අජරාමර නිවන් සුව පිණිස භත්‍යාදරයෙන් පුජා කරමි. පුජා වේවා.

**සාධු! සාධු !! සාධු !!!**

## රත්නාඝර චෛත්‍ය වන්දනාව

**සො පච්ඡි මුත්තර දිසාය දුමින්‍ද මූලා**
**දේවාහි නිම්මිත සුභේ රතනාඝරස්මිං**
**යත්ථාහි ධම්ම පිටකං වසි සම්මසන්තො**
**වන්දා මහං රතනාඝර චෙතියං තං**

මාගේ ස්වාමි වූ ගෞතම භාග්‍යවතුන් වහන්ස ඔබ වහන්සේ බොධිද්‍රැම මූලයෙන් වයඹ දිසාවෙහි දෙවියන් විසින් නිර්මාණය කරන ලද්දා වූ යම් ඒ උතුම් රත්නාඝරයෙහි වැඩ හිඳිමින් සතියක් මුළුල්ලෙහි ගම්භීර අභිධර්ම පිටකය සම්මර්ශනය කළ සේක් ද, ඒ අත්‍යුත්තම රත්නාඝර චෛත්‍යයට ද, සර්වඥතා සම්බුදු රජාණන් වහන්සේටද, චිත්තප්‍රසාදයෙන් මම දොහොත් මුදුනේ තබා වැඳ නමස්කාර කරමි. මාගේ නමස්කාරය වේවා!

**සාධු! සාධු !! සාධු !!!**

## 05. අජපාල චේතිය පූජා ගාථාව

**දීපේහි ගන්ධ ධූපේහි - ගිලාන පච්ච යේහි ච**
**පුප්ථාදි වත්ථු ජාතේහි - සුද්ධේහි කප්පි යේහි ච**
**අජපාල චේතිංචෙව - ගෝතමං ජිනසේවිතං**
**අජරාමර සුඛත්ථාය - භත්‍යාදරේන පූජයේ.**

''ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස'' හාත්පස අඳුර නසමින් බැබළෙන පහනින්ද දසත පැතිරෙන මනහර සුගන්ධ ධූපයෙන්ද, අෂ්ඨපානාදී ප්‍රනීත ගිලන් පසෙන්ද විසිතුරු මල් ආදි ශුද්ධ කැප වස්තු සමූහයෙන්ද, සංසාරගත සත්වයන්ගේ කෙලෙස් දුරු කළ ගෞතම බුදුරජාණන් වහන්සේ පරිභොගකරණ ලද අජපාල චෛත්‍ය ස්ථානයට අජරාමර නිවන් සුව පිණිස භක්‍යාදරයෙන් පූජා කරමි. පූජා වේවා!

**සාධු! සාධු !! සාධු !!!**

## අජපාල චෛත්‍ය වන්දනාව

**ධම්මං චිනං වර විමුත්ති රසං පවින්දං**
**කඞ්ඛා ජටං විජටයං සුර සුන්දරීනං**
**යස්මිං මහේසි විහරිත්ථ අජපාල මූලේ**
**වන්දා මහං තමජ පාල මහග්ඝ චේත්‍යං**

මාගේ ස්වාමී වූ ගෞතම භාග්‍යවතුන් වහන්ස ඔබ වහන්සේ ධර්මය සම්මර්ශනය



කරමින් ද, විමුක්ති රස වින්දනය කරමින් ද, වසවර්ති මාර දිව්‍යාංග ණාවන්ගේ සාංකා ජටාවන් විජටනය කරමින් ද, යම් අජපාල නම් රුක් මුලක සත් දිනක් වැඩ හුන් සේක්ද, ඒ අත්‍යුත්තම අජපාල චෛත්‍ය ස්ථානයට ද, සර්වඥසම්බුදු රාජයාණන් වහන්සේටද, මම දොහොත් මුදුනේ තබා වැඳ නමස්කාර කරමි. මාගේ නමස්කාරය වේවා!

**සාධු! සාධු !! සාධු !!!**

## 06. මුචලින්ද චෙතිය පූජා ගාථාව

**දීපේහි ගන්ධ ධූපේහි - ගිලාන පච්ච යේහි ච**
**පුප්ථාදි වත්ථු ජාතේහි - සුද්ධෙහි කප්පි යේහි ච**
**මුචලින්ද චේතිංචෙව - ගොතමං ජිනසේවිතං**
**අජරාමර සුඛත්ථාය - භත්‍යාදරේන පූජයේ.**

''ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස'' හාත්පස අඳුර නසමින් බැබළෙන පහනින්ද, දසත පැතිරෙන මනහර සුගන්ධ ධූපයෙන්ද, අෂ්ඨපානාදී ප්‍රනීත ගිලන් පසෙන්ද, විසිතුරු මල් ආදි ශුද්ධ කැප වස්තු සමූහයෙන්ද, ලොව අසමසම ගුණ ඇති ගෞතම බුදුරජාණන් වහන්සේ පරිභොගකරණ ලද මුචලින්ද චෛත්‍ය ස්ථානයට අජරාමර නිවන් සුව පිණිස භක්‍යාදරයෙන් පූජා කරමි පූජා වේවා!

**සාධු! සාධු !! සාධු !!!**

## මුචලින්ද චෛත්‍ය වන්දනාව

**සත්තාහ වද්දලික දුක්ඛ නිවාරණත්ථි**
**භෝගින්ද සංරචිත භෝග කුටීර මජ්ඣෙ**
**සත්ථා විමුත්ති මතුලං වසි සම්මසන්තො**
**වන්දේතමබ්භූත මහං මුචලින්ද චෙත්‍යං**

මාගේ ස්වාමී වූ ගෞතම භාග්‍යවතුන් වහන්ස ඔබ වහන්සේ, සතියක් මුළුල්ලේ නොකඩවා පැවතුනා වූ අකල් වැස්සෙන් පීඩා නොවනු පිණිස මුචලින්ද නම් නාග රාජයා විසින් මවා ගන්නා ලද මුචලින්ද භෝග කුටියෙහි විමුක්ති සුවය වින්දනය කරමින් වැඩ විසූ සේක් ද, ඒ ආශ්චර්යවත් මුචලින්ද චෛත්‍ය ස්ථානයට ද සර්වඥසම්බුදු රජාණන් වහන්සේට ද, මම දොහොත් මුදුනේ තබා වැඳ නමස්කාර කරමි. මාගේ නමස්කාරය වේවා!

සාධු! සාධු !! සාධු !!!

## 07. රාජායතන චෙතිය පූජා ගාථාව

**දීපේහි ගන්ධ ධූපේහි - ගිලාන පච්ච යේහි ච**
**පුප්ඵාදි වත්‍ථු ජාතේහි - සුද්ධෙහි කප්පි යේහි ච**
**රාජායතන චේතිංච - ගොතමං ජින සේවිතං**
**අජරාමර සුඛත්ථාය - භත්‍යාදරේන පූජයේ.**



''ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස'' හාත්පස අඳුර නසමින් බැබළෙන පහනින්ද දසත පැතිරෙන මනහර සුගන්ධ ධූපයෙන්ද, අෂ්ඨපානාදී ප්‍රනීත ගිලන් පසෙන්ද විසිතුරු මල් ආදි ශුද්ධ කැප වස්තු සමූහයෙන්ද, පස්මරුන් දිනූ ජිනේන්ද්‍ර ගුණ ඇති ගෞතම බුදුරජාණන් වහන්සේ පරිභොගකරණ ලද රාජායතන චෛත්‍ය ස්ථානයට අජරාමර නිවන් සුව පිණිස භත්‍යාදරයෙන් පූජා කරමි පූජා වේවා!

සාධු! සාධු !! සාධු !!!

## රාජායතන චෛත්‍ය වන්දනාව

**සඤ්ජන්න චේතිය තරූ රවිතාහි සද්ධා**
**සංවෙග තාහි විදිතේ සුවි සාල මූලේ**
**යත්‍රා වසිත්ථ සුගතෝ දිවසානි සත්ත**
**රාජාදිකායතන ඨාන මිමං නමාමි**

මාගේ ස්වාමී වූ ගෞතම භාග්‍යවතුන් වහන්ස ඔබ වහන්සේ, පූජනීය චෛත්‍ය වෘක්ෂ පන්තියෙන් ගැවසී ගත්තා වූ ප්‍රසාද සංවේග ජනක නම් වූ යම් රාජායතන වෘක්ෂ මූලයෙක් හි සත් දිනක් මුළුල්ලේ අමා නිවන් සුව විඳිමින් විසූ සේක් ද, ඒ අත්‍යුත්තම රාජායතන චෛත්‍ය ස්ථානයට ද, සර්වඥා සම්මා සම්බුදුරජාණන් වහන්සේට ද, මම දොහොත් මුදුනේ තබා මස්තක ප්‍රමාණයෙන් වැඳ නමස්කාර කරමි. මාගේ නමස්කාරය වේවා!

# සූවිසි මහා ගුණ පූජාව
# සහ
# සූවිසි මහා ගුණ වන්දනා ගාථා

(සම්පාදනය අතිපූජ්‍ය මාතර ඥාණාරාම නාහිමි)

**නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස ///**

**ඉතිපි සො භගවා අරහං සම්මා සම්බුද්ධො විජ්ජාචරණ සම්පන්නො සුගතො ලොකවිදූ අනුත්තරො පුරිසදම්ම සාරථී සත්ථා දේව මනුස්සානං බුද්ධො භගවාති.**

## අරහං ගුණ පූජාව

1. **දීපේහි ගන්ධ ධූපේහි - ගිලාන පච්ච යේහි ච**
**පුප්ඵාදි වත්ථු ජාතේහි - සුද්ධේහි කප්පි යේහි ච**
**අරහන්ති මහා ගුණං - ධාරේන්තං ගෝතමං ජිනං**
**සද්ධා පපුණ්ණ හදයෝ - නිබ්බානත්ථාය පූජයේ**

"ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස" හාත්පස අඳුර නසමින් බැබළෙන පහනින්ද, දසත පැතිරෙන මනහර සුගන්ධ ධූපයෙන්ද, අෂ්ටපානාදී ප්‍රනීත ගිලන් පසෙන්ද, විසිතුරු මල් ආදි ශුද්ධ කැප වස්තු සමූහයෙන්ද, උත්තරීතර නිවන් සුවය ලැබීම පිණිස සියලු පූජාවන්ට සුදුසු වූ අරහං මහා ගුණ ඥාණය දරන්නා වූ ගෞතම ජිනේන්ද්‍රයන් වහන්සේට හදබැති පිරිපුන් සද්ධාවෙන් නිර්වාණ අවබෝධය පිණිස පූජා



කරමි පූජා වේවා!

සාධු! සාධු !! සාධු !!!

## අරහං ගුණ වන්දනාව

**සෝ භගවා ඉතිපි අරහං අරහං වත සෝ භගවා, තං භගවන්තං අරහන්තං සරණං ගච්ඡාමි. තං භගවන්තං අරහන්තං සිරසා නමාමි.**

"ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස" ඔබ වහන්සේ මෙසේ ද අරහං නම් වන සේක. ඒ භාග්‍යවතුන් වහන්සේ ඒකාන්තයෙන්ම අරහං නම් වන සේක. සමන්නාගත වන සේක. ඒ අරහං ඥාණයෙන් සමන්නාගත භාග්‍යවතුන් වහන්සේ මම සරණ යමි. ඒ අරහං ඥාණයෙන් සමන්නාගත භාග්‍යවතුන් වහන්සේට මාගේ නමස්කාරය වේවා!

සාධු! සාධු !! සාධු !!!

## අරහං ගුණ වන්දනාව

**සෝ බො සවාසන කිලේස බලස්ස සාති**
**ජේතා කිලේස රිපුනං විහනීභවාරං**
**පූජාරහෝ ච භවි සීලවතං සමීපී**
**වන්දෙ සදා තමරහන්ත මුනින්ද මග්ගං**

ඒ භාග්‍යවත් බුදුපියාණන් වහන්සේ වාසනා සහිත සියලු කෙලෙස් බලය සිඳ දමූ සේක.

කෙලෙස් සතුරන් දිනූ සේක. සංසාර චක්‍රයේ අභි සංස්කාර නමැති අර නැසූ සේක. දිව්‍ය-බ්‍රහ්ම-මනුස්ස ආදීන්ගේ පූජාවන්ට සුදුසු වූ සේක. සියලු කල්හි දුස්සිලයන්ගෙන් දුරුව, සිල්වතුනට ළං වූ සේක. ඒ අග්‍ර වූ මුනිඳු වූ සම්මා සම්බුදුපියාණන් වහන්සේට මම නමස්කාර කරමි. මාගේ නමස්කාරය වේවා!

**සාධු! සාධු !! සාධු !!!**

## 2. සම්මා සම්බුද්ධ ගුණ පූජාව

**දීපේහි ගන්ධ ධූපේහි - ගිලාන පච්ච යේහි ච**
**පුප්ඵාදි වත්ථු ජාතේහි - සුද්ධෙහි කප්පි යේහි ච**
**සම්බුද්ධන්ති මහා ගුණං - ධාරේන්තං ගෝතමං ජිනං**
**සද්ධා පපුණ්ණ හදයෝ - නිබ්බානත්ථාය පූජයේ**

''ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස'' හාත්පස අඳුර නසමින් බැබලෙන පහනින්ද, දසත පැතිරෙන මනහර සුගන්ධ ධූපයෙන්ද, අෂ්ඨපානාදී ප්‍රනීත ගිලන් පසෙන්ද, විසිතුරු මල් ආදි ශුද්ධ කැප වස්තු සමූහයෙන්ද, උත්තරීතර නිවන් සුවය ලැබීම පිණිස සවම්භූ ඥාණයෙන් චතුරාර්‍ය්‍ය සත්‍ය ධර්මය අවබෝධ කල සම්මා සම්බුදු ගුණ ඥාණයන් දරන්නා වූ ගෞතම ජිනේන්ද්‍රයන් වහන්සේට හදබැති පිරිපුන් සද්ධාවෙන් නිවන් අවබෝධය පිණිස පූජා කරමි පූජා වේවා!



## සම්මා සම්බුද්ධ ගුණ වන්දනාව

**සෝ භගවා ඉතිපි සම්මා සම්බුද්ධෝ සම්මා සම්බුද්ධෝ වත සෝ භගවා, තං භගවන්තං සම්මා සම්බුද්ධං සරණං ගච්ඡාමි. තං භගවන්තං සම්මා සම්බුද්ධං සිරසා නමාමි.**

''ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස,'' ඔබ වහන්සේ මෙසේ ද සම්මාසම්බුද්ධ නම් වන සේක. ඒ භාග්‍යවතුන් වහන්සේ ඒකාන්තයෙන්ම සම්මාසම්බුද්ධ නම් වන සේක. ඒ සම්මා සම්බුද්ධ ඥාණයෙන් සමන්නාගත භාග්‍යවතුන් වහන්සේ මම සරණ යමි. ඒ සම්මා සම්බුද්ධ ඥාණයෙන් සමන්නාගත භාග්‍යවතුන් වහන්සේට මාගේ නමස්කාරය වේවා!

**සාධු! සාධු !! සාධු !!!**

## සම්මා සම්බුද්ධ ගුණ වන්දනාව

**දුක්ඛං ච සෝ තදුදයාත්ථගමං ච සන්ති**
**මග්ගං තථාහි සමයිත්ථ සයම්භූ ඥාණං**
**තස්සා භවග්ග විතතංසමනුසසරිත**
**සම්මා සම්බුද්ධ මුත්තම ගුණං සිරසා නමාමි**

ඒ භාග්‍යවත් බුදුපියාණන් වහන්සේ දුකය,

එයට හේතු වූ තණ්හාවය, තණ්හාව සංසිඳීම වූ නිර්වාණය, එයට උපාය වූ අරිඅටඟි මගය යන චතුරාර්ය සත්‍යයන් තත්ත්වාකාරයෙන් තමන්වහන්සේගේම ඥානයෙන් පරිඥ්ඥාභි සමය, පහානාභි සමය, සච්ඡිකිරියාභි සමය, භාවනාභි සමය, වශයෙන් මැනවින් අවබෝධ කළ සේක. උන්වහන්සේගේ භවාග්‍රය තෙක් පතළ සම්මා සම්බුද්ධ ගුණය මැනවින් සිහිකොට මම හිස නමා නමස්කාර කරමි. මාගේ නමස්කාරය වේවා!

**සාධු! සාධු !! සාධු !!!**

## 3. විජ්ජාචරණ සම්පන්න ගුණ පූජාව

**දීපේහි ගන්ධ ධූපේහි - ගිලාන පච්ච යේහි ච**
**පුප්ඵාදි වත්‍ථු ජාතේහි - සුද්ධේහි කප්පි යේහි ච**
**විජ්ජාචරණ මහා ගුණං -ධාරේන්තං ගෝතමං ජිනං**
**සද්ධා පපුණ්ණ හදයෝ - නිබ්බානත්ථාය පූජයේ**

''ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස'' හාත්පස අඳුර නසමින් බැබලෙන පහනින්ද දසත පැතිරෙන මනහර සුගන්ධ ධූපයෙන්ද, අෂ්ඨපානාදී ප්‍රනීත ගිලන් පසෙන්ද විසිතුරු මල් ආදි ශුද්ධ කැප වස්තු සමූහයෙන්ද, උත්තරීතර නිවන් සුවය ලැබීම පිණිස සියලු චරණ ධර්මයන්ගෙන් සියලු විද්‍යාවන්ගෙන් යුත් වූ ගුණ



ඥාණය දරන්නා වූ ගෞතම ජිනේන්ද්‍රයන් වහන්සේට හදබැති පිරිපුන් සද්ධාවෙන් නිර්වාණ අවබෝධය පිණිස පූජා කරමි පූජා වේවා!

## විජ්ජාචරණ සම්පන්න ගුණ වන්දනාව

**සෝ භගවා ඉතිපි විජ්ජාචරණ සම්පන්නෝ විජ්ජාචරණ සම්පන්නෝ වත සෝ භගවා, තං භගවන්තං විජ්ජාචරණ සම්පන්නං සරණං ගච්ඡාමි. තං භගවන්තං විජ්ජාචණ සම්පන්නො සිරසා නමාමි.**

ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස ඔබ වහන්සේ මෙසේ ද විජ්ජාචරණ සම්පන්න නම් වන සේක. ඒ භාග්‍යවතුන් වහන්සේ ඒකාන්තයෙන්ම විජ්ජාචරණ සම්පන්න නම් වන සේක. සමන්නාගත වන සේක. ඒ විජ්ජාචරණ සමපන්න ඥාණයෙන් සමන්නාගත භාග්‍යවතුන් වහන්සේ මම සරණ යමි. ඒ විජ්ජාචරණ සමපන්න ඥාණයෙන් සමන්නාගත භාග්‍යවතුන් වහන්සේට මාගේ නමස්කාරය වේවා!

**සාධු! සාධු !! සාධු !!!**

## විජ්ජාචරණ සම්පන්න ගුණ වන්දනාව

**විජ්ජාහි චෙව චරණේහි සුදුල්ලභේහි**
**සම්පුණ්ණතෝ සභගවා භවි පූජනීයෝ**
**තස්සා භවග්ග විතතං ගුණ මච්චමානො**
**වන්දාමි සෙට්ඨ ගුණ සාගර මග්ග භූතං**

ඒ භාග්‍යවත් බුදුපියාණන් වහන්සේ ඉතා දුල්ලභ අට වැදෑරුම් විද්‍යාවන්ගෙන් ද, පසළොස් වැදෑරුම් චරණ ධර්මයන්ගෙන් ද, සම්පූර්ණ වූ හෙයින් පිදිය යුතු වූ සේක. උන්වහන්සේ ගේ භවාග්‍රය තෙක් පතළ වූ අග්‍ර වූ උතුම් ගුණ සාගරයට මම නමස්කාර කරමි. මාගේ නමස්කාරය වේවා!

**සාධු! සාධු !! සාධු !!!**

## 4. සුගත ගුණ පූජාව

**දීපේහි ගන්ධ ධූපේහි - ගිලාන පච්ච යේහි ච**
**පුප්ඵාදි වත්ථු ජාතේහි - සුද්ධේහි කප්පි යේහි ච**
**සුගතොති මහා ගුණං - ධාරේනතං ගෝතමං ජිනං**
**සද්ධා පපුණ්ණ හදයෝ - නිබ්බානත්ථාය පූජයේ**

''ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස'' හාත්පස අඳුර නසමින් බැබළෙන පහනින්ද, දසත පැතිරෙන මනහර සුගන්ධ ධූපයෙන්ද, අෂ්ඨපානාදී ප්‍රනීත ගිලන් පසෙන්ද, විසිතුරු මල් ආදි ශුද්ධ කැප වස්තු සමූහයෙන්ද, උත්තරීතර නිවන් සුවය ලැබීම පිණිස සෝභන ගමනින් නිවනට ගමන්ගන්නා සුගත ගුණ ඥාණය දරන්නා වූ ගෞතම ජිනේන්ද්‍රයන් වහන්සේට හදබැති පිරිපුන් සද්ධාවෙන් නිර්වාණ අවබෝධය පිණිස පූජා කරමි පූජා වේවා!

**සාධු! සාධු !! සාධු !!!**

## සුගත ගුණ වන්දනාව

**සෝ භගවා ඉතිපි සුගතෝ, සුගතෝ වත සෝ භගවා, තං භගවන්තං සුගතං සරණං ගච්ඡාමි. තං භගවන්තං සුගතං සිරසා නමාමි.**

''ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස'' ඔබ වහන්සේ මෙසේ ද සුගත නම් වන සේක. ඒ භාග්‍යවතුන් වහන්සේ ඒකාන්තයෙන්ම සුගත නම් වන සේක. සමන්නාගත වන සේක. ඒ සුගත ඥාණයෙන් සමන්නාගත භාග්‍යවතුන් වහන්සේ මම සරණ යමි. ඒ සුගත ඥාණයෙන් සමන්නාගත භාග්‍යවතුන් වහන්සේට මාගේ නමස්කාරය වේවා!

**සාධු! සාධු !! සාධු !!!**

## සුගත ගුණ වන්දනාව

**යස්මා ගමා පුරිමකා විය සම්භරත්තො**
**සම්මා ච සුන්දර පදං ගතවා සුගත්තො**
**දෙසේසි සච්ච පද මෙත්ථ පජාය තස්මා**
**තං ලෝකනාථ සුගතං පණමාමි භත්ත්‍යා**

ඒ බුදුපියාණන් වහන්සේ යම් හෙයකින් පූර්ව බුදුපියාණන් වහන්සේලා මෙන් සමතිස් පෙරුම් ආදිය පුරා වැඩි සේක් ද, මැනවින් සුන්දර වූ නිර්වාණ පදයට අවබෝධ වශයෙන් පැමිණි සේක්ද, ශෝභන ශරීර ඇති සේක්ද, මේ ලෝකයන් හි සත්ත්වයාට චතුසත්‍යය ධර්මයන් දෙසූ සේක් ද, එහෙයින් ලෝක නාථ වූ සුගතයන් වහන්සේට මම භක්ත්‍යාදරයෙන් නමස්කාර කරමි. මාගේ නමස්කාරය වේවා!

**සාධු! සාධු !! සාධු !!!**

## 5. ලෝක විදූ ගුණ පූජාව

**දීපේහි ගන්ධ ධූපේහි - ගිලාන පච්ච යේහි ච**
**පුප්ඵාදි වත්ථු ජාතේහි - සුද්ධේහි කප්පි යේහි ච**
**ලොක විදූ මහා ගුණං-ධාරෙන්තං ගෝතමං ජිනං**
**සද්ධා පපුණ්ණ හදයෝ - නිබ්බානත්ථාය පූජයේ**

''ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස'' හාත්පස



අඳුර නසමින් බැබළෙන පහනින්ද දසත පැතිරෙන මනහර සුගන්ධ ධූපයෙන්ද, අෂ්ඨපානාදී ප්‍රනීත ගිලන් පසෙන්ද විසිතුරු මල් ආදි ශුද්ධ කැප වස්තු සමූහයෙන්ද, උත්තරීතර නිවන් සුවය ලැබීම පිණිස ත්‍රිවිධ ලෝකය අවබෝධ කළ ලෝකවිදූ ගුණ ඥාණය දරන්නා වූ ගෞතම ජිනේන්ද්‍රයන් වහන්සේට හදබැති පිරිපුන් සද්ධාවෙන් නිර්වාණ අවබෝධය පිණිස පූජා කරමි පූජා වේවා!

**සාධු! සාධු !! සාධු !!!**

## ලෝකවිදූ ගුණ වන්දනාව

**සෝ භගවා ඉතිපි ලෝකවිදූ. ලෝකවිදූ වත සෝ භගවා, තං භගවන්තං ලෝකවිදුං සරණං ගච්ඡාමි. තං භගවන්තං ලෝකවිදුං සිරසා නමාමි.**

''ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස'' ඔබ වහන්සේ මෙසේ ද ලෝකවිදූ නම් වන සේක. ඒ භාග්‍යවතුන් වහන්සේ ඒකාන්තයෙන් ම ලෝකවිදූ නම් වන සේක. ඒ ලෝකවිදූ ඥාණයෙන් සමන්නාගත භාග්‍යවතුන් වහන්සේ මම සරණ යමි. ඒ ලෝකවිදූ ඥාණයෙන් සමන්නාගත භාග්‍යවතුන් වහන්සේට මාගේ නමස්කාරය වේවා!

**සාධු! සාධු !! සාධු !!!**

## ලෝකවිදූ ගුණ වන්දනාව

**සංඛාර සත්ත මවකාස වසා විභත්තං**
**සම්මාව බුජ්ඣි භගවා සකලම්පි ලොකං**
**තස්සාති සුන්දර ගුණං තමනුස්සරන්තො**
**වන්දාමි ලෝකවිදුනං සිරසා තදග්ගං**

ඒ භාග්‍යවත් බුදුපියාණන් වහන්සේ සංස්කාර ලෝකය (ප්‍රත්‍යයෙන් හටගත් ධර්ම) සත්ත්ව ලෝකය (සත්ත්ව සමූහයා) , ඕකාස ලෝකය (සත්ත්වයන් වසන භූමි) යනාදී වශයෙන් බෙදුනු සියලු ලෝකය මැනවින් අවබෝධ කළ සේක. උන්වහන්සේ ගේ ඒ අති සුන්දර ගුණය සිහි කරමින් ඒ ලෝකවිදූ වූ උතුම් සර්වඥයන් වහන්සේට මම මස්තකප්‍රණාමයෙන් නමස්කාර කරමි. මාගේ නමස්කාරය වේවා!

සාධු! සාධු !! සාධු !!!

## 6. අනුත්තර පුරිස දම්මසාරථී ගුණ පූජාව

**දීපේහි ගන්ධ ධූපේහි - ගිලාන පච්ච යේහි ච**
**පුප්ඵාදි වත්‍ථු ජාතේහි - සුද්ධේහි කප්පි යේහි ච**
**සාරතීති මහා ගුණං - ධාරෙන්තං ගොතමං ජිනං**
**සද්ධා පපුණ්ණ හදයෝ - නිබ්බානත්ථාය පූජයේ**

''ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස'' හාත්පස අඳුර නසමින් බැබළෙන පහනින්ද, දසත පැතිරෙන මනහර සුගන්ධ ධූපයෙන්ද, අෂ්ඨපානාදී ප්‍රනීත ගිලන් පසෙන්ද විසිතුරු මල් ආදි ශුද්ධ කැප වස්තු සමූහයෙන්ද, උත්තරීතර නිවන් සුවය ලැබීම පිණිස අනුත්තර ගුණ ඥාණය දරන්නා වූ ගෞතම ජිනේන්ද්‍රයන් වහන්සේට හදබැති පිරිපුන් සද්ධාවෙන් නිර්වාණ අවබෝධය පිණිස පූජා කරමි පූජා වේවා!

සාධු! සාධු !! සාධු !!!

## අනුත්තර පුරිසදම්ම සාරථී ගුණ වන්දනාව

**සො භගවා ඉතිපි අනුත්තර පුරිස දම්ම සාරථී, අනුත්තරෝ පුරිස දම්ම සාරථී වත සො භගවා, තං භගවන්තං අනුත්තර පුරිස දම්ම සාරථිං සරණං ගච්ඡාමි. තං භගවන්තං අනුත්තර පුරිසදම්ම සාරථිං සිරසා නමාමි.**

''ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස'' ඔබ වහන්සේ මෙසේ ද අනුත්තර පුරිස දම්ම සාරථී නම් වන සේක. ඒ භාග්‍යවතුන් වහන්සේ ඒකාන්තයෙන්ම අනුත්තර පුරිස දම්ම සාරථී නම් වන සේක. ඒ අනුත්තර පුරිස දම්ම සාරථී ඥාණයෙන් සමන්නාගත භාග්‍යවතුන් වහන්සේ මම සරණ යමි. ඒ අනුත්තර පුරිස දම්ම සාරථී ඥාණයෙන් සමන්නාගත භාග්‍යවතුන් වහන්සේට

මාගේ නමස්කාරය වේවා!

**සාධු! සාධු !! සාධු !!!**

## අනුත්තර පුරිස දම්ම සාරථී ගුණ වන්දනාව

**සො දේව යක්ඛ නර නාග ගණෙප්පදම්මෙ**
**සම්මා දමෙත්ව නිජ ධම්ම නතෙ කරිත්ථ**
**තං සාරථිං මනුපමං නර දම්මකානං**
**වන්දේ සදාගුණ පදං සමනුස්සරන්තෝ**

ඒ භාග්‍යවත් බුදුපියාණන් වහන්සේ සෙස්සන්ට දමනය කරන්නට නො හැකි දෙව්- යක්- නර- නා සමූහයන් මැනවින් දමනය කොට තමන්වහන්සේ ගේ දහමට නැවුනවුන් කළ සේක. දැමිය යුතු සතුන් හසුරුවාලීමෙහි සාරථියෙකු බඳු වූ උතුම් පුරිසදම්ම සාරථී බුදුපියාණන් වහන්සේට ඒ ගුණ පදයන් බැතියෙන් සිහිකරමින් සියලු කල්හි මම නමස්කාර කරමි. මාගේ නමස්කාරය වේවා!

**සාධු! සාධු !! සාධු !!!**

## 7. සත්ථා දේව මනුස්සානං ගුණ පූජාව

**දීපේහි ගන්ධ ධූපේහි - ගිලාන පච්ච යේහි ච**
**පුප්ඵාදි වත්ථු ජාතේහි - සුද්ධේහි කප්පි යේහි ච**
**සත්ථාඉති මහා ගුණං - ධාරෙන්තං ගෝතමං ජිනං**
**සද්ධා පපුණ්ණ හදයෝ - නිබ්බානත්ථාය පූජයේ**



''ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස'' හාත්පස අඳුර නසමින් බැබළෙන පහනින්ද දසත පැතිරෙන මනහර සුගන්ධ ධූපයෙන්ද, අෂ්ඨපානාදී ප්‍රනීත ගිලන් පසෙන්ද විසිතුරු මල් ආදී ශුද්ධ කැප වස්තු සමූහයෙන්ද, උත්තරීතර නිවන් සුවය ලැබීම පිණිස දෙව් මිනිසුන්ට අනුශාසක ගුණ ඥාණය දරන්නා වූ ගෞතම ජිනේන්ද්‍රයන් වහන්සේට හදබැති පිරිපුන් සද්ධාවෙන් නිර්වාණ අවබෝධය පිණිස පූජා කරමි පූජා වේවා!

**සාධු! සාධු !! සාධු !!!**

## සත්ථා දේවමනුස්සානං ගුණ වන්දනාව

**සෝ භගවා ඉතිපි සත්ථා දේව මනුසසානං සත්ථා දේව මනුසසානං වත සෝ භගවා, තං භගවනතං සත්ථා දේව මනුසසානං සරණං ගච්ඡාමි. තං භගවනතං සත්ථා දේව මනුස්සානං සිරසා නමාමි.**

ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස ඔබ වහන්සේ මෙසේ ද සත්ථා දේවමනුස්සානං නම් වන සේක. ඒ භාග්‍යවතුන් වහන්සේ ඒකාන්තයෙන්ම සත්ථා දේවමනුස්සානං නම් වන සේක. ඒ සත්ථා දේවමනුස්සානං ඥාණයෙන් සමන්නාගත භාග්‍යවතුන් වහන්සේ මම සරණ යමි. ඒ සත්තා දේවමනුස්සානං ඥාණයෙන් සමන්නාගත භාග්‍යවතුන් වහන්සේට මාගේ නමස්කාරය වේවා!

## සත්ථා දේව මනුස්සානං ඥාණ වන්දනාව

**පත්වා විසුද්ධ පදවිං කරුණාද්දි තත්තෝ**
**සිද්ධ්‍යා සදොහය ගතස්ස හිතස්ස සාධු**
**සා සිත්ථ සො තදිහ දේව මනුස්ස සත්ථු**
**නාථං නමාමි සිරසා තමනුස්සරන්තෝ**

ඒ භාග්‍යවත් බුදුපියාණන් වහන්සේ උතුම් වූ බුදු බවට පත්ව, මහා කරුණාවෙන් තෙත් සිතැති ව මේ තුන් ලොව උභය සිද්ධිය සඳහා මැනවින් අනුශාසනා කළ සේක. දෙවි මිනිසුන්ගේ ශ්‍රේෂ්ඨ අනුශාසක වූ ශාස්තෘන්වහන්සේට ඒ ගුණය සිහි කරමින් මම මස්තකප්‍රනාමයෙන් නමස්කාර කරමි. මාගේ නමස්කාරය වේවා!

**සාධු! සාධු !! සාධු !!!**

## 08. බුද්ධ ගුණ ඥාණ පූජාව

**දීපේහි ගන්ධ ධූපේහි - ගිලාන පච්ච යේහි ච**
**පුප්ඵාදි වත්ථු ජාතේහි - සුද්ධේහි කප්පි යේහි ච**
**බුද්ධෝති මහා ගුණං - ධාරෙන්තං ගෝතමං ජිනං**
**සද්ධා පපුණ්ණ හදයෝ - නිබ්බානත්ථාය පූජයේ**

''ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස'' හාත්පස අඳුර නසමින් බැබළෙන පහනින්ද, දසත පැතිරෙන මනහර සුගන්ධ ධූපයෙන්ද,



අෂ්ඨපානාදී ප්‍රනීත ගිලන් පසෙන්ද විසිතුරු මල් ආදි ශුද්ධ කැප වස්තු සමූහයෙන්ද, චතුරාර්ය සත්‍ය අවබෝධ කොට අන්‍යයන් අවබෝධ කළ බුද්ධ ගුණ ඥාණය දරන්නා වූ ගෞතම ජිනේන්ද්‍රයන් වහන්සේට හදබැති පිරිපුන් සද්ධාවෙන් නිර්වාණ අවබෝධය පිණිස පූජා කරමි, පූජා වේවා!

**සාධු! සාධු !! සාධු !!!**

## බුද්ධ ගුණ වන්දනාව

**සෝ භගවා ඉතිපි බුද්ධෝ. බුද්ධෝ වත සෝ භගවා, තං භගවන්තං බුද්ධං සරණං ගච්ඡාමි. තං භගවන්තං බුද්ධං සිරසා නමාමි.**

ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස ඔබ වහන්සේ මෙසේ ද බුද්ධ නම් වන සේක. ඒ භාග්‍යවතුන් වහන්සේ ඒකාන්තයෙන්ම බුද්ධ නම් වන සේක. ඒ බුද්ධ ගුණ ඥාණයෙන් සමන්නාගත භාග්‍යවතුන් වහන්සේ මම සරණ යමි. ඒ බුද්ධ ඥාණයෙන් සමන්නාගත භාග්‍යවතුන් වහන්සේට මාගේ නමස්කාරය වේවා!

**සාධු! සාධු !! සාධු !!!**

## බුද්ධ ගුණ වන්දනාව

**සො සබ්බතාප්පටිහතාය ධියාධි ඤාණෝ**
**ඤෙයප්පභෙද මවබුජ්ඣි සයං සමන්තා**
**බොධෙසි චෙව ජනතං පටිබුජ්ඣි මොහා**
**තං බුද්ධ මුග්ගත ගුණං සිරසා නමාමි**

ඒ භාග්‍යවත් බුදුපියාණන් වහන්සේ විශිෂ්ඨ ඤාණයක් ඇතිව හැම අයුරකින් ම නොපැකිල පවත්නා නුවණින් සකල ඥෙයය මණ්ඩලය තමන් වහන්සේම ප්‍රත්‍යක්‍ෂ කොට දැනගත් සේක. අන්‍යයනට ද අවබෝධ කර වූ සේක. ඒ උසස් ගුණ සමුදායක් ඇති බුදුපියාණන් වහන්සේට මම නමස්කාර කරමි. මාගේ නමස්කාරය වේවා!

සාධු! සාධු !! සාධු !!!

## 09. භගවා ගුණ පූජාව

**දීපේහි ගන්ධ ධූපේහි - ගිලාන පච්ච යේහි ච**
**පුප්ඵාදි වත්‍ථු ජාතෙහි - සුද්ධේහි කප්පි යේහි ච**
**භගවාති මහා ගුණං - ධාරෙන්තං ගෝතමං ජිනං**
**සද්ධා පපුණ්ණ හදයෝ - නිබ්බානත්ථාය පූජයේ**

''ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස'' හාත්පස අඳුර නසමින් බැබළෙන පහනින්ද දසත පැතිරෙන මනහර සුගන්ධ ධූපයෙන්ද, අෂ්ඨපානාදී ප්‍රනීත ගිලන් පසෙන්ද විසිතුරු මල් ආදි ශුද්ධ කැප වස්තු සමූහයෙන්ද, උත්තරීතර නිවන් සුවය ලැබීම පිණිස තුන්ලෝකයෙහි ශ්‍රේෂ්ඨ ගෞරවයෙන් භගවා ගුණ ඤාණය දරන්නා වූ ගෞතම ජිනේන්ද්‍රයන් වහන්සේට හදබැති පිරිපුන් සද්ධාවෙන් නිර්වාණ අවබෝධය පිණිස පූජා කරමි පූජා වේවා!

සාධු! සාධු !! සාධු !!!

## භගවා ගුණ වන්දනාව

**සෝ භගවා ඉතිපි භගවා, භගවා වත සෝ භගවා, තං භගවන්තං සරණං ගච්ඡාමි. තං භගවන්තං සිරසා නමාමි.**

ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස ඔබ වහන්සේ මෙසේ ද භගවා නම් වන සේක. ඒ භාග්‍යවතුන් වහන්සේ ඒකාන්තයෙන්ම භගවා නම් වන සේක. ඒ භගවා ගුණ ඤාණයෙන් සමන්නාගත භාග්‍යවතුන් වහන්සේ මම සරණ යමි. ඒ භගවා ගුණ ඤාණයෙන් සමන්නාගත භාග්‍යවතුන් වහන්සේට මාගේ නමස්කාරය වේවා!

සාධු! සාධු !! සාධු !!!

## භගවා ගුණ වන්දනාව

**යස්මා ගුණෙහි භගවා තිභවෙ විසිට්ඨා**
**සෙට්ඨා ජනාන මතිගාරව භාජනෝ සෝ**
**දෙසේසි ධම්ම මඛිලං පවිභජ්ජ යස්මා**
**භත්‍යා තදග්ග භගවන්ත මහං නමාමි.**

ඒ භාග්‍යවත් බුදුපියාණන් වහන්සේ යම් හෙයකින් තුන් ලොවට විශිෂ්ඨ වූ සේක් ද, සියලු ජනයාට ශ්‍රේෂ්ඨ වූ සේක් ද, ගෞරවයට භාජනය වූ සේක් ද, සියලු ධර්මයන් දෙසා වදාළ සේක් ද, එහෙයින් ඒ භාග්‍යවත් වූ බුදුපියාණන් වහන්සේට බැති සිතින් මම නමස්කාර කරමි. මාගේ නමස්කාරය වේවා!

**නව මහා බුදු ගුණ නිමවන ලදී.**

**ස්වාක්ඛාතො භගවතා ධම්මො සන්දිට්ඨිකො අකාලිකො ඒහිපස්සිකො ඕපනයිකො පච්චත්තං වෙදිතබ්බො විඤ්ඤූහී’ ති.**

## 10. ස්වාක්ඛාත ගුණ පූජාව

**දීපේහි ගන්ධ ධූපේහි - ගිලාන පච්ච යේහි ච**
**පුප්ඵාදි වත්‍ථු ජාතේහි - සුද්ධේහි කප්පි යේහි ච**
**ස්වාක්ඛාත මහා ධම්මං -දෙසෙන්තං ගෝතමං ජිනං**
**කිලේසාමය නාසාය - භත්‍යාදරේන පූජයේ**



''ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස'' හාත්පස අඳුර නසමින් බැබළෙන පහනින්ද, දසත පැතිරෙන මනහර සුගන්ධ ධූපයෙන්ද, අෂ්ඨපානාදී ප්‍රනීත ගිලන් පසෙන්ද විසිතුරු මල් ආදි ශුද්ධ කැප වස්තු සමූහයෙන්ද, පස්මරුන් දිනූ ගෞතම ජිනේන්ද්‍රයන් වහන්සේ දේශනා කරන ලද මුල, මැද, අග, යහපත් වූ ස්වාක්ඛාත මහා දහම් ගුණයට කෙලෙස් නැසීම පිණිස භක්ත්‍යාදරයෙන් පූජා කරමි පූජා වේවා!

**සාධු! සාධු !! සාධු !!!**

## ස්වක්ඛාත ගුණ වන්දනාව

**ස්වාක්ඛාතෝ ඉතිපි තස්ස භගවතෝ සෝ ධම්මෝ. ස්වාක්ඛාතෝ වත තස්ස භගවතෝ සෝ ධම්මෝ. තං ස්වාක්ඛාතං භගවතා ධම්මං සරණං ගච්ඡාමි. තං ස්වාක්ඛාතං භගවතා ධම්මං සිරසා නමාමි.**

''ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස'' ඔබ වහන්සේ මෙසේ ද ස්වාක්ඛාත නම් වන සේක. ස්වාමීනි ඔබ වහන්සේගේ ධර්මය ඒකාන්තයෙන්ම ස්වාක්ඛාත නම් වන සේක. ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස ඔබ වහන්සේගේ ඒ ස්වාක්ඛාත මහා ධර්මය මම සරණ යමි. ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස ඔබ වහන්සේගේ ඒ ස්වාක්ඛාත මහා ධර්මයට මම නමස්කාර කරමි. මාගේ නමස්කාරය වේවා!

## ස්වාක්ඛාත ගුණ වන්දනාව

**අත්ථේහි බ්‍යංජන වයෙහි විධාය සුද්ධං**
**තීස්වාදි මජ්ඣි චරිමේසු සුදෙසි තත්තා**
**ධම්මානුරූප පටිපත්ත්‍ය මතස්ස චෙවං**
**ස්වාක්ඛාත මේව තමහං පණමාමි ධම්මං**

අර්ථයෙන් ද, ව්‍යඤ්ජනයෙන් ද, පදයෙන් ද පිරිසිදු කොට, මුල-මැද-අග යන තුන් තන්හි මනාකොට දේශනා කරන ලද හෙයින් ද, ඒ ධර්මයට අනුරූප වූ ප්‍රතිපත්තිය ද, ප්‍රතිපත්තිය අනුරූප නිවන ද එසේම දේශනා කළ සේක ද, ස්වාක්ඛාත නම් බුද්ධ ධර්මයට මම නමස්කාර කරමි. මාගේ නමස්කාරය වේවා!

සාධු! සාධු !! සාධු !!!

## 11. සන්දිට්ඨික ගුණ පූජාව

**දීපේහි ගන්ධ ධූපේහි - ගිලාන පච්ච යේහි ච**
**පුප්ඵාදි වත්‍ථු ජාතේහි - සුද්ධේහි කප්පි යේහි ච**
**සන්දිට්ඨික මහා ධම්මං -දේසෙන්තං ගෝතමං ජිනං**
**කිලේසාමය නාසාය - භත්‍යාදරේන පූජයේ**

''ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස'' හාත්පස අඳුර නසමින් බැබළෙන පහනින්ද, දසත පැතිරෙන මනහර සුගන්ධ ධූපයෙන්ද, අෂ්ඨපානාදී ප්‍රනීත ගිලන් පසෙන්ද, විසිතුරු මල් ආදි ශුද්ධ කැප වස්තු සමූහයෙන්ද, පස්මරුන් දිනූ ගෞතම ජිනේන්ද්‍රයන් වහන්සේ දේශනා කරන ලද මේ ජීවිතයේදී ම තම සිතින් ඵලය දැකිය හැකි වූ සන්දිට්ඨික ධර්මයට කෙලෙස් නැසීම පිණිස භක්ත්‍යාදරයෙන් පූජා කරමි පූජා වේවා!

සාධු! සාධු !! සාධු !!!

## සන්දිට්ඨික ගුණ වන්දනාව

**සන්දිටඨිකෝ ඉතිපි තස්ස භගවතෝ සෝ ධම්මෝ. සන්දිටඨිකෝ වත තස්ස භගවතෝ සෝ ධම්මෝ. තං සන්දිට්ඨිකං භගවතා ධම්මං සරණං ගච්ඡාමි. තං සන්දිට්ඨිකං භගවතා ධම්මං සිරසා නමාමි.**

''ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස'' ඒ ධර්මය මෙසේ ද සන්දිට්ඨික නම් වන සේක. ස්වාමීනි ඔබ වහන්සේගේ ධර්මය ඒකාන්තයෙන් ම සන්දිට්ඨික නම් වන සේක. ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස ඔබ වහන්සේගේ ඒ සන්දිට්ඨික මහා ධර්මය මම සරණ යමි. ස්වාමීනි. භාග්‍යවතුන් වහන්ස ඔබ වහන්සේගේ ඒ සන්දිට්ඨික මහා ධර්මයට මම නමස්කාර කරමි. මාගේ නමස්කාරය වේවා!

සාධු! සාධු !! සාධු !!!

## සන්දිට්ඨික ගුණ වන්දනාව

**සම්මා කමා සක පවත්ත නිමිත්ත සාති**
**ලොකුත්තරාහි චතුරො පිහ මග්ග ධම්මා**
**සාමං සකත්තනි යථෙ වනු පස්සනීයා**
**සන්දිට්ඨිකං තමිහ ධම්ම ගුණං නමාමි**

මේ ශාසනයෙහි ලැබෙන ලෝකෝත්තර සතර මාර්ග ධර්මයෝ මනාකොට තම තමනට සීමා වූ ප්‍රවෘත්තිය ද, නිමිත්ත ද සිඳින්නාහුය. ඔවුහු යම් සේ තම තමන්ගේ සන්තානයෙහි තමා විසින් ම දත යුතු වූවාහු ද, එහෙයින් සන්දිට්ඨික නම් වූ ඒ ධර්ම රත්නයට මම නමස්කාර කරමි. මාගේ නමස්කාරය වේවා!

**සාධු! සාධු !! සාධු !!!**

## 12. අකාලික ගුණ පූජාව

**දීපේහි ගන්ධ ධූපේහි - ගිලාන පච්ච යේහි ච**
**පුප්ඵාදි වත්‍ථු ජාතේහි - සුද්ධේහි කප්පි යේහි ච**
**අකාලික මහා ධම්මං - දේසෙන්තං ගෝතමං ජිනං**
**කිලේසාමය නාසාය - භත්‍යාදරේන පූජයේ**

''ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස'' හාත්පස අඳුර නසමින් බැබළෙන පහනින්ද, දසත පැතිරෙන මනහර සුගන්ධ ධූපයෙන්ද, අෂ්ඨපානාදී ප්‍රණීත ගිලන් පසෙන්ද, විසිතුරු මල් ආදි ශුද්ධ කැප වස්තු සමූහයෙන්ද, පස්මරුන් දිනූ ගෞතම ජිනෙන්ද්‍රයන් වහන්සේ දේශනා කරන ලද එම මොහොතේම කල් නොයවා ඵලය ලැබීම හැකි වූ අකාලික මහා ධර්මයට කෙලෙස් නැසීම පිණිස භක්ත්‍යාදරයෙන් පූජා කරමි පූජා වේවා!

**සාධු! සාධු !! සාධු !!!**

## අකාලික ගුණ වන්දනාව

**අකාලිකෝ ඉතිපි තස්ස භගවතෝ සෝ ධම්මෝ. අකාලිකෝ වත තස්ස භගවතෝ සෝ ධම්මෝ. තං අකාලිකං භගවතා ධම්මං සරණං ගච්ඡාමි. තං අකාලිකං භගවතා ධම්මං සිරසා නමාමි.**

''ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස'' ඔබ වහන්සේගේ ඒ ධර්මය මෙසේ ද අකාලික නම් වන සේක. ස්වාමීනි ඔබ වහන්සේගේ ධර්මය ඒකාන්තයෙන්ම අකාලික නම් වන සේක. ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස ඔබ වහන්සේගේ ඒ අකාලික මහා ධර්මය මම සරණ යමි. ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස ඔබ වහන්සේගේ ඒ අකාලික මහා ධර්මයට මම නමස්කාර කරමි. මාගේ නමස්කාරය වේවා!

**සාධු! සාධු !! සාධු !!!**

## අකාලික ගුණ වන්දනාව

**ලෝකුත්තරාහි කුසලා චතු මග්ග ධම්මා**
**සානන්තරාය නියතා සවිපාකතාය**
**වුත්තා සමාධි ගතියා යදකාලිකා තො**
**භත්‍යා නමාමි තමකාලික මග්ග ධම්මා**

ලෝකෝත්තර කුසල වූ සතර මාර්ග ධර්මයෝ වනාහි තමහට අනතුරුව පැවැති විපාක සහිත භාවය ඇති සමාධි ගතියෙන් නියත යයි කියන ලද්දාහුය. එහෙයින් ඔවුහු අකාලික නම් වෙති. ඒ අකාලික වූ, අග්‍ර වූ ධර්ම රත්නයට මම නමස්කාර කරමි. මාගේ නමස්කාරය වේවා!

**සාධු! සාධු !! සාධු !!!**

## 13. ඒහිපස්සික ගුණ පූජාව

**දීපේහි ගන්ධ ධූපේහි - ගිලාන පච්ච යේහි ච**
**පුප්ඵාදි වත්‍ථු ජාතේහි - සුද්ධේහි කප්පියේහි ච**
**ඒහිපස්සික මහා ධම්මං - දේසේන්තං ගෝතමං ජිනං**
**කිලේසාමය නාසාය - භත්‍යාදරේන පූජයේ**

''ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස'' හාත්පස අඳුර නසමින් බැබලෙන පහනින්ද, දසත පැතිරෙන මනහර සුගන්ධ ධූපයෙන්ද, අෂ්ඨපානාදී ප්‍රනීත ගිලන් පසෙන්ද විසිතුරු මල් ආදි ශුද්ධ කැප වස්තු සමූහයෙන්ද, පස්මරුන් දිනූ ගෞතම ජිනෙන්ද්‍රයන් වහන්සේ දේශනා කරන ලද විධාන කළ යුතු විද්‍යාමාන ඒහිපස්සික මහා ධර්මයට කෙලෙස් නැසීම පිණිස භක්ත්‍යාදරයෙන් පූජා කරමි පූජා වේවා!

**සාධු! සාධු !! සාධු !!!**

## ඒහිපස්සික ගුණ වන්දනාව

**ඒහිපස්සිකෝ ඉතිපි තස්ස භගවතෝ සෝ ධම්මෝ. ඒහිපස්සිකෝ වත තස්ස භගවතෝ සෝ ධම්මෝ. තං ඒහිපස්සිකං භගවතා ධම්මං සරණං ගච්ඡාමි. තං ඒහිපස්සිකං භගවතා ධම්මං සිරසා නමාමි.**

''ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස,'' ඔබ වහන්සේගේ ඒ ධර්මය මෙසේ ද ඒහිපස්සික නම් වන සේක. ස්වාමීනි ඔබ වහන්සේගේ ධර්මය ඒකාන්තයෙන් ම ඒහිපස්සික නම් වන සේක. ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, ඔබ වහන්සේගේ ඒ ඒහිපස්සික මහා ධර්මය මම සරණ යමි. ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස ඔබ වහන්සේගේ ඒ ඒහිපස්සික මහා ධර්මයට මම නමස්කාර කරමි. මාගේ නමස්කාරය වේවා!

**සාධු! සාධු !! සාධු !!!**

## ඒහිපස්සික ගුණ වන්දනාව

**යස්මා සදා සිවිස දෙහ ගුණා භවන්ති**
**මුත්‍යා කිලෙස ගහණා ච තතො විසුද්ධා**
**පස්සේහි මන්ති සුගුණා ච නිදස්සනීයා**
**තං චෙහි පස්සික ගුණං පණමාමි ධම්මං**

යම් හෙයකින් කෙලෙස් ගහණින් මිදීම සඳහා මේ ධර්මයෙහි ගුණයෝ අතිශයින් විසද වෙත් ද, එහෙයින් කෙලෙස් ගහණින් පිරිසිදු වූවාහු ද, එව බලවයි මෙහි ගුණයෝ දක්විය හැක්කාහු ද, ඒ ඒහිපස්සික ගුණයෙන් යුත් ධර්ම රත්නයට මම නමස්කාර කරමි. මාගේ නමස්කාරය වේවා!

සාධු! සාධු !! සාධු !!!

## 14. ඕපනයික ගුණ පූජාව

**දීපේහි ගන්ධ ධූපේහි - ගිලාන පච්චයේහිච**
**පුප්ඵාදි වත්‍ථු ජාතේහි - සුද්ධේහි කප්පියේහිච**
**ඔපනයික මහා ධම්මං -දෙසෙන්තං ගෝතමං ජිනං**
**කිලේසාමය නාසාය - භත්‍යාදරේන පූජයේ**

''ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස,'' හාත්පස අඳුර නසමින් බැබලෙන පහනින් ද, දසත පැතිරෙන මනහර සුගන්ධ ධූපයෙන් ද, අෂ්ඨපානාදී ප්‍රනීත ගිලන්පසින් ද, විසිතුරු මල් ආදී ශුද්ධ කැප වස්තු සමූහයෙන් ද, පස්මරුන් දිනූ ගෞතම ජිනේන්ද්‍රයන් වහන්සේ දේශනා කරන ලද නිවන් අරමුණු කර දෙන්නා වූ ඔපනයික මහා ධර්මයට කෙලෙස් නැසීම පිණිස භක්ත්‍යාදරයෙන් පූජා කරමි. පූජා වේවා!

සාධු! සාධු !! සාධු !!!

## ඕපනයික ගුණ වන්දනාව

**ඔපනයිකෝ ඉතිපි තස්ස භගවතෝ සෝ ධම්මෝ. ඕපනයිකෝ වත තස්ස භගවතෝ සෝ ධම්මෝ. තං ඕපනයිකං භගවතා ධම්මං සරණං ගච්ඡාමි. තං ඕපනයිකං භගවතා ධම්මං සිරසා නමාමි.**

''ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස,'' ඔබ වහන්සේගේ ඒ ධර්මය මෙසේ ද ඕපනයික නම් වන සේක. ස්වාමීනි ඔබ වහන්සේගේ ධර්මය ඒකාන්තයෙන් ම ඕපනයික නම් වන සේක. ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස ඔබ වහන්සේගේ ඒ ඔපනයික මහා ධර්මය මම සරණ යමි. ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස ඔබ වහන්සේගේ ඒ ඕපනයික මහා ධර්මයට මම නමස්කාර කරමි. මාගේ නමස්කාරය වේවා!

සාධු! සාධු !! සාධු !!!

# ඕපනයික ගුණ වන්දනාව

**ඩයිහං සකඩග වසනං පනතාදි සඤ්ඤං**
**අච්චායිකං කතිමුපෙක්ඛිය තේතු ධම්මා**
**චිත්තාධිරෝපනරහාති සදොපනෙය්‍යා**
**තං චෝපනීය සුගුණං පණමාමි ධම්මං**

ඒ මාර්ගඵල නිර්වාණ ධර්මයෝ වහා ගිනිගත් තම සිරුර හෝ වස්ත්‍රාදිය හෝ එබඳු අනෙක් ඉක්මණින් සිදුකළ යුතු වැඩ ගැන පවා නොසලකා හැර, සියලු කල්හි සිතෙහි ආරෝපණය කර ගත යුතු වන්නා හ. එහෙයින් ඕපනයික නම් වූ උතුම් ගුණය ඇති භාග්‍යවතුන් වහන්සේගේ ධර්ම රත්නයට මම නමස්කාර කරමි. මාගේ නමස්කාරය වේවා!

සාධු! සාධු !! සාධු !!!

## 15. පච්චත්තං වේදිතබ්බො විඤ්ඤූහි ගුණ පූජාව

**දීපේහි ගන්‍ධ ධූපේහි - ගිලාන පච්ච යේහි ච**
**පුප්ඵාදි වත්‍ථු ජාතේහි - සුද්ධෙහි කප්පි යේහි ච**
**පච්චත්ත මහා ධම්මං - දෙසෙන්තං ගෝතමං ජිනං**
**කිලේසාමය නාසාය - භත්‍යාදරේන පූජයේ**

''ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස'' භාත්පස අඳුර නසමින් බැබලෙන පහනින්ද, දසත පැතිරෙන මනහර සුගන්ධ ධූපයෙන්ද, අෂ්ඨපානාදී ප්‍රනීත ගිලන් පසෙන්ද විසිතුරු මල් ආදි ශුද්ධ කැප වස්තු සමූහයෙන්ද, පස්මරුන් දිනූ ගෞතම ජිනෙන්‍ද්‍රයන් වහන්සේ දේශනා කරන ලද නුවණ ඇති අයට ප්‍රත්‍යක්ෂ වන පච්චතතවේදිතබ්බො විඤ්ඤූහි මහා ධර්මයට කෙලෙස් නැසීම පිණිස භක්ත්‍යාදරයෙන් පූජා කරමි පූජා වේවා!

සාධු! සාධු !! සාධු !!!

## පච්චත්තං වේදිතබ්බො විඤ්ඤූහි ගුණ වන්දනාව

**පච්චත්තං වේදිතබ්බෝ විඤ්ඤූහි ඉතිපි තස්ස භගවතෝ සෝ ධම්මො පච්චත්තං වේදිතබ්බෝ විඤ්ඤූහි වත තස්ස භගවතෝ සෝ පච්චත්තං වේදිතබ්බෝ විඤ්ඤූහි තං පච්චත්තං වේදිතබ්බං විඤ්ඤූහි භගවතා ධම්මං සරණං ගච්ඡාමි. තං පච්චත්‍තං වේදිතබ්බං විඤ්ඤූහි භගවතා ධම්මං සිරසා නමාමි.**

''ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස,'' ඔබ වහන්සේගේ ඒ ධර්මය මෙසේ ද පච්චත්ත වේදිතබ්බ විඤ්ඤූහි නම් වන සේක. ස්වාමීනි ඔබ වහන්සේගේ ධර්මය ඒකාන්තයෙන් ම පච්චත්ත

වේදිතබ්බ විඤ්ඤූහි නම් වන සේක. ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස ඔබ වහන්සේගේ ඒ පච්චත්ත වේදිතබ්බ විඤ්ඤූහි මහා ධර්මය මම සරණ යමි. ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස ඔබ වහන්සේගේ ඒ පච්චත්ත වේදිතබ්බ විඤ්ඤූහි මහා ධර්මයට මම නමස්කාර කරමි. මාගේ නමස්කාරය වේවා!

**සාධු! සාධු !! සාධු !!!**

## පච්චත්තං වේදිතබ්බෝ විඤ්ඤූහි ගුණ වන්දනාව

**ලද්දෝපනිස්සය වසෝදිත ජාති පඤ්ඤා**
**යුත්තේහි සච්ඡිකරණා රහතෝග්ග ධම්මා**
**පච්චත්ත මේව සුමතීහිධ වෙදිතබ්බො**
**තං ධම්ම මුත්තම ගුණං සිරසා නමාමි**

ලද උපනිශ්‍රය සම්පත් අනුව උදා වූ ප්‍රතිසන්ධි ප්‍රඥා ඇත්තවුන් විසින් ප්‍රත්‍යක්ෂවම දනගැනීමට සුදුසු වන හෙයින් මාර්ග ඵල නිර්වාණ ධර්මයෝ මේ ශාසනයෙහි නුවණැත්තවුන් විසින් තම තමන් තුළ උපදවා ගැනීමෙන් දත යුතු වූහ. ඒ පච්චත්ත වේදිතබ්බෝ විඤ්ඤූහි යන උතුම් ගුණයට මම මස්තක ප්‍රණාමයෙන් නමස්කාර කරමි. මාගේ නමස්කාරය වේවා!

**සාධු! සාධු !! සාධු !!!**



**භය වැදෑරුම් දහම් ගුණ නිමවන ලදී.**

**සුපටිපන්නෝ භගවතෝ සාවක සංඝෝ, උජුපටිපන්නෝ භගවතෝ සාවක සංඝෝ, ඤායපටිපන්නෝ භගවතෝ සාවක සංඝෝ, සාමීචි පටිපන්නෝ භගවතෝ සාවක සංඝෝ, යදිදං චත්තාරි පුරිස යුගානි අට්ඨ පුරිස පුග්ගලා ඒස භගවතෝ සාවක සංඝෝ, ආහුණෙය්‍යෝ, පාහුණෙය්‍යෝ, දක්ඛිණෙය්‍යෝ, අඤ්ජලිකරණීයෝ, අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලෝකස්සාති.**

## 16. සුපටිපන්න ගුණ පූජාව

**දීපේහි ගන්ධ ධූපේහි - ගිලාන පච්ච යේහි ච**
**පුප්ඵාදි වත්ථු ජාතේහි - සුද්ධේහි කප්පි යේහි ච**
**සුපටිපන්න සංඝං - ගෝතමස්ස යසස්සිනෝ**
**අජරාමර සුඛත්ථාය - පීති භාරේන පූජයේ**

''ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස'' හාත්පස අඳුර නසමින් බැබලෙන පහනින්ද, දසත පැතිරෙන මනහර සුගන්ධ ධූපයෙන්ද, අෂ්ඨපානාදී ප්‍රනීත ගිලන් පසෙන්ද, විසිතුරු මල් ආදි ශුද්ධ කැප වස්තු සමූහයෙන්ද, සම්‍යක් මාර්ගයෙන් නිවනට පමුණුවන්නා වූ ගෞතම ජිනේන්ද්‍රයන් වහන්සේගේ සාවක මහා

සංඝරත්නයට අජරාමර නිවන්සුව ලැබීම පිණිස චිත්තප්ප්‍රීතියෙන් ගෞරවයෙන් පූජා කරමි. පූජා වේවා!

**සාධු! සාධු !! සාධු !!!**

## සුපටිපන්න ගුණ වන්දනාව

**සුපටිපන්නෝ ඉතිපි තස්ස භගවතෝ සෝ සාවක සංඝෝ, සුපටිපන්නෝ වත තස්ස භගවතෝ සෝ සාවක සංඝෝ තං භගවතෝ සාවක සංඝං සුපටිපන්නං සරණං ගච්ඡාමි. තං භගවතෝ සාවක සංඝං සුපටිපන්නං සිරසා නමාමි.**

''ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස,'' ඔබ වහන්සේගේ සාවක සංඝ රත්නය මෙසේ ද සුපටිපන්න නම් වන සේක. ස්වාමීනී, භාග්‍යවතුන් වහන්ස ඔබ වහන්සේගේ සාවක මහා සංඝරත්නය ඒකාන්තයෙන් සුපටිපන්න නම් වන සේක. ස්වාමීනි ඔබ වහන්සේගේ ඒ සුපටිපන්න ගුණයෙන් සමන්නාගත මහා සාවක සංඝරත්නය මම සරණ යමි. ස්වාමීනි ඔබ වහන්සේගේ ඒ සුපටිපන්න ඤාණ ගුණයෙන් සමන්නාගත මහා සාවක සංඝරත්නයට මාගේ නමස්කාරය වේවා!

**සාධු! සාධු !! සාධු !!!**



## සුපටිපන්න ඤාණ ගුණ වන්දනාව

**සෝ ජීවිතායික සමත්ත පසත්ථ සික්ඛෝ**
**සත්ථුස්ස සාවක ගණෝ පටිපත්ති සාරෝ**
**බ්‍රෑහෙති සංවර මණ්ණුම්පි අවිතික්කමන්තෝ**
**වන්දාමි තං සුපටිපන්න ගුණග්ග සංඝං**

තම තමන්ගේ ප්‍රාණයන් සේ සම්පූර්ණව ගත් උතුම් ප්‍රාතිමෝක්ෂ සංවර සික්ඛා ඇති, පිළිවෙතින් සරු වූ මාගේ බුදුපියාණන් වහන්සේ ගේ ශ්‍රාවක වූ ඒ ආර්ය සංඝ සමූහයා සමාදන් වූ සික පදයන් මඳකුත් නො ඉක්ම රකින සේක. ඒ සුපටිපන්න ගුණයෙන් අග්‍ර වූ සංඝ රත්නයට මම නමස්කාර කරමි. මාගේ නමස්කාරය වේවා!

**සාධු! සාධු !! සාධු !!!**

## 17. උජුපටිපන්න ගුණ පූජාව

**දීපේහි ගන්ධ ධූපේහි - ගිලාන පච්ච යේහි ච**
**පුප්ඵාදි වත්ථු ජාතේහි - සුද්ධේහි කප්පි යේහි ච**
**උජුපටිපන්න සංඝං තං - ගෝතමස්ස යසස්සිනෝ**
**අජරාමර සුඛත්ථාය - පීති භාරේන පූජයේ**

''ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස'' හාත්පස අඳුර නසමින් බැබළෙන පහනින්ද, දසත පැතිරෙන මනහර සුගන්ධ ධූපයෙන්ද,

අෂ්ඨපානාදී ප්‍රනීත ගිලන් පසෙන්ද, විසිතුරු මල් ආදි ශුද්ධ කැප වස්තු සමූහයෙන්ද, උජු මාර්ගයෙන් නිවනට පමුණුවන්නා වූ ගෞතම ජිනෙන්ද්‍රයන් වහන්සේගේ සාවක මහා සංඝරත්නයට අජරාමර නිවන්සුව ලැබීම පිණිස චිත්තප්පීතියෙන් ගෞරවයෙන් පූජා කරමි. පූජා වේවා!

සාධු! සාධු !! සාධු !!!

## උජුපටිපන්න ගුණ වන්දනාව

**උජුපටිපන්නො ඉතිපි තස්ස භගවතො සො සාවක සංඝො. උජුපටිපන්නො වත තස්ස භගවතො සො සාවක සංඝො. තං භගවතො සාවක සංඝං උජුපටිපන්නං සරණං ගච්ඡාමි. තං භගවතො සාවක සංඝං උජුපටිපන්නං සිරසා නමාමි.**

''ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස,'' ඔබ වහන්සේගේ සාවක සංඝ රත්නය මෙසේ ද උජුපටිපන්න නම් වන සේක. ස්වාමීනී, භාග්‍යවතුන් වහන්ස ඔබ වහන්සේගේ සමක මහා සංඝරත්නය ඒකාන්තයෙන් උජුපටිපන්න නම් වන සේක. ස්වාමීනී භාග්‍යවතුන් වහන්ස ඒ උජුපටිපන්න ඥාණ ගුණයෙන් සමන්නාගත මහා සංඝරත්නය මම සරණ යමි. ස්වාමීනි ඔබ වහන්සේගේ ඒ උජුපටිපන්න ඥාණ ගුණයෙන්



සමන්නාගත මහා සංඝරත්නයට මාගේ නමස්කාරය වේවා!

සාධු! සාධු !! සාධු !!!

## උජුපටිපන්න ගුණ වන්දනාව

**සො වෙ සලාභ යස කාම විරත්ත චෙතො**
**ද්වාරෙහි තීහි පටිපත්ති මුජුං සමග්ගො**
**පාලෙති සාවක ගණො සුගතස්ස සෙට්ඨො**
**වන්‍දෙ සදෙහ තමුජුප්පටිපන්න සංඝං**

බුදුපියාණන් වහන්සේ ගේ ශ්‍රාවක වූ ඒ සංඝයා වහන්සේ තමන්ගේ ලාභ-කීර්ති-ප්‍රශංසා යන කාම වස්තුවෙන් වෙන් වූ සිත් සතන් ඇති සේක. සෘජු වූ ප්‍රතිපත්තිය තුන් දොරින් ම සමගි වී රකින සේක. ඒ උජුපටිපන්න වූ ආර්ය සංඝ රත්නයට මම මස්තක ප්‍රමාණයෙන් නමස්කාර කරමි. නමස්කාර වේවා!

සාධු! සාධු !! සාධු !!!

## 18. ඥාණ පටිපන්න ගුණ පූජාව

**දීපෙහි ගන්ධ ධූපෙහි - ගිලාන පච්ච යෙහි ච**
**පුප්ඵාදි වත්‍ථු ජාතෙහි - සුද්ධෙහි කප්පි යෙහි ච**
**ඥාය පටිපන්න සංඝං තං - ගොතමස්ස යසස්සිනො**
**අජරාමර සුඛත්ථාය - පීති භාරේන පූජයෙ**

''ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස'' හාත්පස

අඳුර නසමින් බැබළෙන පහනින්ද දසත පැතිරෙන මනහර සුගන්ධ ධූපයෙන්ද, අෂ්ඨපානාදී ප්‍රනීත ගිලන් පසෙන්ද විසිතුරු මල් ආදි ශුද්ධ කැප වස්තු සමූහයෙන්ද, නිවන් මාර්ගයට පමුණුවන්නා වූ ගෞතම ජිනේන්‍ද්‍රයන් වහන්සේගේ සාවක මහා සංඝරත්නයට අජරාමර නිවන්සුව ලැබීම පිණිස චිත්තප්ප්‍රීතියෙන් ගෞරවයෙන් පූජා කරමි. පූජා වේවා!

සාධු! සාධු !! සාධු !!!

## ඤාණ පටිපන්න ගුණ වන්දනාව

**ඤායපටින්නෝ ඉතිපි තස්ස භගවතෝ සෝ සාවක සංඝෝ, ඤායපටින්නෝ වත තස්ස භගවතො සෝ සාවක සංඝෝ, තං භගවතෝ සාවක සංඝං, ඤායපටිපන්නං සරණං ගච්ඡාමි. තං භගවතෝ සාවක සංඝං ඤායපටිපන්නං සිරසා නමාමි.**

ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස, ඔබ වහන්සේගේ මහා සාවක සංඝ රත්නය මෙසේ ද ඤාය පටිපන්න නම් වන සේක. ස්වාමීනී භාග්‍යවතුන් වහන්සේගේ මහා සාවක සංඝරත්නය ඒකාන්තයෙන් ඤාය පටිපන්න නම් වන සේක. ස්වාමීනි ඔබ වහන්සේගේ ඒ ඤාය



පටිපන්න ගුණයෙන් සමන්නාගත මහා සාවක සංඝරත්නය මම සරණ යමි. ස්වාමීනි ඔබ වහන්සේගේ ඒ ඤායපටිපන්න ඤාණ ගුණයෙන් සමන්නාගත මහා සාවක සංඝරත්නයට මාගේ නමස්කාරය වේවා!

සාධු! සාධු !! සාධු !!!

## ඤායපටිපන්න ගුණ වන්දනාව

**සත්ථුස්ස සාවක ගණෝ පටිපත්ති සාරෝ**
**අන්තෙවුභෝ චනුපගම්ම හවප්ප පොණෝ**
**නිබ්බානගං පටිපදං පරිසෝහිතො සෝ**
**වන්දාමි ඤායපටිපන්න ගණං තමග්ගං**

බුදුපියාණන් වහන්සේගේ පිළිවෙතින් සරු වූ ඒ ආර්ය සංඝ රත්නය සසරට නැඹුරු වූ කාමසුඛල්ලිකානු යෝගය, අත්තකිලමතානු යෝගය යන මේ අන්ත දෙකට නො පැමිණ නිවනට පමුණුවන මැදුම් පිළිවෙත සපුරමින් හොබවන සේක. ඒ අග්‍ර වූ ඤායපටිපන්න සංඝරත්නයට මම මස්තක ප්‍රණාමයෙන් නමස්කාර කරමි. මාගේ නමස්කාරය වේවා!

සාධු! සාධු !! සාධු !!!

## 19. සාමීචි පටිපන්නෝ ගුණ පූජාව

**දීපේහි ගන්ධ ධූපේහි - ගිලාන පච්ච යේහි ච**
**පුප්ඵාදි වත්ථු ජාතේහි - සුද්ධේහි කප්පි යේහි ච**
**සාමිචි පටිපන්න සංඝං තං - ගෝතමස්ස යසස්සිනෝ**
**අජරාමර සුඛත්ථාය - පීති භාරේන පූජයේ**

''ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස'' හාත්පස අඳුර නසමින් බැබළෙන පහනින්ද, දසත පැතිරෙන මනහර සුගන්ධ ධූපයෙන්ද, අෂ්ඨපානාදී ප්‍රනීත ගිලන් පසෙන්ද, විසිතුරු මල් ආදි ශුද්ධ කැප වස්තු සමූහයෙන්ද, ගෞරව කළ යුතු නිවන් මාර්ගයට පමුණුවන්නා වූ ගෞතම ජිනෙන්ද්‍රයන් වහන්සේගේ සාවක මහා සංඝරත්නයට අජරාමර නිවන්සුව ලැබීම පිණිස චිත්තප්ප්‍රීතියෙන් ගෞරවයෙන් පූජා කරමි. පූජා වේවා!

**සාධු! සාධු !! සාධු !!!**

## සාමීචි පටිපන්න ගුණ වන්දනාව

**සාමීචිපටින්නෝ ඉතිපි තස්ස භගවතෝ සෝ සාවක සංඝෝ. සාමීචිපටින්නෝ වත තස්ස භගවතෝ සෝ සාවක සංඝෝ. තං භගවතෝ සාවක සංඝං සාමිචිපටිපන්නං සරණං ගච්ඡාමි. තං භගවතෝ සාවක සංඝං සාමිචිපටිපන්නං සිරසා නමාමි.**



ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස, ඔබ වහන්සේගේ සාවක සංඝ රත්නය මෙසේ ද සාමීචි පටිපන්න නම් වන සේක. ස්වාමීනී භාග්‍යවතුන් වහන්ස ඔබ වහන්සේගේ මහා සාවක සංඝ රත්නය ඒකාන්තයෙන් සාමීචිපටිපන්න නම් වන සේක. ස්වාමීනි භාගයවතුන් වහන්ස ඔබ වහන්සේගේ මහා සාවක සංඝරත්නය ඒකාන්තයෙන් සාමීචිපටිපන්න නම් වන සේක. ස්වාමීනි ඔබ වහන්සේගේ ඒ සාමිචි පටිපන්න ගුණයෙන් සමන්නාගත මහා සාවක සංඝරත්නය මම සරණ යමි. ස්වාමීනි ඔබ වහන්සේගේ ඒ සාමිචිපටිපන්න ඥාණ ගුණයෙන් සමන්නාගත මහා සාවක සංඝරත්නයට මාගේ නමස්කාරය වේවා!

**සාධු! සාධු !! සාධු !!!**

## සාමීචිපටිපන්න ගුණ වන්දනාව

**නිබ්බාන සච්ඡි කිරියා පටිපත්ති මග්ගං**
**පූරෙති සෝ සුගත සාවක සෙට්ඨ සංඝෝ**
**ධම්මේනු ගච්ඡති සුභේ ච නිජොවිචිත්තං**
**සාමිචිකංපටිපදං පණමාමි සංඝං**

බුදුපියාණන් වහන්සේගේ ශ්‍රාවක වූ උතුම් සංඝ රත්නය සියලු දුක් ගිනි නිවන නිවන් සුවය ප්‍රත්‍යක්ෂ කොට දැනගැනීමට උපකාර වූ පිළිවෙත් මග සම්පූර්ණ කරන සේක. තමන්ට අනුරූප වූම

ධර්ම මාර්ගය අනුගමනය කරන සේක. ඒ සාමීචිපටිපන්න ශ්‍රාවක මහා සංඝ රත්නයට මම මස්තක ප්‍රණාමයෙන් නමස්කාර කරමි. මාගේ නමස්කාරය වේවා!

**සාධු! සාධු !! සාධු !!!**

## 20. ආහුනෙය්‍යය ගුණ පූජාව

**දීපේහි ගන්ධ ධූපේහි - ගිලාන පච්ච යේහි ච**
**පුප්ඵාදි වත්‍ථු ජාතේහි - සුද්ධේහි කප්පි යේහි ච**
**ආහුනෙය්‍යය මහා සංඝං - ගෝතමස්ස යසස්සිනෝ**
**අජරාමර සුඛත්ථාය - පීති භාරේන පූජයේ**

''ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස'' හාත්පස අඳුර නසමින් බැබළෙන පහනින්ද, දසත පැතිරෙන මනහර සුගන්ධ ධූපයෙන්ද, අෂ්ඨපානාදී ප්‍රනීත ගිලන් පසෙන්ද විසිතුරු මල් ආදි ශුද්ධ කැප වස්තු සමූහයෙන්ද, දුර සිට ගෙන අවුත් පිළිගැනීමට සුදුසු මාර්ගයට පිළිපන්නා වූ ගෞතම ජිනෙන්‍ද්‍රයන් වහන්සේගේ සාවක මහා සංඝරත්නයට අජරාමර නිවන්සුව ලැබීම පිණිස චිත්තප්ප්‍රීතියෙන් ගෞරවයෙන් පූජා කරමි. පූජා වේවා!

**සාධු! සාධු !! සාධු !!!**



## ආහුනෙය්‍ය ගුණ වන්දනාව

**ආහුනෙය්‍යයෝ ඉතිපි තස්ස භගවතෝ සෝ සාවක සංඝෝ, ආහුනෙය්‍යයෝ වත තස්ස භගවතෝ සෝ සාවක සංඝෝ, තං භගවතෝ සාවක සංඝං ආහුනෙය්‍යං සරණං ගච්ඡාමි. තං භගවතෝ සාවක සංඝං ආහුනෙය්‍යං සිරසා නමාමි.**

ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස, ඔබ වහන්සේගේ මහා සාවක සංඝ රත්නය මෙසේ ද ආහුනෙය්‍යය නම් වන සේක. ස්වාමීනී භාග්‍යවතුන් වහන්ස ඔබ වහන්සේගේ සාවක සංඝරත්නය ඒකාන්තයෙන් ආහුනෙය්‍යය නම් වන සේක. ස්වාමීනි ඔබ වහන්සේගේ ඒ ආහුනෙය්‍යය ගුණයෙන් සමන්නාගත මහා සාවක සංඝරත්නය මම සරණ යමි. ස්වාමීනි ඔබ වහන්සේගේ ඒ ආහුනෙය්‍යය ඥාණ ගුණයෙන් සමන්නාගත මහා සාවක සංඝරත්නයට මාගේ නමස්කාරය වේවා!

**සාධු! සාධු !! සාධු !!!**

## ආහුනෙය්‍යය ගුණ වන්දනාව

**අට්ඨාරියානු වර මග්ග ඵලප්ප භූතං**
**තේ ලද්ධ නිබ්බුති රසා විරතා භවස්මා**
**දූරාභතාන මරහා චතු පච්චයානං**
**සංඝං නමේ තමහ සාවක මාහුණෙය්‍යං**

මේ ශාසනයෙහි බුදුපියාණන් වහන්සේගේ ශ්‍රාවක සංඝ වූ මගඵලයෙන් නිපන් ආර්යයන් අටදෙනා වහන්සේලා ලත් නිවන් රසය ඇත්තා හ. දෙවි මිනිසුන් විසින් දුර සිට ගෙනෙන ලද සිවුපස පූජාවට සුදුසු වූ සේක. ආහුණෙය්‍ය ගුණය ඇති ඒ තථාගත ශ්‍රාවක මහා සංඝ රත්නයට මම මස්තක ප්‍රණාමයෙන් නමස්කාර කරමි. මාගේ නමස්කාර වේවා.

**සාධු! සාධු !! සාධු !!!**

## 21. පාහුනෙය්‍ය ගුණ පූජාව

**දීපේහි ගන්ධ ධූපේහි - ගිලාන පච්ච යේහි ච**
**පුප්ඵාදි වත්‍ථු ජාතේහි - සුද්ධේහි කප්පි යේහි ච**
**පාහුනෙය්‍ය මහා සංඝං - ගෝතමස්ස යසස්සිනෝ**
**අජරාමර සුඛත්ථාය - පීති භාරෙන පූජයෙ**

''ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස'' හාත්පස අඳුර නසමින් බැබළෙන පහනින්ද, දසත පැතිරෙන මනහර සුගන්ධ ධූපයෙන්ද, අෂ්ඨපානාදී ප්‍රනීත ගිලන් පසෙන්ද, විසිතුරු මල් ආදි ශුද්ධ කැප වස්තු සමූහයෙන්ද, ආගන්තුක සත්කාරයට සුදුසු මාර්ගයට පිළිපන්නා වූ ජිනේන්ද්‍රයන් වහන්සේගේ සාවක මහා සංඝරත්නයට අජරාමර නිවන්සුව ලැබීම පිණිස චිත්තප්‍රීතියෙන් ගෞරවයෙන් පූජා කරමි. පූජා වේවා!



## පාහුනෙය්‍ය ගුණ වන්දනාව

**පාහුනෙය්‍යෝ ඉතිපි තස්ස භගවතෝ සෝ සාවක සංඝෝ, පාහුනෙය්‍යෝ වත තස්ස භගවතෝ සෝ සාවක සංඝෝ, තං භගවතෝ සාවක සංඝං පාහුනෙය්‍යං සරණං ගච්ඡාමි. තං භගවතෝ සාවක සංඝං පාහුනෙය්‍යං සිරසා නමාමි.**

''ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස,'' ඔබ වහන්සේගේ සාවක සංඝ රත්නය මෙසේ ද පාහුනෙය්‍ය නම් වන සේක. ස්වාමීනී භාග්‍යවතුන් වහන්ස ඔබ වහන්සේගේ සාවක මහා සංඝරත්නය ඒකාන්තයෙන් පාහුනෙය්‍ය නම් වන සේක. ස්වාමීනි ඔබ වහන්සේගේ ඒ පාහුනෙය්‍ය ගුණයෙන් සමන්නාගත මහා සංඝරත්නය මම සරණ යමි. ස්වාමීනි ඔබ වහන්සේගේ ඒ පාහුනෙය්‍ය ඥාණ ගුණයෙන් සමන්නාගත මහා සංඝරත්නයට මාගේ නමස්කාරය වේවා!

**සාධු! සාධු !! සාධු !!!**

## පාහුනෙය්‍ය ගුණ වන්දනාව

**අට්ඨාරියානු වර මග්ග ඵලප්ප භූතං**
**තේ ලද්ධ නිබ්බුති රසා විරතා භවස්මා**
**සක්කාර තාන මරහා ඉහ පාහුණානං**
**තං පාහුණෙය්‍ය මුණි සංඝ මහං නමාමි**

බුදුපියාණන් වහන්සේගේ ශ්‍රාවක සංඝ වූ මේ ශාසනයෙහි මග ඵල දෙකෙන් නිපන් ආර්යයෝ අටදෙනා වහන්සේලා ලද නිවන් රසය ඇත්තා හ. එසේම සසරින් වෙන්ව සිටගත්හ. මේ ලෝකයෙහි පාහුණ නම් වූ සත්කාර සමූහයට සුදුසුම වූ සේක. ඒ පාහුණෙය්‍ය ගුණය ඇති ඒ තථාගත ශ්‍රාවක සංඝ රත්නයට මම මස්තක ප්‍රණාමයෙන් නමස්කාර කරමි.මාගේ නමස්කාරය වේවා!

**සාධු! සාධු !! සාධු !!!**

## 22. දක්ඛිණෙය්‍ය ගුණ පූජාව

**දීපේහි ගන්ධ ධූපේහි - ගිලාන පච්ච යේහි ච**
**පුප්ඵාදි වත්‍ථු ජාතේහි - සුද්ධේහි කප්පි යේහි ච**
**දක්ඛිණෙය්‍ය මහා සංඝං-ගෝතමස්ස යසස්සිනෝ**
**අජරාමර සුඛත්ථාය - පීති භාරේන පූජයේ**

''ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස'' හාත්පස අඳුර නසමින් බැබළෙන පහනින්ද, දසත පැතිරෙන මනහර සුගන්ධ ධූපයෙන්ද, අෂ්ඨපානාදී ප්‍රනීත ගිලන් පසෙන්ද, විසිතුරු මල් ආදි ශුද්ධ කැප වස්තු සමූහයෙන්ද, මෙලොව පරලොව පින්පළ අදහා දෙන දානය පිළිගැනීමට සුදුසු මාර්ගයට පිළිපන්නා වූ ගෞතම ජිනෙන්ද්‍රයන් වහන්සේගේ සාවක මහා සංඝරත්නයට අජරාමර නිවන්සුව ලැබීම පිණිස චිත්තප්පීතියෙන් ගෞරවයෙන් පූජා කරමි. පූජා වේවා!

**සාධු! සාධු !! සාධු !!!**

## දක්ඛිණෙය්‍ය ගුණ වන්දනාව

**දක්ඛිණෙයියෝ ඉතිපි තස්ස භගවතෝ සෝ සාවක සංඝෝ, දක්ඛිණෙයියෝ වත තස්ස භගවතෝ සෝ සාවක සංඝෝ, තං භගවතෝ සාවක සංඝං දක්ඛිණෙය්‍යං සරණං ගච්ඡාමි. තං භගවතෝ සාවක සංඝං දක්ඛිණෙය්‍යං සිරසා නමාමි.**

''ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස,'' ඔබ වහන්සේගේ මහා සාවක සංඝ රත්නය මෙසේ ද දක්ඛිනෙය්‍ය නම් වන සේක. ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස ඔබ වහන්සේගේ මහා සාවක සංඝ රත්නය ඒකාන්තයෙන්ම දක්ඛිණෙය්‍ය නම් වන සේක. ස්වාමීනි ඔබ වහන්සේගේ ඒ දක්ඛිනෙය්‍ය ගුණයෙන් සමන්නාගත මහා සංඝරත්නය මම සරණ යමි. ස්වාමීනි ඔබ වහන්සේගේ ඒ දක්ඛිනෙය්‍ය ඥාණ ගුණයෙන් සමන්නාගත මහා සාවක සංඝරත්නයට මාගේ නමස්කාරය වේවා!

**සාධු! සාධු !! සාධු !!!**

## දක්ඛිණෙය්‍යා ගුණ වන්දනාව

**යෙ පුග්ගලාධි ගත මග්ග ඵලා සුසන්තා**
**සබ්බාරහා ච ජනතා හිත දක්ඛිණානං**
**සත්ථුස්ස සාවක ගණේසු සදාග්ගභූතා**
**වන්දාමි සංඝ මනසං වර දකඛිණෙය්‍යං**

ලද මග ඵල දහම් ඇති අතිශයින් ශාන්ත වූ යම් ආර්ය පුද්ගල කෙනෙක් වෙත් නම් උන්වහන්සේලා මහා ජනයා විසින් පූජා වශයෙන් ඉදිරිපත් කරන ලද දක්ෂිණාවට සර්වාකාරයෙන් සුදුසු වූ සේක. ශාස්තෘන්වහන්සේගේ ඒ ශ්‍රාවක සංඝ රත්නය අතරෙහි සියලු කල්හි අග්‍ර වූ සේක. නිර්දෝෂ වූ ආර්ය සංඝරත්නයට මම නමස්කාර කරමි. මාගේ නමස්කාරය වේවා!

සාධු! සාධු !! සාධු !!!

## 23. අඤ්ජලිකරණීය ගුණ පූජාව

**දීපේහි ගන්ධ ධූපේහි - ගිලාන පච්ච යේහි ච**
**පුප්ඵාදි වත්‍ථු ජාතේහි - සුද්ධේහි කප්පි යේහි ච**
**අඤ්ජලිකරණීය සංඝං - ගෝතමස්ස යසස්සිනෝ**
**අජරාමර සුඛත්ථාය - පීති භාරේන පූජයේ**

''ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස'' හාත්පස අඳුර නසමින් බැබළෙන පහනින්ද, දසත පැතිරෙන මනහර සුගන්ධ ධූපයෙන්ද, අෂ්ඨපානාදී ප්‍රනීත ගිලන් පසෙන්ද විසිතුරු මල් ආදි ශුද්ධ කැප වස්තු සමූහයෙන්ද, දොහොත් මුදුන් දී වැඳ නමස්කාර කිරීමට සුදුසු වූ මාර්ගයට පිළිපන්නා වු ගෞතම ජිනෙන්ද්‍රයන් වහන්සේගේ ශාවක මහා සාවක සංඝරත්නයට අජරාමර නිවන්සුව ලැබීම පිණිස චිත්තප්ප්‍රීතියෙන් ගෞරවයෙන් පූජා කරමි. පූජා වේවා!

සාධු! සාධු !! සාධු !!!

## අඤ්ජලිකරණීය ගුණ වන්දනාව

**අඤ්ජලිකරණීයෝ ඉතිපි තස්ස භගවතෝ සෝ සාවක සංඝෝ. අඤ්ජලිකරණීයෝ වත තස්ස භගවතෝ සෝ සාවක, සංඝෝ. තං භගවතෝ සාවක සංඝං අඤ්ජලිකරණීයං සරණං ගච්ඡාමි. තං භගවතෝ සාවක සංඝං අඤ්ජලිකරණීයං සිරසා නමාමි.**

''ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස,'' ඔබ වහන්සේගේ මහා සාවක සංඝ රත්නය මෙසේ ද අඤ්ජලිකරණීය නම් වන සේක. ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස ඔබවහන්සේගේ මහා සාවක සංඝරත්නය ඒකාන්තයෙන් අඤ්ජලිකරණීය නම් වන සේක. ස්වාමීනි ඔබ වහන්සේගේ ඒ අඤ්ජලිකරණීය ගුණයෙන් සමන්නාගත මහා

සාවක සංඝරත්නය මම සරණ යමි. ස්වාමීනි ඔබ වහන්සේගේ ඒ අඤ්ජලිකරණීය ඤාණ ගුණයෙන් සමන්නාගත මහා සාවක සංඝරත්නයට මාගේ නමස්කාරය වේවා!

සාධු! සාධු !! සාධු !!!

## අඤ්ජලිකරණීය ගුණ වන්දනාව

**සෝ සබ්බ සෙට්ඨ මහනීය ගුණාකරත්තා**
**සංඝොසි සබ්බ ජනතාහි නමස්සනීයො**
**තං බුද්ධ සාවක ගණං ගුණතෝ විසිට්ඨං**
**වන්දෙඤ්ජලීකරණීං මුණිරාජ සංඝං**

බුදුපියාණන් වහන්සගේ ඒ ශ්‍රාවක සංඝ රත්නය සියලු උතුම් පිදිය යුතු වූ ගුණයනට ආකාර වූ හෙයින් සියලු ජනයා විසින් වැඳිය යුතු වූයේය. ගුණයෙන් වූ විශිෂ්ඨ වූ, බුද්ධ ශ්‍රාවක සමූහයා වූ අඤ්ජලිකරණයට සුදුසු වූ මහා සාවක සංඝරත්නයට මම නමස්කාර කරමි. මාගේ නමස්කාරය වේවා!

සාධු! සාධු !! සාධු !!!



## 24. අනුත්තර පුඤ්ඤඛෙත්ත ගුණ පූජාව

**දීපේහි ගන්ධ ධූපේහි - ගිලාන පච්ච යේහි ච**
**පුප්ඵාදි වත්‍ථු ජාතේහි - සුද්ධේහි කප්පි යේහි ච**
**අනුත්තරං මහා සංඝං - ගෝතමස්ස යසස්සිනෝ**
**අජරාමර සුඛත්ථාය - පීති භාරේන පූජයේ**

''ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස'' හාත්පස අඳුර නසමින් බැබළෙන පහනින්ද, දසත පැතිරෙන මනහර සුගන්ධ ධූපයෙන්ද, අෂ්ඨපානාදී ප්‍රනීත ගිලන් පසෙන්ද, විසිතුරු මල් ආදි ශුද්ධ කැප වස්තු සමූහයෙන්ද, පින්පල නෙලා ගැනීමට සුදුසු ගුණයට පිළිපන්නා වූ ගෞතම ජිනෙන්ද්‍රයන් වහන්සේගේ සාවක මහා සංඝරත්නයට අජරාමර නිවන්සුව ලැබීම පිණිස චිත්තප්පීතියෙන් ගෞරවයෙන් පූජා කරමි. පූජා වේවා!

සාධු! සාධු !! සාධු !!!

## අනුත්තර පුඤ්ඤඛෙත්ත ගුණ වන්දනාව

**අනුත්තරං පුඤ්ඤඛෙත්තං ලෝකස්ස ඉතිපි තස්ස භගවතෝ සෝ සාවක සංඝෝ, අනුත්තරං පුඤ්ඤඛෙත්තං ලෝකස්ස වත තස්ස භගවතෝ සෝ සාවක සංඝෝ, තං භගවතෝ සාවක සංඝං අනුත්තර පුඤ්ඤඛෙත්තං ලෝකස්ස සරණං**

**ගච්ඡාමි. තං භගවතෝ සාවක සංඝං අනුත්තර පුඤ්ඤක්ඛෙත්තං ලෝකස්ස සිරසා නමාමි.**

"ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස," ඔබ වහන්සේගේ සාවක සංඝ රත්නය මෙසේ ද අනුත්තර පුඤ්ඤක්ඛෙත්තං නම් වන සේක. ස්වාමීනි භාගයවතුන් වහන්ස ඔබවහන්සේගේ මහා සාවක සංඝරත්නය ඒකාන්තයෙන් අනුත්තර පුඤ්ඤකෙත්තං නම් වන සේක. ස්වාමීනි ඔබ වහන්සේගේ ඒ අනුත්තර පුඤ්ඤක්ඛෙත්තං ගුණයෙන් සමන්නාගත මහා සාවක සංඝරත්නය මම සරණ යමි. ස්වාමීනි ඔබ වහන්සේගේ ඒ අනුත්තර පුඤ්ඤක්ඛෙත්තං ඤාණ ගුණයෙන් සමන්නාගත මහා සාවක සංඝරත්නයට මාගේ නමස්කාරය වේවා!

**සාධු! සාධු !! සාධු !!!**

## අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලෝකස්ස ගුණ වන්දනාව

**සෝ සං කිලෙස කර දෝස ගගණා පමුත්තෝ**
**පුඤ්ඤත්ථීනං සුවිපුලං ඵල මාව හන්තෝ**
**ලෝකස්ස සබ්බධි භවෙ මහතී පතිට්ඨයෝ**
**සංඝං නමාමි තමනුත්තර පුඤ්ඤක්ඛෙත්තං**

මේ ශාසනයෙහි බුදුපියාණන් වහන්සේ ගේ ශ්‍රාවක සංඝරත්නය සංක්ලේශ බලයනට හේතු වූ



දොස් රැසින් මිදුන සේක. පින් කැමති ජනයාගේ පුණ්‍ය ඵලයන් ගෙනදෙන සේක. එහෙයින් ලෝකයාට, සියලු තැන මහත් පිහිටක් වන සේක. එහෙයින් ලොවට උතුම් පින්කෙත්ව වැඩ සිටි ඒ උතුම් මහා සංඝ රත්නයට මස්තක ප්‍රණාමයෙන් මම නමස්කාර කරමි. මාගේ නමස්කාරය වේවා!

සාධු! සාධු !! සාධු !!!

**නව මහා සඟ ගුණ නිමවන ලදී.**

# සූවිසි පට්ඨාන පූජාව
# සහ
# සූවිසි පට්ඨාන වන්දනාව

**නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධසසස**

පට්ඨාන උද්දේසය හෙවත් මාතිකාව

**හේතු පච්චයෝ, ආරම්මණ පච්චයෝ, අධිපති පච්චයෝ, අනන්තර පච්චයෝ, සමනන්තර පච්චයෝ, සහජාත පච්චයෝ, අඤ්ඤමඤ්ඤ පච්චයෝ, නිස්සය පච්චයෝ, උපනිස්සය පච්චයෝ, පුරෙජාත පච්චයෝ, පච්ඡාජාත පච්චයෝ, ආසේවන පච්චයෝ, කම්ම පච්චයෝ, විපාක පච්චයෝ, ආහාර පච්චයෝ, ඉන්ද්‍රිය**

පච්චයෝ, ඣාන පච්චයෝ, මග්ග පච්චයෝ, සම්පයුත්ත පච්චයෝ, විප්පයුත්ත පච්චයෝ, අත්‍ථි පච්චයෝ, නත්‍ථි පච්චයෝ, විගත පච්චයෝ අවිගත පච්චයෝති පච්චයුද්දේසෝ.

පට්ඨාන නිද්දේසය හෙවත් විස්තර දේශනයː

## 1. හේතු ප්‍රත්‍යය ඤාණ පූජාව

**දීපේහි ගන්‍ධ ධූපේහි - ගිලාන පච්ච යේහි ච**
**පුප්ඵාදි වත්‍ථු ජාතේහි - සුද්ධේහි කප්පි යේහි ච**
**හේතුම්හි පච්චයේ ඤාණං-දෙසෙන්තං ගෝතමං ජිනං**
**කිලේසාමය නාසාය - භත්‍යාදරේන පූජයේ**

''ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස'', හාත්පස අඳුර නසමින් බැබළෙන පහනින්ද, දසත පැතිරෙන මනහර සුගන්ධ ධූපයෙන්ද, අෂ්ඨපානාදී ප්‍රනීත ගිලන් පසෙන්ද, විසිතුරු මල් ආදි ශුද්ධ කැප වස්තු සමූහයෙන්ද, පස්මරුන් දිනූ ගෞතම ජිනෙන්‍ද්‍රයන් වහන්සේ විසින් දේශනා කරන ලද, හේතු ප්‍රත්‍යය ඤාණයට කෙලෙස් නැසීම පිණිස භක්ත්‍යාදරයෙන් පූජා කරමි. පූජා වේවා!

**සාධු! සාධු !! සාධු !!!**



## හේතු ප්‍රත්‍ය ඤාණ වන්දනාව

**සෝ භගවා ඉතිපි හේතුපච්චයේ ඤාණේන සමන්නාගතෝ. හේතුපච්චයේ ඤාණේන සමන්නාගතෝ වත සෝ භගවා. තං භගවන්තං හේතුපච්චයේ ඤාණේන සමන්නාගතං සරණං ගච්ඡාමි. තං භගවන්තං හෙතුපච්චයේ ඤාණේන සමන්නාගතං සිරසා නමාමි.**

ඒ භාග්‍යවතුන් වහන්සේ, මෙසේ ද හේතු ප්‍රත්‍යය ඤාණයෙන් සමන්නාගත වන සේක. ඒ භාග්‍යවතුන් වහන්සේ ඒකාන්තයෙන් හේතු ප්‍රත්‍ය ඤාණයෙන් සමන්නාගත වන සේක. ඒ හේතු ප්‍රත්‍යය ඤාණයෙන් සමන්නාගත ඒ භාග්‍යවතුන් වහන්සේ මම සරණ යමි. ඒ හේතු ප්‍රත්‍යය ඤාණයෙන් සමන්නාගත භාග්‍යවතුන් වහන්සේට මම නමස්කාර කරමි. මාගේ නමස්කාරය වේවා!

**සාධු! සාධු !! සාධු !!!**

**1. හේතුපච්චයෝ ති හේතු හේතු සම්පයුත්තකානං ධම්මානං තං සමුට්ඨානානඤ්ච රූපානං හේතුපච්චයේන පච්චයෝ**

## 2. ආරම්මණ ප්‍රත්‍ය ඤාණ පූජාව

**දීපේහි ගන්ධ ධූපේහි - ගිලාන පච්ච යේහි ච**
**පුප්ඵාදි වත්‍ථු ජාතේහි - සුද්ධේහි කප්පි යේහි ච**
**ආරම්මණ පච්චයෙ ඤාණං - දේසෙන්තං ගෝතමං ජිනං**
**කිලෙසාමය නාසාය - භත්‍යාදරේන පූජයේ**

''ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස'', හාත්පස අඳුර නසමින් බැබළෙන පහනින්ද, දසත පැතිරෙන මනහර සුගන්ධ ධූපයෙන්ද, අෂ්ඨපානාදී ප්‍රනීත ගිලන් පසෙන්ද විසිතුරු මල් ආදි ශුද්ධ කැප වස්තු සමූහයෙන්ද, පස්මරුන් දිනූ ගෞතම ජිනේන්ද්‍රයන් වහන්සේ විසින් දේශනා කරන ලද, ආරම්මණ ප්‍රත්‍ය ඤාණයට කෙලෙස් නැසීම පිණිස භක්ත්‍යාදරයෙන් පූජා කරමි. පූජා වේවා!

**සාධු! සාධු !! සාධු !!!**

## ආරම්මණ ප්‍රත්‍ය ඤාණ වන්දනාව

**සෝ භගවා ඉතිපි ආරම්මණ පච්චයේ ඤාණේන සමන්නාගතෝ. ආරම්මණ පච්චයේ ඤාණේන සමන්නාගතෝ වත සෝ භගවා. තං භගවන්තං ආරම්මණ පච්චයේ ඤාණේන සමන්නාගතං සරණං ගච්ඡාමි. තං භගවන්තං ආරම්මණ පච්චයේ ඤාණේන සමන්නාගතං සිරසා නමාමි.**

ඒ භාග්‍යවතුන් වහන්සේ, මෙසේ ද



ආරම්මණ ප්‍රත්‍යය ඤාණයෙන් සමන්නාගත වන සේක. ඒ භාග්‍යවතුන් වහන්සේ ඒකාන්තයෙන් ආරම්මණ ප්‍රත්‍ය ඤාණයෙන් සමන්නාගත වන සේක. ඒ ආරම්මණ ප්‍රත්‍යය ඤාණයෙන් සමන්නාගත ඒ භාග්‍යවතුන් වහන්සේ මම සරණ යමි. ඒ හේතු ප්‍රත්‍යය ඤාණයෙන් සමන්නාගත භාග්‍යවතුන් වහන්සේට මම නමස්කාර කරමි. මාගේ නමස්කාරය වේවා!

**සාධු! සාධු !! සාධු !!!**

(සම්පාදනය - අතිපූජ්‍ය අරියධම්ම නාහිමි)

**2. ආරම්මණ පච්චයෝ ති, රූපායතනං චක්ඛුවිඤ්ඤාණ ධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධමමානං ආරමමණ පච්චයේන පච්චයෝ, සද්දායතනං සොතවිඤ්ඤාණ ධාතුයා තං සම්පයුත්තකානං ච ධම්මානං ආරම්මණ පච්චයේන පච්චයෝ, ගන්ධායතනං ඝාණවිඤ්ඤාණ ධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධම්මානං ආරම්මණ පච්චයේන පච්චයෝ, රසායතනං ජිව්හා විඤ්ඤාණ ධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධම්මානං ආරම්මණ පච්චයේන පච්චයෝ, ඵොට්ඨබායතනං කායවිඤ්ඤාණ ධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධම්මානං ආරම්මණ පච්චයේන පච්චයෝ. රූපායතනං සද්දායතනං ගන්ධායතනං රසායතනං ඵොට්ඨබ්බායතනං මනොධාතුයා තං**

සම්පයුත්තකානඤ්ච ධම්මානං ආරම්මණ පච්චයේන පච්චයෝ, සබ්බෙ ධම්මා මනොවිඤ්ඤාණ ධාතුයා තං සම්පයුත්ත කානඤ්ච ධම්මානං ආරම්මණ පච්චයෙන පච්චයො, යං යං ධම්මං ආරබ්භ යේ යේ ධම්මා උප්පජ්ජන්ති චිත්ත චෙතසිකා ධම්මා, තේ තේ ධම්මා තේසං තේසං ධම්මානං ආරම්මණ පච්චයේන පච්චයෝ.

## 3. අධිපති ප්‍රත්‍ය ඤාණ පූජාව

**දීපේහි ගන්ධ ධූපේහි - ගිලාන පච්ච යේහි ච**
**පුප්ඵාදි වත්ථු ජාතේහි - සුද්ධේහි කප්පි යේහි ච**
**අධිපති පච්චයේ ඤාණං - දෙසෙන්තං ගෝතමං ජිනං**
**කිලෙසාමය නාසාය - භත්‍යාදරේන පූජයේ**

''ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස'' හාත්පස අඳුර නසමින් බැබළෙන පහනින්ද, දසත පැතිරෙන මනහර සුගන්ධ ධූපයෙන්ද, අෂ්ඨපානාදී ප්‍රනීත ගිලන් පසෙන්ද, විසිතුරු මල් ආදි ශුද්ධ කැප වස්තු සමූහයෙන්ද, පස්මරුන් දිනූ ගෞතම ජිනේන්‍ද්‍රයන් වහන්සේ විසින් දේශනා කරන ලද, අධිපති ප්‍රත්‍යය ඤාණයට කෙලෙස් නැසීම පිණිස භක්ත්‍යාදරයෙන් පූජා කරමි. පූජා වේවා!

**සාධු! සාධු !! සාධු !!!**



## අධිපති ප්‍රත්‍ය ඤාණ වන්දනාව

**සෝ භගවා ඉතිපි අධිපති පච්චයේ ඤාණේන සමන්නාගතෝ. අධිපති පච්චයේ ඤාණේන සමන්නාගතෝ වත සෝ භගවා. තං භගවන්තං අධිපති පච්චයේ ඤාණේන සමන්නාගතං සරණං ගච්ඡාමි. තං භගවන්තං අධිපති පච්චයේ ඤාණේන සමන්නාගතං සිරසා නමාමි.**

ඒ භාග්‍යවතුන් වහන්සේ, මෙසේ ද අධිපති ප්‍රත්‍යය ඤාණයෙන් සමන්නාගත වන සේක. ඒ භාග්‍යවතුන් වහන්සේ ඒකාන්තයෙන් අධිපති ප්‍රත්‍ය ඤාණයෙන් සමන්නාගත වන සේක. ඒ අධිපති ප්‍රත්‍යය ඤාණයෙන් සමන්නාගත ඒ භාග්‍යවතුන් වහන්සේ මම සරණ යමි. ඒ අධිපති ප්‍රත්‍යය ඤාණයෙන් සමන්නාගත භාග්‍යවතුන් වහන්සේට මම නමස්කාර කරමි. මාගේ නමස්කාරය වේවා!

**සාධු! සාධු !! සාධු !!!**

**3. අධිපති පච්චයෝ ති, ඡන්දාධිපති ඡන්ද සම්පයුත්තකානං ධම්මානං තං සමුට්ඨානානඤ්ච රූපානං අධිපතිපච්චයේන පච්චයෝ, විරියාධිපති විරිය සම්පයුත්තකානං ධම්මානං තං සමුට්ඨානඤ්ච රූපානං අධිපති පච්චයේන පච්චයෝ, චිත්තාධිපති චිත්ත සම්පයුත්තකානං**

ධම්මානං තං සමුට්ඨානානඤ්ච රූපානං අධිපති පච්චයේන පච්චයෝ, වීමංසාධිපති වීමංසා සම්පයුත්තකානං ධම්මානං තං සමුට්ඨානානඤ්ච රූපානං අධිපති පච්චයේන පච්චයෝ, යං යං ධම්මං ගරුං කත්වා යේ යේ ධම්මා උප්පජ්ජන්ති චිත්ත චෙතසිකා ධම්මා, තේ තේ ධම්මා තේසං තේසං ධම්මානං අධිපති පච්චයේන පච්චයෝ.

## 4. අනන්තර ප්‍රත්‍ය ඤාණ පූජාව

**දීපේහි ගන්ධ ධූපේහි - ගිලාන පච්ච යේහි ච**
**පුප්ඵාදි වත්ථු ජාතේහි  සුද්ධෙහි කප්පි යේහි ච**
**අන්නතර පච්චයේ ඤාණං -දේසෙන්තං ගෝතමං ජිනං**
**කිලෙසාමය නාසාය - හත්‍යාදරේන පූජයේ**

''ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස'', හාත්පස අඳුර නසමින් බැබළෙන පහනින්ද, දසත පැතිරෙන මනහර සුගන්ධ ධූපයෙන්ද, අෂ්ඨපානාදී ප්‍රනීත ගිලන් පසෙන්ද විසිතුරු මල් ආදි ශූද්ධ කැප වස්තු සමූහයෙන්ද, පස්මරුන් දිනූ ගෞතම ජිනෙන්ද්‍රයන් වහන්සේ විසින් දේශනා කරන ලද, අනන්තර ප්‍රත්‍යය ඤාණයට කෙලෙස් නැසීම පිණිස භක්ත්‍යාදරයෙන් පූජා කරමි. පූජා වේවා!

**සාධු! සාධු !! සාධු !!!**



## අනන්තර ප්‍රත්‍ය ඤාණ වන්දනාව

**සෝ භගවා ඉතිපි අනන්තර පච්චයේ ඤාණේන සමන්නා ගතෝ. අනන්තර පච්චයේ ඤාණේන සමන්නාගතෝ වත සෝ භගවා. තං භගවන්තං අනන්තර පච්චයේ ඤාණේන සමන්නාගතං සරණං ගච්ඡාමි. තං භගවන්තං අනන්තර පච්චයේ ඤාණේන සමන්නාගතං සිරසා නමාමි.**

ඒ භාග්‍යවතුන් වහන්සේ, මෙසේ ද අනන්තර ප්‍රත්‍යය ඤාණයෙන් සමන්නාගත වන සේක. ඒ භාග්‍යවතුන් වහන්සේ ඒකාන්තයෙන් අනන්තර ප්‍රත්‍ය ඤාණයෙන් සමන්නාගත වන සේක. ඒ අනන්තර ප්‍රත්‍යය ඤාණයෙන් සමන්නාගත ඒ භාග්‍යවතුන් වහන්සේ මම සරණ යමි. ඒ අනන්තර ප්‍රත්‍යය ඤාණයෙන් සමන්නාගත භාග්‍යවතුන් වහන්සේට මම නමස්කාර කරමි. මාගේ නමස්කාරය වේවා!

**සාධු! සාධු !! සාධු !!!**

**අනන්තර පච්චයෝ ති, චක්ඛුවිඤ්ඤාණ ධාතු තං සම්පයුත්තකාච ධම්මා මනෝධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධම්මානං අනන්තර පච්චයේන පච්චයෝ, මනෝධාතු තං සම්පයුත්තකාච ධම්මා විඤ්ඤාණ ධාතුයා තං**

සම්පයුත්තකානඤ්ච ධම්මානං අනන්තර පච්චයේන පච්චයෝ, සොතවිඤ්ඤාණධාතු තං සම්පයුත්තකා ච ධම්මා මනෝධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධම්මානං අනන්තර පච්චයේන පච්චයෝ, මනෝධාතු තං සම්පයුත්තකාච ධම්මා මනොවිඤ්ඤාණ ධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධම්මානං අනන්තරපච්චයෙන පච්චයෝ, ඝාණවිඤ්ඤාණ ධාතු තං සම්පයුත්තකාච ධම්මා මනෝධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධම්මානං අනන්තර පච්චයේන පච්චයෝ, මනෝධාතු තං සම්පයුත්තකාච ධම්මා මනෝවිඤ්ඤාණ ධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධම්මානං අනන්තර පච්චයේන පච්චයෝ, ජිවහා විඤ්ඤාණධාතු තං සම්පයුත්තකාච ධම්මා මනෝධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධම්මානං අනන්තර පච්චයේන පච්චයෝ, මනෝධාතු තං සම්පයුත්තකාච ධම්මා මනෝවිඤ්ඤාණ ධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධම්මානං අනන්තර පච්චයේන පච්චයෝ. කායවිඤ්ඤාණ ධාතු තං සම්පයුත්තකාච ධම්මා මනෝධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධම්මානං අනන්තර පච්චයේන පච්චයෝ, මනෝධාතු තං සම්පයුත්තකාච ධම්මා මනෝවිඤ්ඤාණ ධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධම්මානං අනත්තර පච්චයේන පච්චයෝ.



පුරිමා පුරිමා කුසලා ධම්මා පච්ඡිමානං පච්ඡිමානං කුසලානං ධම්මානං අනන්තර පච්චයේන පච්චයෝ, පුරිමා පුරිමා කුසලා ධම්මා පච්ඡිමානං පච්ඡිමානං අබ්‍යාකතානං ධම්මානං අනන්තර පච්චයේන පච්චයෝ

පුරිමා පුරිමා අකුසලා ධම්මා පච්ඡිමානං පච්ඡිමානං අකුසලානං ධම්මානං අනන්තර පච්චයේන පච්චයෝ, පුරිමා පුරිමා අකුසලා ධම්මා පච්ඡිමානං පච්ඡිමානං අබ්‍යාකතානං ධම්මානං අනන්තර පච්චයේන පච්චයෝ.

පුරිමා පුරිමා අබ්‍යාකතා ධම්මා පච්ඡිමානං පච්ඡිමානං අබ්‍යාකතානං ධම්මානං අන්නතර පච්චයේන පච්චයෝ, පුරිමා පුරිමා අබ්‍යාකතා ධම්මා පච්ඡිමානං පච්ඡිමානං කුසලානං ධම්මානං අනන්තර පච්චයේන පච්චයෝ, පුරිමා පුරිමා අබ්‍යාකතා ධම්මා පච්ඡිමානං පච්ඡිමානං අකුසලානං ධම්මානං අනන්තර පච්චයේන පච්චයෝ, යේසං යේසං ධම්මානං අනන්තරා යේ යේ ධම්මා උප්පජ්ජන්ති චිත්ත චෙතසිකා ධම්මා තේ තේ ධම්මා තේසං තේසං ධම්මානං අනන්තර පච්චයේන පච්චයෝ.

## 5. සමනන්තර ප්‍රත්‍ය ඥාණයට පූජාව

**දීපේහි ගන්ධ ධූපේහි - ගිලාන පච්ච යේහි ච**
**පුප්ඵාදි වත්‍ථු ජාතේහි - සුද්ධේහි කප්පි යේහි ච**
**සමනන්තර පච්චයේ ඥාණං-දෙසෙන්තං ගෝතමං ජිනං**
**කිලේසාමය නාසාය - භත්‍යාදරේන පූජයේ**

''ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස,'' හාත්පස අඳුර නසමින් බැබළෙන පහනින්ද, දසත පැතිරෙන මනහර සුගන්ධ ධූපයෙන්ද, අෂ්ඨපානාදී ප්‍රනීත ගිලන් පසෙන්ද විසිතුරු මල් ආදි ශුද්ධ කැප වස්තු සමූහයෙන්ද, පස්මරුන් දිනූ ගෞතම ජිනෙන්‍ද්‍රයන් වහන්සේ විසින් දේශනා කරන ලද, සමනන්තර ප්‍රත්‍යය ඥාණයට කෙලෙස් නැසීම පිණිස භක්ත්‍යාදරයෙන් පූජා කරමි. පූජා වේවා!

සාධු! සාධු !! සාධු !!!

## සමනන්තර ප්‍රත්‍ය ඥාණ වන්දනාව

**සෝ භගවා ඉතිපි සමනන්තර පච්චයේ ඥාණේන සමන්නාගතෝ. සමනන්තර පච්චයේ ඥාණේන සමන්නාගතෝ වත සෝ භගවා. තං භගවන්තං සමනන්තර පච්චයේ ඥාණේන සමන්නාගතං සරණං ගච්ඡාමි. තං භගවන්තං සමනන්තර පච්චයේ ඥාණේන සමන්නාගතං සිරසා නමාමි.**



ඒ භාග්‍යවතුන් වහන්සේ, මෙසේ ද සමනන්තර ප්‍රත්‍යය ඥාණයෙන් සමන්නාගත වන සේක. ඒ භාග්‍යවතුන් වහන්සේ ඒකාන්තයෙන් සමනන්තර ප්‍රත්‍ය ඥාණයෙන් සමන්නාගත වන සේක. ඒ සමනන්තර ප්‍රත්‍යය ඥාණයෙන් සමන්නාගත ඒ භාග්‍යවතුන් වහන්සේ මම සරණ යමි. ඒ සමනන්තර ප්‍රත්‍යය ඥාණයෙන් සමන්නාගත භාග්‍යවතුන් වහන්සේට මම නමස්කාර කරමි. මාගේ නමස්කාරය වේවා!

**සාධු! සාධු !! සාධු !!!**

**5. සමනන්තර පච්චයෝ ති, චක්ඛුවිඤ්ඤාණ ධාතු තං සම්පයුත්තකාච ධම්මා මනෝධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධම්මානං සමනන්තර පච්චයේන පච්චයෝ, මනෝධාතු තං සම්පයුත්තකාච ධම්මා මනෝවිඤ්ඤාණ ධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධම්මානං සමනන්තර පච්චයේන පච්චයෝ**
**සොතවිඤ්ඤාණධාතු තං සම්පයුත්තකා ච ධම්මා මනෝධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධම්මානං සමනන්තර පච්චයේන පච්චයෝ, මනෝධාතු තං සම්පයුත්තකාච ධම්මා මනෝවිඤ්ඤාණ ධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධම්මානං සමනන්තරපච්චයේන පච්චයෝ,**
**ඝාණවිඤ්ඤාණ ධාතු තං සම්පයුත්තකාච ධම්මා**

මනෝධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධම්මානං සමනන්තර පච්චයේන පච්චයෝ, මනෝධාතු තං සම්පයුත්තනකාච ධම්මා මනෝවිඤ්ඤාණ ධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධම්මානං සමන්නතර පච්චයේන පච්චයෝ,

ජිව්හා විඤ්ඤාණධාතු තං සම්පයුත්තකාච ධම්මා මනෝධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධම්මානං සමනන්තර පච්චයේන පච්චයෝ, මනෝධාතු තං සම්පයුත්තකාච ධම්මා මනෝවිඤ්ඤාණ ධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධම්මානං සමනන්තර පච්චයේන පච්චයෝ.

කායවිඤ්ඤාණ ධාතු තං සම්පයුත්තකාච ධම්මා මනෝධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධම්මානං සමනන්තර පච්චයේන පච්චයෝ, මනෝධාතු තං සම්පයුත්තකාච ධම්මා මනෝවිඤ්ඤාණ ධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධම්මානං සමනන්තර පච්චයේන පච්චයෝ.

පුරිමා පුරිමා කුසලා ධම්මා පච්ඡිමානං පච්ඡිමානං කුසලානං ධම්මානං සමනන්තර පච්චයේන පච්චයෝ, පුරිමා පුරිමා කුසලා ධම්මා පච්ඡිමානං පච්ඡිමානං අබ්‍යාකතානං ධම්මානං සමනන්තර පචචයේන පචචයෝ

පුරිමා පුරිමා අකුසලා ධමමා පචඡිමානං පච්ඡිමානං අකුසලානං ධම්මානං සමනන්තර පචචයේන පචචයෝ, පුරිමා පුරිමා අකුසලා ධමමා පචඡිමානං පචඡිමානං අබ්‍යාකතානං



ධම්මානං සමනන්තර පච්චයේන පච්චයෝ.

පුරිමා පුරිමා අබ්‍යාකතා ධම්මා පච්ඡිමානං පච්ඡිමානං අබ්‍යාකතානං ධම්මානං සමනන්තර පච්චයෙන පච්චයො, පුරිමා පුරිමා අබ්‍යාකතා ධම්මා පච්ඡිමානං කුසලානං ධම්මානං සමනන්තර පච්චයේන පච්චයෝ, පුරිමා පුරිමා අබ්‍යාකතා ධම්මා පච්ඡිමානං පච්ඡිමානං අකුසලානං ධම්මානං සමනන්තර පච්චයේන පච්චයෝ, යෙසං යෙසං ධම්මානං සමනන්තරා යේ යේ ධම්මා උප්පජ්ජන්ති චිත්ත චෙතසිකා ධම්මා තේ තේ ධම්මා තේසං තේසං ධම්මානං සමනන්තර පච්චයේන පච්චයෝ.

## 6. සහජාත ප්‍රත්‍ය ඤාණ පූජාව

**දීපේහි ගන්ධ ධූපේහි - ගිලාන පච්ච යේහි ච**
**පුප්ඵාදි වත්ථු ජාතේහි - සුද්ධේහි කප්පි යේහි ච**
**සහජාත පච්චයේ ඤාණං - දෙසෙන්තං ගෝතමං ජිනං**
**කිලෙසාමය නාසාය - භත්‍යාදරේන පූජයේ**

''ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස'', හාත්පස අඳුර නසමින් බැබළෙන පහනින්ද, දසත පැතිරෙන මනහර සුගන්ධ ධූපයෙන්ද, අෂ්ඨපානාදී ප්‍රනීත ගිලන් පසෙන්ද, විසිතුරු මල් ආදි ශුද්ධ කැප වස්තු සමූහයෙන්ද, පස්මරුන් දිනූ ගෞතම ජිනේන්ද්‍රයන් වහන්සේ විසින් දේශනා

කරන ලද, සහජාත ප්‍රත්‍යය ඤාණයට කෙලෙස් නැසීම පිණිස භක්ත්‍යාදරයෙන් පූජා කරමි. පූජා වේවා!

සාධු! සාධු !! සාධු !!!

## සහජාත ප්‍රත්‍ය ඤාණ වන්දනාව

**සෝ භගවා ඉතිපි සහජාත පච්චයේ ඤාණේන සමන්නා ගතෝ. සහජාත පච්චයේ ඤාණේන සමන්නාගතෝ වත සෝ භගවා. තං භගවන්තං සහජාත පච්චයේ ඤාණේන සමන්නාගතං සරණං ගච්ඡාමි. තං භගවන්තං සහජාත පච්චයේ ඤාණේන සමන්නාගතං සිරසා නමාමි.**

ඒ භාග්‍යවතුන් වහන්සේ, මෙසේ ද සහජාත ප්‍රත්‍යය ඤාණයෙන් සමන්නාගත වන සේක. ඒ භාග්‍යවතුන් වහන්සේ ඒකාන්තයෙන් සහජාත ප්‍රත්‍ය ඤාණයෙන් සමන්නාගත වන සේක. ඒ සහජාත ප්‍රත්‍යය ඤාණයෙන් සමන්නාගත ඒ භාග්‍යවතුන් වහන්සේ මම සරණ යමි. ඒ සහජාත ප්‍රත්‍යය ඤාණයෙන් සමන්නාගත භාග්‍යවතුන් වහන්සේට මම නමස්කාර කරමි. මාගේ නමස්කාරය වේවා!

සාධු! සාධු !! සාධු !!!



**6. සහජාත පච්චයො ති, - චත්තාරො ඛන්ධා අරූපිනො අඤ්ඤමඤ්ඤං සහජාත පච්චයේන පච්චයෝ, චත්තාරො මහාභූතා අඤ්ඤමඤ්ඤං සහජාත පච්චයේන පච්චයෝ, ඔක්කන්තික්ඛණෙ නාමරූපං අඤ්ඤමඤ්ඤං සහජාත පච්චයේන පච්චයෝ, චිත්ත චෙතසිකා ධම්මා චිත්ත සමුට්ඨානානං රූපානං සහජාත පච්චයේන පච්චයෝ, මහා භූතා උපාදාය රූපානං සහජාත පච්චයේන පච්චයෝ, රූපිනෝ ධම්මා අරූපීනං ධම්මානං කිඤ්චිකාලෙ සහජාත පච්චයේන පච්චයෝ, කිඤ්චිකාලෙ න සහජාත පච්චයේන පච්චයෝ.**

## 7. අඤ්ඤමඤ්ඤ ප්‍රත්‍ය ඤාණ වන්දනාව

**දීපේහි ගන්ධ ධූපේහි - ගිලාන පච්ච යේහි ච**
**පුප්ඵාදි වත්ථු ජාතේහි - සුද්ධේහි කප්පි යේහි ච**
**අඤ්ඤමඤ්ඤ පච්චයේ ඤාණං - දෙසෙන්තං ගෝතමං ජිනං**
**කිලෙසාමය නාසාය - භත්‍යාදරේන පූජයේ**

''ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස'', හාත්පස අඳුර නසමින් බැබළෙන පහනින්ද, දසත පැතිරෙන මනහර සුගන්ධ ධූපයෙන්ද, අෂ්ඨපානාදී ප්‍රනීත ගිලන් පසෙන්ද විසිතුරු මල් ආදි ශුද්ධ කැප වස්තු සමූහයෙන්ද, පස්මරුන්

දිනූ ගෞතම ජිනේන්‍ද්‍රයන් වහන්සේ විසින් දේශනා කරන ලද, අඤ්ඤමඤ්ඤ ප්‍රත්‍යය ඤාණයට කෙලෙස් නැසීම පිණිස භක්ත්‍යාදරයෙන් පූජා කරමි. පූජා වේවා!

සාධු! සාධු !! සාධු !!!

## අඤ්ඤමඤ්ඤ ප්‍රත්‍ය ඤාණ වන්දනාව

**සෝ භගවා ඉතිපි අඤ්ඤමඤ්ඤ පච්චයේ ඤාණේන සමන්නාගතෝ. අඤ්ඤමඤ්ඤ පච්චයේ ඤාණේන සමන්නාගතෝ වත සෝ භගවා තං භගවන්තං අඤ්ඤමඤ්ඤ පච්චයේ ඤාණේන සමන්නාගතං සරණං ගච්ඡාමි. තං භගවන්තං අඤ්ඤමඤ්ඤ පච්චයේ ඤාණේන සමන්නාගතං සිරසා නමාමි.**

ඒ භාග්‍යවතුන් වහන්සේ, මෙසේ ද අඤ්ඤමඤ්ඤ ප්‍රත්‍යය ඤාණයෙන් සමන්නාගත වන සේක. ඒ භාග්‍යවතුන් වහන්සේ ඒකාන්තයෙන් අඤ්ඤමඤ්ඤ ප්‍රත්‍ය ඤාණයෙන් සමන්නාගත වන සේක. ඒ අඤ්ඤමඤ්ඤ ප්‍රත්‍යය ඤාණයෙන් සමන්නාගත ඒ භාග්‍යවතුන් වහන්සේ මම සරණ යමි. ඒ අඤ්ඤමඤ්ඤ ප්‍රත්‍යය ඤාණයෙන් සමන්නාගත භාග්‍යවතුන් වහන්සේට මම නමස්කාර කරමි. මාගේ නමස්කාරය වේවා!



**7. අඤ්ඤමඤ්ඤ පච්චයෝති, චත්තාරෝ ඛන්ධා**

**අරූපිනෝ අඤ්ඤමඤ්ඤ පච්චයේන පච්චයෝ, චතතාරෝ මහාභූතා අඤ්ඤමඤ්ඤ පච්චයේන පච්චයෝ, ඔක්කන්තික්ඛණෙ නාම රූපං අඤ්ඤමඤ්ඤ පච්චයේන පච්චයෝ.**

## 8. නිස්සය ප්‍රත්‍ය ඤාණ පූජාව

**දීපේහි ගන්ධ ධූපේහි - ගිලාන පච්ච යේහි ච**
**පුප්ඵාදි වත්‍ථු ජාතේහි - සුද්ධේහි කප්පි යේහි ච**
**නිස්සය පච්චයේ ඤාණං - දෙසෙන්තං ගෝතමං ජිනං**
**කිලෙසාමය නාසාය - භත්‍යාදරේන පූජයේ**

''ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස'', හාත්පස අඳුර නසමින් බැබළෙන පහනින්ද, දසත පැතිරෙන මනහර සුගන්ධ ධූපයෙන්ද, අෂ්ඨපානාදී ප්‍රනීත ගිලන් පසෙන්ද විසිතුරු මල් ආදි ශුද්ධ කැප වස්තු සමූහයෙන්ද, පස්මරුන් දිනූ ගෞතම ජිනේන්‍ද්‍රයන් වහන්සේ විසින් දේශනා කරන ලද, නිස්සය ප්‍රත්‍යය ඤාණයට කෙලෙස් නැසීම පිණිස භක්ත්‍යාදරයෙන් පූජා කරමි. පූජා වේවා!

සාධු! සාධු !! සාධු !!!

## නිස්සය ප්‍රත්‍ය ඤාණ වන්දනාව

**සෝ භගවා ඉතිපි නිස්සය පච්චයේ ඤාණේන සමන්නාගතෝ. නිස්සය පච්චයේ ඤාණේන සමන්නාගතෝ වත සෝ භගවා. තං භගවන්තං නිස්සය පච්චයේ ඤාණේන සමන්නාගතං සරණං ගච්ඡාමි. තං භගවන්තං නිස්සය පච්චයේ ඤාණේන සමන්නාගතං සිරසා නමාමි.**

ඒ භාග්‍යවතුන් වහන්සේ, මෙසේ ද නිස්සය ප්‍රත්‍යය ඤාණයෙන් සමන්නාගත වන සේක. ඒ භාග්‍යවතුන් වහන්සේ ඒකාන්තයෙන් නිස්සය ප්‍රත්‍ය ඤාණයෙන් සමන්නාගත වන සේක. ඒ නිස්සය ප්‍රත්‍යය ඤාණයෙන් සමන්නාගත ඒ භාග්‍යවතුන් වහන්සේ මම සරණ යමි. ඒ නිස්සය ප්‍රත්‍යය ඤාණයෙන් සමන්නාගත භාග්‍යවතුන් වහන්සේට මම නමස්කාර කරමි. මාගේ නමස්කාරය වේවා!

**සාධු! සාධු !! සාධු !!!**

**8. නිස්සය පච්චයෝති, චත්තාරෝ ඛන්ධා රූපිනෝ අඤ්ඤමඤ්ඤං නිස්සය පච්චයේන පච්චයෝ චත්තාරෝ මහා භූතා අඤ්ඤමඤ්ඤං නිස්සය පච්චයේන පච්චයෝ, ඔක්කන්තික්ඛණෙ නාමරූපං අඤ්ඤමඤ්ඤං නිස්සය පච්චයේන**



**පච්චයෝ, චිත්ත චෙතසිකා ධම්මා චිත්ත සමුට්ඨානානං රූපානං නිස්සය පච්චයේන පච්චයෝ, මහාභූතා උපාදාන රූපානං නිස්සය පච්චයේන පච්චයෝ.**

**චක්ඛායතනං චක්ඛුවිඤ්ඤාණ ධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධම්මානං නිස්සය පච්චයේන පච්චයෝ, සෝතායතනං සොතවිඤ්ඤාණ ධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධම්මානං නිස්සය පච්චයේන පච්චයෝ, ඝාණායතනං ඝාණවිඤ්ඤාණ ධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධම්මානං නිස්සය පච්චයේන පච්චයෝ. ජිව්හායතනං ජිව්හා විඤ්ඤාණ ධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධම්මානං නිස්සය පච්චයේන පච්චයෝ, කායායතනං කායවිඤ්ඤාණ ධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධම්මානං නිස්සය පච්චයේන පච්චයෝ, යං රූපං නිස්සාය මනෝධාතුච මනොවිඤ්ඤාණ ධාතුච වත්තන්ති තංරූපං මනෝධාතුයා ච මනෝ විඤ්ඤාණ ධාතුයා ච තං සම්පයුත්තකානඤ්ච ධම්මානං නිස්සය පච්චයේන පච්චයෝ.**

## 9. උපනිස්සය ප්‍රත්‍ය ඥාණ පූජාව

**දීපේහි ගන්ධ ධූපේහි - ගිලාන පච්ච යේහි ච**
**පුප්ඵාදි වත්‍ථු ජාතේහි - සුද්ධේහි කප්පියේහි ච**
**උපනිස්සය පච්චයේ ඥාණං - දෙසෙන්තං ගෝතමං ජිනං**
**කිලේසාමය නාසාය - භත්‍යාදරේන පූජයේ**

''ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස'' හාත්පස අඳුර නසමින් බැබළෙන පහනින්ද, දසත පැතිරෙන මනහර සුගන්ධ ධූපයෙන්ද, අෂ්ඨපානාදී ප්‍රනීත ගිලන් පසෙන්ද, විසිතුරු මල් ආදි ශුද්ධ කැප වස්තු සමූහයෙන්ද, පස්මරුන් දිනූ ගෞතම ජිනෙන්‍ද්‍රයන් වහන්සේ විසින් දේශනා කරන ලද, උපනිස්සය ප්‍රත්‍යය ඥාණයට කෙලෙස් නැසීම පිණිස භක්ත්‍යාදරයෙන් පූජා කරමි. පූජා වේවා!

සාධු! සාධු !! සාධු !!!

## උපනිස්සය ප්‍රත්‍ය ඥාණ වන්දනාව

**සෝ භගවා ඉතිපි උපනිස්සය පච්චයේ ඥාණේන සමන්නාගතෝ. උපනිස්සය පච්චයේ ඥාණේන සමන්නාගතෝ වත සෝ භගවා. තං භගවන්තං උපනිස්සය පච්චයේ ඥාණේන සමන්නාගතං සරණං ගච්ඡාමි. තං භගවන්තං උපනිස්සය පච්චයේ ඥාණේන සමන්නාගතං සිරසා නමාමි.**

ඒ භාග්‍යවතුන් වහන්සේ, මෙසේ ද උපනිස්සය ප්‍රත්‍යය ඥාණයෙන් සමන්නාගත වන



සේක. ඒ භාග්‍යවතුන් වහන්සේ ඒකාන්තයෙන් උපනිස්සය ප්‍රත්‍ය ඥාණයෙන් සමන්නාගත වන සේක. ඒ උපනිස්සය ප්‍රත්‍යය ඥාණයෙන් සමන්නාගත ඒ භාග්‍යවතුන් වහන්සේ මම සරණ යමි. ඒ උපනිස්සය ප්‍රත්‍යය ඥාණයෙන් සමන්නාගත භාග්‍යවතුන් වහන්සේට මම නමස්කාර කරමි. මාගේ නමස්කාරය වේවා!

සාධු! සාධු !! සාධු !!!

**9. උපනිස්සය පච්චයෝ ති, පුරිමා පුරිමා කුසලා ධම්මා පච්ඡිමානං පච්ඡිමානං කුසලානං ධම්මානං උපනිස්සය පච්චයේන පච්චයෝ, පුරිමා පුරිමා කුසලා ධම්මා පච්ඡිමානං පච්ඡිමානං අකුසලානං ධම්මානං කේසඤ්චි උපනිස්සය පච්චයේන පච්චයෝ, පුරිමා පුරිමා කුසලා ධම්මා පච්ඡිමානං පච්ඡිමානං අබ්‍යාකතානං ධම්මානං උපනිස්සය පච්චයේන පච්චයෝ.**

**පුරිමා පුරිමා අකුසලා ධම්මා පච්ඡිමානං පච්ඡිමානං අකුසලානං ධම්මානං උපනිස්සය පච්චයේන පච්චයෝ පුරිමා පුරිමා අකුසලා ධම්මා පච්ඡිමානං පච්ඡිමානං කුසලානං ධම්මානං කේසඤ්චි උපනිස්සය පච්චයේන පච්චයෝ, පුරිමා පුරිමා අකුසලා ධම්මා පච්ඡිමානං පච්ඡිමානං අබ්‍යාකතානං ධම්මානං උපනිස්සය පච්චයේන පච්චයෝ.**

**පුරිමා පුරිමා අබ්‍යාකතා ධම්මා පච්ඡිමානං**

පච්ඡිමානං අබ්‍යාකතානං ධම්මානං උපනිස්සය පච්චයේන පච්චයෝ, පුරිමා පුරිමා අබ්‍යාකතා ධම්මා පච්ඡිමානං පච්ඡිමානං කුසලානං ධම්මානං උපනිස්සය පච්චයේන පච්චයෝ, පුරිමා පුරිමා අබ්‍යාකතා ධම්මා පච්ඡිමානං පච්ඡිමානං අකුසලානං ධම්මානං උපනිස්සය පච්චයේන පච්චයෝ, උතු භෝජනම්පි උපනිස්සය පච්චයේන පච්චයෝ, පුග්ගලෝපි උපනිස්සය පච්චයේන පච්චයෝ, සෙනාසනම්පි උපනිස්සය පච්චයේන පච්චයෝ.

## 10. පුරේජාත ප්‍රත්‍ය ඥාණ පූජාව

දීපේහි ගන්ධ ධූපේහි - ගිලාන පච්ච යේහි ච
පුප්ඵාදි වත්‍ථු ජාතේහි - සුද්ධේහි කප්පි යේහි ච
පුරෙජාත පච්චයේ ඤාණං -දේසෙන්තං ගෝතමං ජිනං
කිලෙසාමය නාසාය - භත්‍යාදරේන පූජයේ

''ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස'', හාත්පස අඳුර නසමින් බැබළෙන පහනින්ද, දසත පැතිරෙන මනහර සුගන්ධ ධූපයෙන්ද, අෂ්ඨපානාදී ප්‍රනීත ගිලන් පසෙන්ද, විසිතුරු මල් ආදි ශුද්ධ කැප වස්තු සමූහයෙන්ද, පස්මරුන් දිනූ ගෞතම ජිනෙන්‍ද්‍රයන් වහන්සේ විසින් දේශනා කරන ලද, පුරෙජාත ප්‍රත්‍යය ඥාණයට



කෙලෙස් නැසීම පිණිස භක්ත්‍යාදරයෙන් පූජා කරමි. පූජා වේවා!

සාධු! සාධු !! සාධු !!!

## පුරේජාත ප්‍රත්‍ය ඥාණ වන්දනාව

සෝ භගවා ඉතිපි පුරේජාත පච්චයේ ඤාණේන සමන්නා ගතෝ. පුරේජාත පච්චයේ ඤාණේන සමන්නාගතෝ වත සෝ භගවා. තං භගවන්තං පුරේජාත පච්චයේ ඤාණේන සමන්නාගතං සරණං ගච්ඡාමි. තං භගවන්තං පුරේජාත පච්චයේ ඤාණේන සමන්නාගතං සිරසා නමාමි.

ඒ භාග්‍යවතුන් වහන්සේ, මෙසේ ද පුරේජාත ප්‍රත්‍යය ඥාණයෙන් සමන්නාගත වන සේක. ඒ භාග්‍යවතුන් වහන්සේ ඒකාන්තයෙන් පුරේජාත ප්‍රත්‍ය ඥාණයෙන් සමන්නාගත වන සේක. ඒ පුරේජාත ප්‍රත්‍යය ඥාණයෙන් සමන්නාගත ඒ භාග්‍යවතුන් වහන්සේ මම සරණ යමි. ඒ පුරේජාත ප්‍රත්‍යය ඥාණයෙන් සමන්නාගත භාග්‍යවතුන් වහන්සේට මම නමස්කාර කරමි. මාගේ නමස්කාරය වේවා!

සාධු! සාධු !! සාධු !!!

10. පුරේජාත පච්චයෝ ති, චක්ඛායතනං චක්ඛුවිඤ්ඤාණ ධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධම්මානං පුරේජාත පච්චයේන පච්චයෝ, සොතායතනං සොතවිඤ්ඤාණ ධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධම්මානං පුරේජාත පච්චයේන පච්චයෝ, ඝාණායතනං ඝාණවිඤ්ඤාණ ධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධම්මානං පුරේජාත පච්චයේන පච්චයෝ, ජිව්හායතනං ජිව්හාවිඤ්ඤාණ ධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධම්මානං පුරේජාත පච්චයේන පච්චයෝ, කායායතනං කායවිඤ්ඤාණ ධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධම්මානං පුරේජාත පච්චයේන පච්චයෝ.

රූපායතනං චක්ඛු විඤ්ඤාණ ධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධම්මානං පුරේජාත පච්චයේන පච්චයෝ, සද්දායතනං සොතවිඤ්ඤාණ ධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධම්මානං පුරේජාත පච්චයේන පච්චයෝ, ගන්ධායතනං ඝාණවිඤ්ඤාණ ධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධම්මානං පුරේජාත පච්චයේන පච්චයෝ, රසායතනං ජිව්හාවිඤ්ඤාණ ධාතුයා තං සම්යුත්තකානඤ්ච ධම්මානං පුරේජාත පච්චයේන පච්චයෝ, ඵොට්ඨබ්බායතනං කායවිඤ්ඤාණ ධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධම්මානං පුරේජාත පච්චයේන පච්චයෝ.



රූපායතනං සද්දායතනං ගන්ධායතනං රසායතනං ඵොට්ඨබ්බායතනං මනෝධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධම්මානං පුරේජාත පච්චයේන පච්චයෝ, යං රූපං නිස්සාය මනෝධාතුච මනෝවිඤ්ඤාණ ධාතුච වත්තන්ති තං රූපං මනෝධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධම්මානං පුරේජාත පච්චයේන පච්චයෝ, මනෝවිඤ්ඤාණ ධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධම්මානං කිඤ්චිකාලේ පුරේජාත පච්චයේන පච්චයෝ, කිඤ්චි කාලේ න පුරේජාත පච්චයේන පච්චයෝ.

## 11. පච්ඡාජාත ප්‍රත්‍ය ඥාණයට පූජාව

දීපේහි ගන්ධ ධූපේහි - ගිලාන පච්ච යේහි ච
පුප්ඵාදි වත්ථු ජාතේහි - සුද්ධේහි කප්පි යේහි ච
පච්ඡාජාත පච්චයේ ඥාණං-දෙසෙන්තං ගෝතමං ජිනං
කිලෙසාමය නාසාය - භත්‍යාදරේන පූජයේ

''ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස'', හාත්පස අඳුර නසමින් බැබළෙන පහනින්ද, දසත පැතිරෙන මනහර සුගන්ධ ධූපයෙන්ද, අෂ්ඨපානාදී ප්‍රනීත ගිලන් පසෙන්ද විසිතුරු මල් ආදි ශුද්ධ කැප වස්තු සමූහයෙන්ද, පස්මරුන් දිනූ ගෞතම ජිනෙන්ද්‍රයන් වහන්සේ විසින්

දේශනා කරන ලද, පච්ඡාජාත ප්‍රත්‍යය ඥාණයට කෙලෙස් නැසීම පිණිස භක්ත්‍යාදරයෙන් පූජා කරමි. පූජා වේවා!

සාධු! සාධු !! සාධු !!!

## පච්ඡාජාත ප්‍රත්‍ය ඥාණ වන්දනාව

**සෝ භගවා ඉතිපි පච්ඡාජාත පච්චයේ ඥාණේන සමන්නාගතෝ. පච්ඡාජාත පච්චයේ ඥාණේන සමන්නාගතෝ වත සෝ භගවා. තං භගවන්තං පච්ඡාජාත පච්චයේ ඥාණේන සමන්නාගතං සරණං ගච්ඡාමි. තං භගවන්තං පච්ඡාජාත පච්චයේ ඥාණේන සමන්නාගතං සිරසා නමාමි.**

ඒ භාග්‍යවතුන් වහන්සේ, මෙසේ ද පච්ඡාජාත ප්‍රත්‍යය ඥාණයෙන් සමන්නාගත වන සේක. ඒ භාග්‍යවතුන් වහන්සේ ඒකාන්තයෙන් පච්ඡාජාත ප්‍රත්‍ය ඥාණයෙන් සමන්නාගත වන සේක. ඒ පච්ඡාජාත ප්‍රත්‍යය ඥාණයෙන් සමන්නාගත ඒ භාග්‍යවතුන් වහන්සේ මම සරණ යමි. ඒ පච්ඡාජාත ප්‍රත්‍යය ඥාණයෙන් සමන්නාගත භාග්‍යවතුන් වහන්සේට මම නමස්කාර කරමි. මාගේ නමස්කාරය වේවා!

සාධු! සාධු !! සාධු !!!



**11. පච්චාජාත පච්චයො ති, පච්ඡාජාතා චිත්ත චෙත සිකා ධම්මා පුරෙජාතස්ස ඉමස්ස කායස්ස පච්ඡාජාත පච්චයේන පච්චයෝ.**

## 12. ආසේවන ප්‍රත්‍ය ඥාණයට පූජාව

**දීපේහි ගන්ධ ධූපේහි - ගිලාන පච්ච යේහි ච**
**පුප්ඵාදි වත්‍ථු ජාතේහි - සුද්ධේහි කප්පි යේහි ච**
**ආසේවන පච්චයේ ඥාණං -දේසෙන්තං ගෝතමං ජිනං**
**කිලෙසාමය නාසාය - භත්‍යාදරේන පූජයේ**

''ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස'', හාත්පස අඳුර නසමින් බැබළෙන පහනින්ද, දසත පැතිරෙන මනහර සුගන්ධ ධූපයෙන්ද, අෂ්ඨපානාදී ප්‍රනීත ගිලන් පසෙන්ද, විසිතුරු මල් ආදි ශුද්ධ කැප වස්තු සමූහයෙන්ද, පස්මරුන් දිනූ ගෞතම ජිනේන්‍ද්‍රයන් වහන්සේ විසින් දේශනා කරන ලද, ආසේවන ප්‍රත්‍යය ඥාණයට කෙලෙස් නැසීම පිණිස භක්ත්‍යාදරයෙන් පූජා කරමි. පූජා වේවා!

සාධු! සාධු !! සාධු !!!

## ආසේවන ප්‍රත්‍ය ඥාණ වන්දනාව

**සෝ භගවා ඉතිපි ආසේවන පච්චයේ ඤාණේන සමන්නාගතෝ. ආසේවන පච්චයේ ඤාණේන සමන්නාගතෝ වත සෝ භගවා. තං භගවන්තං ආසේවන පච්චයේ ඤාණේන සමන්නාගතං සරණං ගච්ඡාමි. තං භගවන්තං ආසේවන පච්චයේ ඤාණේන සමන්නාගතං සිරසා නමාමි.**

ඒ භාග්‍යවතුන් වහන්සේ, මෙසේ ද ආසෙවන ප්‍රත්‍යය ඥාණයෙන් සමන්නාගත වන සේක. ඒ භාග්‍යවතුන් වහන්සේ ඒකාන්තයෙන් ආසෙවන ප්‍රත්‍ය ඥාණයෙන් සමන්නාගත වන සේක. ඒ ආසෙවන ප්‍රත්‍යය ඥාණයෙන් සමන්නාගත ඒ භාග්‍යවතුන් වහන්සේ මම සරණ යමි. ඒ ආසෙවන ප්‍රත්‍යය ඥාණයෙන් සමන්නාගත භාග්‍යවතුන් වහන්සේට මම නමස්කාර කරමි. මාගේ නමස්කාරය වේවා!

**සාධු! සාධු !! සාධු !!!**

**12. ආසේවන පච්චයෝ ති, පුරිමා පුරිමා කුසලා ධම්මා පච්ඡිමානං පච්ඡිමානං කුසලානං ධම්මානං ආසේවන පච්චයේන පච්චයෝ, පුරිමා පුරිමා අකුසලා ධම්මා පච්ඡිමානං පච්ඡිමානං අකුසලානං ධම්මානං ආසේවන පච්චයේන පච්චයෝ, පුරිමා පුරිමා අබ්‍යාකතා ධම්මා**



**පච්ඡිමානං පච්ඡිමානං අබ්‍යාකතානං ධම්මානං ආසේවන පච්චයේන පච්චයෝ.**

## 13. කම්ම ප්‍රත්‍ය ඥාණයට පූජාව

**දීපේහි ගන්ධ ධූපේහි - ගිලාන පච්ච යේහි ච**
**පුප්ඵාදි වත්‍ථු ජාතේහි - සුද්ධේහි කප්පි යේහි ච**
**කම්ම පච්චයේ ඤාණං - දෙසෙන්තං ගෝතමං ජිනං**
**කිලෙසාමය නාසාය - භත්‍යාදරේන පූජයේ**

''ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස'', හාත්පස අඳුර නසමින් බැබළෙන පහනින්ද, දසත පැතිරෙන මනහර සුගන්ධ ධූපයෙන්ද, අෂ්ඨපානාදී ප්‍රනීත ගිලන් පසෙන්ද, විසිතුරු මල් ආදි ශුද්ධ කැප වස්තු සමූහයෙන්ද, පස්මරුන් දිනූ ගෞතම ජිනෙන්‍ද්‍රයන් වහන්සේ විසින් දේශනා කරන ලද, කම්ම ප්‍රත්‍යය ඥාණයට කෙලෙස් නැසීම පිණිස භක්ත්‍යාදරයෙන් පූජා කරමි. පූජා වේවා!

**සාධු! සාධු !! සාධු !!!**

## කම්ම ප්‍රත්‍ය ඤාණ වන්දනාව

**සෝ භගවා ඉතිපි කම්ම පච්චයේ ඤාණේන සමන්නාගතෝ. කම්ම පච්චයේ ඤාණේන සමන්නාගතෝ වත සෝ භගවා. තං භගවන්තං කම්ම පච්චයේ ඤාණේන සමන්නාගතං සරණං ගච්ඡාමි. තං භගවන්තං කම්ම පච්චයේ ඤාණේන සමන්නාගතං සිරසා නමාමි.**

ඒ භාග්‍යවතුන් වහන්සේ, මෙසේ ද කම්ම ප්‍රත්‍යය ඤාණයෙන් සමන්නාගත වන සේක. ඒ භාග්‍යවතුන් වහන්සේ ඒකාන්තයෙන් කම්ම ප්‍රත්‍ය ඤාණයෙන් සමන්නාගත වන සේක. ඒ කම්ම ප්‍රත්‍යය ඤාණයෙන් සමන්නාගත ඒ භාග්‍යවතුන් වහන්සේ මම සරණ යමි. ඒ කම්ම ප්‍රත්‍යය ඤාණයෙන් සමන්නාගත භාග්‍යවතුන් වහන්සේට මම නමස්කාර කරමි. මාගේ නමස්කාරය වේවා!

සාධු! සාධු !! සාධු !!!

**13. කම්ම පච්චයෝ ති, කුසලාකුසලං කම්මං විපාකානං ඛන්ධානං කටත්තා ච රූපානං කම්මපච්චයේන පච්චයෝ, චෙතනා සම්පයුත්තකානං ධම්මානං තං සමුට්ඨානානඤ්ච රූපානං කම්ම පච්චයේන පච්චයෝ.**



## 14. විපාක ප්‍රත්‍ය ඤාණයට පූජාව

**දීපේහි ගන්ධ ධූපේහි - ගිලාන පච්ච යේහි ච
පුප්ඵාදි වත්‍ථු ජාතේහි - සුද්ධේහි කප්පි යේහි ච
විපාක පච්චයේ ඤාණං - දේසෙන්තං ගෝතමං ජිනං
කිලෙසාමය නාසාය - භත්‍යාදරේන පූජයේ**

''ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස'', හාත්පස අඳුර නසමින් බැබළෙන පහනින්ද, දසත පැතිරෙන මනහර සුගන්ධ ධූපයෙන්ද, අෂ්ඨපානාදී ප්‍රනීත ගිලන් පසෙන්ද, විසිතුරු මල් ආදි ශුද්ධ කැප වස්තු සමූහයෙන්ද, පස්මරුන් දිනූ ගෞතම ජිනෙන්ද්‍රයන් වහන්සේ විසින් දේශනා කරන ලද, විපාක ප්‍රත්‍යය ඤාණයට කෙලෙස් නැසීම පිණිස භක්ත්‍යාදරයෙන් පූජා කරමි. පූජා වේවා!

සාධු! සාධු !! සාධු !!!

## විපාක ප්‍රත්‍ය ඤාණ වන්දනාව

**සෝ භගවා ඉතිපි විපාක පච්චයේ ඤාණේන සමන්නාගතෝ. විපාක පච්චයේ ඤාණේන සමන්නාගතෝ වත සෝ භගවා, තං භගවන්තං විපාක පච්චයේ ඤාණේන සමන්නාගතං සරණං ගච්ඡාමි. තං භගවන්තං විපාක පච්චයේ ඤාණේන සමන්නාගතං සිරසා නමාමි.**

ඒ භාග්‍යවතුන් වහන්සේ, මෙසේ ද විපාක ප්‍රත්‍යය ඥාණයෙන් සමන්නාගත වන සේක. ඒ භාග්‍යවතුන් වහන්සේ ඒකාන්තයෙන් විපාක ප්‍රත්‍ය ඥාණයෙන් සමන්නාගත වන සේක. ඒ විපාක ප්‍රත්‍යය ඥාණයෙන් සමන්නාගත ඒ භාග්‍යවතුන් වහන්සේ මම සරණ යමි. ඒ විපාක ප්‍රත්‍යය ඥාණයෙන් සමන්නාගත භාග්‍යවතුන් වහන්සේට මම නමස්කාර කරමි. මාගේ නමස්කාරය වේවා!

සාධු! සාධු !! සාධු !!!

**14. විපාක පච්චයෝ ති, විපාකා චත්තාරෝ ඛන්ධා අරූපිනෝ අඤ්ඤමඤ්ඤ විපාක පච්චයේන පච්චයෝ.**

## 15. ආහාර ප්‍රත්‍යය ඥාණ පූජාව

**දීපේහි ගන්ධ ධූපේහි - ගිලාන පච්ච යේහි ච**
**පුප්ඵාදි වත්ථු ජාතේහි - සුද්ධේහි කප්පි යේහි ච**
**ආහාර පච්චයේ ඤාණං - දේසෙන්තං ගෝතමං ජිනං**
**කිලෙසාමය නාසාය - භත්‍යාදරේන පූජයේ**

''ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස'', හාත්පස අඳුර නසමින් බැබළෙන පහනින්ද, දසත පැතිරෙන මනහර සුගන්ධ ධූපයෙන්ද, අෂ්ඨපානාදී ප්‍රනීත ගිලන් පසෙන්ද, විසිතුරු මල් ආදි ශුද්ධ කැප වස්තු සමූහයෙන්ද, පස්මරුන්



දිනූ ගෞතම ජිනේන්ද්‍රයන් වහන්සේ විසින් දේශනා කරන ලද, ආහාර ප්‍රත්‍යය ඥාණයට කෙලෙස් නැසීම පිණිස භක්ත්‍යාදරයෙන් පූජා කරමි. පූජා වේවා!

සාධු! සාධු !! සාධු !!!

## ආහාර ප්‍රත්‍ය ඥාණ වන්දනාව

**සෝ භගවා ඉතිපි ආහාර පච්චයේ ඤාණේන සමන්නාගතෝ. ආහාර පච්චයේ ඤාණේන සමන්නාගතෝ වත සෝ භගවා, තං භගවන්තං ආහාර පච්චයේ ඤාණේන සමන්නාගතං සරණං ගච්ඡාමි. තං භගවන්තං ආහාර පච්චයේ ඤාණේන සමන්නාගතං සිරසා නමාමි.**

ඒ භාග්‍යවතුන් වහන්සේ, මෙසේ ද ආහාර ප්‍රත්‍යය ඥාණයෙන් සමන්නාගත වන සේක. ඒ භාග්‍යවතුන් වහන්සේ ඒකාන්තයෙන් ආහාර ප්‍රත්‍ය ඥාණයෙන් සමන්නාගත වන සේක. ඒ ආහාර ප්‍රත්‍යය ඥාණයෙන් සමන්නාගත ඒ භාග්‍යවතුන් වහන්සේ මම සරණ යමි. ඒ ආහාර ප්‍රත්‍යය ඥාණයෙන් සමන්නාගත භාග්‍යවතුන් වහන්සේට මම නමස්කාර කරමි. මාගේ නමස්කාරය වේවා!

සාධු! සාධු !! සාධු !!!

15. ආහාර පච්චයෝති, කබලිංකාරෝ ආහාරෝ ඉමස්ස කායස්ස ආහාර පච්චයේන පච්චයෝ, අරූපිනෝ ආහාර සම්පයුත්තකානං ධම්මානං තං සමුට්ඨානානඤ්ච රූපානං ආහාර පච්චයේන පච්චයෝ.

## 16. ඉන්ද්‍රිය ප්‍රත්‍ය ඤාණයට පූජාව

දීපේහි ගන්ධ ධූපේහි - ගිලාන පච්ච යේහි ච
පුප්ඵාදි වත්ථු ජාතේහි - සුද්ධේහි කප්පි යේහි ච
ඉන්ද්‍රිය පච්චයේ ඤාණං - දේසෙන්තං ගෝතමං ජිනං
කිලෙසාමය නාසාය - භත්‍යාදරේන පූජයේ

"ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස" හාත්පස අඳුර නසමින් බැබළෙන පහනින්ද, දසත පැතිරෙන මනහර සුගන්ධ ධූපයෙන්ද, අෂ්ඨපානාදී ප්‍රනීත ගිලන් පසෙන්ද, විසිතුරු මල් ආදි ශුද්ධ කැප වස්තු සමූහයෙන්ද, පස්මරුන් දිනූ ගෞතම ජිනෙන්ද්‍රයන් වහන්සේ විසින් දේශනා කරන ලද, ඉන්ද්‍රිය ප්‍රත්‍යය ඤාණයට කෙලෙස් නැසීම පිණිස භක්ත්‍යාදරයෙන් පූජා කරමි. පූජා වේවා!

සාධු! සාධු !! සාධු !!!



## ඉන්ද්‍රිය ප්‍රත්‍ය ඤාණ වන්දනාව

සෝ භගවා ඉතිපි ඉන්ද්‍රිය පච්චයේ ඤාණේන සමන්නාගතෝ. ඉන්ද්‍රිය පච්චයේ ඤාණේන සමන්නාගතෝ වත සෝ භගවා. තං භගවන්තං ඉන්ද්‍රිය පච්චයේ ඤාණේන සමන්නාගතං සරණං ගච්ඡාමි. තං භගවන්තං ඉන්ද්‍රිය පච්චයේ ඤාණේන සමන්නාගතං සිරසා නමාමි.

ඒ භාග්‍යවතුන් වහන්සේ, මෙසේ ද ඉන්ද්‍රිය ප්‍රත්‍යය ඤාණයෙන් සමන්නාගත වන සේක. ඒ භාග්‍යවතුන් වහන්සේ ඒකාන්තයෙන් ඉන්ද්‍රිය ප්‍රත්‍ය ඤාණයෙන් සමන්නාගත වන සේක. ඒ ඉන්ද්‍රිය ප්‍රත්‍යය ඤාණයෙන් සමන්නාගත ඒ භාග්‍යවතුන් වහන්සේ මම සරණ යමි. ඒ ඉන්ද්‍රිය ප්‍රත්‍යය ඤාණයෙන් සමන්නාගත භාග්‍යවතුන් වහන්සේට මම නමස්කාර කරමි. මාගේ නමස්කාරය වේවා!

සාධු! සාධු !! සාධු !!!

16. ඉන්ද්‍රිය පච්චයෝ ති, චක්ඛුන්ද්‍රියං චක්ඛුවිඤ්ඤාණ ධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධම්මානං ඉන්ද්‍රිය පච්චයේන පච්චයෝ සෝතින්ද්‍රියං සෝතවිඤ්ඤාණ ධාතුයා තං සම්පයුත්තකාඤ්ච ධම්මානං ඉන්ද්‍රිය පච්චයේන පච්චයෝ, සාණින්ද්‍රියං සාණවිඤ්ඤාණ ධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධමමානං ඉන්ද්‍රිය පච්චයේන පච්චයෝ, ජිව්හින්ද්‍රියං

ජිව්හාවිඤ්ඤාණ ධාතුයා තං සම්පයුත්කානඤ්ච ධම්මානං ඉන්ද්‍රිය පච්චයේන පච්චයෝ, කායින්ද්‍රියං කායවිඤ්ඤාණ ධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධම්මානං ඉන්ද්‍රිය පච්චයේන පච්චයෝ රූප ජීවිතින්ද්‍රියං කටත්තා රූපානං ඉන්ද්‍රිය පච්චයේන පච්චයෝ, අරූපිනෝ ඉන්ද්‍රිය සම්පයුත්තකානං ධම්මානං තං සමුට්ඨානානඤ්ච රූපානං ඉන්ද්‍රිය පච්චයේන පච්චයෝ.

## 17. ඣාන ප්‍රත්‍ය පූජාව

දීපේහි ගන්ධ ධූපේහි - ගිලාන පච්ච යේහි ච
පුප්ඵාදි වත්‍ථු ජාතේහි - සුද්ධේහි කප්පි යේහි ච
ඣාන පච්චයේ ඤාණං - දේසෙන්තං ගෝතමං ජිනං
කිලෙසාමය නාසාය - භත්‍යාදරේන පූජයේ

''ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස'', හාත්පස අඳුර නසමින් බැබළෙන පහනින්ද, දසත පැතිරෙන මනහර සුගන්ධ ධූපයෙන්ද, අෂ්ඨපානාදී ප්‍රනීත ගිලන් පසෙන්ද, විසිතුරු මල් ආදි ශුද්ධ කැප වස්තු සමූහයෙන්ද, පස්මරුන් දිනූ ගෞතම ජිනේන්‍ද්‍රයන් වහන්සේ විසින් දේශනා කරන ලද, ඣාන ප්‍රත්‍යය ඤාණයට කෙලෙස් නැසීම පිණිස භක්ත්‍යාදරයෙන් පූජා කරමි. පූජා වේවා!

සාධු! සාධු !! සාධු !!!



## ඣාන ප්‍රත්‍ය ඤාණ වන්දනාව

සෝ භගවා ඉතිපි ඣාන පච්චයේ ඤාණේන සමන්නාගතෝ. ඣාන පච්චයේ ඤාණේන සමන්නාගතෝ වත සෝ භගවා. තං භගවන්තං ඣාන පච්චයේ ඤාණේන සමන්නාගතං සරණං ගච්ඡාමි. තං භගවන්තං ඣාන පච්චයේ ඤාණේන සමන්නාගතං සිරසා නමාමි.

ඒ භාග්‍යවතුන් වහන්සේ, මෙසේ ද ඣාන ප්‍රත්‍යය ඤාණයෙන් සමන්නාගත වන සේක. ඒ භාග්‍යවතුන් වහන්සේ ඒකාන්තයෙන් ඣාන ප්‍රත්‍ය ඤාණයෙන් සමන්නාගත වන සේක. ඒ ඣාන ප්‍රත්‍යය ඤාණයෙන් සමන්නාගත ඒ භාග්‍යවතුන් වහන්සේ මම සරණ යමි. ඒ ඣාන ප්‍රත්‍යය ඤාණයෙන් සමන්නාගත භාග්‍යවතුන් වහන්සේට මම නමස්කාර කරමි. මාගේ නමස්කාරය වේවා!

සාධු! සාධු !! සාධු !!!

17. ඣාන පච්චයෝ ති, ඣානඞ්ගානි ඣාන සම්පයුත්තකානං ධම්මානං තං සමුට්ඨානානඤ්ච රූපානං ඣාන පච්චයේන පච්චයෝ.

## 18. මග්ග ප්‍රත්‍ය ඤාණයට පූජාව

**දීපේහි ගන්ධ ධූපේහි - ගිලාන පච්ච යේහි ච**
**පුප්ඵාදි වත්‍ථු ජාතේහි - සුද්ධේහි කප්පි යේහි ච**
**මග්ග පච්චයේ ඤාණං - දෙසේනතං ගෝතමං ජිනං**
**කිලෙසාමය නාසාය - භත්‍යාදරේන පූජයේ**

''ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස'', හාත්පස අඳුර නසමින් බැබළෙන පහනින්ද, දසත පැතිරෙන මනහර සුගන්ධ ධූපයෙන්ද, අෂ්ඨපානාදී ප්‍රනීත ගිලන් පසෙන්ද, විසිතුරු මල් ආදි ශුද්ධ කැප වස්තු සමූහයෙන්ද, පස්මරුන් දිනූ ගෞතම ජිනෙන්‍ද්‍රයන් වහන්සේ විසින් දේශනා කරන ලද, මගග ප්‍රත්‍යය ඤාණයට කෙලෙස් නැසීම පිණිස භක්ත්‍යාදරයෙන් පූජා කරමි. පූජා වේවා!

**සාධු! සාධු !! සාධු !!!**

### මග්ග ප්‍රත්‍ය ඤාණ වන්දනාව

**සෝ භගවා ඉතිපි මග්ග පච්චයේ ඤාණේන සමන්නාගතෝ. මග්ග පච්චයේ ඤාණේන සමන්නාගතෝ වත සෝ භගවා. තං භගවන්තං මග්ග පච්චයේ ඤාණේන සමන්නාගතං සරණං ගච්ඡාමි. තං භගවන්තං මග්ග පච්චයේ ඤාණේන සමන්නාගතං සිරසා නමාමි.**



ඒ භාග්‍යවතුන් වහන්සේ, මෙසේ ද මග්ග ප්‍රත්‍යය ඤාණයෙන් සමන්නාගත වන සේක. ඒ භාග්‍යවතුන් වහන්සේ ඒකාන්තයෙන් මග්ග ප්‍රත්‍ය ඤාණයෙන් සමන්නාගත වන සේක. ඒ මග්ග ප්‍රත්‍යය ඤාණයෙන් සමන්නාගත ඒ භාග්‍යවතුන් වහන්සේ මම සරණ යමි. ඒ මග්ග ප්‍රත්‍යය ඤාණයෙන් සමන්නාගත භාග්‍යවතුන් වහන්සේට මම නමස්කාර කරමි. මාගේ නමස්කාරය වේවා!

**සාධු! සාධු !! සාධු !!!**

**18. මග්ග පච්චයෝ ති, මග්ගඞ්ගානි මග්ග සම්පයුත්තකානං ධම්මානං තං සමුට්ඨානානඤ්ච රූපානං මග්ග පචචයේන පච්චයෝ.**

## 19. සම්ප්‍රයුත්ත ප්‍රත්‍ය ඤාණ පූජාව

**දීපේහි ගන්ධ ධූපේහි - ගිලාන පච්ච යේහි ච**
**පුප්ඵාදි වත්‍ථු ජාතේහි - සුද්ධේහි කප්පි යේහි ච**
**සම්පයුත්ත පච්චයේ ඤාණං - දේසෙන්තං ගෝතමං ජිනං**
**කිලෙසාමය නාසාය - භත්‍යාදරේන පූජයේ**

''ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස'', හාත්පස අඳුර නසමින් බැබළෙන පහනින්ද, දසත පැතිරෙන මනහර සුගන්ධ ධූපයෙන්ද, අෂ්ඨපානාදී ප්‍රනීත ගිලන් පසෙන්ද විසිතුරු මල්

ආදි ශුද්ධ කැප වස්තු සමූහයෙන්ද, පස්මරුන් දිනූ ගෞතම ජිනේන්ද්‍රයන් වහන්සේ විසින් දේශනා කරන ලද, සම්පයුත්ත ප්‍රත්‍යය ඥාණයට කෙලෙස් නැසීම පිණිස භක්ත්‍යාදරයෙන් පූජා කරමි. පූජා වේවා!

## සම්පයුත්ත ප්‍රත්‍ය ඥාණ වන්දනාව

**සෝ භගවා ඉතිපි සම්පයුත්ත පච්චයේ ඤාණේන සමන්නාගතෝ සම්පයුත්ත පච්චයේ ඤාණේන සමන්නාගතෝ වත සෝ භගවා, තං භගවන්තං සම්පයුත්ත පච්චයේ ඤාණේන සමන්නාගතං සරණං ගච්ඡාමි. තං භගවන්තං සම්පයුත්ත පච්චයේ ඤාණේන සමන්නාගතං සිරසා නමාමි.**

ඒ භාග්‍යවතුන් වහන්සේ, මෙසේ ද සම්පයුත්ත ප්‍රත්‍යය ඥාණයෙන් සමන්නාගත වන සේක. ඒ භාග්‍යවතුන් වහන්සේ ඒකාන්තයෙන් සම්පයුක්ත ප්‍රත්‍ය ඥාණයෙන් සමන්නාගත වන සේක. ඒ සම්පයුක්ත ප්‍රත්‍යය ඥාණයෙන් සමන්නාගත ඒ භාග්‍යවතුන් වහන්සේ මම සරණ යමි. ඒ සම්පයුක්ත ප්‍රත්‍යය ඥාණයෙන් සමන්නාගත භාග්‍යවතුන් වහන්සේට මම නමස්කාර කරමි. මාගේ නමස්කාරය වේවා!

**සාධු! සාධු !! සාධු !!!**



**19. සම්පයුත්ත පච්චයෝ ති, චත්තාරෝ ඛන්ධා අරූපිනෝ අඤ්ඤමඤ්ඤ සම්පයුත්ත පච්චයේන පච්චයෝ.**

## 20. විප්පයුත්ත ප්‍රත්‍ය ඥාණ පූජාව

**දීපේහි ගන්ධ ධූපේහි - ගිලාන පච්ච යේහි ච**
**පුප්ඵාදි වත්ථු ජාතේහි - සුද්ධේහි කප්පි යේහි ච**
**විප්පයුත්ත පච්චයේ ඤාණං - දෙසෙන්තං ගෝතමං ජිනං**
**කිලෙසාමය නාසාය - භත්‍යාදරේන පූජයේ**

''ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස'', හාත්පස අඳුර නසමින් බැබළෙන පහනින්ද, දසත පැතිරෙන මනහර සුගන්ධ ධූපයෙන්ද, අෂ්ඨපානාදී ප්‍රනීත ගිලන් පසෙන්ද, විසිතුරු මල් ආදි ශුද්ධ කැප වස්තු සමූහයෙන්ද, පස්මරුන් දිනූ ගෞතම ජිනේන්ද්‍රයන් වහන්සේ විසින් දේශනා කරන ලද, විප්පයුතත ප්‍රත්‍යය ඥාණයට කෙලෙස් නැසීම පිණිස භක්ත්‍යාදරයෙන් පූජා කරමි. පූජා වේවා!

**සාධු! සාධු !! සාධු !!!**

## විප්පයුත්ත ප්‍රත්‍ය ඤාණ වන්දනාව

**සෝ භගවා ඉතිපි විප්පයුත්ත පච්චයේ ඤාණේන සමන්නාගතෝ. විප්පයුත්ත පච්චයේ ඤාණේන සමන්නාගතෝ වත සෝ භගවා. තං භගවන්තං විප්පයුත්ත පච්චයේ ඤාණේන සමන්නාගතං සරණං ගච්ඡාමි. තං භගවන්තං විප්පයුත්ත පච්චයේ ඤාණේන සමන්නාගතං සිරසා නමාමි.**

ඒ භාග්‍යවතුන් වහන්සේ, මෙසේ ද විප්පයුත්ත ප්‍රත්‍යය ඤාණයෙන් සමන්නාගත වන සේක. ඒ භාග්‍යවතුන් වහන්සේ ඒකාන්තයෙන් විප්පයුත්ත ප්‍රත්‍ය ඤාණයෙන් සමන්නාගත වන සේක. ඒ විප්පයුත්ත ප්‍රත්‍යය ඤාණයෙන් සමන්නාගත ඒ භාග්‍යවතුන් වහන්සේ මම සරණ යමි. ඒ සම්ප්පයුත්ත ප්‍රත්‍යය ඤාණයෙන් සමන්නාගත භාග්‍යවතුන් වහන්සේට මම නමස්කාර කරමි. මාගේ නමස්කාරය වේවා!

**සාධු! සාධු !! සාධු !!!**

**20. විප්පයුත්ත පච්චයෝ ති, රූපිනෝ ධම්මා අරූපීනං ධම්මානං විප්පයුත්ත පච්චයෙන පච්චයෝ, අරූපිනෝ ධම්මා රූපීනං ධම්මානං විප්පයුත්ත පච්චයේන පච්චයෝ.**



## 21.අත්ථි ප්‍රත්‍ය ඤාණ පූජාව

**දීපේහි ගන්ධ ධූපේහි - ගිලාන පච්ච යේහි ච**
**පුප්ඵාදි වත්‍ථු ජාතේහි - සුද්ධේහි කප්පි යේහි ච**
**අත්ථි පච්චයේ ඤාණං - දේසෙන්තං ගෝතමං ජිනං**
**කිලෙසාමය නාසාය - භත්‍යාදරේන පූජයේ**

''ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස'', හාත්පස අඳුර නසමින් බැබළෙන පහනින්ද, දසත පැතිරෙන මනහර සුගන්ධ ධූපයෙන්ද, අෂ්ඨපානාදී ප්‍රනීත ගිලන් පසෙන්ද, විසිතුරු මල් ආදි ශුද්ධ කැප වස්තු සමූහයෙන්ද, පස්මරුන් දිනූ ගෞතම ජිනෙන්ද්‍රයන් වහන්සේ විසින් දේශනා කරන ලද, අත්ථි ප්‍රත්‍යය ඤාණයට කෙලෙස් නැසීම පිණිස භක්ත්‍යාදරයෙන් පූජා කරමි. පූජා වේවා!

**සාධු! සාධු!! සාධු!!!**

## අත්ථි ප්‍රත්‍ය ඤාණ වන්දනාව

**සෝ භගවා ඉතිපි අත්ථි පච්චයේ ඤාණේන සමන්නාගතෝ. අත්ථි පච්චයේ ඤාණේන සමන්නාගතෝ වත සෝ භගවා. තං භගවන්තං අත්ථි පච්චයේ ඤාණේන සමන්නාගතං සරණං ගච්ඡාමි. තං භගවන්තං අත්ථි පච්චයේ ඤාණේන සමන්නාගතං සිරසා නමාමි.**

ඒ භාග්‍යවතුන් වහන්සේ, මෙසේ ද අත්ථි ප්‍රත්‍යය ඤාණයෙන් සමන්නාගත වන සේක. ඒ භාග්‍යවතුන් වහන්සේ ඒකාන්තයෙන් අත්ථි ප්‍රත්‍ය ඤාණයෙන් සමන්නාගත වන සේක. ඒ අත්ථි ප්‍රත්‍යය ඤාණයෙන් සමන්නාගත ඒ භාග්‍යවතුන් වහන්සේ මම සරණ යමි. ඒ අත්ථි ප්‍රත්‍යය ඤාණයෙන් සමන්නාගත භාග්‍යවතුන් වහන්සේට මම නමස්කාර කරමි. මාගේ නමස්කාරය වේවා!

සාධු! සාධු !! සාධු !!!

21. අත්ථි පච්චයෝ ති, චත්තාරෝ ඛන්ධා අරූපිනෝ අඤ්ඤමඤ්ඤං අත්ථි පච්චයේන පච්චයෝ, චත්තාරෝ මහාභූතා අඤ්ඤමඤ්ඤං අත්ථි පච්චයේන පච්චයෝ, ඔක්කන්තික්ඛණේ නාමරූපං අඤ්ඤමඤ්ඤං අත්ථි පච්චයේන පච්චයෝ, චිත්ත චෙතසිකා ධම්මා චිත්ත සමුට්ඨානානං රූපානං අත්ථි පච්චයේන පච්චයෝ, මහාභූතා උපාදාය රූපානං අත්ථි පච්චයේන පච්චයෝ.

චක්ඛායතනං චක්ඛුවිඤ්ඤාණ ධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධම්මානං අත්ථි පච්චයේන පච්චයෝ සෝතායතනං සෝතවිඤ්ඤාණ ධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධම්මානං අත්ථි පච්චයේන පච්චයෝ, ඝාණායතනං ඝාණවිඤ්ඤාණ ධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධම්මානං අත්ථි පච්චයේන පච්චයෝ,



ජිව්හායතනං ජිව්හාවිඤ්ඤාණ ධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධම්මානං අත්ථි පච්චයේන පච්චයෝ, කායායතනං කායවිඤ්ඤාණ ධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධම්මානං අත්ථි පච්චයේන පච්චයෝ.

රූපායතනං චක්ඛුවිඤ්ඤාණ ධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධම්මානං අත්ථි පච්චයේන පච්චයෝ, සද්දායතනං සෝතවිඤ්ඤාණ ධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධම්මානං අත්ථි පච්චයේන පච්චයෝ, ගන්ධායතනං ඝාණවිඤ්ඤාණ ධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධම්මානං අත්ථි පච්චයේන පච්චයෝ, රසායතනං ජිව්හාවිඤ්ඤාණ ධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධම්මානං අත්ථි පච්චයේන පච්චයෝ, ඵොට්ඨබ්බායතනං කාය විඤ්ඤාණධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධම්මානං අත්ථි පච්චයේන පච්චයෝ රූපායතනං සද්දායතනං ගන්ධායතනං රසායතනං ඵොට්ඨබ්බායතනං මනෝ ධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධම්මානං අත්ථි පච්චයේන පච්චයෝ, යං රූපං නිස්සාය මනෝධාතුච මනෝවිඤ්ඤාණ ධාතුච වත්තන්ති තං රූපං මනෝධාතුයා ච මනෝවිඤ්ඤාණ ධාතුයා ච තං සම්පයුත්තකානඤ්ච ධම්මානං අත්ථි පච්චයේන පච්චයෝ.

## 22. නත්ථි ප්‍රත්‍ය ඥාණයට පූජාව

**දීපේහි ගන්ධ ධූපේහි - ගිලාන පච්ච යේහි ච**
**පුප්ඵාදි වත්ථු ජාතේහි - සුද්ධේහි කප්පි යේහි ච**
**නත්ථි පච්චයේ ඤාණං - දේසෙන්තං ගෝතමං ජිනං**
**කිලේසාමය නාසාය - භත්‍යාදරේන පූජයේ**

''ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස'', හාත්පස අඳුර නසමින් බැබළෙන පහනින්ද, දසත පැතිරෙන මනහර සුගන්ධ ධූපයෙන්ද, අෂ්ඨපානාදී ප්‍රනීත ගිලන් පසෙන්ද, විසිතුරු මල් ආදි ශුද්ධ කැප වස්තු සමූහයෙන්ද, පස්මරුන් දිනූ ගෞතම ජිනේන්‍ද්‍රයන් වහන්සේ විසින් දේශනා කරන ලද, නත්ථි ප්‍රත්‍යය ඥාණයට කෙලෙස් නැසීම පිණිස භක්ත්‍යාදරයෙන් පූජා කරමි. පූජා වේවා!

**සාධු! සාධු !! සාධු !!!**

## නත්ථි ප්‍රත්‍ය ඥාණ වන්දනාව

**සෝ භගවා ඉතිපි නත්ථි පච්චයේ ඤාණේන සමන්නාගතෝ. නත්ථි පච්චයේ ඤාණේන සමන්නාගතෝ වත සෝ භගවා. තං භගවන්තං නත්ථි පච්චයේ ඤාණෙන් සමන්නාගතං සරණං ගච්ඡාමි. තං භගවන්තං නත්ථි පච්චයේ ඤාණේන සමන්නාගතං සිරසා නමාමි.**



ඒ භාග්‍යවතුන් වහන්සේ, මෙසේ ද නත්ථි ප්‍රත්‍යය ඥාණයෙන් සමන්නාගත වන සේක. ඒ භාග්‍යවතුන් වහන්සේ ඒකාන්තයෙන් නත්ථි ප්‍රත්‍ය ඥාණයෙන් සමන්නාගත වන සේක. ඒ නත්ථි ප්‍රත්‍යය ඥාණයෙන් සමන්නාගත ඒ භාග්‍යවතුන් වහන්සේ මම සරණ යමි. ඒ නත්ථි ප්‍රත්‍යය ඥාණයෙන් සමන්නාගත භාග්‍යවතුන් වහන්සේට මම නමස්කාර කරමි. මාගේ නමස්කාරය වේවා!

**සාධු! සාධු !! සාධු !!!**

**22. නත්ථි පච්චයෝ ති, සමනන්තර නිරුද්ධා චිත්ත චෙතසිකා ධම්මා පච්චුප්පන්නානං චිත්ත චෙතසිකානං ධම්මානං නත්ථි පච්චයේන පච්චයෝ.**

## 23. විගත ප්‍රත්‍ය ඥාණ පූජාව

**දීපේහි ගන්ධ ධූපේහි - ගිලාන පච්ච යේහි ච**
**පුප්ඵාදි වත්ථු ජාතේහි - සුද්ධේහි කප්පි යේහි ච**
**විගත පච්චයේ ඤාණං - දේසෙන්තං ගෝතමං ජිනං**
**කිලේසාමය නාසාය - භත්‍යාදරේන පූජයේ**

''ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස'', හාත්පස අඳුර නසමින් බැබළෙන පහනින්ද දසත පැතිරෙන මනහර සුගන්ධ ධූපයෙන්ද, අෂ්ඨපානාදී ප්‍රනීත ගිලන් පසෙන්ද විසිතුරු මල් ආදි ශුද්ධ කැප වස්තු සමූහයෙන්ද, පස්මරුන් දිනූ

ගෞතම ජිනේන්‍ද්‍රයන් වහන්සේ විසින් දේශනා කරන ලද, විගත ප්‍රත්‍යය ඥාණයට කෙලෙස් නැසීම පිණිස භක්ත්‍යාදරයෙන් පූජා කරමි. පූජා වේවා!

සාධු! සාධු !! සාධු !!!

## විගත ප්‍රත්‍ය ඥාණ වන්දනාව

**සෝ භගවා ඉතිපි විගත පච්චයේ ඥාණේන සමන්නාගතෝ. විගත පච්චයේ ඥාණේන සමන්නාගතෝ වත සෝ භගවා. තං භගවන්තං විගත පච්චයේ ඥාණේන සමන්නාගතං සරණං ගච්ඡාමි. තං භගවන්තං විගත පච්චයේ ඥාණේන සමන්නාගතං සිරසා නමාමි.**

ඒ භාග්‍යවතුන් වහන්සේ, මෙසේ ද විගත ප්‍රත්‍යය ඥාණයෙන් සමන්නාගත වන සේක. ඒ භාග්‍යවතුන් වහන්සේ ඒකාන්තයෙන් විගත ප්‍රත්‍ය ඥාණයෙන් සමන්නාගත වන සේක. ඒ විගත ප්‍රත්‍යය ඥාණයෙන් සමන්නාගත ඒ භාග්‍යවතුන් වහන්සේ මම සරණ යමි. ඒ විගත ප්‍රත්‍යය ඥාණයෙන් සමන්නාගත භාග්‍යවතුන් වහන්සේට මම නමස්කාර කරමි. මාගේ නමස්කාරය වේවා!

සාධු! සාධු !! සාධු !!!

**23. විගත පච්චයෝ ති, සමනන්තර විගතා චිත්ත චෙතසිකා ධම්මා පචුප්පන්නානං චිත්ත චෙතසිකානං ධම්මානං විගත පච්චයේන පච්චයෝ.**



## 24. අවිගත ප්‍රත්‍ය ඥාණ පූජාව

**දීපේහි ගන්ධ ධූපේහි - ගිලාන පච්ච යේහි ච**
**පුප්ඵාදි වත්‍ථු ජාතේහි - සුද්ධෛහි කප්පි යේහි ච**
**අවිගත පච්චයේ ඥාණං - දේසෙන්තං ගෝතමං ජිනං**
**කිලෙසාමය නාසාය - භත්‍යාදරේන පූජයේ**

''ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස'', හාත්පස අඳුර නසමින් බැබළෙන පහනින්ද, දසත පැතිරෙන මනහර සුගන්ධ ධූපයෙන්ද, අෂ්ඨපානාදී ප්‍රනීත ගිලන් පසෙන්ද, විසිතුරු මල් ආදි ශුද්ධ කැප වස්තු සමූහයෙන්ද, පස්මරුන් දිනූ ගෞතම ජිනෙන්‍ද්‍රයන් වහන්සේ විසින් දේශනා කරන ලද, අවිගත ප්‍රත්‍යය ඥාණයට කෙලෙස් නැසීම පිණිස භක්ත්‍යාදරයෙන් පූජා කරමි. පූජා වේවා!

**සාධු! සාධු !! සාධු !!!**

## අවිගත ප්‍රත්‍ය ඥාණ වන්දනාව

**සො භගවා ඉතිපි අවිගත පච්චයේ ඥාණේන සමන්නාගතෝ. අවිගත පච්චයේ ඥාණේන සමන්නාගතෝ වත සෝ භගවා. තං භගවන්තං අවිගත පච්චයේ ඥාණේන සමන්නාගතං සරණං ගච්ඡාමි. තං භගවන්තං අවිගත පච්චයේ ඥාණේන සමන්නාගතං සිරසා නමාමි.**

ඒ භාග්‍යවතුන් වහන්සේ, මෙසේ ද අවිගත

ප්‍රත්‍යය ඥාණයෙන් සමන්නාගත වන සේක. ඒ භාග්‍යවතුන් වහන්සේ ඒකාන්තයෙන් අවිගත ප්‍රත්‍ය ඥාණයෙන් සමන්නාගත වන සේක. ඒ අවිගත ප්‍රත්‍යය ඥාණයෙන් සමන්නාගත ඒ භාග්‍යවතුන් වහන්සේ මම සරණ යමි. ඒ අවිගත ප්‍රත්‍යය ඥාණයෙන් සමන්නාගත භාග්‍යවතුන් වහන්සේට මම නමස්කාර කරමි. මාගේ නමස්කාරය වේවා!

සාධු! සාධු !! සාධු !!!

24. අවිගත පච්චයෝ ති, චත්තාරෝ ඛන්ධා අරූපිනෝ අඤ්ඤමඤ්ඤං අවිගත පච්චයේන පච්චයෝ, චත්තාරෝ මහාභූතා අඤ්ඤමඤ්ඤං අවිගත පච්චයේන පච්චයෝ, ඔක්කන්තික්ඛණේ නාමරූපං අඤ්ඤමඤ්ඤං අවිගත පච්චයේන පච්චයෝ, චිත්ත චෙතසිකා ධම්මා චිත්ත සමුට්ඨානානං රූපානං අවිගත පච්චයේන පච්චයෝ, මහාභූතා උපාදාය රූපානං අවිගත පච්චයේන පච්චයෝ.

චක්ඛායතනං චක්ඛුවිඤ්ඤාණ ධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධම්මානං අවිගත පච්චයේන පච්චයෝ, සෝතායතනං සෝතවිඤ්ඤාණ ධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධම්මානං අවිගත පච්චයේන පච්චයෝ, ඝාණායතනං ඝාණවිඤ්ඤාණ ධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධම්මානං අවිගත පච්චයේන පච්චයෝ, ජිව්හායතනං ජිව්හාවිඤ්ඤාණ ධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධම්මානං අවිගත පච්චයේන



පච්චයෝ, කායායතනං කායවිඤ්ඤාණ ධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධම්මානං අවිගත පච්චයේන පච්චයෝ.

රූපායතනං චක්ඛුවිඤ්ඤාණ ධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධම්මානං අවිගත පච්චයේන පච්චයෝ, සද්දායතනං සොතවිඤ්ඤාණ ධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධම්මානං අවිගත පච්චයේන පච්චයෝ, ගන්ධායතනං ඝාණවිඤ්ඤාණ ධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධම්මානං අවිගත පච්චයේන පච්චයෝ, රසායතනං ජිව්හාවිඤ්ඤාණ ධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධම්මානං අවිගත පච්චයේන පච්චයෝ, ඵොට්ඨබ්බායතනං කායවිඤ්ඤාණ ධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධම්මානං අවිගත පච්චයේන පච්චයෝ, රූපායතනං සද්දායතනං ගන්ධායතනං රසායතනං ඵොට්ඨබ්බායතනං මනෝධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධම්මානං අවිගත පච්චයේන පච්චයෝ, යං රූපං මනෝධාතුයා ච මනෝවිඤ්ඤාණ ධාතුයා ච තං සම්පයුත්තකානඤ්ච ධම්මානං අවිගත පච්චයේන පච්චයෝති,

පච්චය නිද්දේ නිට්ඨිතෝ

සාධු! සාධු!! සාධු!!!

**විචිත්තමති ගම්භීර - මනන්ත නය මණ්ඩිතං**
**පට්ඨානං සම්මසන්තස්ස - විමලාමිත බුද්ධියා**
**යස්ස දෙහා නික්ඛමිංසු - සුභා ඡබ්බණ්ණ රංසියො**
**නීල පීතා රත්ත සේතා - මඤ්ජෙට්ඨාච පභස්සරා**
**තං ලොක නාථං සුගතං - ධම්මඤ්ච ජින සෙවිතං**
**සංඝං නිරංගණං සෙට්ඨං- නමාමි සිරසාදරං**
**ඒතේන සච්චේන සුවත්ථි හෝතු**

## සෙත් පිරිත්

**නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස**
**නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස**
**නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස**

ඒ භාග්‍යවත් වූ අර්හත් වූ ඒ සම්මා සම්බුදු රජාණන් වහන්සේට මාගේ නමස්කාරය වේවා.!
ඒ භාග්‍යවත් වූ අර්හත් වූ ඒ සම්මා සම්බුදු රජාණන් වහන්සේට මාගේ නමස්කාරය වේවා.!
ඒ භාග්‍යවත් වූ අර්හත් වූ ඒ සම්මා සම්බුදු රජාණන් වහන්සේට මාගේ නමස්කාරය වේවා.!



ඉතිපිසෝ භගවා අරහං සම්මා සම්බුද්ධෝ විජ්ජාචරණ සම්පන්නෝ සුගතෝ ලෝකවිදූ අනුත්තරෝ පුරිසදම්ම සාරථී සත්ථා දෙවමනුස්සානං බුද්ධෝ භගවාති
''ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස'' ඔබ වහන්සේ අර්හත්ය. සම්මා සම්බුද්ධය, විජ්ජාචරණ සම්පන්නය, සුගතය, ලෝකවිදූය, අනුත්තර පුරිස ධම්ම සාරථීය, සත්ථා දේව මනුස්සාණංය, බුද්ධය භගවාය.
ස්වාක්ඛාතෝ, භගවතෝ, ධම්මෝ සන්දිට්ඨිකෝ, අකාලිකෝ, ඒහිපස්සිකෝ, ඕපනයිකෝ, පච්චත්තං වෙදිතබ්බෝ විඤ්ඤූහීති

මුල මැද අග යහපත් බැවින් ස්වාක්ඛාත නම් වේ. තමාගේ මේ ජීවිතයේ දීම අවබෝධ කළ යුතු බැවින් සන්දිට්ඨික නම් වේ. කුසලයට අනතුරුවම ඵල විපාක ගෙන දෙන බැවින් අකාලික නම් වේ. මෙහි එව බලව කිය යුතු හෙයින් ඒහිපස්සික නම් වේ. නිර්වාණය අරමුණු කිරීම් වශයෙන් ඕපනයික නම් වේ. තමන්ගේම නැණ පමණින් අවබෝධ කළ බැවින් පච්චත්තං වේදිතබ්බො නම් වන සේක.

සුපටිපන්නෝ භගවතෝ සාවක සංඝෝ,
උජුපටිපන්නෝ භගවතෝ සාවක සංඝෝ,
ඤායපටිපන්නෝ භගවතෝ සාවක සංඝෝ,
සාමීචිපටිපන්නෝ භගවතෝ සාවක සංඝෝ,
යදිදං චත්තාරි පුරිස යුගානි අට්ඨපුරිස පුග්ගලා
ඒස භගවතෝ සාවක සංඝෝ, ආහුනෙය්‍යයෝ
පාහුනෙය්‍යයෝ දක්ඛිනෙය්‍යයෝ අංජලිකරණීයෝ
අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලෝකස්සාති

සුපටිපන්න ගුණයෙන්, උජුපටිපන්න ගුණයෙන්, ඤාය පටිපන්න ගුණයෙන්, සාමීචිපටිපන්න ගුණයෙන්, ආයුණෙය්‍ය ගුණයෙන්, පාහුනෙය්‍ය ගුණයෙන්, දක්ඛිනෙය්‍ය ගුණයෙන්, අඤ්ජලිකරණීය ගුණයෙන්, අනුත්තර පුඤ්ඤඛෙත්ත ගුණයෙන් යුක්ත වේ. (සම්‍යක් මාර්ගයට පිළිපන් හෙයින්, ඍජු ප්‍රතිපත්තියට පිළිපන් හෙයින්, නිවන් මාර්ගයට පිළිපන් හෙයින්, දුර සිට සිව්පස ගෙන දීමට සුදුසු හෙයින්ද, ආගන්තුක සත්කාරයන්ට සුදුසු හෙයින්ද, පින්ඵල අදහා යමක් පිරිනැමීමට සුදුසු හෙයින්ද, දොහොත් මුදුනේ තබා වැඳීමට සුදුසු වූ හෙයින් ද, ලෝක සත්ත්වයාට කුසල් වැපිරීමට උතුම් පින් කෙතක් වන හෙයින් ද යුක්ත වේ.)



ඒවං බුද්ධං සරන්තානං ධම්මං සංඝංච භික්ඛවෝ
භයංවා ඡම්භිචත්තංවා ලෝමහන්සෝවා
නහෙස්සතීති
ඒතේන සච්ච වජ්ජේන පාතු තං රතනත්තයං
ඒතේන සච්ච වජ්ජේන පාතු තං රතනත්තයං
ඒතේන සච්ච වජ්ජේන පාතු තං රතනත්තයං

මහණෙනි බුද්ධ රත්නයද, ධර්ම රත්නයද, සංඝ රත්නයද, මෙසේ සිහි කරන්නවුන්ට බියක්, තැති ගැනීමක්, ලොමු ඩැහැගැනීමක් නොවේ. එම රත්නත්‍රයේ සත්‍යානුභාව බලයෙන් ආරක්ෂාව පහළ වූවා වෙයි.

## මහා මංගල සූත්‍ර නිධානය

ලෝකයේ ඒ ඒ කාලවලදී කෝලාහලයන් ඇති වේ. මංගලයයි ඇති වුණු කෝලාහලය ''මංගල කෝලාහාලය'' ලෝක විනාශයේ දී ඇති වන කෝලාහලය '' කල්ප කෝලාහාලය'' සක්විති රජ කෙනෙකු පහළ වන විට ඇති වන කෝලාහලය ''සක්විති කෝලාහාලය'' බුදු කෙනෙකු පහළ වන විට ඇති වන කෝලාහාලය ''බුද්ධ කෝලාහලය'' මෙතනින් පෙන්නුම් කරන්නේ මංගල කෝලාහාලයයි.

එකල දඹදිව බොහෝ ජනයා එකතුව විවිධ බාහිර බොහෝ කථා, බොහෝ ධනය වියදම් කොට ප්‍රීතියෙන් යුක්තව ඒ කතාවන් අසන

සිරිතක් තිබුණි.

මේ කාලයේදී දඹදිව මිනිසුන් අතර මංගල නම් කුමක් දැයි පැන නැගුණු කථාවකි. යම් කෙනෙකු ඇසින් දුටු ප්‍රිය දෙය මංගල යැයි ද, තව කෙනෙකු කණට ඇසෙන දේ මංගල යැයිද, තව කෙනෙකු නාසයට දැනෙන දේ ප්‍රිය නම් මංගල යැයි ද, තව කෙනෙක් දිවට දැනෙන දේ ප්‍රිය නම් මංගල යයි ද, කයට දැනෙන දේ සුව පහසක් නම් මංගල යැයි ද, කීහ.

මෙසේ ඔවුන් අතර මේ විවාදය ඉතා බලවත් විය. තව සමහර අය රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ, ප්‍රිය වන්නාක් මෙන් අප්‍රිය විය හැකි යැයි නොයෙක් විතර්ක පහළ කළහ.

මෙසේ මිනිස් ලොවින් පැන නැගුණු විවාදය දෙව්ලොව දක්වාද, එයින් බඹ ලොව දක්වාද පැතිරෙන්නට විය. මිනිසුන්ද, දෙවි බඹුන් ද දෙකොටසක්වී මේ මංගල සිතුවිල්ලෙන් වෙහෙසට පත් වූහ. මෙසේ එය විසඳා ගන්නට බැරිව අවුරුදු දොළසක් ගත විය.

මේ අවස්ථාවේදී තව්තිසා වැසි දෙව් පිරිසක් එක්සත්ව මේ මංගලය විසඳා ගැනීම පිණිස සක්දෙව් රජුන්ගේ අවසරය පරිදි සර්වාභරණයෙන් සැරසී දෙවියන් බ්‍රහ්මයන් සමඟ බුදුරජාණන් වහන්සේ වෙත පැමිණ එක් ව්‍යත්ත ප්‍රතිබල දේවතාවෙක් මංගලය නම් කුමක් දැයි ගාථාවකින් විචාළ කළ මෙම මංගල සූත්‍රය දේශනා කළ සේක.



# මහා මංගල සූත්‍රයි

**ඒවං මේ සුතං ඒකං සමයං භගවා සාවත්ථියං විහරති ජේතවනේ අනාථපිණ්ඩිකස්ස ආරාමේ අථඛෝ අඤ්ඤතරා දේවතා අභික්කන්තාය රත්තියා අභික්කන්ත වණ්ණා කේවල කප්පං ජේතවනං ඔභාසෙත්වා යේන භගවා තේනුපසංකමි, උපසංකමිත්වා, භගවන්තං අභිවාදෙත්වා ඒකමංතං අට්ඨාසි. එකමංතං ඨිතා ඛෝ සා දේවතා භගවන්තං ගාථාය අජ්ඣභාසි**

මා විසින් මෙසේ අසන ලදී. එක සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර අනාථ පිණ්ඩික සිටුතුමා විසින් කරන ලද ජේතවනාරාමයෙහි වැඩ වාසය කරන කල්හි එක්තරා දිව්‍ය පුත්‍රයෙක් රාත්‍රිය ඉක්ම වූ කල්හි ඉතා විශිෂ්ඨ සෝභාසම්පන්නව මුළු ජේතවනාරාමය ශරීරාලෝකයෙන් බබුළුවාගෙන භාග්‍යවතුන් වහන්සේ යම් තැනක වැඩහුන් සේක් නම් එතනට එළඹ භාග්‍යවතුන් වහන්සේට වැඳ එකත්පසෙක සිට ගාථාවකින් මෙසේ කී සේක.

**1.බහුදේවා මනුස්සාච - මංගලානි අචින්තයුං**
**ආකංඛමානා සොත්ථානං - බ්‍රෑහි මංගල මුත්තමං**

මෙලොව පරලොව සැප කැමැති වන්නාවූ

බොහෝ දෙවියෝ ද, මනුෂ්‍යයෝ ද, මංගල කරුණු සිතූහ. ඒ උතුම් මංගල කරුණු වදාළ මැනව යැයි කීහ.

**2. අසේවනා ච බාලානං - පණ්ඩිතානං ච සේවනා**
**පූජා ච පූජනීයානං - ඒතං මංගල මුත්තමං**

බාලයන් (ගුණයෙන් බාල) සහ අසත්පුරුෂයන් සේවනය නොකිරීම, පණ්ඩිතයන් සහ සත්පුරුෂයන් සේවනය කිරීම, උතුම් පිදිය යුත්තන් පිදීම, උතුම් මංගල කරුණකි.

**3. පතිරූපදේස වාසෝ ච- පුබ්බේ ච කතපුඤ්ඤතා**
**අත්තසම්මාපණිධී ච - ඒතං මංගල මුත්තමං**

සුදුසු ප්‍රදේශයක විසීම, (තුණුරුවන් පවතින) පෙරපින කළ බවද, සිය ආත්මය දහමෙහි පිහිට වීමද, උතුම් මංගල කරුණකි.

**4. බාහු සච්චඤ්ච සිප්පඤ්ච -විනයෝ ච සුසික්ඛිතෝ**
**සුභාසිතා ච යා වාචා - ඒතං මංගල මුත්තමං**

බොහෝ ඇසූ පිරූ තැන් ඇති බවද, ශිල්පය දූන ගැනීමද, මනාව හික්මුණු විනය ඇති බවද, සුභාසිත වචනය කියන ලද (යහපත් වචනය) උතුම් මංගල කරුණකි.



**5. මාතාපිතු උපට්ඨානං - පුත්තදාරස්ස සංගහෝ**
**අනාකුලා ච කම්මන්තා - ඒතං මංගල මුත්තමං**

මව්පියන්ට උපස්ථාන කිරීමද, අඹුදරුවන්ට සංග්‍රහ කිරීමද, නිරවුල් කර්මාන්ත කිරීමද, උතුම් මංගල කරුණකි.

**6. දානංච ධම්මචරියා ච - ඤාතකානඤ්ච සංගහෝ**
**අනවජ්ජානි කම්මානි - ඒතං මංගල මුත්තමං**

දන්දීමද, දස කුසලයෙහි යෙදීමද (හැසිරීමද) ඥාතීන්ට සංග්‍රහ කිරීමද, නිවැරදි කර්මාන්ත කිරීමද, උතුම් මංගල කරුණකි.

**7. ආරති විරති පාපා - මජ්ජපානා ච සඤ්ඤමෝ**
**අප්පමාදෝ ච ධම්මේසු - ඒතං මංගල මුත්තමං**

පාපයෙහි නොඇලීමද, පාපයෙන් වෙන් වීමද, (වැළකීම) මත් පැනින් වැළකීමද, කුසල ධර්මයෙහි අප්‍රමාදව යෙදීමද මෙය උතුම් මංගල කරුණකි.

**8. ගාරවෝච නිවාතෝච - සන්තුට්ඨී ච කතඤ්ඤුතා**
**කාලේන ධම්ම සවණං - ඒතං මංගල මුත්තමං**

ගරු කළ යුත්තන්ට ගරු කිරීමද, නිහතමානී බවද, ලද දෙයින් සතුටු වීම, කළගුණ සැලකීම, කළගුණ දැනීම, සුදුසු කල්හි ධර්මය ඇසීමද, මෙය උතුම් මංගල කරුණකි.

**9. ඛන්තී ච සෝච වස්සතා -සමණානංච දස්සනං**
**කාලේන ධම්ම සාකච්ඡා - ඒතං මංගල මුත්තමං**

ඉවසීමද, කීකරු බවද (සුවච බවද) ශ්‍රමණයන් වහන්සේලා දැකීමද, සුදුසු කල්හි ධර්ම සාකච්ඡාවද මෙය උතුම් මංගල කරුණකි.

**10. තපෝච බ්‍රහ්මචරියා ච -අරිය සච්චාන දස්සනං**
**නිබ්බාන සච්ඡි කිරියා ච - ඒතං මංගල මුත්තමං**

තපසද (තපෝගුණයද) යහපත් හැසිරීමද, ආර්ය සත්‍ය දැකීමද, නිවන් අවබෝධ කිරීමද උතුම් මංගල කරුණකි.

**11.ඵුට්ඨස්ස ලෝකධම්මේහි-චිත්තං යස්ස න කම්පති**
**අසෝකං විරජං ඛෙමං - ඒතං මංගල මුත්තමං**

අෂ්ඨ ලෝක ධර්මයෙහි කම්පා නොවීමද (සැප දුක්, නින්දා ප්‍රසංසා, ලාභ අලාභ, යස අයස) සිත කම්පා නොවීම, සෝක නොවීම, රාගාදී කෙලෙස් නැති බව, භය නැති බව මෙය උතුම් මංගල කරුණකි.



**12. ඒතාදිසානි කත්වාන - සබ්බත්ථ මපරාජිතා**
**සබ්බත්ථ සොත්ථිං ගච්ඡන්ති- තං තේසං මංගල මුත්තමන්ති**

මෙම මංගල කරුණු හේතු කොට ගෙන සෑම තැනකදීම නොපැරදී, සියලු තැන්හි සැපයට පැමිණෙයි. මෙම කරුණු උතුම් මංගල මංගල්‍යයක් වේ.

**ඒතේන සච්ච වජ්ජේන හෝතු මේ ජයමංගලං**
**ඒතේන සච්ච වජ්ජේන හෝතු මේ ජයමංගලං**
**ඒතේන සච්ච වජ්ජේන හෝතු මේ ජයමංගලං**
මෙම සත්‍යයේ හේතුවෙන් උතුම් මංගල්ලයයක් වේවා!
මෙම සත්‍යයේ හේතුවෙන් උතුම් මංගල්ලයයක් වේවා!
මෙම සත්‍යයේ හේතුවෙන් උතුම් මංගල්ලයයක් වේවා!

## රතන සූත්‍ර නිධානය

රතන සූත්‍රය අන් අයගේ ආරක්ෂාව පිණිසත් අමනුෂ්‍යයන්ගේ උවදුරු වැළැක්වීම සඳහාත් දේශනා කරන ලදී.

අතීතයේ විශාලා මහ නුවර විශාල දුර්භික්ෂයක් විය. ආහාර හිඟවීම නිසා විශාල

මිනිසුන් ප්‍රමාණයක් මැරෙන්නට විය. එම මළ කුණු ගඳින් අමනුෂ්‍යයෝ නුවරට ඇතුල් වූහ. එයින් තවත් වැඩියෙන් මැරෙන්නට වූහ. එය හේතු කොට ගෙන 'අහිවාතක රෝගය' ඇති විය. එම නිසා දුර්භික්ෂ, අමනුෂ්‍ය, රෝග යන ත්‍රිවිධ භය ඇතිවිය. විශාලා මහ නුවර වැසියෝ මහත් දුකකට පත් වූහ. මේ බව නගරවාසී හූ රජවරුන්ගේ වරදක් දැයි විමසා, එසේ නොවේ යැයි දැන දීර්ඝ සාකච්ඡාවකින් පසු තථාගත බුදුරජාණන් වහන්සේ මේ නුවරට වැඩමවා ගතහොත් සියලු උපද්‍රව දුරුවේයැයි තීරණය කළහ. බිම්බිසාර රජතුමාගේ කැමැත්ත පරිදි ලිච්ඡවී රජවරු භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹ ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස විශාලා මහනුවර ත්‍රිවිධ භයකින් පෙළෙන අය රට වැසියන්ට (ජනතාවට) අනුකම්පා කොට රට වැසියන්ගේ නිදුක් නිරෝගී භාවය පිණිස අප නුවරට වඩින සේක් නම් ඉතා යහපත් වේ යැයි දන්වා සිටියහ.

තථාගතයන් වහන්සේ ලිච්ඡවී රජ දරුවන්ගේ ආරාධනය පිළිගෙන රතන සූත්‍රයෙහි අනුහසින් කෙළ ලක්ෂයන් සක්වලට ආරක්ෂාව සිදුවන බවත් විශාල පිරිසකට ධර්ම අවබෝධය වෙතැයි සලකා පන්සීයක් භික්ෂූන් වහන්සේලා සමඟ විශාලා මහ නුවරට වැඩම කළ සේක. ඒ සමඟම සිව් දිගින් කළුකොට නැගුණු මහ මේඝයෙන් ඇද හැලුණු මහ වර්ෂාවෙන් සියලු මළ කඳන් ගංගා නම් ගඟට



පාවී ගියේය. නගරය පිරිසිදු විය. බුදු පාමොක් සඟ රුවන විශාලා මහ නුවරට පිවිසෙත්ම සක් දෙවිඳු මහානුභාව සම්පන්න දෙවියන් සමඟ පැමිණියහ. ඔහුගේ පැමිණීම සමඟ අමනුෂ්‍යයෝ ක්‍රමයෙන් ඉවත් වී ගියේය. තථාගතයන් වහන්සේ නුවර දොරටුව අභියස සිට ආනන්ද හිමියන් අමතා ආනන්දය මෙම රතන සූත්‍රය දේශනා කරමින් ම විශාලා මහ නුවරටම පිරිත් පැන් ඉසින්න යැයි වදාළේය. සියලු අමනුෂ්‍යයෝ පළා ගියහ. නගරය මනාව ආරක්ෂාව ඇති විය. සියලු උවදුරු දුරු විය. මනුෂ්‍යයෝ සැපවත් වූහ. අසූහාරදහසක් දෙනාට ධර්මාභිසමය විය.

## රතන සූත්‍රය

**යානීධ භූතානි සමාගතානි**
**භුම්මානි වා යා නිව අන්තලික්ඛේ**
**සබ්බේව භූතා සුමනා භවන්තු**
**අථෝපි සක්කච්ච සුණන්තු භාසිතං**

පොළොවෙහිද, අහසෙහිද, යම් අමනුෂ්‍ය කෙනෙක් මෙහි රැස් වූවාහු ද, ඒ සියලු අමනුෂ්‍යයෝ සතුටු සිත් ඇත්තෝ වෙත්වා. මාගේ වචනය සකස් කොට අසත්වා.

තස්මා හි භූතා නිසාමේථ සබ්බේ
මෙත්තං කරෝථ මානුසියා පජාය
දිවා ච රත්තෝ ච හරන්ති යේ බලිං
තස්මා හි නේ රක්ඛථ අප්පමත්තා

අමනුෂ්‍යයනි, එසේ හෙයින් තොප සියලු දෙනා මාගේ වචනය අසව්. මිනිස් ප්‍රජාවට මෛත්‍රී වඩව්, යම් කෙනෙක් දිවා රාත්‍රියෙහි පුද පඬුරු එලවත් ද එසේ හෙයින් අප්‍රමාදව ඔවුන් රකිව්.

යං කිඤ්චි විත්තං ඉධ වා හුරං වා
සග්ගේසුවායං රතනං පණීතං
නනෝ සමං අත්‍ථි තථාගතේන
ඉදම්පි බුද්ධෙ රතනං පණීතං
එතේන සච්චේන සුවත්‍ථි හෝතු

මිනිස් ලොව, නා ලොව ආදී යම් ලොවක යම් ධනයක් වේද, ස්වර්ගයෙහි යම් කිසි උතුම් රත්නයක් වේද, ඔවුන් අතරින් තථාගතයන් වහන්සේට සමාන (රත්නයක්) කෙනෙක් නැත්තේය. බුදුරදුන් කෙරෙහි මේ රත්නභාවයද උතුම් ය. එම සත්‍යානුභාව බලයෙන් සෙතක් වේවා.!



ඛයං විරාගං අමතං පණීතං
යදජ්ඣගා සක්‍යමුනී සමාහිතෝ
නතේන ධම්මේන සමත්‍ථි කිඤ්චි
ඉදම්පි ධම්මේ රතනං පණීතං
ඒතේන සච්චේන සුවත්‍ථි හෝතු

එකග වූ සිත් ඇති ශාක්‍යමුනි වූ (බුදුරජාණන් වහන්සේ කෙලෙසුන් කෙරෙන් දුරු වූ හෙයින්) ක්‍ෂය නම් වූ රාගයෙන් වෙන් වූ මරණයක් නැති, යම් නිවනක් අවබෝධ කළේ ද, ඒ ධර්මයට සමාන කිසිවක් නැත්තේය. මේ ධර්ම රත්නය ඉතාම උතුම්ය. මේ උතුම් සත්‍යානුභාවයෙන් සත්‍යානුභාව බලයෙන් සෙතක් වේවා.

යං බුද්ධසෙට්ඨෝ පරිවණ්ණයි සුචිං
සමාධිමානන්තරිකඤ්ඤමාහු
සමාධිනා තේන සමෝන විජ්ජති
ඉදම්පි ධම්මේ රතනං පණීතං
ඒතේන සච්චේන සුවත්‍ථි හෝතු

බුද්ධ ශ්‍රේෂ්ඨ තෙමේ පිරිසිදු යම් ධර්ම මාර්ගයක් වර්ණනා කෙළේද, යම් මාර්ගයක් ආනන්තරික සමාධියක් යැයි කියයි ද, ඒ සමාධියට සමාන සමාධියක් නැත්තේය. ධර්ම රත්නය ඉතාම උතුම්ය. මේ උතුම් සත්‍යානුභාව බලයෙන් සෙතක් වේවා.!

**යේ පුග්ගලාඅට්ඨ සතං ප සත්ථා**
**චත්තාරි ඒතානි යුගානි හොන්තී**
**තේ දක්ඛිණෙය්‍යා සුගතස්ස සාවකා**
**ඒතේසු දින්නානි මහප්ඵලානි**
**ඉදම්පි සංඝෙ රතනං පණීතං**
**ඒතේන සච්චේන සුවත්ථි හෝතු**

සත්පුරුෂයන් විසින් පසන්නා ලද යම් ආර්ය පුද්ගලයෝ අට දෙනෙක් වෙත් ද, එකසිය අටක් ආර්ය පුද්ගලයෝ වෙත් ද, ඔවුන් අටදෙනා සතර යුගලයක් වේ. සුගතයන් වහන්සේගේ ශ්‍රාවක වූ ආර්ය පුද්ගලයෝ දක්ෂිණාවට සුදුසු වෙති. ඒ සත්‍යයන් කෙරෙහි දෙන ලද දානය මහත් ඵල ඇත්තේය. එම සංඝ රත්නය ඉතා උතුම්ය. මේ උතුම් සත්‍යානුභාවයෙන් සත්‍යානුභාව බලයෙන් සෙතක් වේවා.

**යේ සුප්පයුත්තා මනසා දළ්හේන**
**නික්ඛාමිනෝ ගෝතම සාසනම්හි**
**තේ පත්තිපත්තා අමතං විගය්හ**
**ලද්ධාමුධා නිබ්බුතිං භුඤ්ජමානා**
**ඉදම්පි සංඝෙ රතනං පණීතං**
**ඒතේන සච්චේන සුවත්ථි හෝතු**

යම් කෙනෙක් ස්ථිර වූ සිතින් මනාකොට යෙදුනා වූ ගෞතම ශාසනයෙහි කෙලෙසුන්ගෙන් මිදුනා වූද, නිවනට බැස නොමිලේම නිවන් සුවය



වළඳා රහත් ඵලයට පැමිණියේ ද මේ සංඝ රත්නය ඉතා උතුම්ය. සංඝ රත්නයේ සත්‍යානුභාවයෙන් සත්‍යානුභාව බලයෙන් සෙතක් වේවා.!

**යථින්දඛීලෝ පඨවිංසිතෝ සියා**
**චතුබ්භි වාතේහි අසම්ප කම්පියෝ**
**තථූපමං සප්පුරිසං වදාමි,**
**යෝ අරිය සච්චානි අවෙච්ච පස්සති**
**ඉදම්පි සංඝෙ රතනං පණීතං**
**ඒතේන සච්චේන සුවත්ථි හෝතු**

යම් සේ පොළොවෙහි යටට බැස ගත් ඉන්ද්‍රඛීලය. සිව්දිගින් හමන සුළඟින් කම්පා නොවෙයි. (සෙලවිය නොහැකි වේද) යම් ආර්ය පුද්ගලයෙක් ආර්ය සත්‍යය නුවණින් අවබෝධ කළේද, ඒ සත්පුරුෂ තෙමේ ඉන්ද්‍රඛීලය බඳු වේ යැයි කියමි. මේ සංඝ රත්නය ඉතා උතුම්ය. මේ උතුම් සත්‍යානුභාවයෙන් සත්‍යානුභාව බලයෙන් සෙතක් වේවා.

**යේ අරිය සච්චානි විභාවයන්ති**
**ගම්භීරපඤ්ඤේන සුදේසිතානි**
**කිඤ්චාපි තේ හොන්ති භුසප්පමත්තා**
**න තේ භවං අට්ඨමං ආදියන්ති**
**ඉදම්පි සංඝෙ රතනං පණීතං**
**ඒතේන සච්චේන සුවත්ථි හෝතු**

යම් සෝවාන් කෙනෙක් ගැඹුරු නුවණින් බුදුරජාණන් වහන්සේ විසින් මනා කොට දේශනා කරන ලද ආර්ය සත්‍යය අවබෝධ කෙරෙත්ද, ඔහු බෙහෙවින් නමුත් අට වෙනි ආත්මයක් නොගනී. එසේ හෙයින් මහා සංඝ රත්නය උතුම්ය. මේ උතුම් සත්‍යානුභාවයෙන් සත්‍යානුභාව බලයෙන් සෙතක් වේවා.

**සහාවස්ස දස්සනසම්පදාය**
**තයස්සු  ධම්මා ජහිතා භවන්ති**
**සක්කායදිට්ඨී විචිකිච්ඡිතඤ්ච**
**සීලබ්බතං වාපි යදත්ථි කිඤ්චි**
**චතූහ පායෙහි ච විප්පමුත්තෝ**
**ඡ චාභිඨානානි අභබ්බෝ කාතුං**
**ඉදම්පි සංඝේ රතනං පණීතං**
**ඒතේන සච්චේන සුවත්ථි හෝතු**

සෝවාන් පුද්ගලයාගේ දර්ශන සම්පත්තිය සමගම (සෝවාන් මග නුවණ පහළ වීම සමගම සක්කාය දිට්ඨී, විචිකිච්චාව, ශීලාවුතාදියක් වෙත් ද, ඒ සංයෝජන ධර්මයෝ තුන් දෙන දුරු කරන ලද්දාහු වෙත්, සතර අපායෙන් මිදුනේ වෙත්, සවදැරුම් පාප කර්මයෙන් කරන්නට නුසුදුසු වේ. එසේ හෙයින් මහා සංඝ රත්නය උතුම් වේ. මේ සත්‍යානුභාවයෙන් සත්‍යානුභාව බලයෙන් සෙතක් වේවා.



**කිඤ්චාපි සෝ කම්මං කරෝති පාපකං**
**කායේන වාචා උද චේතසා වා**
**අභබ්බෝ සෝ තස්ස පටිච්ඡාදාය**
**අභබ්බතා දිට්ඨ පදස්ස වුත්තා**
**ඉදම්පි සංඝේ රතනං පණීතං**
**ඒතේන සච්චේන සුවත්ථි හෝතු**

ඒ සෝවාන් පුද්ගලයා කයෙන්, වචනයෙන්, සිතින් කිසියම් පාප කර්මයක් කෙරේද, ඒ පාප කර්මය සැඟවීමට නොහැක්කේය. වරද සැගවීමෙහි අභාග්‍යයැයි බුදුරජාණන් වහන්සේ විසින් වදාරන ලදී. එම නිසා සංඝ රත්නය උතුම්ය. මේ සත්‍යානුභාවයෙන් සත්‍යානුභාව බලයෙන් සෙතක් වේවා.

**වනප්පගුබ්බේ යථා ඵුස්සිතග්ගේ**
**ගිම්හාන මාසේ පඨමස්මිං ගිම්හේ**
**තථූපමං ධම්මවරං අදේසයි**
**නිබ්බාණ ගාමිං පරමං හිතාය**
**ඉදම්පි බුද්ධේ රතනං පණීතං**
**ඒතේන සච්චේන සුවත්ථි හෝතු**

වන ලැහැබ ග්‍රීස්ම සෘතුවේ පළමු මාසයෙහි හෙවත් බක් මස සුපිපි ඇත්තේ යම් සේද, එසේම නිවන් පමුණුවන ධර්ම රත්නය නිවන් සුව පිණිසම ඒ බුදුරජාණන් වහන්සේ දෙසූ සේක. එම නිසා බුද්ධ රත්නය ඉතා උතුම්ය. මේ උතුම්

සත්‍යානුභාවයෙන් සත්‍යානුභාව බලයෙන් සෙතක් වේවා.

**වරෝ වරඤ්ඤූ වරදෝ වරාහරෝ**
**අනුත්තරෝ ධම්මවරං අදේසයි**
**ඉදම්පි බුද්ධෙ රතනං පණීතං**
**ඒතේන සච්චේන සුවත්ථි හෝතු**

උතුම් වූ නිවන දන්නා වූ, උතුම් වූ නිවන් දෙන්නා වූ, උතුම් නිවන් ගෙන හැර පාන්නා වූ, අනුත්තර වූ බුදුරජාණන් වහන්සේ උතුම් දහමක් දෙසන ලද්දේද එම බුද්ධ රත්නය ඉතා උතුම්ය. මේ සත්‍යානුභාවයෙන් සත්‍යානුභාව බලයෙන් සෙතක් වේවා.

**ඛීණං පුරාණං නවං නත්ථි සම්භවං**
**විරත්ත චිත්තා ආයතිකේ භවස්මිං**
**තේ ඛීණබීජා අවිරුළ්හිච්ඡන්දා**
**නිබ්බන්ති ධීරා යථා යම්පදීපෝ**
**ඉදම්පි සංඝේ රතනං පණීතං**
**ඒතේන සච්චේන සුවත්ථි හෝතු**

යම් රහතන් වහන්සේ නමකගේ පුරාණ කර්මය ක්‍ෂය වූයේ ද, අලුත් භවයක් නැත්තේද, මතු භවය කෙරෙහි නොඇලූ සිත් ඇත්තේ වේද, ක්‍ෂය වූ විඥාන සිත් ඇත්තේද, පුනරුත්පත්තියෙහි ආශාවන් නැති ධෛර්‍ය්‍ය සම්පන්න වූ ඒ රහතන් වහන්සේ වේ. පහන මෙන් පිරිනිවෙත්, මෙයද



මහා සංඝ රත්නය උතුම්ය. මේ සත්‍යානුභාවයෙන් සත්‍යානුභාව බලයෙන් සෙතක් වේවා.!

**යානීධ භූතානි සමාගතානි**
**භුම්මා නි වා යා නිව අන්තලික්ඛෙ**
**තථාගතං දේවමනුස්ස පූජිතං**
**බුද්ධං නමස්සාම සුවත්ථි හෝතු**

මෙතැන්හි රැස් උනාවූ පොළොවෙහි යම් අමනුෂ්‍ය කෙනෙක් ඇද්ද, අහසෙහි යම් අමනුෂ්‍ය කෙනෙක් ඇද්ද, එම සැමදෙනා දෙව් මිනිසුන් විසින් පුදන ලද තථාගතයන් වහන්සේ වූ බුදුරදුන් නමදිමු. මේ සත්‍යානුභාවයෙන් සත්‍යානුභාව බලයෙන් සෙතක් වේවා.!

**යානීධ භූතානි සමාගතානි**
**භුම්මා නි වා යා නිව අන්තලික්ඛෙ**
**තථාගතං දේවමනුස්ස පූජිතං**
**ධම්මං නමස්සාම සුවත්ථි හෝතු**

මෙතැන්හි රැස් උනාවූ පොළොවෙහි යම් අමනුෂ්‍ය කෙනෙක් ඇද්ද, අහසෙහි යම් අමනුෂ්‍ය කෙනෙක් ඇද්ද, එම සැමදෙනා දෙව් මිනිසුන් විසින් පුදන ලද තථාගතයන් වූ ධර්ම රත්නය නමදිමු. මේ සත්‍යානුභාවයෙන් සත්‍යානුභාව බලයෙන් සෙතක් වේවා.!

**යානීධ භූතානි සමාගතානි**
**භුම්මා නි වා යා නිව අන්තලික්ඛේ**
**තථාගතං දේවමනුස්ස පූජිතං**
**සංඝං නමස්සාම සුවත්ථි හෝතු**

මෙතැන්හි රැස් උනාවූ පොළොවෙහි යම් අමනුෂ්‍ය කෙනෙක් ඇද්ද, අහසෙහි යම් අමනුෂ්‍ය කෙනෙක් ඇද්ද, එම සැමදෙනා දෙව් මිනිසුන් විසින් පුදන ලද තථාගත වූ සංඝ රත්නය නමදිමු. මේ සත්‍යානුභාවයෙන් සත්‍යානුභාව බලයෙන් සෙතක් වේවා.!

**එතෙන සච්ච වජ්ජේන දුක්ඛා වූපසමෙන්තු මෙ (තෙ) ඒතේන සච්ච වජ්ජේන භයා වූපසමෙන්තු මෙ (තෙ) එතෙන සච්ච වජ්ජේන රොගා වූපසමෙන්තු මෙ (තෙ)**

ඒ සත්‍යානුබාව බලයෙන් මට දුක් ගිනි නැති වේවා.

ඒ සත්‍යානුබාව බලයෙන් මට භය ගිනි නැති වේවා.

ඒ සත්‍යානුබාව බලයෙන් මට රෝග ගිනි නැති වේවා.

(මෙහිදී අන්‍යයන් වෙනුවෙන් මේ වෙනුවට තෙ යනුවෙන් ද මට වෙනුවට ඔබට යනුවෙන් ද භාවිතා කරන්න)



# කරණීයමෙත්ත සූත්‍ර නිධානය

මෙම කරණීය මෙත්ත සූත්‍ර දේශනය අමනුෂ්‍යයන්ගෙන් සිදුවන උවදුරු වැළැක්වීම සඳහා දේශනා කරන ලදී.

බුදුරජාණන් වහන්සේ සැවැත් නුවර ජේතවනාරාමයේ වැඩ වසන සමයක සසර කළකිරුණු ස්වාමීන් වහන්සේලා පිරිසක් බුදුරජාණන් වහන්සේගෙන් කමටහන් ගෙන ඉතා සිත් කළු රමණීය වන ලැහැබකට පිවිසියාහ. එම සිල්වත් භික්ෂූන්ගේ ගුණානුභාවය නිසා ඒ වනයෙහි සිටි වන දේවතාවන්ට, වෘක්ෂ දේවතාවන්ට එම විමන්වල සිටිනට නොහැකි විය. මේ භික්ෂූන් වහන්සේලා ආගන්තුකව සිටිනු ඇතැයි සිතා විමන්වලින් බැස ඔබනොබ හැසිරෙන්නට විය. එහෙත් නොයෙන බව දැනගත් එම වෘක්ෂ වන දේවතාවෝ ඒ භික්ෂූන් වහන්සේලාට හිඳීමට නොහැකි වන සේ නොයෙක් බිය උපදවන අරමුණු පෙන්වූහ. බිය ගන්වන හඬ ඇති කළහ. නානාප්‍රකාර බියජනක රූප අරමුණු ඉපිද විය. ඉදිරියේ සිටින්නාක් මෙන් දැක්වූහ. භික්ෂූන් බියට පත්ව දුර්වර්ණ වූහ. නොයෙක් රෝගාබාධ ද ඇති විය. සිත එකඟ කර ගන්නට නොහැකි විය. ක්ලාන්තභාවයට පත් වූහ. මෙසේ එකිනෙකාගෙන් විමසූ කළ සැමදෙනා වහන්සේටම මෙවැනි උවදුරු ඇති බව දැනගත්

සංඝ ස්ථවිරයන් වහන්සේ භික්ෂූන් සමඟ සාකච්ඡා කොට වස් විසීමට වෙන ස්ථානයක් සඳහා යනු පිණිස භාග්‍යවතුන් වහන්සේට සැල කරණු මැනවියි කියා සියලු දෙනා වහන්සේම භාග්‍යවතුන් වහන්සේ සමීපයට ගොස් සියලු තොරතුරු දන්වා සිටියහ.

භාග්‍යවතුන් වහන්සේ ඒ සියලු තොරතුරු අසා මහණෙනි, ඔබලාගේ ජය භූමිය එම ස්ථානයැයි වදාරා ඔබලා පළමු ගමනේ දී හිස් අතින් එතනට ගියේ. දැන් මම ඔබලාට ආයුධයක් දෙන්නම් යැයි, සතුරාට පහර දිය යුතු කරණීය මෙත්ත සූත්‍රය දේශනා කර, පාඩම් කර භාවනා කර්මස්ථානයක් ලෙසද භාවිතා කළ යුතු යැයි උගන්වා එම ස්ථානයට ආපසු පිටත් කර හැරියේය. එම භික්ෂූන් වහන්සේලා සජ්ඣායනා කරමින්, සාකච්ඡා කරමින්, ධර්ම දේශනා කරමින්, කර්මස්ථානය ලෙස භාවනා කරමින් භාවනා වඩා පිං අනුමෝදන් කරමින් පුහුණු කළ විට අමනුෂ්‍ය බිය දුරු වේය. දෙවියෝ හිතවත් කම් දක්වන්නේ යැයි වදාළේ යැයි මෙම කරණීය මෙත්ත සූත්‍රය දේශනා කළ සේක.



# කරණීය මෙත්ත සූත්‍රය

**1. කරණීය මත්ථ කුසලේන**
**යංතං සන්තං පදං අභිසමෙච්ච**
**සක්කෝ උජූ ච සූජූ ච**
**සුවචෝ චස්ස මුදු අනතිමානී,**

ශාන්ත නිවනට පැමිණෙවන්නාහු විසින් යමක් කළ යුතු ද අභිවෘද්ධියට දක්ෂයා විසින් ඒ දෙය කළ යුතුය. දක්ෂයෙක් විය යුතුය. ඍජු විය යුතුය. මනාකොට ඍජු විය යුතුය. කීකරු විය යුතුය. මෘදු විය යුතුය. නිහතමානී විය යුතුය.

**2. සන්තුස්සකෝ ච සුභරෝච**
**අප්පකිච්චෝ ච සල්ලහුකවුත්ති,**
**සන්තින්ද්‍රියෝ ච නිපකෝ ච**
**අප්පගබ්භෝ කුලේසු අනනුගිද්ධෝ**

ලද දෙයින් සතුටු විය යුතුය. පහසුවෙන් පෝෂණය කළ යුතුය. ස්වල්ප වැඩ කටයුතු ඇති විය යුතුය. සැහැල්ලු පැවතුම් විය යුතුය. නුවණක් ඇති විය යුතුය. යටහත්භාවයෙන් සංවර විය යුතුය. කුලයන් කෙරෙහි නොයෙලිය යුතුය.

**3. නච බුද්ධං සමාචරේ**
**කිඤ්චි යේන විඤ්ඤූ පරේ උපවදෙය්‍යුං**
**සුඛිනෝ වා ඛෙමිනෝ හොන්තු**
**සබ්බේ සත්තා භවන්තු සුඛිතත්තා,**

යම් ක්‍රියාවකින් අන් නුවනැත්තෙක් නින්දා කෙරේද එබඳු ස්වල්ප වූ වරදක් නොකරන්නේය. සියලු සත්ත්වයෝ සැප ඇත්තෝ වෙත්වා. භය නැත්තෝ වෙත්වා. සුඛිත සිත් ඇත්තෝ වෙත්වා.

**4. යේ කේචි පාණභූතත්ථි**
**තසාවාථාවරා වා අනවසේසා,**
**දීඝාවා යේ මහන්තා වා**
**මජ්ඣිමා රස්ස කාණුකථූලා,**

කෙලෙස් ඇති බැවින් භයින් තැතිගත්තාහුද, නිර්භය හෙයින් (කෙලෙස් නැති) ස්ථාවර වූ ද, සියලු යම් කිසි සත්ත්ව කෙනෙක් වෙත් ද, දීර්ඝ ජාති ඇත්තා වූද, මහත් සිරුරු ඇති සත්ත්වයෝද, මධ්‍යම ප්‍රමාණයේ සිරුරු ඇත්තෝද, මිටි සිරුරු ඇත්තෝ ද, ඉතා සියුම් සිරුරු ඇති සත්ත්වයෝද, ස්ථූල සිරුරු ඇති සත්ත්වයෝද,

**5. දිට්ඨා වා යේව අද්දිට්ඨා**
**යේච දූරේ වසන්ති අවිදූරේ**
**භූතා වා සම්භවේසී වා**
**සබ්බේ සත්තා භවන්තු සුඛිතත්තා,**



ඇසට පෙනෙන සත්ත්වයෝද, නොපෙනෙන සත්ත්වයෝද, දුර ඉන්නා සත්ත්වයෝද, ළඟ සිටින සත්ත්වයෝද, ඉපදුන සත්ත්වයෝද, ඉපදෙන සත්ත්වයෝද, සියලු සත්ත්වයෝ සුඛිත සිත් ඇත්තෝ වෙත්වා, මෙත් වඩන්නාහ

**6. නපරෝ පරං නිකුබ්බේථ**
**නාතිමඤ්ඤේථ කත්ථචි නං කඤ්චි**
**බ්‍යාරෝසනා පටිඝසඤ්ඤා**
**නාඤ්ඤ මඤ්ඤස්ස දුක්ඛමිච්ඡෙය්‍ය**

කෙනෙක් අනෙකෙකු නොරවටන්නේය. අනෙකෙකුට අවමන් නොකරන්නේය. කාය වාක් විකාරයෙන්, කෝපයෙන් පටිඝ සංඥාවෙන් අන් කෙනෙක් අන්කෙනෙකුට දුකක් නොකැමැති වන්නේය.

**7. මාතා යථා නියං පුත්තං**
**ආයුසා එකපුත්තමනුරක්ඛේ**
**එවම්පි සබ්බභූතේසු**
**මානසංභාවයේ අපරිමානං**

යම් මවක් තමාගේ ඇති එකම පුතු දිවි හිමියෙන් රකීද, එසේම සැම සතුන් කෙරෙහි අප්‍රමාණ වූ මෛත්‍රී සිතක් වඩන්නේය.

**8. මෙත්තංච සබ්බ ලෝකස්මිං**
**මාන සංභාවයේ අපරිමාණං**
**උද්ධං අධෝ ච තිරියඤ්ච**
**අසම්බාධං අවේරං අසපත්තං**

උඩ, යට, සරස සම්බාධ නැතිව, වෛර නැතිව, සතුරන් නැතිව, සියලු සත්ත්වයන් කෙරෙහි අප්‍රමාණ මෛත්‍රී සහගත සිතක් වඩන්නේය.

**9. තිට්ඨං චරං නිසින්නෝවා**
**සයානෝවා යාව තස්ස විගත මිද්ධෝ,**
**ඒතං සතිං අධිට්ඨෙය්‍ය**
**බ්‍රහ්මමේතං විහාරං ඉධමාහු**

සිටින්නේ, ඇවිදින්නේ, හිඳින්නේ, සයනය කරන්නේ, යම්තාක් නොනිදාද (ඒ තාක්) මේ මෛත්‍රී සහගත සිහිය අධිෂ්ඨාන කරන්නේ, මේ ශාසනයෙහි බ්‍රහම විහාරයයි (බුද්ධාදී උතුමෝ කියත්)

**10. දිට්ඨීඤ්ච අනුපගම්ම සීලවා**
**දස්සනේන සම්පන්නෝ,**
**කාමේසු විනෙය්‍යගේධං**
**නහි ජාතු ගබ්භසෙය්‍යං පුනරේතීති**



මිත්‍යාදෘෂ්ටියට නොපැමිණි සිල්වත් වූයේ, දර්ශනයෙන් යුක්ත වූයේ, කාම යන්හි ගිජුබව දුරු කොට ඒකාන්තයෙන් මව්කුස පිළිසිඳ ගැනීමට නැවත නොයෙන්නේය.

**ඒතේන සච්ච වජ්ජේන සොත්ථි මේ (තෙ) හෝතු සබ්බදා**
**ඒතේන සච්ච වජ්ජේන සොත්ථි මේ (තෙ) හෝතු සබ්බදා**
**ඒතේන සච්ච වජ්ජේන සොත්ථි මේ (තෙ) හෝතු සබ්බදා**

ඒ සත්‍යානුභාව බලයෙන් මට (ඔබට) යහපතක්ම වේවා!
ඒ සත්‍යානුභාව බලයෙන් මට (ඔබට) යහපතක්ම වේවා!
ඒ සත්‍යානුභාව බලයෙන් මට (ඔබට) යහපතක්ම වේවා!

## ධම්මචක්කප්පවත්තන සූත්‍ර නිදානය

සාරා සංඛ්‍ය කල්ප ලක්ෂයක් දස පාරමී ධර්මයන් සම්පූර්ණ කරමින් දඹදිව බුද්ධගයා ශුද්ධ භූමියේ දී සපරි වාර මාර පරාජය කොට ලොව්තුරා බුද්ධත්වයට පත් වීමෙන් පසු සත්සතිය ගත කොට කිරිපලු රුක මුලින් නැගිට අජපාල නුගරුක මුල

වැඩ ඉන්නා වූ භාග්‍යවතුන් වහන්සේට සංකල්පනාවක් පහළ විය. මා අවබෝධ කරගත් දහම ඉතා ගැඹුරුය. සුවසේ දැකිය නොහැකිය. සුවසේ අවබෝධ නොකළ හැකිය. මා අවබෝධ කළ ධර්මය ඉතාමත් ශාන්තයි, ප්‍රණීතයි. තර්ක මාත්‍රයෙන් බැස ගැනීමට නොහැකිය. මනාව පිළිපන් නුවණ ඇත්තන් විසින්ම අවබෝධ කළ දත යුතු ධර්මයකි. ඥාණයෙන් අන්ධ වූවන්ට ධර්මය දෙසීම නිෂ්ඵලය. මා ඉතා පරිශ්‍රමයකින් අවබෝධ කළ ගැඹුරු ධර්මය දෙසීමට තවම යෝග්‍ය නොවේ. රාගයෙන් රත්වූවන්ට, ද්වේෂයෙන් දුෂ්ඨ වූවන්ට, මෝහයෙන් මුලාවූවන්ට අවබෝධ කළ නොහැකිය.

මෙසේ ධර්මයේ ගැඹුරු බවත්, සත්වයන් දැඩි ලෙස කෙලෙස් බැදුම්වලින් බැදී ඉන්නා තෙක්ම මේ ධර්මය දෙසීම නිෂ්ඵල බවත් සිතීම වශයෙන් භාග්‍යවතුන් වහන්සේට ඇති වූ සංකල්පනාව දත් සහම්පතී බ්‍රහ්මරාජයා දස දහසක් සක්වල දෙව් බඹුන් කැටුව බණ අසා අවබෝධ කිරීමට වීර්‍යය කරමි යැයි උනන්දු ඇතිව පැමිණ බණ අසන්නට දැඩි ඕනෑකමක් දක්වා ආයාචනා කරනුයේ සර්වඥයන් වහන්ස, සුප්‍රඥයන් වහන්ස, මේ අමාදොර (නිවන් දොර) විවෘත කරනු මැනව, වීර්යයන් වහන්ස, මාර සංග්‍රාමයෙන් ජයගත් වීර්යයන් වහන්ස, සතර කතරින් එතර කරන තථාගතයන් වහන්ස,



කාමඡන්ද නැමැති ණයෙන් නිදහස් වූ තථාගතයන් වහන්ස නැගී සිටිනු මැනවි යයි ධර්මය දැනගන්නෝ වෙතැයි කීය.

භාග්‍යවතුන් වහන්සේ එකෙනෙහිම බුදු ඇසින් ලොව බලා වදාරණ සේක. ඇසූ කෙනෙහිම ධර්මය අවබෝධ කිරීමට තරම් මේරූ නුවණ ඇතියන් ද, ඒ ඇසූ කෙනෙහි අවබෝධ නොකොටහොත් විස්තර කරන අවස්ථාවේ අවබෝධයට පොහොසතුන්ද, බුද්ධ වචනය විස්තර ලෙස දැන ඉගෙන නුවණින් සලකමින් සත්පුරුෂ ආශ්‍රය කිරීමෙන් ධර්ම අවබෝධ කිරීමට තරම් ශක්තිය ඇත්තන්ද, කිසි ලෙසිනුදු මේ ජාතියේ දී ධර්ම අවබෝධයට පොහොසත් නොවූවන්ද, යන සතර වැදෑරුම් වූ පුද්ගලයන් දුටු සේක. දැක ධර්මය ඇසීමට බොහෝ සත්ත්වයන් සැරසී ඉන්නා බැවින් දැන් ධර්ම දේශනාවට කාලයැයි සලකා බ්‍රහ්මය ප්‍රනීත වූ ධර්ම නුවණ මදවූවන්ට දෙසීම පීඩාකාරය යන අදහසින් දේශනා නොකෙරෙමි. දැන් වනාහි කන් ඇත්තෝ දහම් ඇසීමට ශ්‍රද්ධාව විහිදුවත්වා ඔවුන්ට අමා දොරවල්, ආර්ය මාර්ග ද්වාරයේ හැර තබන ලද්දාහ. සහම්ප්‍රතී බ්‍රහ්ම රාජයා බුදුරජාණන් වහන්සේට වැද ප්‍රදක්ෂිණා කොට දෙව් බඹ පිරිස සමග එතැන්හිම අතුරුදන් විය. ඉන් පසු බුදුරජාණන් වහන්සේ මනුෂ්‍යයන් අතරින් පළමුව කාහට ධර්මය දේශනා කරමි දැයි සිතූ සේක.

ආලාරකාලාම, උද්දකරාමපුත්ත තවුසන් කොහේදැයි දිවැසින් බලා ඔවුන් මරණයට පත් වී ඇති බව දැක අන් කවරෙක් ධර්මය අවබෝධයට සමත් දැයි විමසා පස්වග තවුසන් දැක ඔවුන් කොහෙදැයි බලා බරණැස ඉසිපතනාරාමයෙහි සිටිනා බව දැන එහි වඩින්නට අදහස් කළසේක. දින කිහිපයක් බෝ මැඩ අසල වැඩ සිටි බරණැස් නුවර කරා වඩින්නට අටලොස් යොදුන් මගට පිළිපන්නාහ. ඇසළ පුන්පොහොය දවසෙහි බරණැස් නුවරට වැඩම කළ භාග්‍යවතුන් වහන්සේ පස්වග තවුසන්ගේ සැකය දුරු කරමින් තථාගත තෙමේ අර්හත් සම්‍යක් සම්මා සම්බුද්ධ යැයි ප්‍රතිඥා දුන්හ. පස්වග තවුසන් භාග්‍යවතුන් වහන්සේ බුදුබව ලත් බැවින්ම මෙසේ වදාරන්නේ යැයි පිළිගෙන ධර්මය ශ්‍රවණයට සැරසුණාහ. පස්වග තවුසන් අවිජහිත ස්ථානයක් වූ තැන රැස්වූහ. භාග්‍යවතුන් වහන්සේ අනූපමේය බුද්ධ ශ්‍රීයෙන් බබළමින් අස්නෙහි වැඩහුන් සේක. එකෙනෙහිම දසදහසක් සක්වළින් දෙවියෝද, බ්‍රහ්මයෝද, යක්ෂයෝද ගලා එන මහ ගංගාවක වතුරක් සේ රැස් වූහ.

භාග්‍යවතුන් වහන්සේ ශ්‍රී මුඛය විවෘත කොට බ්‍රහ්ම ස්වර විහිදුවා දහම් දෙසන්නට පටන්ගත් සේක. එතැන පැවති සියලු ශබ්දයෝ නැවතුනාහ. පක්ෂි ගණයාද නිහඬව හුන්හුන් තැන්වලම හිඳ භාග්‍යවතුන් වහන්සේගේ මධුර



හඬට කන් යොමු කළහ. අවසානයේ දස දහසක් සක්වල කම්පා විය. මනුෂ්‍යයන් අතුරෙන් අඤ්ඤා කොණ්ඩඤ්ඤ තවුසාණෝ සෝවාන් මගඵල ලැබුවේය. භාග්‍යවතුන් වහන්සේගේ පැවිදි උපසම්පදාව ඉල්ලා ඒහි භික්ඛු භාවයෙන් පැවිදි උපසම්පදාව දී වදාළසේක. ඥාණ මුහුකුරා ගිය දහඅට කෝටියක් වූ බ්‍රහ්මයෝ නිවන් අවබෝධ කළහ. මෙසේ මේ සූත්‍ර ධර්ම දේශනාව බලා අසා ගැනීමේ කුසල බලයෙන් සියලු දෙනාටම ධර්ම අවබෝධය පිණිස උපකාර වේවා.

## ධම්මචක්කප්පවත්තන සූත්‍රය

**ඒවං මේ සුතං ඒකං සමයං භගවා බාරාණසියං විහරති ඉසිපතනේ මිගදායේ. තත්‍ර බෝ භගවා පඤ්චවග්ගියේ භික්ඛූ ආමන්තේසි ද්වේ මේ භික්ඛවේ, අන්තා පබ්බජිතේන න සේවිතබ්බා. යෝචා යං කාමේසු කාමසුඛල්ලිකානුයෝගෝ හීනෝ ගම්මෝ පෝථුජ්ජනිකෝ අනරියෝ අනත්ථසංහිතෝ යෝචායං අත්තකිලමථානුයෝගෝ දුක්ඛෝ අනරියෝ අනත්ථසංහිතෝ. ඒතේ තේ භික්ඛවේ, උභෝ අන්තේ අනුපගම්ම මජ්ඣිමා පටිපදා තථාගතේන අභිසම්බුද්ධා චක්ඛුකරණී ඤාණකරණී උපසමාය අභිඤ්ඤාය සම්බෝධාය නිබ්බානාය සංවත්තති.**

මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ බරණැස් නුවර මුවන්ට අභය දානය දුන් මිගදායනම් ඉසිපතනාරාමයෙහි වැඩ වසන සේක. එකල්හි භාග්‍යවතුන් වහන්සේ පස්වග මහනුන් ඇමතූහ.

මහණෙනි පැවිද්දෙකු විසින් සේවනය නොකළ යුතු අන්ත දෙකකි. එනම් හීන වූ ගම්‍ය වූ පෘථග්ජනයන් විසින් පුරුදු කරන ලද අනර්ථයම සිදු කරන කාම වස්තු කෙරෙහි නැවත නැවත යෙදීමක් වෙයිද, එසේම දුක් උපදවන්නා වූ අනාරිය වූ අනර්ථයක්ම සිදුකරන හීන වූ යම් අත්ථකිලමතානුයෝගයෙහි යෙදීමක් ඇද්ද, මහණෙනි මෙම අන්ත දෙකට නොපැමිණි තථාගතයන් වහන්සේ විසින් මධ්‍යම ප්‍රතිපදා තොමෝ අවබෝධ කරන ලද්දේ ද ප්‍රඥා චක්ෂුෂ පහළ කරන්නේ ද, නුවණැස පහළ කරන්නේද කෙලෙසුන් සංසිඳීම පිණිස, චතුරාර්‍ය සත්‍ය ප්‍රතිවේධය පිණිස, සම්බෝධිය පිණිස, ඔවුන්ගේම අවබෝධය පිණිස, නිවන් පිණිස පවතින්නේය.

**කතමාචසාභික්ඛවේ,මජ්ඣිමාපටිපදාතථාගතේන අභිසම්බුද්ධා චක්ඛුකරණී ඤාණකරණී උපසමාය අභිඤ්ඤාය සම්බෝධාය නිබ්බානාය සංවත්තති ? අයමේව අරියෝ අට්ඨංගිකෝ මග්ගෝ. සෙය්‍යථීදං: සම්මාදිට්ඨී, සම්මාසංකප්පෝ, සම්මාවාචා,**



**සම්මාකම්මන්තෝ, සම්මාආජීවෝ, සම්මාවායාමෝ, සම්මාසති, සම්මාසමාධි. අයං ඛෝ සා භික්ඛවේ, මජ්ඣිමා පටිපදා තථාගතේන අභිසම්බුද්ධා චක්ඛුකරණී ඤාණකරණී උපසමාය අභිඤ්ඤායසම්බෝධායනිබ්බානායසංවත්තති.**

මහණෙනි තථාගතයන් වහන්සේ විසින් මනා කොට අවබෝධ කරන ලද ඒ කවර මධ්‍යම ප්‍රතිපදාවක් තොමෝ ප්‍රඥා ඇස සිදුකරන්නී, නුවණැස ඇති කරන්නී, කෙලෙසුන් සංසිඳීම පිණිස, චතුරාර්‍ය සත්‍ය අවබෝධය පිණිස සම්බෝධිය පිණිස, ඔවුන්ගේම අවබෝධය පිණිස, පවතීද ඒ මේ ආර්‍ය අෂ්ඨාංගික මාර්ගයැයි ද ඒ කවරේද යත් සම්‍යක් දිට්ඨිය, සම්‍යක් සංකල්පනාව, සම්‍යක් වචනය, සම්‍යක් කර්මාන්ත, සම්‍යක් ආජීවය, සම්‍යක් ව්‍යායාමය, සම්‍යක් සතිය, සම්‍යක් සමාධිය යන මොහුයි.

මහණෙනි තථාගතයන් වහන්සේ විසින් අවබෝධ කරන ලද ඒ මේ මධ්‍යම ප්‍රතිපදා තොමෝ ප්‍රඥා ඇස සිදුකරන්නීය. නුවණැස ඇති කරන්නීය, කෙලෙසුන් සංසිඳීම පිණිස, චතුරාර්‍ය සත්‍ය ප්‍රතිවේධය පිණිස, සම්බෝධිය පිණිස, නිවන් පිණිස පවතින්නේය.

**ඉදං ඛෝ පන භික්ඛවේ, දුක්ඛං අරියසච්චං. ජාති පි දුක්ඛා ජරා පි දුක්ඛා ව්‍යාධි පි දුක්ඛෝ මරණම්පි**

**දුක්ඛං අප්පියේහි සම්පයෝගෝ දුක්ඛෝ පියේහි විප්පයෝගෝ දුක්ඛෝ යම්පිච්ඡං න ලභති තම්පි දුක්ඛං සංඛිත්තේන පඤ්චුපාදානක්ඛන්ධා දුක්ඛා.**

මහණෙනි, මෙය වනාහි දුක්ඛ ආර්ය සත්‍ය වේ. ඉපදීමද දුකය. ජරාවද දුකය, රෝගවීමද දුකය. මරණයද දුකය. අප්‍රියන් හා එක්වීම දුකය. ප්‍රියයන්ගෙන් වෙන්වීම දුකය. කැමති දේ නොලැබීම දුකය. සැකෙවින් පඤ්ච උපාදානක්ඛන්ධයම දුක් වන්නාහුය.

**ඉදං ඛෝ පන භික්ඛවේ, දුක්ඛසමුදයං අරියසච්චං. යායං තණ්හා පෝනෝභවිකා නන්දිරාගසහගතා තත්‍රතත්‍රාභිනන්දිනී. සෙය්‍යථීදං : කාමතණ්හා භවතණ්හා විභවතණ්හා.**

මහණෙනි, මෙය වනාහි දුක්ඛ සමුදය ආර්ය සත්‍ය නම් වේ. යම් සේ තෘෂ්ණාවෙන් පුනරුප්පත්තිය ඇති කෙරේද, නන්දි රාග සම්ප්‍රයුක්ත වන්නී ද ඒ ඒ භවයෙහි විශේෂයෙන් ම සතුට ඇති කරන්නේද, ඒ තෘෂ්ණාව කවරේද යත් කාම තෘෂ්ණාව, භව තෘෂ්ණාව, විභව තෘෂ්ණාව යන මොහුය.

**ඉදං ඛෝ පන භික්ඛවේ, දුක්ඛනිරෝධං අරියසච්චං, යෝ තස්සායේව තණ්හාය අසේසවිරාගනිරෝධෝ චාගෝ පටිනිස්සග්ගෝ මුත්ති අනාලයෝ.**



මහණෙනි, ඒ තෘෂ්ණාවන්ගේම යම් සම්පූර්ණ නොඇලීමක් ඇති කිරීමක් වේ ද අත්හැරීමක් වේද, දුරලීමක් වේද, මිදීමක් වේද, මෙය වනාහි දුක්ඛ නිරෝධ ආර්ය සත්‍යයයි.

**ඉදං ඛෝ පන භික්ඛවේ, දුක්ඛනිරෝධගාමිනීපටිපදා අරියසච්චං, අයමේව අරියෝ අට්ඨංගිකෝ මග්ගෝ. සෙය්‍යථීදං: සම්මාදිට්ඨි, සම්මාසංකප්පෝ, සම්මාවාචා සම්මාකම්මන්තෝ, සම්මා ආජීවෝ, සම්මා වායාමෝ, සම්මාසති, සම්මාසමාධි.**

මහණෙනි මෙය වනාහි දුක්ඛ නිරෝධ ගාමිණී ප්‍රතිපදා ආර්ය සත්‍ය නම් වේ. එනම් ආර්ය අෂ්ටාංගික මාර්ගයමය. ඒ කවරෙක්ද යත් සම්‍යක් දිට්ඨිය, සම්‍යක් සංකල්පනාව, සම්‍යක් වචනය, සම්‍යක් කර්මාන්ත, සම්‍යයක් ආජීවය, සම්‍යයක් ව්‍යායාමය, සම්‍යයක් සතිය, සම්‍යයක් සමාධිය යනු වෙයි.

**ඉදං දුක්ඛං අරියසච්චන්ති මේ භික්ඛවේ, පුබ්බේ අනනුස්සුතේසු ධම්මේසු චක්ඛුං උදපාදි ඤාණං උදපාදි පඤ්ඤා උදපාදි විජ්ජා උදපාදි ආලෝකෝ උදපාදි. තං ඛෝ පනිදං දුක්ඛං**

**අරියසච්චං පරිඤ්ඤෙය්‍යන්ති මෙ භික්ඛවෙ, පුබ්බෙ අනනුස්සුතේසු ධම්මේසු චක්ඛුං උදපාදි ඤාණං උදපාදි පඤ්ඤා උදපාදි විජ්ජා උදපාදි ආලෝකෝ උදපාදි. තං ඛෝ පනිදං දුක්ඛං අරියසච්චං පරිඤ්ඤාතන්ති මෙ භික්ඛවෙ, පුබ්බෙ අනනුස්සුතේසු ධම්මේසු චක්ඛුං උදපාදි ඤාණං උදපාදි පඤ්ඤා උදපාදි විජ්ජා උදපාදි ආලෝකෝ උදපාදි.**

මහණෙනි, මේ මට ඒ මේ දුක්ඛ ආර්‍ය සත්‍යයැයි කියා පෙර නො ඇසූ විරූ ධර්මයෙහි නිමිති කොට ගෙන සත්‍ය ඥාන චක්‍ෂුස පහළ වෙයි. තත්වාකාරයෙන් දත යුතු ඥාණය පහළ විය. අර්ථය දැන ගැනීම වූ ප්‍රඥාව පහළ විය. විද්‍යාව හෙවත් කෙලෙස් දුරුකිරීමේ නුවණ පහළ විය. අවිද්‍යාන්ධකාරය දුරුකරන ඥානාලෝකය පහළ විය. මහණෙනි මේ මට එසේ මේ දුක්ඛ සත්‍යය වනා හී පිරිසිඳ දත යුතුය යැයි මහණෙනි පෙර නො ඇසූවිරූ ධර්මයන්හි නිමිති කොටගෙන සත්‍ය ඥාන චක්‍ෂුස පහළ විය. අර්ථය දැන ගැනීම වූ ප්‍රඥාව පහළ විය. විද්‍යාව හෙවත් කෙලෙස් දුරු කිරීමේ නුවණ පහළ විය. අවිද්‍යාන්ධකාර දුරුකරන ඥානාලෝකය පහළ විය. මහණෙනි ඒ මේ දුක්ඛ ආර්‍ය සත්‍යය වනාහී පිරිසිඳින ලද්දේයැයි පෙර නො ඇසූවිරූ ධර්මයන්හි නිමිති කොටගෙන ඥාන චක්‍ෂුස



පහළ විය. තත්වාකාරයෙන් දත යුතු ඥානය පහළ විය. අර්ථය දැන ගැනීම වූ ප්‍රඥාව පහළ විය. විද්‍යාව හෙවත් කෙලෙස් දුරුකිරීමේ නුවණ පහළ විය. අවිද්‍යාන්ධකාරය දුරුකරන ඥානාලෝකය පහළ විය.

**ඉදං දුක්ඛසමුදයං අරියසච්චන්ති මෙ භික්ඛවෙ, පුබ්බෙ අනනුස්සුතේසු ධම්මේසු චක්ඛුං උදපාදි ඤාණං උදපාදි පඤ්ඤා උදපාදි විජ්ජා උදපාදි ආලෝකෝ උදපාදි. තං ඛෝ පනිදං දුක්ඛසමුදයං අරියසච්චං පහාතබ්බන්ති මෙ භික්ඛවෙ පුබ්බෙ අනනුස්සුතේසු ධම්මේසු චක්ඛුං උදපාදි ඤාණං උදපාදි පඤ්ඤා උදපාදි විජ්ජා උදපාදි ආලෝකෝ උදපාදි. තං ඛෝ පනිදං දුක්ඛසමුදයං අරියසච්චං පහීනන්ති මෙ භික්ඛවෙ පුබ්බෙ අනනුස්සුතේසු ධම්මේසු චක්ඛුං උදපාදි ඤාණං උදපාදි පඤ්ඤා උදපාදි විජ්ජා උදපාදි ආලෝකෝ උදපාදි.**

මහණෙනි, මේ මට ඒ මේ දුක්ඛ සමුදය සත්‍යයැයි කියා පෙර නො ඇසූවිරූ ධර්මයෙහි නිමිති කොට ගෙන සත්‍ය ඥාන චක්‍ෂුස පහළ වේයි. තත්වාකාරයෙන් දත යුතු ඥානය පහළ විය. අර්ථය දැන ගැනීම වූ ප්‍රඥාව පහළ විය. විද්‍යාව හෙවත් කෙලෙස් දුරු කිරීමේ නුවණ පහළ විය. අවිද්‍යාන්ධාකාරය දුරුකරන ඥානාලෝකය පහළ විය. ඒ මේ දුක්ඛ සමුදය සත්‍යය ප්‍රහාණය

කළ යුතු යැයි පෙර නොවූවිරූ ධර්මයන්හි නිමිති කොටගෙන සත්‍යය ඥාන අර්ථය දැනගැනීමේ වූ ප්‍රඥාව පහල විය. චක්ෂුස පහළ විය. තත්වාකාරයෙන් දැනගතයුතු ඥානය පහල විය. විද්‍යාව හෙවත් කෙලෙස් දුරුකිරීමේ නුවණ පහළ විය. අවිද්‍යාන්ධකාර දුරුකරන ඥානාලෝකය පහළ විය. මහණෙනි ඒ මේ දුක්ඛ සමුදය ප්‍රහීනයැයි පෙර නො ඇසූවිරූ ධර්මයන්හි නිමිති කොටගෙන සත්‍ය ඥාන චක්ෂුස පහළ විය. තත්වාකාරයෙන් දතයුතු ඥාණය පහළ විය. විද්‍යාව හෙවත් කෙලෙස් දුරුකිරීමේ නුවණ පහළ විය. අවිද්‍යාන්ධකාරය දුරුකර ඥාණයලෝකය පහළ විය.

**ඉදං දුක්ඛනිරෝධං අරියසච්චන්ති මේ භික්ඛවේ, පුබ්බේ අනනුස්සුතේසු ධම්මේසු චක්ඛුං උදපාදි ඤාණං උදපාදි පඤ්ඤා උදපාදි විජ්ජා උදපාදි ආලෝකෝ උදපාදි. තං ඛො පනිදං දුක්ඛනිරෝධං අරියසච්චං සච්ඡි කාතබ්බන්ති, මෙ භික්ඛවෙ පුබ්බේ අනනුස්සුතේසු ධම්මේසු චක්ඛුං උදපාදි ඤාණං උදපාදි පඤ්ඤා උදපාදි විජ්ජා උදපාදි ආලෝකෝ උදපාදි. තං ඛෝ පනිදං දුක්ඛනිරෝධං අරියසච්චං සච්ඡිකතන්ති මේ භික්ඛවේ, පුබ්බේ අනනුස්සුතේසු ධම්මේසු චක්ඛුං උදපාදි ඤාණං උදපාදි පඤ්ඤා උදපාදි විජ්ජා උදපාදි ආලෝකෝ උදපාදි.**



මහණෙනි, මේ මට ඒ මේ දුක්ඛ නිරෝධ ආර්ය සත්‍යයැයි කියා පෙර නො ඇසූවිරූ ධර්මයෙහි නිමිති කොට ගෙන සත්‍ය ඥාණ චක්ෂුස පහළ වෙයි. තත්වාකාරයෙන් දත යුතු ඥාණය පහළ විය. අර්ථය දැන ගැනීම වූ ප්‍රඥාව පහළ විය. විද්‍යාව හෙවත් කෙලෙස් දුරුකිරීමේ නුවණ පහළ විය. අවිද්‍යා අන්ධකාරය දුරුකරන ඥානා ලෝකය පහල විය. මහණෙනි මේ මට ඒ මේ දුක්ඛ නිරෝධ සත්‍යය වනාහී සාක්ෂාත් කළ යුතු යැයි පෙර නොවූ විරූ ඇසූවිරූ ධර්මයන්හි නිමිති කොටගෙන සත්‍ය ඥාණ චක්ෂුස පහළ විය. තත්වාකාරයෙන් දත යුතු කෙලෙස් දුරුකිරීමේ නුවණ පහළ විය. අර්ථය දැනගැනීමේ ප්‍රඥාව පහළ විය. විද්‍යාව හෙවත් කෙලෙස් දුරු කිරීමේ ප්‍රඥාව පහල විය. අවිද්‍යාන්ධකාර දුරුකරන ඥාණාලෝකය පහළ විය.

මහනෙනි, මේ මට ඒ මේ දුක්ඛ නිරෝධ සත්‍යය වනාහි සාක්ෂාත් කරන ලද්දේ යැයි පෙර නොවිසුරූ ධර්මයෙහි නිමිති කොට ගෙන සත්‍ය ඥානය චක්ෂුය පහල විය. තත්වාකාරයෙන් දත යුතු ඥානය පහල විය. අර්ථය දැනගැනීමේ වූ ප්‍රඥාව පහළ විය. විද්‍යාව හෙවත් කෙලෙස් දුරු කිරීමේ නුවණ පහළ විය. අවිද්‍යාන්ධකාර දුරුකරන ඥාණාලෝකය පහළ විය.

**ඉදං දුක්ඛනිරෝධගාමිනීපටිපදා අරියසච්චං මේ භික්ඛවේ, පුබ්බේ අනනුස්සුතේසු ධම්මේසු චක්ඛුං උදපාදි ඤාණං උදපාදි පඤ්ඤා උදපාදි විජ්ජා උදපාදි ආලෝකෝ උදපාදි. තං ඛො පනිදං දුක්ඛනිරොධගාමිනීපටිපදා අරියසච්චං භාවෙතබ්බන්ති මෙ භික්ඛවෙ පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු චක්ඛුං උදපාදි, ඤාණං උදපාදි, පඤ්ඤා උදපාදි, විජ්ජා උදපාදි, ආලොකො උදපාදි, තං ඛො පනිදං දුක්ඛනිරොධගාමිනීපටිපදා අරියසච්චං භාවිතන්ති මෙ භික්ඛවෙ පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු චක්ඛුං උදපාදි, ඤාණං උදපාදි, පඤ්ඤා උදපාදි, විජ්ජා උදපාදි, ආලොකො උදපාදි**

මහණෙනි, මේ මට ඒ මේ දුක්ඛ නිරෝධ ගාමිණී පටිපදා ආර්ය සත්‍යයැයි කියා පෙර නො ඇසූවිරූ ධර්මයෙහි නිමිති කොට ගෙන සත්‍යය ඥාණ චක්ෂුස පහළ විය. තත්වාකාරයෙන් දත යුතු ඥාණය පහළ විය. අර්ථය දැන ගැනීම වූ ප්‍රඥාව පහළ විය. විද්‍යාව හෙවත් කෙලෙස් දුරු කිරීමේ නුවණ පහළ විය. අවිද්‍යාන්ධකාර දුරුකරන ඥාණාලෝකය පහළ විය. ඒ මේ දුක්ඛ නිරෝධ ගාමිණී පටිපදා ආර්ය සත්‍යය වනාහි භාවනා වශයෙන් වැඩිය යුතු යැයි පෙර නොවූ විරූ ධර්මයන්හි නිමිති කොටගෙන සත්‍ය චක්ෂුස පහළ විය. තත්වාකාරයෙන් දත යුතු ඥාණය පහළ



විය. අර්ථය දැන ගැනීම වූ ප්‍රඥාව පහළ විය. විද්‍යාව හෙවත් කෙලෙස් දුරුකිරීමේ නුවණ පහළ විය. අවිද්‍යාන්ධකාරය දුරුකරන ඥාණාලෝකය පහළ විය. මහණෙනි ඒ මේ දුක්ඛ නිරෝධ ගාමිණී පටිපදා ආර්ය වනාහි භාවනා වශයෙන් වඩන ලද්දේ යැයි පෙර නො ඇසූවිරූ ධර්මයන්හි නිමිති කොටගෙන සත්‍ය ඥාණ චක්ෂුස පහළ විය. තත්වාකාරයෙන් දත යුතු ඥාණය පහළ විය. අර්ථය දැන ගැනීම වූ ප්‍රඥාව පහළ විය. විද්‍යාව හෙවත් කෙලෙස් දුරු කිරීමේ නුවණ පහළ විය. අවිද්‍යාන්ධකාර දුරුකරන ඥාණාලෝකය පහළ විය.

**යාවකීවඤ්ච මේ භික්ඛවේ, ඉමේසු චතූසු අරියසච්චේසු ඒවං තිපරිවට්ටං ද්වාදසාකාරං යථාභූතං ඤාණදස්සනං න සුවිසුද්ධං අහෝසි. නේවතාවාහං භික්ඛවේ, සදේවකේ ලෝකේ සමාරකේ සබ්‍රහ්මකේ සස්සමණබ්‍රාහ්මණියා පජාය සදේව මනුස්සාය අනුත්තරං සම්මාසම්බෝධිං අභිසම්බුද්ධෝති පච්චඤ්ඤාසිං. යතෝ ච ඛෝ මේ භික්ඛවේ, ඉමේසු චතූසු අරියසච්චේසු ඒවං තිපරිවට්ටං ද්වාදසාකාරං යථාභූතං ඤාණදස්සනං සුවිසුද්ධං අහෝසි.**

මහණෙනි, යම්තාක් කල් මෙසේ සත්‍යඥාණ, කෘත්‍යඥාණ කෘතඥාණ සංඛ්‍යාත වූ තිපරිවෘත්තයක්

ඇති ( මේ සත්‍ය තුන් ආකාර වශයෙන්) දොළොස් ආකාරයක් ඇති වේ. චතුරාර්ය සත්‍යයන් කෙරෙහි යථාභූත ඥාණ දර්ශනය මට අතිපරිශුද්ධ නොවීය. මහණෙනි ඒ තාක් කල් දෙවියන් සහිත, මරුන් සහිත, බඹුන් සහිත, ප්‍රජාව අතරෙහි මම අනුත්තර සම්මා සම්බෝධිය ප්‍රත්‍යක්ෂ කළෙමියි ප්‍රතිඥා නොකෙළෙමි.

**අථාහං භික්ඛවේ, සදේවකේ ලෝකේ සමාරකේ සබ්‍රහ්මකේ සස්සමණබ්‍රාහ්මණියා පජාය සදේව මනුස්සාය අනුත්තරං සම්මාසම්බෝධිං අභිසම්බුද්ධෝ පච්චඤ්ඤාසිං. ඤාණඤ්ච පන මේ දස්සනං උදපාදි අකුප්පා මේ චේතෝ විමුත්ති අයමන්තිමා ජාති නත්ථිදානි පුනබ්භවෝ ති ඉදමවෝච භගවා. අත්තමනා පඤ්චවග්ගියා භික්ඛු භගවතෝ භාසිතං අභිනන්දුන්ති.**

මහණෙනි යම් තැනෙක පටන් මෙසේ තිපරිවෘත්තයක් ඇති දොළොස් ආකාර ඇති මේ චතුරාර්ය සත්‍ය කෙරෙහි යථාභූත ඥාණ දර්ශනය මට අතිපාරිශුද්ධ වීද මහණෙනි එකල්හි මම දෙවියන් සහිත, මරුන් සහිත, සත්වලෝකයෙහි මහණ බඹුණන් සහිත දෙවි මිනිසුන් සහිත වූ ප්‍රජාවෙහි ද අනුත්තර සම්මා සම්බෝධිය ප්‍රත්‍යක්ෂ කෙළෙමියි දැනගතිමියි ප්‍රතිඥා කළෙමි, මට ප්‍රත්‍යාවෙක්ෂා ඥාණය පහළ



විය. මාගේ චෙතෝ විමුක්තිය අකෝප්‍යය මෝතොමෝ අන්තිම ජාතිය වන්නීය. නැවත ඉපදීමක් නැත්තේ යැයි භාග්‍යවතුන් වහන්සේ මේ සූත්‍රය වදාළ සේක. සතුටු සිත් ඇති පඤ්ච වාර්ගික භික්ෂූහු බුදුරජාණන් වහන්සේගේ දේශනාව අභිනන්දය කළාහුය.

**ඉමස්මිඤ්ච පන වෙය්‍යාකරණස්මිං භඤ්ඤමානේ ආයස්මතෝ කොණ්ඩඤ්ඤස්ස විරජං වීතමලං ධම්ම චක්ඛුං උදපාදි යං කිඤ්චි සමුදය ධම්මං සබ්බං තං නිරෝධධම්මන් ති.**

වෙය්‍යාකරණ ධර්මයක්වූ මේ සූත්‍ර ධර්මය වදාළ කල්හි ආයුෂ්මත් කොණ්ඩඤ්ඤ ස්වාමීන් වහන්සේට කෙලෙස් රහිත වූ පහවූ කෙලෙස් මල ඇති දහම් ඇස සෝවාන් මාර්ග ඤාණය පහළ විය. යම් කිසිවක් හටගන්නා ස්වභාවය ඇත්තේද, ඒ සියල්ල නිරුද්ධ වන ස්වභාවය ඇත්තේය කියාය.

**පවත්තිතේ ච පන භගවතා ධම්මචක්කේ භුම්මා දේව සද්දමනුස්සාවේසුං ඒතං භගවතා බාරාණසියං ඉසිපතනේ මිගදායේ අනුත්තරං ධම්මචක්කං පවත්තිතං අප්පතිවත්තියං සමණේන වා බ්‍රාහ්මණේන වා දේවේන වා මාරේන වා බ්‍රහ්මුනා වා කේනචි වා ලෝකස්මින්තී.**

භාග්‍යවතුන් වහන්සේ විසින් මේ ධර්ම චක්‍රය පවත්වන ලද කල්හි භූමාටු දෙවියෝ සාධු නාද පැවැත් වූහ. (කෙසේද) භාග්‍යවතුන් වහන්සේ විසින් බරාණසි පුරයෙහි මිගදාය නම් ඉසිපතනාරාමයේදී සමණයකු විසින් බමුණෙකු හෝ දෙවියෙකු විසින් හෝ මාරයෙකු විසින් හෝ බ්‍රාහ්මනයෙකු විසින් හෝ ලෝකයෙහි අන් කිසිවෙකු විසින් හෝ නොපැවැත්විය හැකි වූ අනුත්තර වූ ධර්ම චක්‍රය පවත්වන ලද්දේය කියාය.

**භුම්මානං දේවානං සද්දං සුත්වා චාතුම්මහාරාජිකා දේවා සද්දමනුස්සාවේසුං චාතුම්මහාරාජිකානං දේවානං සද්දං සුත්වා, තාවතිංසා දේවා සද්දමනුස්සාවේසුං තාවතිංසානං දේවානං සද්දං සුත්වා යාම දේවා සද්දමනුස්සාවේසුං. යාමානං දේවානං සද්දං සුත්වා තුසිතාදේවා සද්දමනුස්සාවේසුං තුසිතානං දේවානං සද්දං සුත්වා නිම්මාණරතී දේවා සද්දමනුස්සාවේසුං නිම්මාණරතීනං දේවානං සද්දං සුත්වා පරනිම්මිතවසවත්තිනෝ දේව සද්දමනුස්සාවේසුං පරනිම්මිතවසවත්තීනං දේවානං සද්දං සුත්වා, බ්‍රහ්මපාරිසජ්ජා දේවා සද්දමනුස්සාවේසුං බ්‍රහ්මපාරිසජ්ජානං දේවානං සද්දං සුත්වා බ්‍රහ්මපුරෝහිතා දේව සද්දමනුස්සාවේසුං බ්‍රහ්මපුරෝහිතානං දේවානං**



**සද්දං සුත්වා මහාබ්‍රහ්මා දේව සද්දමනුස්සාවේසුං මහා බ්‍රහ්මානං දේවානං සද්දං සුත්වා පරිත්තාභා දේව සද්දමනුස්සාවේසුං පරිත්තාභානං දේවානං සද්දං සුත්වා අප්පමාණාභා දේවා සද්දමනුස්සාවේසුං අප්පමාණාභානං දේවානං සද්දං සුත්වා ආභස්සරා දේවා සද්දමනුස්සාවේසුං ආභස්සරානං දේවානං සද්දං සුත්වා පරිත්තසුභා දේව සද්දමනුස්සාවේසුං පරිත්තසුභානං දේවානං සද්දං සුත්වා අප්පමාණසුභා දේවා සද්දමනුස්සාවේසුං අප්පමාණසුභානං දේවානං සද්දං සුත්වා සුභකිණ්හකා දේවා සද්දමනුස්සාවේසුං සුභකිණ්හකානං දේවානං සද්දං සුත්වා, වේහප්ඵලා දේවා සද්දමනුස්සාවේසුං වේහප්ඵලානං දේවානං සද්දං සුත්වා, අවිහා දේවා සද්දමනුස්සාවේසුං අවිහානං දේවානං සද්දං සුත්වා, ආතප්පා දේවා සද්දමනුස්සාවේසුං ආතප්පානං දේවානං සද්දං සුත්වා සුදස්සා දේවා සද්දමනුස්සාවේසුං සුදස්සානං දේවානං සද්දං සුත්වා සුදස්සී දේවා සද්දමනුස්සාවේසුං සුදස්සීනං දේවානං සද්දං සුත්වා අකණිට්ඨකා දේවා සද්දමනුස්සාවේසුං.**

භූමාටු දෙවියන්ගේ සාධු නාදය අසා චාතුර්මහාරාජික දෙවියෝද සාධුකාර දෙමින් ශබ්දය අනුශ්‍රවණය කළහ. චාතුර්මහාරාජික දිව්‍යලෝක වාසී වූ දෙවියන්ගේ සාධු කර ශබ්දය

අසා තව්තිසා වැසි දෙවියෝද සාධුකාර දෙමින් ශබ්දය අනුශ්‍රවණය කළහ. තව්තිසා වැසි දෙවියන්ගේ සාධුකාර ශබ්දය අසා යාම දෙව්ලොව දෙවියෝ සාධුකාර දෙමින් ශබ්දය අනුශ්‍රවණය කළහ. යාම දෙව්ලොව වැසි දෙවියන්ගේ සාධුකාර ශබ්දය අසා තුසිත දෙව්ලාව වැසි දෙවියෝ සාධුකාර දෙමින් ශබ්දය අනුශ්‍රවණය කළහ. තුසිත දෙව් ලෝවැසි දෙවියන්ගේ සාධුකාර ශබ්දය අසා නිර්මාණරතී දෙව්ලෝවැසි දෙවියෝ සාධාකර දෙමින් ශබ්දය අනුශ්‍රවණය කළහ. නිර්මාණරති දෙව් ලොවැසි දෙවියන්ගේ සාධුකාර ශබ්දය අසා පරනිම්මිත වසවත්ති දෙව් ලෝවැසියෝ සාධුකාර දෙමින් ශබ්දය අනුශ්‍රවණය කළහ. පරනිම්මිත වසවත්ති දෙවියන්ගේ සාධුකාර ශබ්දය අසා බ්‍රහ්මපාරිසජ්ජ නම් බඹලෝ වැසි බ්‍රහ්මයෝ සාධුකාර දෙමින් ශබ්දය අනුශ්‍රවණය කළහ. බ්‍රහ්මපාරිසජ්ජ බ්‍රහ්මයන්ගේ සාධුකාර ශබ්දය අසා බ්‍රහ්ම පුරෝහිත නම් බඹලෝ වැසි බ්‍රහ්මයෝ සාධුකාර දෙමින් ශබ්දය අනුශ්‍රවණය කළහ. බ්‍රහ්ම පුරෝහිත නම් බඹලෝ වැසි බ්‍රහ්මයන්ගේ සාධුකාර ශබ්දය අසා මහා බ්‍රහ්ම වැසියෝ බ්‍රහ්මයෝ සාධුකාර දෙමින් ශබ්දය අනුශ්‍රවණය කළහ. බ්‍රහ්මයන්ගේ සාධුකාර ශබ්දය අසා පරිත්තාභ නම් බ්‍රහ්මයෝ සාධුකාර දෙමින් ශබ්දය අනුශ්‍රවනය කළහ. පරිත්තාභා



නම් බඹලෝ වැසි බ්‍රහ්මයන්ගේ සාධුකාර අසා අප්පමාණාභා නම් බඹලෝ වැසි බ්‍රහ්මයෝ සාධුකාර දෙමින් ශබ්දය අනුශ්‍රවනය කළහ. අප්පමාණාභා නම් බඹලෝ වැසි බ්‍රහ්මයෝ සාධුකාර ශබ්දය අසා ආභස්සර නම් බඹලෝ වැසි බ්‍රහ්මයෝ සාධුකාර දෙමින් ශබ්දය අනුශ්‍රවනය කළහ. ආභස්සර නම් බඹලෝ වැසි බ්‍රහ්මයන්ගේ සාධුකාර ශබ්දය අසා පරිත්තසුභ නම් බඹලෝ වැසි බ්‍රහ්මයෝ සාධුකාර දෙමින් ශබ්දය අනුශ්‍රවණය කළහ. පරිත්තසුභ නම් බඹලෝ වැසි බ්‍රහ්මයන්ගේ සාධුකාර ශබ්දය අසා අප්පමාණ සුභ නම් බඹලෝ වැසි බ්‍රහ්මයෝ සාධුකාර දෙමින් ශබ්දය අනුශ්‍රවණය කළහ.අප්පමාණ සුභ නම් බඹලෝ වැසි බ්‍රහ්මයන්ගේ සාධුකාර ශබ්දය අසා සුභකිණ්හක නම් බඹලෝ වැසි බ්‍රහ්මයෝ සාධුකාර දෙමින් ශබ්දය අනුශ්‍රවණය කළහ. සුභකිණ්හක නම් බඹලෝ වැසි බ්‍රහ්මයන්ගේ සාධුකාර ශබ්දය අසා වේහප්ඵල නම් බඹලෝ වැසි බ්‍රහ්මයෝ සාධුකාර දෙමින් ශබ්දය අනුශ්‍රවණය කළහ. වේහප්ඵල නම් බඹලෝ වැසි බ්‍රහ්මයන්ගේ සාධුකාර ශබ්දය අසා අවිහ නම් බඹලෝ වැසි බ්‍රහ්මයෝ සාධු කාර දෙමින් ශබ්දය අනුශ්‍රවණය කළහ. අවිහ නම් බඹලෝ වැසි බ්‍රහ්මයන්ගේ සාධුකාර ශබ්දය අසා අතප්ප නම් බඹලෝ වැසි බ්‍රහ්මයෝ සාධු කාර දෙමින් ශබ්දය අනුශ්‍රවණය කළහ. අතප්ප නම්

බඹලෝ වැසි බ්‍රහ්මයන්ගේ සාධුකාර ශබ්දය අසා සුදස්ස නම් බඹලෝ වැසි බ්‍රහ්මයෝ සාධුකාර දෙමින් ශබ්දය අනුශ්‍රවණය කළහ. සුදස්ස නම් බඹලෝ වැසි බ්‍රහ්මයන්ගේ සාධුකාර ශබ්දය අසා සුදස්සි නම් බඹලෝ වැසි බ්‍රහ්මයෝ සාධුකාර දෙමින් ශබ්දය අනුශ්‍රවණය කළහ. සුදස්සි නම් බඹලො වැසි බ්‍රහ්මයන්ගේ සාදුකාර ශබ්දය අසා අකනිට්ඨක නම් බඹලෝ වැසි බ්‍රහ්මයෝ සාදුකාර දෙමින් ශබ්දය අනුශ්‍රමණය කලහ.

**ඒතං භගවතා බාරාණසියං ඉසිපතනේ මිගදායේ අනුත්තරං ධම්මචක්කං පවත්තිතං අප්පතිවත්තියං සමණේන වා බ්‍රාහ්මණේන වා දේවේන වා මාරේන වා බ්‍රහ්මුනා වා කේනචි වා ලෝකස්මින් ති. ඉතිහ තේන ඛණේන තේන මුහුත්තේන යාව බ්‍රහ්මලෝකා සද්දෝ අබ්භුග්ගඤ්ඡි. අයඤ්ච දසසහස්සී ලෝකධාතු සංකම්පි සම්පකම්පි සම්පවේධි අප්පමාණෝ ච උළාරෝ ඕභාසෝ ලෝකේ පාතුරහෝසි.**

ශ්‍රමණයෙකු විසින් හෝ බමුණෙකු විසින් හෝ දෙවියෙකු විසින් හෝ මාරයෙකු විසින් හෝ බ්‍රහ්මයෙකු විසින් හෝ ලෝකයෙහි කිසිවෙකු විසින් නොපැවැත්විට හැකිවූ මේ ධර්ම චක්‍රය පවත්වන ලද්දේ කියාය. මේ ආකාරයෙන් එකෙනෙහි බඹලොව දක්වා සාධුකාර ශබ්දය



ඉතා උස්ව පැන නැග්ගාහ. මේ දශසහශ්‍රී ලෝක ධාතුවද බොහෝ සෙයින් කම්පා විය. අතිශයින්ම කම්පා විය. විශේෂයෙන්ම කම්පා විය. දෙවියන්ගේ ආනුභාවය ඉක්මවා අප්‍රමාණ වූ මහත් වූ ආලෝකයක් ලෝකයෙහි පහළ විය.

**අතික්කම්ම දේවානං දේවානුභාවන්ති. අථ ඛෝ භගවා උදානං උදානේසි : අඤ්ඤාසි වත භෝ කොණ්ඩඤ්ඤෝ අඤ්ඤාසි වත භෝ කොඤ්ඩඤ්ඤෝති. ඉතිහිදං ආයස්මතෝ කොණ්ඩඤ්ඤස්ස අඤ්ඤාකොණ්ඩඤ්ඤෝත්වේව නාමං අහෝසි ති.**

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ භවත් (පින්වත්) කොණ්ඩඤ්ඤ තෙමේ ඒකාන්තයෙන් චතුරාර්ය සත්‍යය දන්නේය. භවත් (පින්වත්) කොණ්ඩඤ්ඤ තෙමේ ඒකාන්තයෙන් චතුසත්‍යය අවබෝධ කළේයැයි ප්‍රීති වාක්‍යයක් පැවැත්වූ සේක. මෙසේ මේ කාරණයේදී කොණ්ඩඤ්ඤ ආයුෂ්මත් වහන්සේට අඤ්ඤා කොණ්ඩඤ්ඤ යන නාමය ඇති වූයේ විය.

**එතෙන සච්ච වජ්ජේන දුක්ඛාවූප සමෙන්තු මෙ (තෙ)**
**එතෙන සච්ච වජ්ජේන භයාවූප සමෙන්තු මෙ (තෙ)**

එතෙන සච්ච වජ්ජේන රෝගාවූප සමෙන්තු මෙ (තෙ)

සත්‍යානුභාව බලයෙන් මට (ඔබට) දුක් ගිනි නැති වේවා!
සත්‍යානුභාව බලයෙන් මට (ඔබට) බිය සාංකා නැති වේවා!
සත්‍යානුභාව බලයෙන් මට (ඔබට) රෝගාබාධ නැති වේවා!
(මෙහිදි අන්‍යයන් වෙනුවෙන් මෙ වෙනුවට තෙ යොදා භාවිතා කරන්න.)

## සත් බුදු පිරිත

නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස !!!

විපස්සි භගවා අරහං සම්මා සම්බුද්ධෝ අනන්ත පුඤ්ඤෝ අනන්ත ඤාණෝ, අනන්ත ගුණෝ, අනන්ත තෙජෝ, අනන්ත ඉද්ධි, අනන්ත ජුතී
සිඛී භගවා අරහං සම්මා සම්බුද්ධෝ අනන්ත පුඤ්ඤෝ අනන්ත ඤාණෝ, අනන්ත ගුණෝ, අනන්ත තෙජෝ, අනන්ත ඉද්ධී, අනන්ත ජුතී
වෙස්සභූ භගවා අරහං සම්මා සම්බුද්ධෝ අනන්ත පුඤ්ඤෝ අනන්ත ඤාණෝ, අනන්ත ගුණෝ,



අනන්ත තෙජෝ, අනන්ත ඉද්ධී, අනන්ත ජුතී
කකුසන්ධෝ භගවා අරහං සම්මා සම්බුද්ධෝ අනන්ත පුඤ්ඤෝ අනන්ත ඤාණෝ, අනන්ත ගුණො, අනන්ත තෙජෝ, අනන්ත ඉද්ධී, අනන්ත ජුතී
කෝණාගමනෝ භගවා අරහං සම්මා සම්බුද්ධෝ අනන්ත පුඤ්ඤෝ අනන්ත ඤාණෝ, අනන්ත ගුණෝ, අනන්ත තෙජෝ, අනන්ත ඉද්ධී, අනන්ත ජුතී
කස්සපෝ භගවා අරහං සම්මා සම්බුද්ධෝ අනන්ත පුඤ්ඤෝ අනන්ත ඤාණෝ, අනන්ත ගුණෝ, අනන්ත තෙජෝ, අනන්ත ඉද්ධී, අනන්ත ජුතී
අංගීරසෝ ගොතමෝ භගවා අරහං සම්මා සම්බුද්ධෝ අනන්ත පුඤ්ඤෝ අනන්ත ඤාණෝ, අනන්ත ගුණෝ, අනන්ත තෙජෝ, අනන්ත ඉද්ධී, අනන්ත ජුතී
සත්තිමේ බුද්ධා භගවන්තො අරහන්තො සම්මා සම්බුද්ධා අනන්ත පුඤ්ඤා අනන්ත ඤාණා, අනන්ත ගුණා, අනන්ත තෙජා, අනන්ත ඉද්ධිමන්තා, අනන්ත ජුතිමන්තා, මය්හං නාථා, මය්හං දීපා, මය්හං තාණා, මය්හං ලේනා, මය්හං පතිසරණා අනන්ත පුඤ්ඤා බුද්ධා භගවන්තො අනන්තෙහි පුඤ්ඤ චක්කෙහි මං රක්ඛන්තු සබ්බදා අනන්ත ඤාණා බුද්ධා භගවන්තෝ අනන්තෙහි ඤාණ චක්කේහි මං රක්ඛන්තු

සබ්බදා අනන්ත ගුණා බුද්ධා භගවන්තෝ අනන්තෙහි ගුණ චක්කේහි මං රක්ඛන්තු සබ්බදා අනන්ත තෙජා බුද්ධා භගවන්තෝ අනන්තේහි තෙජ චක්කේහි මං රක්ඛන්තු සබ්බදා අනන්ත ඉද්ධිමන්තා බුද්ධා භගවන්තෝ අනන්තෙහි ඉද්ධි චක්කෙහි මං රක්ඛන්තු සබ්බදා අනන්ත ජුතිමන්තා බුද්ධා භගවන්තො අනන්තේහි ජුති චක්කෙහි මං රක්ඛන්තු සබ්බදා සබ්බේ මහිද්ධිකා සම්මා සම්බුද්ධා සබ්බෙහි සම්මා සම්බුද්ධ චක්කෙහි මං රක්ඛන්තු සබ්බදා සබ්බෙ මහිද්ධිකා පච්චේක සම්මා සම්බුද්ධා සබ්බෙහි පච්චේක සම්මා සම්බුද්ධ චක්කේහි මං රක්ඛන්තු සබ්බදා සබ්බෙ මහිද්ධිකා ඛීණාසවා අරහන්තෝ සබ්බේහි අරහන්ත චක්කේහි මං රක්ඛන්තු සබ්බදා සබ්බේ මහිද්ධිකා අරියා සබ්බෙහි අරිය චක්කේහි මං රක්ඛන්තු සබ්බදා සබ්බේ මහිද්ධිකා දේවා සබ්බේහි දේව චක්කේහි මං රක්ඛන්තු සබ්බදා සබ්බේ මහිද්ධිකා ඉන්දා සබ්බේහි ඉන්ද චක්කේහි මං රක්ඛන්තු සබ්බදා සබ්බේ මහිද්ධිකා බ්‍රහ්මා සබ්බේහි බ්‍රහ්ම චක්කෙහි මං රක්ඛන්තු සබ්බදා සබ්බේ මහිද්ධිකා නාගා සබ්බේහි නාග චක්කේහි මං රක්ඛන්තු සබ්බදා සබ්බේ මහිද්ධිකා ගරුළා සබ්බේහි ගරුළ චක්කේහි මං රක්ඛන්තු සබ්බදා සබ්බේ මහිද්ධිකා යක්ඛා සබ්බේහි යක්ඛ චක්කෙහි මං රක්ඛන්තු සබ්බදා සබ්බේ මහිද්ධිකා රක්ඛස සබ්බේහි රක්ඛස චක්කේහි මං රක්ඛන්තු සබ්බදා



සබ්බේ මහිද්ධිකා ගන්ධබ්බා සබ්බෙහි ගන්ධබ්බා චක්කේහි මං රක්ඛන්තු සබ්බදා සබ්බේ මහිද්ධිකා කුම්භණ්ඩ සබ්බෙහි කුම්භණ්ඩා චක්කේහි මං රක්ඛන්තු සබ්බදා සබ්බේ සම්මා සම්බුද්ධා සබ්බේ පච්චෙක සම්බුද්ධා සබ්බේ ඛීණාසවා අරහන්තෝ සබ්බේ අරියා සබ්බේ දේවා සබ්බේ ඉන්දා, සබ්බේ බ්‍රහ්මා, සබ්බේ නාගා, සබ්බේ ගරුළා, සබ්බේ යක්ඛා, සබ්බේ රක්ඛසා, සබ්බේ ගන්ධබ්බා, සබ්බේ කුම්භණ්ඩා, මං රක්ඛන්තු සබ්බදා

## සත් බුදු පිරිතයි

සත්‍ය බලන ක්‍රමය:

අළුයම 05.00 ටත් 06.00 ත් අතර කාලයේ නොපිපුණු නෙළුම් කැකුලක් ගෙන 108 වරක් මෙයින් පිරිත් කළ කල්හි එය පුබුදු වී තමන් ඉන්න දෙසට නැමේ. අත්දුටුවයි.

සීලයෙහි පිහිටා තෙරුවන් නැමැද මේ පිරිත සජ්ඣායනා කළ යුතුය. අනුන්ට කියන විට මය්හං යන තැනට තුය්හං කියාද මං යන තැනට ත්වං කියාද යෙදිය යුතුය. මෙයින් 108 වර පිරෙනවිට පුදුම ගුණ ලැබේ. වනගතව විවේකීව භාවනා වඩන යෝගී උතුමන් උදෙසාම විශේෂයෙන් සකස් කරන ලද්දකි. මෙයින් සියළු අමනුෂ්‍ය භය රෝග භය අපල උපද්‍රවාදිය දුරුවී දේවාරක්‍ෂාව ලැබේ. කුඩා දරුවන්ට විශේෂයෙන් ඵලදායී වේ.

බලන්ගොඩ බුදුන්වෙල හාමු මහතා වෙතින් පූජනීය රාජකීය පණ්ඩිත මාතර ශ්‍රී ඥානාරාම මහෝපාධ්‍යාය මාහිමියන් වහන්සේට ලැබුනු පිරිතකි.

## බුදු ගුණ පිරිත

1. සෝ භගවා ඉතිපි අරහං,අරහං වත සෝ භගවා තං භගවන්තං අරහන්තං සරණං ගච්ඡාමි ,තං භගවන්තං අරහන්තං සිරසා නමාමි, තේන අරහං ගුණ තේජසා සොත්ථී තේ හෝතු සබ්බදා

2. සෝ භගවා ඉතිපි සම්මා සම්බුද්ධෝ , සම්මා සම්බුද්ධෝ වත සෝ භගවා , තං භගවන්තං සම්මා සම්බුද්ධං සරණං ගච්ඡාමි, තං භගවන්තං සම්මා සම්බුද්ධං සිරසා නමාමි. තේන සම්මා සම්බුද්ධ ගුණ තේජසා සොත්ථී තේ හෝතු සබ්බදා

3. සෝ භගවා ඉතිපි විජ්ජාචරණ සම්පන්නෝ , විජ්ජාචරණ සම්පන්නෝ වත සෝ භගවා , තං භගවන්තං විජ්ජාචරණ සම්පන්නං සරණං ගච්ඡාමි , තං භගවන්තං විජ්ජාචරණ සම්පන්නං සිරසා නමාමි - තේන විජ්ජාචරණ සම්පන්න ගුණ තේජසා සොත්ථී තේ හෝතු සබ්බදා

4. සෝ භගවා ඉතිපි සුගතෝ - සුගතෝ වත සො භගවා, තං භගවන්තං සුගතං සරණං ගච්ඡාමි - තං භගවන්තං සුගතං සිරසා නමාමි - තේන සුගත ගුණ තේජසා සොත්ථී තේ හෝතු සබ්බදා



5. සෝ භගවා ඉතිපි ලෝකවිදූ - ලෝකවිදූ වත සෝ භගවා, තං භගවන්තං ලෝකවිදූ සරණං ගච්ඡාමි - තං භගවන්තං ලෝකවිදුං සිරසා නමාමි - තේන ලෝකවිදූගුණ තේජසා සොත්ථී තේ හෝතු සබ්බදා

6. සෝ භගවා ඉතිපි අනුත්තරෝ පුරිසදම්ම සාරථී - අනුත්තරො පුරිසදම්ම සාරථී වත සෝ භගවා - තං භගවන්තං අනුත්තරං පුරිසදම්ම සාරථිං සරණං ගච්ඡාමි - තං භගවන්තං අනුත්තරං පුරිසදම්ම සාරථිං සිරසා නමාමි - තේන අනුත්තර පුරිසදම්ම සාරථී ගුණ තේජසා - සොත්ථී තේ හෝතු සබ්බදා

7. සෝ භගවා ඉතිපි සත්ථා දෙව මනුස්සානං - සත්ථා දෙව මනුස්සානං වත සෝ භගවා - තං භගවන්තං සත්ථාරං දේව මනුස්සානං සරණං ගච්ඡාමි - තං භගවන්තං සත්ථාරං දෙවමනුස්සානං සිරසා නමාමි - තෙන සත්ථාදෙව මනුස්සානං ගුණ තෙජසා සොත්ථී තේ හෝතු සබ්බදා

8. සෝ භගවා ඉතිපි බුද්ධෝ - බුද්ධෝ වත සෝ භගවා - තං භගවන්තං බුද්ධං සරණං ගච්ඡාමි - තං භගවන්තං බුද්ධං සිරසා නමාමි - තේන බුද්ධ ගුණ තේජසා සොත්ථී තේ හෝතු

සබ්බදා

9. සෝ භගවා ඉතිපි භගවා - භගවා වත සෝ භගවා - තං භගවන්තං භගවන්ත සරණං ගච්ඡාමි - තං භගවන්තං භගවන්තං සිරසා නමාමි - තේන භගවා ගුණ තේජසා සොත්ථි තේ හෝතු සබ්බදා

10. සෝ භගවා ඉතිපි දසබලධාරී - දසබලධාරී වත සෝ භගවා - තං භගවන්තං දසබලධාරිං සරණං ගච්ඡාමි - තං භගවන්තං දසබලධාරිං සිරසා නමාමි - තේන දස බලඤාණ තේජසා සොත්ථි තේ හෝතු සබ්බදා

11. සෝ භගවා ඉතිපි චතුවෙසාරජ්ජ විසාරදෝ - චතුවෙසාරජ්ජ විසාරදෝ වත සෝ භගවා - තං භගවන්තං චතුවෙසාරජ්ජ විසාරදං සරණං ගච්ඡාමි - තං භගවන්තං චතුවෙසාරජ්ජ විසාරදං සිරසා නමාමි - තේන චතුවෙසාරජ්ජ ඤාණ තෙජසා සොත්ථි තේ හෝතු සබ්බදා

12. සො භගවා ඉතිපි දුක්ඛේඤාණේන සමන්නාගතෝ දුක්ඛෙඤාණේන සමන්නාගතෝ වත සෝ භගවා, තං භගවන්තං දුක්ඛේඤාණේන සමන්නාගතං සරණං ගච්ඡාමි - තං භගවන්තං දුක්ඛෙඤාණෙන සමන්නාගතං සිරසා නමාමි - තේන දුක්ඛෙඤාණ තෙජසා සොත්ථි තේ හෝතු



සබ්බදා

13. සෝ භගවා ඉතිපි සමුදයේ ඤාණේන සමන්නාගතෝ - සමුදයේ ඤාණේන සමන්නාගතෝ වත සෝ භගවා - තං භගවන්තං සමුදයේඤාණේන සමන්නාගතං සරණං ගච්ඡාමි - තං භගවන්තං සමුදයේ ඤාණේන සමන්නාගතං සිරසා නමාමි - තේන සමුදයේ ඤාණ තේජසා සොත්ථි තේ හෝතු සබ්බදා

14. සෝ භගවා ඉතිපි නිරොධේඤාණේන සමන්නාගතෝ, නිරොධෙඤාණේන සමන්නාගතෝ වත සෝ භගවා - තං භගවන්තං නිරොධේඤාණේන සමන්නාගතං සරණං ගච්ඡාමි - තං භගවන්තං නිරොධේඤාණේන සමන්නාගතං සිරසා නමාමි - තේන නිරොධේඤාණ තෙජසා සොත්ථි තේ හෝතු සබ්බදා

15. සෝ භගවා ඉතිපි මග්ගේඤාණේන සමන්නා ගතෝ, මග්ගේ, ඤාණේන සමන්නාගතෝ වත සෝ භගවා - තං භගවන්තං මග්ගේඤාණේන සමන්නාගතං සරණං ගච්ඡාමි - තං භගවන්තං මග්ගේඤාණේන සමන්නාගතං සිරසා නමාමි - තේන මග්ගෙඤාණ තේජසා සොත්ථි තේ හෝතු සබ්බදා

16. සෝ භගවා ඉතිපි අත්ථපටිසම්භිදේ,

ඤාණේන සමන්නාගතෝ, අත්ථිපටිසම්භිදේ ඤාණේන සමන්නාගතෝ වත සෝ භගවා, තං භගවන්තං අත්ථපටිසම්භිදේ, ඤාණේන සමන්නාගතං සරණං ගච්ඡාමි තං භගවන්තං අත්ථපටිසම්භිදේ ඤාණේන සමන්නාගතං සිරසා නමාමි - තේන අත්ථපටිසම්භිදේ ඤාණ තේජසා සොත්ථි තේ හෝතු සබ්බදා

17. සෝ භගවා ඉතිපි ධම්මපටිසම්භිදේ, ඤාණේන සමන්නාගතෝ, ධම්ම පටිසම්භිදේ ඤාණේන සමන්නාගතෝ වත සෝ භගවා - තං භගවන්තං ධම්මපටිසම්භිදේ ඤාණේන සමන්නාගතං සරණං ගච්ඡාමි - තං භගවන්තං ධම්මපටිසම්භිදේ ඤාණේන සමන්නාගතං සිරසා නමාමි - තේන ධම්මපටිසම්භිදේ ඤාණ තේජසා සොත්ථි තෙ හෝතු සබ්බදා

18. සෝ භගවා ඉතිපි නිරුත්තිපටිසම්භිදේ ඤාණේන සමන්නාගතෝ, නිරුත්තිපටිසම්භිදේ ඤාණෙන සමන්නාගතෝ වත සෝ භගවා, තං භගවන්තං නිරුත්තිපටිසම්භිදේ ඤාණේන සමන්නාගතං සරණං ගච්ඡාමි - තං භගවන්තං නිරුත්තිපටිසම්භිදේ ඤාණේන සමන්නාගතං සිරසා නමාමි - තේන නිරුත්තිපටිසම්භිදේ ඤාණ තෙජසා සොත්ථි තේ හෝතු සබ්බදා

19. සෝ භගවා ඉතිපි පටිභානපටිසම්භිදේ



ඤාණේන සමන්නාගතෝ පටිභානසම්භිදෙ ඤාණේන සමන්නාගතෝ වත සෝ භගවා - තං භගවන්තං පටිභානපටිසම්භිදේ ඤාණේන සමන්නාගතං සරණං ගච්ඡාමි - තං භගවන්තං පටිභානපටිසම්භිදේ ඤාණේන සමන්නාගතං සිරසා නමාමි - තේන පටිභානපටිසම්භිදේ ඤාණ තේජසා සොත්ථි තේ හෝතු සබ්බදා

20. සෝ භගවා ඉතිපි ඉන්ද්‍රියපරොපරියන්තේ ඤාණේන සමන්නාගතෝ, ඉන්ද්‍රියපරොපරියන්තේ ඤාණේන සමන්නාගතෝ වත සෝ භගවා - තං භගවන්තං ඉන්ද්‍රියපරෝපරියන්තේ ඤාණේන සමන්නාගතං සරණං ගච්ඡාමි - තං භගවන්තං ඉන්ද්‍රියපරෝපරියන්තේ ඤාණේන සමන්නාගතං සිරසා නමාමි - තේන ඉන්ද්‍රියපරොපරියත්තේ ඤාණතේජසා සොත්ථි තේ හෝතු සබ්බදා

21. සෝ භගවා ඉතිපි ආසයානුසයේ ඤාණේන සමන්නාගතො ආසයානුසයේ ඤාණේන සමන්නාගතෝ වත සෝ භගවා - තං භගවන්තං ආසයානුසයෙ ඤාණෙන සමන්නාගතං සරණං ගච්ඡාමි - තං භගවන්තං ආසයානුසයේ ඤාණේන සමන්නාගතං සිරසා නමාමි - තේන ආසයානුසයේ ඤාණ තේජසා සොත්ථි තේ හෝතු සබ්බදා

22. සෝ භගවා ඉතිපි යමකපටිහාරියේ ඤාණේන සමන්නාගතෝ - යමකපටිහාරියේ ඤාණේන සමන්නාගතෝ වත සෝ භගවා - තං භගවන්තං යමකපටිහාරියේ ඤාණේන සමන්නාගතං සරණං ගච්ඡාමි - තං භගවන්තං යමකපටිහාරියේ ඤාණේන සමන්නාගතං සිරසා නමාමි - තේන යමකපටිහාරියේ ඤාණ තේජසා සොත්ථි තේ හෝතු සබ්බදා

23. සෝ භගවා ඉතිපි මහා - කරුණා සමාපත්තියා ඤාණේන සමන්නාගතෝ- මහා කරුණා සමාපත්තියා ඤාණේන සමන්නාගතෝ වත සෝ භගවා - තං භගවන්තං මහා කරුණා සමාපත්තියා ඤාණේන සමන්නාගතං සරණං ගච්ඡාමි - තං භගවන්තං මහා කරුණා සමාපත්තියා ඤාණේන සමන්නාගතං සිරසා නමාමි - තේන මහා කරුණා සමාපත්තියා ඤාණ තේජසා සොත්ථි තේ හෝතු සබ්බදා

24. සෝ භගවා ඉතිපි සබ්බඤ්ඤුත ඤාණේන සමන්නාගතෝ - සබ්බඤ්ඤුත ඤාණේන සමන්නාගතෝ වත සෝ භගවා - තං භගවන්තං සබ්බඤ්ඤුත ඤාණේන සමන්නාගතං සරණං ගච්ඡාමි - තං භගවන්තං සබ්බඤ්ඤුත ඤාණේන සමන්නාගතං සිරසා නමාමි - තේන සබ්බඤ්ඤුත ඤාණ තේජසා සොත්ථි තේ හෝතු සබ්බදා



25. සො භගවා ඉතිපි අනාවරණඤාණෙන සමන්නාගතො, අනාවරණඤාණෙන සමන්නාගතෝ වත සෝ භගවා - තං භගවන්තං අනාවරණඤාණෙන සමන්නාගතං සරණං ගච්ඡාමි - තං භගවන්තං අනාවරණඤාණේන සමන්නාගතං සිරසා නමාමි - තේන අනාවරණඤාණ තෙජසා සොත්ථි තේ හෝතු සබ්බදා

# අංගුලිමාල පිරිත

පරිත්තං යං භණන්තස්ස - නිසින්නට්ඨානධෝවනං,
උදකම්පි විනාසේසි සබ්බමේව පරිස්සයං.
සොත්ථිනා ගබ්භවුට්ඨා නං - යං ච සාධෙති තං ඛණෙ,
ථෙරස්සඞ්ගුලිමාලස්ස - ලෝකනාථේන භාසිතං,
කප්පට්ඨායි මහාතේජං, පරිත්තං තං භණාමහෙ
යතෝහං භගිනි අරියාය ජාතියා ජාතෝ නාභිජානාමි
සංචිච්ච පාණං ජීවිතා වෝරෝපේතා තේන සච්චේන සොත්ථි තේ හෝතු සොත්ථි ගබ්භස්සාති

(ගැබිණි මව්වරුන්ට විශේෂ පිරිතකි)
මේ පිරිත සර්වඥයන් වහන්සේ විසින් අංගුලිමාල තෙරුවන් වහන්සේට උගන්වා වදාරණ ලදී.

## ජය පිරිත

සිරි ධිති මති තේජෝ ජය සිද්ධි මහිද්ධි මහා ගුණාං අපරිමිත පුඤ්ඤාධිකාරස්ස සබ්බන්තරාය නිවාරණ සමත්ථස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස ද්වත්තිංස මහා පුරිසලක්ඛණානුභාවේන. අසීත්‍යනුව්‍යඤ්ජන ලක්ඛණානුභාවේන අට්ඨුත්තර සත මංගල ලක්ඛණානුභාවේන ඡබ්බණ්ණ රංස්‍යානුභාවේන. කේතු මාලානුභාවේන. දස පාරමිතා නුභාවේන, දස උප පාරමිතානුභාවේන දස පරමත්ථ පාරමිතානුභාවේන, සීල සමාධි පඤ්ඤානු භාවේන, බුද්ධානුභාවේන, ධම්මානුභාවේන, සංඝානුභාවේන,තේජානුභාවේන,ඉද්ධ්‍යානුභාවේ න, බලානුභාවේන, ඤෙය්‍ය ධම්මානු භාවේන, චතුරා සීති සහස්ස ධම්මක්ඛන්ධානු භාවේන, නව ලෝකෝත්තර ධම්මානුභාවේන, අට්ඨංගික මග්ගානුභාවේන, අට්ඨසමාපත්‍යානුභාවේන, ඡළභිඤ්ඤානුභාවේන, මෙත්තා කරුණා මුදිතා උපෙක්ඛානු භාවේන, සබ්බ පාරමිතානුභාවේන, රතනත්තය සරණානුභාවේන තුය්හං සබ්බරෝග සෝක උපද්දව දුක්ඛ දෝමනස්සුපායාසා විනස්සතු සබ්බ සංකප්පා තුය්හං සමිජ්ඣන්තු දීඝායුකෝ හෝතු සතවස්ස ජීවේන සමංගිකෝ හෝතු සබ්බදා ආකාස පබ්බත වන භූමි තටාක ගංගා මහා සමුද්ද ආරක්ඛක දේවතා සදා තුම්හෙ අනුරක්ඛන්තු සබ්බ බුද්ධානු භාවේන, සබ්බ ධම්මානුභාවේන සබ්බ



සංඝානුභාවේන බුද්ධ රතනං, ධම්ම රතනං, සංඝ රතනං තින්නං රතනාතං අනුභාවේන චතුරාසීතී සහස්ස ධම්මක්ඛන්ධානු භාවේන, පිටකත්තයානුභාවේන, ජිනසාවකානුභාවේන, සබ්බේ තේ රෝගා, සබ්බේ තේ භයා, සබ්බේ තේ අන්තරායා සබ්බේ තේ උපද්දවා, සබ්බේ තේ දුන්නිමිත්තා, සබ්බේ තේ, අවමඞ්ගලා විනස්සන්තු ආයුවඩ්ඪකෝ ධනවඩ්ඪකෝ සිරිවඩ්ඪකෝ යසවඩ්ඪකෝ බලවඩ්ඪකෝ වණ්ණවඩ්ඪකෝ සුඛවඩ්ඪකෝ හෝතු සබබදා. දුක්ඛ රොගභයාවෙරා සොකා සබ්බේ උපද්දවා, අනේ කා අනතරායා පි විනස්සන්තු ච තේජසා. ජයසිද්ධි ධනං ලාභං සොත්ථි භාග්‍යංසුඛංබලං සිරියායු ච වණ්ණෝ ච භොගං වුද්ධී ච යසවා සතවස්සා ච ආයූ ච ජීව සිද්ධී භවන්තු තේ.

## අන්තරාය නිවාරණ පිරිත

01. බුද්ධානං ජීවිතස්ස නසක්කා කේනචි අන්තරායෝ කාතුං
02. බුද්ධානං ඡබ්බණ්ණරංසිනං නසක්කා කේනචි අන්තරායෝ කාතුං
03. බුද්ධානං ද්වත්තිංස මහා පුරිසලක්ඛණානං නසක්කා කේනචි අන්තරායෝ කාතුං
04. බුද්ධානං අභිහට චතුන්තං පච්චයානං නසක්කා කේනචි අන්තරායෝ කාතුං

**ඉමේසං චතුන්නං අච්ඡරියානං නසක්කා කේනචි අන්තරායෝ කාතුං**

**ඒතෙන සච්ච වජ්ජේන**
**අන්තරායා අසේසතෝ**
**මාරාදයෝ විනස්සන්තු**
**ජයසිද්ධී භවන්තු මෙ (තෙ)**

**අන්තරාය නිවාරණ පිරිතේ සිංහල තේරුම**

1. සර්වඥයන් වහන්සේලාගේ ජීවිතයට අනතුරක් කිරීමට කිසිවකුටත් නොහැකිය.

2. සර්වඥයන් වහන්සේලාගේ ෂඩ් වර්ණ ඝන බුද්ධ රශ්මි මාලාවන්ට අනතුරක් කිරීමට කිසිවකුටත් නොහැකිය.

3. සර්වඥයන් වහන්සේලාගේ ද්වත්තිංස මහා පුරුෂ ලක්ෂණයන්ට අනතුරක් කිරීමට කිසිවකුටත් නොහැකිය.

4. සර්වඥයන් වහන්සේලාගේ වෙත පිරිනැමූ සිව්පස දානයන්ට අනතුරක් කිරීමට කිසිවකුට නොහැකිය.

සතරක් වූ මේ ආශ්චර්ය ධර්මයන්ට අනතුරක් කිරීමට කිසිවකුටත් නොහැකිය.



ගාථාවේ තේරුම

සතර ආකාරවූ මේ ආශ්චර්ය ධර්ම ඒකාන්තයෙන් සත්‍යය. ඒ සත්‍යය වචනයේ ආනුභාව බලයෙන් සකලාන්තරාද, මාරක බාධක සියල්ලද, විහත විද්වංසනය වෙත්වා. ආරක්ෂාව, සෙත් ශාන්තිය, ජය සිද්ධිය මාහට (ඔබ සැමට අත්වේවා)

## ඥාතීන්ට හා දෙවියන්ට පින්දීම

### ඥාතීන්ට පින් දීම

**ඉදං වෝ ඤාතීනං හෝතු - සුඛිතා හොන්තු ඤාතයෝ**
**ඉදං වෝ ඤාතීනං හෝතු - සුඛිතා හොන්තු ඤාතයො**
**ඉදං වො ඤාතීනං හෝතු - සුඛිතා හොන්තු ඤාතයෝ**

### දෙවියන්ට පින් දීම

**එත්තාවතාච අම්හේහි**
**සම්භතං පුඤ්ඤ සම්පදං**
**සබ්බේ දේවා අනුමෝදන්තු**
**සබ්බ සම්පත්ති සිද්ධියා**

එත්තාවතාච අම්හේහි
සම්භතං පුඤ්ඤං සම්පදං
සබ්බේ භූතා අනුමෝදන්තු
සබ්බ සම්පත්ති සිද්ධියා

එත්තාවතාච අම්හේහි
සම්භතං පුඤ්ඤං සම්පදං
සබ්බේ සත්තා අනුමෝදන්තු
සබ්බ සම්පත්ති සිද්ධියා

ආකාසට්ඨාච භූම්මට්ඨා
දේවානාගා මහිද්ධිකා
පුඤ්ඤන්තං අනුමෝදිත්වා
චිරං රක්ඛන්තු සාසනං

ආකාසට්ඨාච භූම්මට්ඨා
දේවානාගා මහිද්ධිකා
පුඤ්ඤන්තං අනුමෝදිත්වා
චිරං රක්ඛන්තු දේසනං

ආකාසට්ඨාච භූම්මට්ඨා
දෙවානා ගා මහිද්ධිකා
පුඤ්ඤන්තං අනුමොදිත්වා
චිරං රක්ඛන්තු මං පරං



## විහාරයේ ආරාමයේ සිටින දෙවියන්ට පින් දීම

ඉස්මිං විහාරේච ආරාමේ (අරඤ්ඤ ඛෙත්තම්හි)
අධිවත්ථා ච දේවතා
අනුමෝදිත්වා නිමං පුඤ්ඤං
රක්ඛන්තු ජින සාසනං

## සියලු සත්ත්වයන්ට පින් දීම

සබ්බෙ සත්තාච මජ්ඣත්තා - හිතාච අහිතාචමේ
අනුමෝදිත්වා ඉමං පුඤ්ඤං - බුජ්ඣන්තු අමතං පදං

## මෛත්‍රී බෝධිසත්වයන්ට පින් දීම

කප්ප සත සහස්සානි - සෝළසාපි අසංඛියෙ
සම්භරං බෝධි සම්භාරේ - ආගතෝ ජාති ජාතිසු
නියතෝ බුද්ධ භාවාය - භද්ද කප්පේ ඉධන්තිමේ
බෝධි සත්තෝච මෙත්තෙයෝ - පුඤ්ඤං මේ අනුමෝදතු

## ලෝක පාලන දෙවියන්ට පින් දීම හා පුණ්‍ය ප්‍රාර්ථනා

චත්තාරොච මහා රාජා
සක්කො චාපි සුරා පරෙ
අනුමෝදිත්වා ඉමං පුඤ්ඤං
රක්ඛන්තු ජින සාසනං

චිරං තිට්ඨතු ලොකස්මිං
සම්මා සම්බුද්ධ සාසනං
තස්මිං සගාරවා නිච්චං
හොන්තු සබ්බෙ පි පාණිනො

සම්මා වස්සතු කාලේන
දෙවෝච ජගතී පතී
සද්ධම්ම නිරතෝ ලොකං
ධම්මේ නේව පසාසතු

යං පස්සං කුසලං තස්ස
අනුභාවෙන පාණිනෝ
සබ්බේ සද්ධම්ම රාජස්ස
ඤත්වා ධම්මං සුඛාවහං

පාපු නන්තු විසුද්ධාය
සුඛාය පටිපත්ති යා
අසෝක මනු පායාසං
නිබ්බාන සුඛ මුත්ත මං



චිරං තිට්ඨතු සද්ධම්මෝ
ධම්මේ හොන්තු සගාරවා
සබ්බෙපි සත්තා කාලෙන
සම්මා දෙවෝ පවස්ස තු

යථා රක්ඛිංසු පොරාණා
සුරා ජානෝ තථෙවිමං
රාජා රක්ඛතු ධම්මේන
අත්ත නෝව පජං පජං

## කල්‍යාණ මිත්‍ර සම්පත්තිය ප්‍රාර්ථනා කිරීම

ඉමිනා පුඤ්ඤ කම්මේන
මා මේ බාල සමාගමෝ
සතං සමාගමෝ හෝතු
යාව නිබ්බාන පත්තියා

ඉමිනා පුඤ්ඤ කම්මේන
මා මේ බාල සමාගමෝ
සතං සමාගමෝ හෝතු
යාව නිබ්බාන පත්තියා

ඉමිනා පුඤ්ඤ කම්මේන
මා මේ බාල සමාගමෝ
සතං සමාගමෝ හෝතු
යාව නිබ්බාන පත්තියා

## නිවන් අවබෝධය ප්‍රාර්ථනා කිරීම

ඉදං මෙ පුඤ්ඤ කම්මං ආස වක්ඛයා වහං හෝතු
සබ්බ දුක්ඛා පමුඤ්චතු

## ප්‍රතිපත්ති පූජාව

ඉමාය ධම්මානු ධම්ම පටිපත්තියා බුද්ධං පූජෙමි
ඉමාය ධම්මානු ධම්ම පටිපත්තියා ධම්මං පූජෙමි
ඉමාය ධම්මානු ධම්ම පටිපත්තියා සංඝං පූජෙමි
අද්ධා ඉමාය පටිපත්තියා ජාති ජරා මරණම්හා
පරිමුච්චිස්සාමි

## තුණුරුවන් සමාකර ගැනීම

කායෙන වාචා චිත්තේන - පමාදේන මයා
කතං
අච්චයං ඛම මෙ හන්තේ - භූරි පඤ්ඤ තථාගත

කායෙන වාචා චිත්තේන - පමාදේන මයා කතං
අච්චයං ඛම මේ ධම්ම - සන්දිට්ඨික අකාලික
කායෙන වාචා චිත්තේන - පමාදේන මයා කතං
අච්චයං ඛම මේ සංඝ - පුඤ්ඤක්ඛෙත්ත
අනුත්තර



## උදේ සවස භාවිතා කළ යුතු ආරක්ෂක ගාථා

බුද්ධං සුද්ධ ගුණාකරං දසබලං - දේවාති දේවං
ජිනං
ධම්ම තේන සුදේසිතං භවනුදං - දුක්ඛා පගං
නිම්ම ලං
සංඝාචාපි නිරංගණං මුනිසුතං - වන්දාමහං
මුද්ධනා
බුද්ධෝ ධම්ම වරෝ තථාගත ගණෝ
පාලෙන්තුතෙ (ත්වං) මං සදා

## පින් අනුමෝදන් වීම සහ අනුමෝදන් කරවීම

'' ඔකාස වන්දාමි භන්තෙ''
''අවසරයි ස්වාමීන් වහන්ස'' මම වන්දනා කරමි.

''මයාකතං පුඤ්ඤං සාමිනා අනුමෝදිතබ්බං''
මා විසින් රැස්කර ගන්නා ලද පින ගරු ස්වාමීන්
වහන්සේ අනුමෝදන් වන සේක්වා.
සාධු සාධු අනුමෝදාමි
සාධු සධු අනුමෝදන් වෙමි.

සාමිනා කතං පුඤ්ඤං මය්හං දාතබ්බං
ගරු ස්වාමීන් වහන්සේ විසින් කරන ලද පින
මටද දෙන සේක්වා!

**සාධු සාධු අනුමෝදාහි**
සාධු සාධු අනුමෝදන් කරවමි.
**සාධු සාධු අනුමෝදාමි**
සාධු සධු අනුමෝදන් වෙමි.

**ඔකාස ද්වාරත්තයෙන කතං සබ්බං අච්චයං ඛමථ මෙ හන්තෙ**
අවසර ස්වාමීන් වහන්ස මගේ තුන් දොරින් සිදුවූ සියලු පමා වරදට සමාවන සේක්වා

**නමාමි ඛමි තබ්බං**
සමා වෙමි/ සමා වේවා

**ඕකාස ඛමාමි හන්තෙ**
අවසර ස්වාමීනි, මම ද සමා වෙමි.

**ගරු ස්වාමීන්වහන්සේලාට වන්දනා කරන ගාථා**

**සීලවන්තං ගුණවන්තං - පුඤ්ඤක්ඛෙත්තං අනුත්තරං**
**දුල්ලභේන මයා ලද්ධං - පස්සිතුං වන්දිතුං වරං**
**සාරිපුත්තාදි ථෙරානං - ආගතං පටිපාටියා**
**සද්ධා සීලං දයාවාසං - බුද්ධ පුත්තං නමාමහං**



# ශාසනික පුණ්‍ය ප්‍රාර්ථනාව

අප මහා බෝසතාණන් වහන්සේ විසින් අසංඛ්‍ය කල්ප ලක්‍ෂයකට ඉහතදී තබන ලද පාරමී ධර්මයන් සිහිපත් කරමින් සත් අසංඛ්‍ය කල්ප ලක්සයක් සිතින් බුදු බව පැතූ බව සත්‍යයි. එම සත්‍යානුභාව බලයෙන් ද, නවාසංඛ්‍ය කල්ප ලක්‍ෂයක් වචනයෙන් බුදු බව පැතූ බව සත්‍යයි. එම සත්‍යානුභාව බලයෙන්ද, දීපංකර පාද මූලයේ පටන් සාරාසංඛ්‍ය කල්ප ලක්‍ෂයක් දස පාරමී ධර්මයන් සමතිංසත් ආකාරයෙන් මනාව සම්පූර්ණ කළ බව සත්‍යයි. එම සත්‍යානුභාව බලයෙන්ද එම කාලය තුළ ලොව පහළ වූවා වූ (5-12-027) පන් ලක්‍ෂ දොළොස්දහස් විසිහත් නමක් වූ බුදුරජාණන් වහන්සේලාගේ සත්‍යානුභාව බලයෙන්ද, ලොව සියල්ල දන්නා වූ ලොව්තුරා බුද්ධත්වය ලැබූ බව ඒකාන්තයෙන් සත්‍යයි. එම සත්‍යානුභාව බලයෙන් ද, එම බෝධි මූලයේ දී අවබෝධ කළ නව ලොව්තුරා ශ්‍රී සද්ධර්ම රත්නය ඒකාන්තයෙන් සත්‍යයි. එම සත්‍යානුභාව බලයෙන් ද, එම සත්‍ය ධර්මය අවබෝධ කළ ධර්මයට අනුව පිළිවෙත් පුරණ මහා සංඝරත්නය ඒකාන්ත සත්‍යයි එම සත්‍යානුභාව බලයෙන්, සතර මාර්ග ඥාන, ෂඩ් අසාධාරණ ඥාන, දසබල ඥාන, චුද්දස මහා

ඥාන, සොළොස මහා ඥාන, අට්ඨාරස ආවේනික බුද්ධ ගුණ ඥාන, සූවිසි කෝටිවාර අර්හත් ඵල වජ්‍රඥාන, අනන්තඥය සමන්නාගත සමන්ත පට්ඨාන ප්‍රකරණ විෂයන්තර්ගත ගම්භීර ඥාන ඉන්ද්‍රිය පරොපරියත්ත ඥාන, අසයානුසය ඥාන, යමක පටිහාරිය ඥාන මහා කරුණා සමාපප්ති ඥාන, සබ්බඤ්ඤුත ඥාන, අනාවරණ ඥාන ආදිය පරිවාර කොට ඇති සර්වඥතා ඥානය අවබෝධ කළ බව ඒකාන්තයෙන් සත්‍යයි. එම සත්‍යානුභාව බලයෙන් ද, ධර්ම රත්‍නයේ ආනුභාව බලයෙන්ද, මහා සංඝ රත්නයේ ආනුභාව බලයෙන් ද, ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේගේ ආනුභාව බලයෙන්ද, දන්ත ධාතූන් වහන්සේලාගේ ආනුභාව බලයෙන්ද, ලලාට ධාතූන් වහන්සේගේද, ගීවාහා ධාතූන් වහන්සේගේද, අකු ධාතූන් වහන්සේලාගේද ආනුභාව බලයෙන්ද, ද්‍රෝණයක් සවීඥ ධාතූන් වහන්සේලාගේ ආනුභාවයෙන්ද, බුදුරජාණන් වහන්සේගේ නව අරහාදී ගුණ බලයෙන්ද, සත්බුදුවරුන්ගේ අනුභාබලයෙන්ද, අටවිසි බුදුවරයන් වහන්සේලාගේ ගුණ බලයෙන්ද ලොව පහල වදාල සියලුම බුදුවරයින් වහන්සේලාගේද අනුභාව බලයෙන්ද, බුද්ධ තේජානුභා බලයෙන්ද බුද්ධ ඍද්ධ්‍යානුභාව බලයෙන්ද, පින්



අනුමෝදන් වන දෙවියන්ගේ රැකවරණයෙන්ද කල්‍යාණ මිත්‍රයන් වහන්සේලාගේ මෛත්‍රී පූර්වාඞ්ගම ආශිර්වාද බලයෙන්ද, නිවන් දක්නා ජාති දක්වාම සුවසේ පාරමී ධර්මයන් පුරාගැනීමට යම් බඳු බාධාවක් වශයෙන් පැමිණ ඇති සියලුම අපල උපද්‍රව ග්‍රහදොස් සතුරු කරදර බාදක පීඩා අදෘශ්‍යමාන බලවේග ආදී සියලු විපත්ති දුරුවේවා. නිදුක් නිරෝගී භාවයෙන් සුවසේම ආමිස ප්‍රතිපත්ති ධර්මයන් පුරාගැනීමට භාවනා මනසිකාර දියුණු කර ගැනීමට ඇති සියලුම විපත්ති දුරු වේවා. සම්පත්ති ළඟා වේවා. අකුසල් සිත් දුරු වේවා. කුසල් සිත් පහළ වේවා. මෝහාන්ධකාරය දුරු වේවා. ප්‍රඥාලෝකය පහළ වේවා. අවිද්‍යා අන්ධකාරය දුරු වේවා. විද්‍යාලෝකය පහළ වේවා. අධර්මය දුරු වේවා. ධර්මය ළඟා වේවා. අසත් පුරුෂයෝ දුරු වෙත්වා. සත් පුරුෂයෝ ළඟා වෙත්වා. අධමයෝ දුරු වෙත්වා. උත්තමයෝ ළඟාවෙත්වා. ජනිත කරගත් කුසල් ශක්තිය අපගේ නමින් මිය පරලොව ගිය සියලු ඥාතීන්ට අත්වේවා. මේ පින් බලයෙන් උපනූපන් ජීවිතයක් පාසාම සුගති සැප විදිමින් සුවසේ පාරමී පුරා නිවන් අවබෝධ වේවා. ශාසන ආරක්ෂක, ආත්ම ආරක්ෂක දිව්‍ය රාජ මණ්ඩලය මේ පින් අනුමෝදන් වී අපවත්, ශාසනයත්, අපගේ ගෙවල්, දොරවල්, ඉඩකඩම්,

යාන වාහන දූ දරුවන් , දේපළ, වෙළඳ ව්‍යාපාර, රැකියා ස්ථානයන් ආදි සැම දේටත් සැම දෙනාටත් මැනවින් දේවාරක්ෂාව ලබා දෙත්වා. අපගේ මවුපිය දූදරු නෑදෑ හිතමිත්‍ර ආදී සියලුම ඥාතීන්ටත්, හිතවතුන්ටත් සියලුම කල්‍යාණ මිත්‍රයන්ටත් ආයුරාරෝග්‍ය සම්පත් ඇතුව සුවසේම මෙලොව පරලොව දෙව් මිනිස් දෙගතියෙහි සුවසේම පාරමී පුරාගෙන නිවන් සුවය අවබෝධ වෙත්වා. සොර, සතුරු, ගිනිදිය, වස විස, අවි ආයුධයකින් කිසිදු අන්තරාවක් නොම වේවා. අපගේද වෙළඳ ව්‍යාපාර, රැකීරක්ෂා, අධ්‍යාපන කටයුතු හා අනාගත යහපත් පුණ්‍ය ප්‍රාර්ථනා පූර්ණ චන්ද්‍ර මණ්ඩලය සේ පිරී ඉතිරී සශ්‍රීක වී සෞභාග්‍යමත් අනාගතයක් උදාවේවා. ශාසනය පිහිට කරගෙන තව තවත් සීල, සමාධි, ප්‍රඥා, දාන, සීල, භාවනා, ආමිස, ප්‍රතිපත්ති,සමථ, විපස්සනා යන ආදී ශාසනික සාරණීය ගුණධර්ම සුවසේම පාරමී වශයෙන් පුරාගෙන සුවසේම භාවනා අරමුණෙහි සිත පිහිටුවා සමාධි ඥාන, භාවනා ඥාන, විදර්ශනා ඥාන, මාර්ග ඥාන, ප්‍රතිපත්ති ඥාන, අනුපිළිවෙලින් ලැබ සුවසේම ලෞකික ලෝකෝත්තර ප්‍රාර්ථනා මුදුන්පත් වී අති උතුම් පරම රමණීය ශාන්ති ලක්ෂණ නිර්වානඅවබෝධයට පැමිණීම පිණිස ධර්මයම



පිහිට වේවා. උතුම් වූ නිවන් අවබෝධය දක්වාම කල්‍යාණ මිත්‍ර සම්පත්තිය සුවසේම ලැබේවා. සියලු සත්ත්වයෝ නිදුක් වෙත්වා, නිරෝගි වෙත්වා, සුවපත් වෙත්වා, නිවන් අවබෝධයෙන් සසරෙන් එතෙර වෙත්වා.

**චිරං තිට්ඨතු සාසනං**

සාධු! සාධු!! සාධු!!!

සම්මා සම්බුද්ධ සාසනය බොහෝ කල් පවතීවා.

## අපේ පැතුම

මෙම උතුම් කුසල් බලයෙන් අප සැම දෙනාටම සැපෙන් සතුටින් ජීවත් වෙන්න ලැබේවා. අපව හදා වඩා ගන්නා දයාබර මව්පියන්ට සුවව කීකරුව ජීවත් වෙන්න ලැබේවා.

- අපට ශිල්ප උගන්වන ගුරුවරුන්ට සුවවව අවනතව හොඳින් ඉගෙන ගන්න ලැබේවා.
- අපගේ සහෝදර සහෝදරියන් සමඟ සමගියෙන් ඉන්න ලැබේවා.
- අපට අනාගතයෙහි රට, දැය ආගම වෙනුවෙන් වැඩ කරන්න ලැබේවා.
- එළඹ සිටි සිහි නුවණින් උසස් අධ්‍යාපන කටයුතු කරගන්න ලැබේවා.
- අපගේ අනාගතය වාසනාවන්ත බවට පත්වේවා.

ඉෂානි දෙව්මිණි මදනායක, තරුෂි තත්සාරින්ද්‍යා රණවීර, කාන්ති හේවා හියලගේ, ශෙනාල් කවීෂ රණවීර, පසිඳු මධුසංඛ කුමාරසිරි, එච්.අයි. ජයරත්න, සිත්මි ප්‍රාර්ථනා කුමාරසිරි, නිරෝෂිණී ද සිල්වා, එච්.අයි. ප්‍රියශාන්ත ප්‍රභාත් මදනායක, ටී.ඒ. වයලට්, චාමර ප්‍රනීත් මදනායක, ආර්.ඩී. රමණී චිත්‍රාංගනී, මියුරු කාව්‍යා සුරවීර, කුසඟ නේත්‍ර සුරවීර, නදුන් සෙනෙවිරත්න, නදෙව් සෙනෙවිරත්න, දනිඳු සෙනෙවිරත්න, දනිඳු සෙනෙවිරත්න, දුල්මි හංසනී ලියනගේ, ජනිත් උදයංග ලියනගේ, එම්. දිදුල ගිම්හාන ආනන්ද, එම්. ත්‍යාගයා පූජානි, අංජනී මනීෂා වික්‍රමනායක, තරිඳු රශ්මික වික්‍රමනායක, හිරන්ති දිසානායක, තුසිතා ස්වර්ණා කාන්ති සෙනරත්, මැණිකේ පල්ලියගුරු, දිසස් දම්සන, සසුනි සිප්නාරා, සමාධි දෙව්මිණි, ජලනි, ඔම්ල ජනාන්දිත, අපාරා ලෝසත්මි, තරුලි නෙතුනිකා,



චතුෂාන් මදුසංඛ, චතුරිකා මදූෂානි, පසන් මලීෂ, බුද්ධි භාග්‍යා, උපේක්ෂා දහනායක, පවිත්‍රා දහනායක, ඩිලුකි අෂ්මිතා, ලෙශාන් චින්තක උග්ගල්ල, ලූශාන්ත මදුරංග උග්ගල්ල, කල්පනි චතුරිකා උග්ගල්ල, ශශිකලා එරන්දි ඒකනායක, ගයාත්‍රි ඒකනායක, සුනිමල් ලසන්ත, යෙශාන් බානුක, ඩී. දිශාන් තරිඳු දාබරේ, සුභාෂිනී අනෝමා කුලතුංග, ලිසිත් කල්හාර, ශ්‍රීමාලි ප්‍රේමලාල්, චාමරිකා වික්‍රමරත්න, නෙතුමිණි, කෞෂල්‍යා, සිතිල බිනෝද්, සනුල ඉනෝල්, කේෂිණී හංසිකා, සිතුල සිව්හත්, ඉවිඳු උද්දීශ, නේලක තරුක්ෂ, දනාශා රශ්මිනී, හර්ෂ තාරක, පේෂාන් ද මෙල්, ප්‍රේමලතා විතානගේ, එච්.එම්. නදිකා මනෝරි, අයිරංගනී ප්‍රනාන්දු.